කල් තබන ලද විවාදය නව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [අගෝස්තු 9.]

"කෙටුම්පත් පණත දැන් දෙවනවර කියවිය යුතුය"—[ගරු වන්නිනායක]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

வினா மீதான ஒத்திவைக்கப்பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது [9, ஓகஸ்ட்]

" மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிக்கப் படுமாக."—[கௌரவ வன்னிநாயக்க.]

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming Adjourned Debate on Question.*—[9th *August*].

"That the Bill be now read a Second time".—[*Hon. Wanninayake.*]

*Question again proposed.*

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

The hon. Member for Walapane (Mr. T. B. M. Herath) desires to make a personal explanation. He cannot introduce any new matter. He must strictly confine his remarks to the point of the personal explanation he wishes to make.

Digitized by Noolaham Foundation. noolaham.org | aavanaham.org

පූ. භා. 10.18

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, 1965 අගෝස්තු මස 19 වැනි දින මෙම ගරු සභාවේ අය වැය විවාදයේදී කථා කළ ගරු ප්‍රවාහණ උප ඇමති, ගම්පොල මන්ත්‍රීතුමා (එල්. බී. දසනායක මයා.) මගේ පෞද්ගලික චරිත යට හානිකර වූ අසත්‍ය ප්‍රකාශ කිපයක් කර තිබෙනවා. ඒ අවස්ථාවේදී මා මෙම ගරු සභාවේ නොසිටි බැවින් මගේ පෞද්ගලික තත්ත්වය පැහැදිලි කර දීම සඳහා ඔබ තුමාගේ අවසරය ඇතිව පහත සඳහන් ප්‍රකාශය කරනු කැමැත්තෙමි.

1 වන කාරණය: 1965 අගෝස්තු මස 19 වැනි දින නිල වාර්තාවේ 731 වැනි තීරු වේ, 1965 මාර්තු මස 1 වැනි දින සිට වලපනේ ඡන්ද කොට්ඨාශයේ ගුරුවරුන් 60 ක් මාරු කරන ලද බව ගරු ගම්පොල මන්ත්‍රීතුමා ප්‍රකාශ කර තිබෙනව. මේ මැති වරණ කාලයයි. මා එවිට මන්ත්‍රීවරයකු නොවෙයි. 1965 මාර්තු 1 වැනිදා සිට වලපනේ ආසනයේ ගුරුවරුන් 60 ක් මාරු කරන ලද බවට කර ඇති ප්‍රකාශය මෙන්ම, එය මා විසින් කරන ලද්දකැයි දැක්වීමට දරන ලද ප්‍රයත්නයද සම්පූර්ණ අසත්‍යයකි.

2 වන කාරණය: මගේ සහෝදරයකු රුපහ මහා විද්‍යාලයේ විද්‍යාලයාධිපති වශ යෙන් වැඩ කළ බව සැබෑය. ඔහු පසුව උඩ පුස්සැල්ලාව මහා විද්‍යාලයට මාරු කරන ලද නමුත් එහිදී වැළඳුණු අසාධ්‍ය රෝග යක් නිසා වෛද්‍ය සහතික උඩ නැවත රුපහ මහා විද්‍යාලයට මාරු කරන ලද බවත් සැබැයි. එහෙත් ඔහු කවදාවත් කුරුපනා වෙල මහා විද්‍යාලයේ විද්‍යාලයාධිපති වශ යෙන් සේවය කර නැත. එහෙයින් ගම් පොල මන්ත්‍රීතුමාගේ එම ප්‍රකාශයද අසත්‍යයකි.

3 වන කාරණය: මා වලපනේ විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ සභාපති වරයා බව සැබැයි. 1961 අවසාන භාගයේ සිට 1965 මැයි මාසය දක්වා මම එම තන තුර දැරීමි. ඒ කාලය තුළ මගේ සහෝදරයා සේවය කළ රුපහ මහා විද්‍යාලයේ හෝ උඩ පුස්සැල්ලාව මහා විද්‍යාලයේ හෝ කිසිම කොන්ත්‍රාත්තුවක් විවිධ සේවා සමුපකාර සංගමය භාරගෙන නැත. එහෙයින් එම ප්‍රකාශයද සම්පූර්ණයෙන්ම අසත්‍යයකි.

4 වන කාරණය: වලපනේ විවිධ සේවා සංගමයේ සභාපති ලෙස මා ඉහත සඳහන් මහා විද්‍යාලවල ගොඩනැගිලි කොන්ත්‍රාත් ලබා ගෙන මගේ සහෝදරයා ලවා ඒවා සාදවා ලාභය ඔහුට දෙන ලද බව ගරු ගම් පොල මන්ත්‍රීතුමා පැහැදිලිවම පවසා ඇත. ගරු කථානායකතුමනි, වලපනේ විවිධ සේවා සංගමය මගේ සහෝදරයා සේවය කළ විද්‍යාල දෙකේම කොන්ත්‍රාත් ලබා ගෙන නොමැති බව වගකීමක් ඇතිව මා මෙහි දී ප්‍රකාශ කරන අතර, ලබා නොගත් කොන්ත්‍රාත්තුවක් සහෝදරයා ලවා කර වන ලද බවටත් ලාභ ලබන ලද බවටත් කර ඇති සම්පූර්ණ අසත්‍ය ප්‍රකාශය හිතා මතා මෙම ගරු සභාවේ මන්ත්‍රීවරයකුගේ හොඳ නම කෙළෙසීමට දරන ලද ඉතා පහත් තත්ත්වයේ ප්‍රයත්නයක් බව නො කියාම බැහැ.

5 වන කාරණය: මගේ සහෝදරයා ගෙයක් සාදා ඇති බව සැබෑය. රටේ කවුරු නුත් තමාගේ පදිංචියට ගෙවල් සාදාගන්නා අතර මන්ත්‍රීවරුන්ගේ සහෝදරයින්ට එසේ කිරීමට තහනමක් තිබේදැයි ප්‍රශ්න කිරීමට මා කැමතියි. මගේ සහෝදරයා සාදා ඇති ගෙයි වටිනාකම ගරු ගම්පොල මන්ත්‍රී තුමා සඳහන් කරන අන්දමට රුපියල් 75,000 ක් බව පවසතත්, එහි වටිනාකම එයින් පහෙන් පංගුවක්, එනම් රුපියල් 15,000 කට අඩු යයි මා වගකීමක් ඇතිව ප්‍රකාශ කරනව.

ගරු කථානායකතුමනි, වලපනේ විවිධ සේවා සංගමය මෙම විද්‍යාලවල කොන්ත්‍රාත් ලබා ගෙන නැති බැවින් එහි සභාපති වශ යෙන් සමුපකාර සංගමයට යන්ට තිබුණු මුදලින් රුපියල් 75,000 ක ගෙයක් සෑදුවා යයි ගරු ගම්පොල මන්ත්‍රීවරයාගේ ප්‍රකා ශය ඉතාමත් භයානකයි. ඔහු සංගමයට යන්ට තිබුණු ලාභයෙන් මුදල් ගත් බවට පැහැදිලි චෝදනාවක් කර ඇත. මේ ප්‍රකා ශය මෙම ගරු සභාවෙන් පිටත කළේ නම් අධිකරණය ඉදිරියේ මගේ හා මගේ සහෝ දරයාගේ අවංක භාවය ඔප්පු කිරීමට ඉඩ තිබුණි. නමුත් මෙම ගරු සභාවේ වරප්‍රසාද වලට මුවා වී අසත්‍ය මෙන්ම ගොතාගත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

භයානක මුදල් වංචාවක් පිළිබඳව චෝදනාවක් ඉදිරිපත් කිරීමෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ චරිත ඝාතනය කිරීමට දරන ලද නින්දිත ප්‍රයත්නයට වඩා පුද්ගලයකු ඉදිරියට පැමිණ ඔහුට වෙඩි තබා මරා දැමීම වුවද එක් අතකින් උසස් යයි සිතිය හැකිය. ගරු කථානායකතුමනි, මේ ප්‍රකාශයේ ඇති භයානක තත්ත්වය ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කොට පරීක්ෂණයක් මගින් හෝ තේරීම් කාරක සභාවක් මගින් හෝ සත්‍ය අනාවරණය කොට මේ ගරු සභාවේ ගරුත්වය රැක ගන්නා ලෙස අවධාරණයෙන්ම ප්‍රකාශ කරනවා. මේ ප්‍රකාශය සත්‍ය බව ගරු ගම්පොල මන්ත්‍රීතුමා ඔප්පු කළ යුතුයි. එසේ ඔප්පු කළොත් මා මන්ත්‍රීවරයකු ලෙස රැඳී සිටීමට සූදානම් නැහැ. නැතහොත් මෙවැනි අසත්‍ය චෝදනා නැඟීමෙන් කරන බලවත් අපරාධ නැවැත්වීමට මාර්ගයක් තිබිය යුතුය. සිතා මතා ද්වේෂ සහගත ලෙස අසත්‍ය චෝදනා නැඟීමට ඉඩ ඇති පළියට එසේ කිරීම වැළැක්වීමට මේ ගරු සභාවේ ඔබතුමාට බලයක් තිබිය යුතු යයි මා කල්පනා කරනව.

6 වන කාරණය : ගරු කථානායකතුමනි, ගරු ගම්පොල මන්ත්‍රීතුමා, උඩ පළාත ගම් සභාපතිතුමා මගේ සහෝදරියකගේ ස්වාමි පුරුෂයා බව පවසා ඇත. මට ඇත්තේ එක සහෝදරියක් පමණයි. ඇගේ ස්වාමි පුරුෂයා ගම්සභාපතිවරයාද නොවෙයි. එයද සම්පූර්ණ අසත්‍යයකි.

7 වන කාරණය : තවද ඔහු කුරුපනාවෙල—රූපන දක්වා වැටි ඇති කරත්ත පාර කපන ලද්දේ මගේ සහෝදරයාගේ ගෙට යාමට යයි ප්‍රකාශ කර ඇත. එයද සම්පූර්ණ අසත්‍යයකි. මේ පාර කැපීම ආරම්භ වූයේ දැනට අවුරුදු 15කට පෙර යයි සිතමි. එක්සත් ජාතික පක්ෂයේ රජය පැවති කාලයේ එක්සත් ජාතික පක්ෂයේ ගම්සභාපතිවරයකු විසින් කුරුපනාවෙල පැත්තෙන් සැතපුම් ගණනාවක් පාර කපා ගෙන යන ලද අතර කුඹුරු හිමියන්ගේ විරෝධයක් නිසා පාර කැපීම නැවැත්වීමට සිදු විය. ඉන් පසුව ගම්සභාව එම පාර අනික් කෙළවරින්, රූපන පැත්තෙන් කැපීම ආරම්භ කළ බව සැබෑය. එය සහෝදරයාගේ ගෙට පාරක් කැපීමකැයි හුවා දැක්වීමට තැත් කිරීම බලවත් අසාධාරණයකි.

8 වන කාරණය : මගේ සහෝදරයාගේ ගේ ඉදිරිපිට බෝධියක් තිබුණු බවත් එය මගේ වුවමනාවට කපා දැමූ බවත් ගම්පොල ගරු මන්ත්‍රීතුමා පවසයි. ගරු කථානායකතුමනි, මම මේ චෝදනාව කියවනතුරු එවැන්නක් ගැන අසා තිබුණේද නැත. බෞද්ධයකු වන මා සියයට අනූවක් බෞද්ධයන් සිටින මේ රටේ ජනතාව අතර අප්‍රසාදයට ලක් කිරීමට හිතාමතා කරන ලද තවත් ප්‍රකාශනයකි එය. මේ ගැන බලවත් කණගාටුව ප්‍රකාශ කිරීමට සිදු වී ඇත. මා සම්බන්ධයෙන් කරන ලද එම ප්‍රචාරය සම්පූර්ණයෙන්ම අසත්‍ය බව ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

9 වන කාරණය : ගරු සමාජසේවා ඇමතිතුමා හා මා අතර ඇති වූ සිදුවීම ඔබතුමාගේ නායකත්වයෙන්, පක්ෂ නායකවරුන්ගේ එකඟත්වය ඇතිව බේරුම් කර ගන්නා ලද බව ඔබතුමා දන්නවා ඇත. එම සිද්ධියට තුඩු දුන් කරුණ, 1965 ජූලි 28 වන දින නිල වාර්තාවේ සඳහන් ප්‍රකාශනයකි. එහෙත් ගම්පොල ගරු මන්ත්‍රීවරයා, එයට කිසිම සම්බන්ධයක් නැති, මා කවදාවත් පාවිච්චි නොකළ වචනයක් 1965 අගෝස්තු 19 ද නිල වාර්තාවේ 733 තීරුවේ සඳහන් කර ඇත. මෙය සම්පූර්ණ අසත්‍යයකි. එදින ගරු කථානායකතුමා කරුණු සාකච්ඡා කළ අවස්ථාවේදී පවා මෙවැනි ප්‍රකාශයක් ගැන සඳහන් කිරීමක් නොවූයේය. එහෙයින් මෙයද හිතාමතා ගොතන ලද අසත්‍ය ප්‍රකාශනයකි. එහිදී බේරුම් කර ගන්නා ලද කාරණයක් ගැන කථානායකතුමාගේ නියෝගය පිළිගෙන එයින් සෑහීමට පත්ව දෙපක්ෂය නිසොල්මන්ව සිටියදී නැවත වරක් බොරු චෝදනා නැඟීමෙන් මහජනතාව අතර නොසන්සුන්තාවයක් ඇති කිරීමට ගම්පොල ගරු මන්ත්‍රීතුමා දරන ලද ඒ ප්‍රයත්නය මට නොවෙයි, ගරු කථානායකතුමනි, ඔබතුමාට කරන ලද නිග්‍රහයක් ලෙස මට හැඳින්වීමට සිදු වී තිබීම ගැන මම කණගාටු වෙනව.

10 වන කාරණය : තවද ගරු කථානායකතුමනි, මගේ භාර්යාව ගැනද එතුමා සඳහන් කර තිබෙනවා. ඒ ගැනද මගේ කණගාටුව පමණක් මා මෙහිදී ප්‍රකාශ කරනව. ඊට වැඩිය ඒ ගැන පිළිතුරු දෙන්න මම කල්පනා කරන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]
ගම් පුළුල් කිරීමෙ වැඩ පිළිවෙළට අවශ්‍ය නොවන, ජනපද පිහිටුවීමෙ වැඩ පිළිවෙළට අවශ්‍ය නොවන, ඉඩම් ඉක්මන් ක්‍රමයකට අතිරේක ආහාර නිෂ්පාදනය සඳහා යෙදවීම ඉතාමත්ම අවශ්‍ය බව අපට පෙනී ගියා. සමහර අතිරේක ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය යම් විධියක දැනුමක් හා පළපුරුද්දක් ඇතුව කළ යුතුව තිබෙනව. එම නිසා ඒ වෙනුවෙන් අර විධියෙ ක්‍රමයක් ඇති කළාම සමහරවිට අපේ ජනතාවටත් ඒ මගින් අභ්‍යාශයක් ලබා ගන්න පුළුවනි. ඒ වැඩ පිළිවෙළ මීට පෙරත් මෙම සභාවට ඉදිරිපත් කර තිබෙනව. දොම්පෙ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) 1961-62 වර්ෂයෙ අයවැය ලේඛන කථාව කරද්දි මේ ප්‍රතිපත්තිය ගැන ප්‍රකාශ කළා. එදා නම්, "මෙම වැඩ පිළිවෙළ අපේ ඉඩම් ප්‍රතිපත්තිය නැති කර දමා එක එක කොටස්වලට ඒ ඉඩම් පාවා දීමේ වැයමක් "ය කියා කිසිවෙක් කීවෙ නැහැ. මා ළඟ තිබෙනව එතුමා කළ කථාවෙන් කොටසක්. හැන්සාඩ් වාර්තාවෙන් උපුටා ගත් පරිදි එම කොටස මෙසේයි:

"Even as much as we are prepared to encourage every form of genuine industrial enterprise with favourable incentives, we shall give every encouragement to large investors, who are prepared to open farms or new lands under paddy and other subsidiary food crops."—[OFFICIAL REPORT, 27th July 1961; Vol. 43, c. 945].

ඒ ප්‍රතිපත්තිය හරි. ඒකෙ කිසි වරදක් නැහැ.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
එදා තමුන්නාන්සෙල ඒක හොඳයි කීවෙ නැහැ.

ප්‍රේමදාස මයා.
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
කිසි විරුද්ධයක් වුණේ නැහැ. තමුන්නාන්සෙ එදා මෙම ප්‍රතිපත්තිය ප්‍රකාශ කළ දවසෙ පළවූ හැන්සාඩ් වාර්තාව මා කියවා බැලුව. එදා විරුද්ධ පාර්ශ්වයෙ සිටි, අද ආණ්ඩු පක්ෂයෙ සිටින එක්කෙනෙක් වත් විරුද්ධ වෙලා නැහැ.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
පිළිතුරු දෙන විට මම පෙන්වන්නම්.

ප්‍රේමදාස මයා.
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
ඒක සත්‍යයක්. අද තමුන්නාන්සේලා ඒ ප්‍රතිපත්තියට විරුද්ධ ව්‍යාපාරයක් ගෙන යනව. Subsidiary food crops—ආහාර ද්‍රව්‍ය පමණක් නොවෙයි, තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළට මේ කොටසත් ඇතුළත් වෙනව: "To open farms or new lands under paddy and other subsidiary food crops." අපේ ප්‍රතිපත්තියේ එහෙම දෙයක් නැහැ. මෙවැනි දේවල් කියාපාමින් සම්පූර්ණයෙන් කලින් තිබුණු ඉඩම් ප්‍රතිපත්තිය අහෝසි කර ලොකු කොම්පැනිවලට ඉඩම් පාවාදීමේ වැඩ පිළිවෙලක් අපි ගෙන යනවා යයි බොරු ප්‍රචාරයක් ගෙන යනව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයට යුතුකමක් තිබෙනව, ආණ්ඩුවේ වැඩ පිළිවෙළේ යම් වරදක් තිබෙනව නම් විවේචනය කරන්ට. ඒ විවේචනය බොරු එකක් වුණොත්, කවදාවත් ඊට ආයුෂ නැති බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. අපි පැහැදිලි කරන්ට ඕනැ, ඩී. එස්. සේනානායක මහත්මයා මේ රටේ ඇති කළ ඉඩම් ප්‍රතිපත්තිය වඩාත් තහවුරු කරමින් අපි ඉදිරියට ගෙන ගියා පමණක් නොව, මේ රටේ දුප්පත් ජනතාවට ඇති ඒ ඉඩම් පිළිබඳ අයිතිවාසිකම් නැති කරන්ට කිසිදු දෙයක් මේ රජයෙන් කෙරී නැති බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අයවැය වාර්තාව සම්බන්ධයෙන් කෙරුණු ඇතැම් කථා ගැන කල්පනා කරන විට පෙනී යනව, ඇතැම් උදවියට මේ ආණ්ඩුව පිහිටුවූ අවස්ථාවේදී මේ රට තිබුණේ මොන විධියේ තත්ත්වයක්ද යන්න අමතක වී තිබෙන බව. හුඟක් දුරටම ඒක අමතක වී තිබෙනව. පසුගිය ආණ්ඩුව පරාජයට පත් වන අවස්ථාවේ රටේ තිබුණු භයානක ආර්ථික පරිහානිය අද බොහෝ දෙනෙකුට අමතක වී තිබෙනව. යම් යම් අවශ්‍ය දේවල් ලබා ගන්ට තිබුණු අමාරුව;

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

expansion despite all talk to the contrary, and you, on the other hand, it is equally clear that the Government is taxing already at levels which are aggressive those sources from which the capital resources of the private sector can be found. This is what I call falling between two stools."

Mr. Speaker, our Hon. Minister of Finance did not want to "fall between two stools" as the last Government had done. We want the private sector to exist and at the same time we want to give them those necessary incentives and so on, so that the private sector can exist and flourish. That, in a nut-shell, is our attitude towards the private sector.

The hon. Member for Panadura (Mr. Leslie Goonewardene) tried to make out that this Budget has placed undue emphasis on the private sector. That is not quite correct. It is true that we are anxious that the private sector should exist and flourish, but we are not depending for the development of the country on the private sector alone.

As you will be pleased to see, Mr. Speaker, in our Budget we have set aside a sum of Rs. 674 million for capital expenditure as against a sum of Rs. 558 million set apart by the hon. Member for Yatiyantota in his 1964-65 Budget. The estimated amount was Rs. 558 million and the amount actually spent was Rs. 475 million.

Therefore, you will be pleased to note that while we are giving every possible encouragement to the private sector, we have set apart in the Budget the necessary capital to maintain our level of expansion of the public sector. But what was wrong in the last four years was the tremendous under-expenditure of capital investment funds that had been set aside by the Cabinet. In 1960-61 there was an under-expenditure of nearly Rs. 19 millions. In 1961-62 there was an under-expenditure of nearly 21 per cent. In 1962-63 there was an under-expenditure of Rs. 75 millions—that was the "Sunshine Budget" of the "hon. Member for Tumpane." In 1963-64 there was an under-expenditure of Rs. 116 millions. If you look at these figures, Mr. Speaker, it is curious that over the last four years the under-expenditure on capital investment was something like Rs. 418 millions; in other words, in four years we had lost one year's development.

Our Government is determined that there shall be no under-expenditure on capital investment. For that purpose, as outlined by the Hon. Minister of Finance in his Budget speech, there is a high-powered committee set up consisting of the Hon. Prime Minister, the Hon. Minister of Finance and the Hon. Minister of State to co-ordinate and plan the development of our country. It is interesting that Lord Cloughden, Chief Planning Officer in England, in his report to the Treasury had recommended a committee of this nature in England, so that there could be planned development. He had advocated that the spending Ministers—that is, in our country Ministers like the Minister of Industries, Minister of Land, Irrigation and Power, and so on—should be on that committee, and that the Hon. Prime Minister and the Hon. Minister of Finance should be in charge of shaping policy.

Therefore, you will see not only that we have set apart a higher amount for capital expenditure this year but that we have also made possible such investment and set up the necessary machinery to see that there shall be no under-expenditure at the end of the year.

Mr. Speaker, I started my speech by saying that there are two objectives in this Budget. One is to bring down the cost of living and the other to encourage capital formation. I am sure no one can gainsay that the removal of the import duties on various items like potatoes, onions, chillies, kerosene oil and so on will tend to bring down the cost of living. The hon. Member for Yatiyantota said, "What have you done? You have reduced the price of kerosene oil by one cent, potatoes by one cent and onions by one cent." If it was so simple, why did he not do it in his Budget in 1964-65?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. ශිවසිතම්පරම් මයා.]

I am sure that these measures of the Hon. Minister of Finance announced in his Budget speech would tend to bring down the cost of living in this country.

With regard to capital formation, as far as local capital is concerned, we have given all incentives to form this capital. There is the question of foreign capital, and the need for foreign capital has been very ably put in the Annual Report of the Central Bank of Ceylon for 1964, at page 10:

"It will be apparent from the discussion above, that whilst Ceylon's balance of payments position and the problem of her future import capacity could be alleviated by a vigorous effort at import substitution in the agricultural sphere, and by an increase in exports, which should include industrial exports, these are medium to long-term solutions. In the interim period Ceylon is likely, unless she enjoys an unforseen improvement in her terms of trade, to experience relatively acute payments problems. These could, if not overcome in other way, jeopardize not only the realization of the long-term prospect but even the maintenance of current levels of economic activity.

It is to deal with the problems of the interim period specially that Ceylon would need to benefit from the third of the possible approaches towards relieving her external payments difficulties and enabling her to carry through a programme of rapid development. This approach concerns an enhanced flow of capital receipts from abroad. The existence of a gap between minimum import needs and likely export earnings is common to the developing countries as a whole at the present time. Since the world demand for primary products is unlikely to rise at an adequate rate and there are limits to the practicable extent of import substitution, there will inevitably be a need for larger capital inflows to bridge the payments gap that would arise in these countries in the process of accelerated development."

Further on, at page 12, this is what the Central Bank Report says:

"There can be little doubt that, over the years immediately ahead, an expanded flow of capital receipts will be one of the important means whereby Ceylon's import capacity might be supplemented in the initial period. This would enable Ceylon to accelerate programmes in the field of agricultural and industrial development and to strengthen eventually her external position as well as reduce her dependence on external assistance. Ceylon's need is not merely for 'project aid'."

Mr. Speaker, it will thus be clear that even the Central Bank is convinced that to tide over our interim difficulties it is absolutely essential that there should be a greater inflow of capital from abroad. If you look at any developing country in South-East Asia the history has been that foreign capital has kept on flowing into it at an increased pace.

Every Finance Minister has lamented the fact that foreign capital has been chary of coming into our country. It is relevant to ask why. It is true that Finance Ministers over the last four years have been giving assurances on the Floor of this House and outside for foreign capital to come into Ceylon. It is no use giving assurances on the Floor of the House and at the same time imposing a moratorium on dividends being sent out of the country. Foreign capital is not interested in mere assurances given by Finance Ministers. It is more interested in seeing how investors who have already invested their money in this country are being treated. That is the way in which the confidence of foreign capital can be gained and, thereby, persuaded to flow into this country.

It has been alleged that the National Government, in particular the United National Party, has mortgaged the country to foreign capital. It will be interesting to note that over the years since we gained independence, this country has entered into agreements with various foreign countries to the tune of Rs. 940 million in the form of aid and loans. It will be interesting to learn what portion of this money by way of aid and loans had been agreed to before 1956, that is during the eight years in which the United National Party was in power, and in the eight years subsequent to 1956 and up to 1965. You will be amazed to find that while the United National Party during the eight years prior to 1956 had entered into agreements only for a sum of Rs. 83.4 million in the form of aid and loans, these gentlemen who accuse

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the National Government of mortgaging the country, namely the Sri Lanka Freedom Party Government of the late Mr. S. W. R. D. Bandaranaike and the Sirimavo Government, have entered into agreements for foreign loans and aid to the tune of Rs. 857 million. Therefore, you will see who had mortgaged the country —whether it is the Government which had got aid in the sum of Rs. 83.4 million or the Governments which had agreed to aid to the tune of Rs. 857 million.

There is one more feature which we must take note of in this connection. Out of this sum of Rs. 857 million, loans from international organizations amount to Rs. 106 million, from Western countries, Rs. 237 million and from Eastern countries, the Communist bloc, Rs. 514 million.

Now, Sir, the curious feature about aid from the Communist countries is that not a cent comes to us as a gift, except of course Communist China, which sends us money because of the Rubber-Rice Agreement. Every cent given to us from Communist countries is in the form of a loan. How can then one speak of mortgaging the country? It can only apply to the Rs. 514 million this country had agreed to with the Communist bloc in the form of loans. Therefore, Mr. Speaker, it is useless trying to make out that the National Government, and particularly the United National Party, has been trying in the past to mortgage the country to the foreign capitalists.

Sir, I thought of dealing with a number of matters which I wished to deal with but, however, as time is running out I shall deal now only with taxation.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

The hon. Member has exceeded the time allotted to him. I am sorry I cannot allow you any more time.

එම්. සිවසිතම්පරම් මයා.
(திரு. எம். சிவசிதம்பரம்)
(Mr. M. Sivasithamparam)

Yes, Sir, I will just touch on this question of taxation and end my speech. The hon. Member for Yatiyantota (Dr. N. M. Perera) and others had attacked the taxation proposals of the Hon. Minister of Finance. The Hon. Minister of State had, to a certain degree, replied to those criticisms. I want to look at it from another angle. One of the difficulties in the collection of revenue over the last few years was that there has been a plethora of taxes. The actual revenue that has been collected has been on the diminishing scale. Fancied, fanciful and newfangled taxes, unheard of in any other country, have been levied. Taxes have been conceived and embodied purely for their novelty. There have been taxes introduced out of pure malice and from a sense of vindictiveness, as was the Notarial Professional Tax. In all these taxes one is amazed to see a decrease in the total revenue that has been collected. In the eight years from 1956 to 1964 there has been an increase in the total revenue by Rs. 533. 4 million, while in the previous eight years of the U. N. P. regime there has been an increase of Rs. 741. 8 million in total revenue as a result of direct taxes.

Even if you look at the percentage of direct taxes as to the totality of the taxes collected, then also you find a decrease. In 1947-48 there was 20.3 per cent. of direct taxes from the net tax revenue. In 1952-53 it was 25.5 per cent. In 1955-56 it was 26.6 per cent. But since then there has been a steady drop. In 1958-59 it was 24 per cent.; in 1961-62 it was 22.6 per cent.; and in 1963-64 it was 21.7 per cent. Does it not show that the successive increases in the scope and rates of direct taxes have not produced a comparative increase in revenue corresponding to the increase in taxation? In other words, Mr. Speaker, tax levies, although high, have tended to yield less revenue. That is why the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. සිවසිතම්පරම් මයා.]
Hon. Minister of Finance thought that it was time that the entire tax structure was looked into and changes introduced soon.

The Hon. Minister of Finance has, quite rightly, emphasized the need for national unity for the development of our country. During the last four years with an unduly long emergency, with the army being posted in one part of our country, the normal economic life of this country has been disturbed. It has only been a disturbance in the normal life of this country. This Government in 1961 had to incur an expenditure of nearly Rs. 11 million for the purpose of keeping the Army in the Northern parts of the Island. An expenditure of Rs. 11 million in one year for keeping the army in the North !

The National Government has, quite rightly, emphasized the need for restoring national unity and goodwill among the communities if this country is to advance economically. I am glad that the hon. Member for Colombo South had responded to the speech of the Hon. Minister of Finance when he said that he himself and his party were anxious to settle this problem. Unfortunately, we heard a discordant note in the Coalition flute when the hon. Member for Walapane (Mr. T. B. M. Herath) as usual played the communal tune. The culmination of these assurances by the National Government will be when legislation is placed before the House to implement the Government's intentions in this matter as outlined in the Speech from the Throne.

In the past, discrimination was based not only on language and on the question of minorities but even on the question of the development of the Northern and Eastern Provinces. You will remember, Mr. Speaker, that the last Motion that this House debated before it was dissolved in December 1964 was a Private Member's Motion by me regarding the development of the Kankesanturai harbour. On that occasion, the then hon. Member for Dehiwala-Mt. Lavinia, Dr. Colvin R. de Silva, in an attempt to filibuster and prevent a vote being taken on that Motion, had spoken for nearly four hours on every conceivable subject. I remember one almost prophetic statement that he made. He asked me why I do not ask my new friends—he was referring to the alliance that we had formed to defeat them on the Throne Speech—to accept my Motion. I am glad that the new friends who are with us in the National Government, particularly the Hon. Minister of Nationalized Services, have at last agreed to the development of the Kankesanturai harbour, thereby not only developing the hinterland in the Northern Province but also bringing down the price of cement by Rs. 2.50 per cwt.

The Hon. Minister of Finance, as I said yesterday, has fashioned an instrument for advancing the economic development of this country. I am sure that with national unity established, with mutual goodwill, and with every section of this country putting its shoulder to the common weal, he will achieve the objective of giving a good life to all the people of this country.

පූ. භා. 10.51

**ඇස්. බී. යාලෙගම මයා. (රත්තොට)**
*(திரு. எஸ். பி. யாலேகம றத்தோட்டை)*
(Mr. S. B. Yalegama—Rattota)

ගරු කථානායකතුමනි, ජාතික රජයේ අයවැය ලේඛනය සම්බන්ධයෙන් මටත් මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ඇත්ත වශයෙන්ම මේ අයවැය ලේඛනය ඉදිරිපත් කරන තුරු ජනතාව මහත් බලාපොරොත්තු ඇතිව පුල පුලා සිටියා. නමුත් මේ අයවැය ලේඛනයෙන් මේ රටේ ජනතාව, ගොවි ජනතාව බලාපොරොත්තුවූ යම් යම් සහන ලැබී නැති බව අපට පැහැදිලි වශයෙන්ම පෙනී ගොස් තිබෙනවා. විශේෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෙන්ම ජීවන වියදම අඩු කිරීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් කළයුතු පිළියම් වශයෙන් අයවැය ලේඛනයේ යම් යම් කරුණු ඇතු ලත් වෙනව. ඒ එක් කාරණයක් තමයි නැව් ගාස්තු හැකි තරම් අඩු කිරීමට යම් යම් සාකච්ඡා පවත්වා ක්‍රියා කිරීම. නැව් ගාස්තු සම්බන්ධයෙන් සඳහන් කරන විට, පසුගිය කාලයේත් යම් යම් අවස්ථා වල නැව් ගාස්තු අඩුවූ බව මා මතක් කරන්නට සතුටුයි. නමුත් නැව් ගාස්තු අඩු වුණාට එයින් ඇතිවූ සහනය මේ රටේ සිටින තොග වෙළෙන්දන් පාරි භෝගිකයාට ලැබෙන්නට ඉඩ හැරියෙ නැහැ. පොදුවේ වෙළඳ ව්‍යාපාරිකයන් ගැන කල්පනා කරගෙන යන විට ඔවුන් ගෙන් කොයි අන්දමකින්වත් සහනයක් සාධාරණයක් පාරිභෝගිකයාට සලසේවිය කියා අපට බලාපොරොත්තු වෙන්න බැහැ. ඊට හේතුව මේකයි. සෑම වෙළඳ ව්‍යාපාරිකයකුම නිතරම කල්පනා කරන්නේ තමන් සතු භාණ්ඩ කොයි අන්දමකින් හෝ වැඩි මුදලකට විකුණා වැඩි ලාභයක් ලබා ගන්නයි. ඒ නිසා අද තිබෙනවාට වඩා තද පාලන නීතිරීති පනවා ක්‍රියාත්මක කරනවා නම්, ඒවාගේම වෙළෙන්දා ලවා පාරිභෝගික යාට පහසු මිළට බඩු සැපයීමට රජය හැකි තරම් දුරට පියවරවල් ගන්නවා නම්, පමණක් පාරිභෝගිකයාට සෙතක් සැල සිය හැකි බව මගේ විශ්වාසයයි. එසේ නැතිව සිය කැමැත්තෙන් නම් වෙළෙන් දා කවදාවත් අඩු මිළට පාරිභෝගිකයාට අවශ්‍ය බඩු සපයාවිය කියා අපට විශ්වාස කරන්නට බැහැ.

ගරු කථානායකතුමනි, ඒවාගේම මේ රටේ කලුකඩකාරයිනුත්, නොයෙකුත් දූෂණවල යෙදෙන වෙළෙන්දනුත් මැඩ පැවැත්වීමට ජනතා කොමිටි පත් කරන් නට අදහස් කරනවාය කියා අයවැය කථා වේදී අපට අසන්නට ලැබුණා. මේ ජනතා කොමිටි පත් කිරීමේ අදහස මේ අයවැය ලේඛනයේ පමණක් නොවෙයි, පසුගිය අයවැය ලේඛනයෙත් සඳහන් වුණා. නමුත් මේ අදහසේ වෙනසක් දැන් අපට පෙනෙනව. පසුගිය රජ්යේ අයවැය ලේඛනයෙන් ඉදිරිපත් කළ යෝජනාව

අනුව ජනතා කොමිටිවලට පත් කිරීමට තීරණය කර තිබුණේ පාරිභෝගිකයන්, ඒවාගේම තරුණ සමිතිවල නියෝජිත වරුන්, ගම්වල තිබෙන නොයෙකුත් සමිති සමාගම්වල නියෝජිතයන් ආදීනුයි. වෙන විධියකින් කියනවා නම් සාමාන්‍ය ජනතාව නියෝජනය කරන උදවිය ඒ ජනතා කොමිටිවලට පත් කරන්නටයි තීරණය කර තිබුණේ. නමුත් අද, වර්ත මාන මුදල් ඇමතිවරයාගේ අයවැය ලේඛනය අනුව ජනතා කොමිටිවලට නියෝජිතයන් පත් කරන්නට යන්නෙ ඒ ඒ දිස්ත්‍රික්ක භාර දිසාපතිවරුන් මුල් කරගෙනයි.

සාමාන්‍ය මහජනතාවගේ ප්‍රශ්න පිළි බඳව හරි අවබෝධයක් නැති, ඒවා පිළි බඳව හරි හැටියට කටයුතු කරන්න බැරි පිරිසක්, වැඩි වශයෙන්ම නිලධාරි පිරි සක්, ඒ කොමිටිවලට පත් කර කටයුතු කිරීමට වර්තමාන මුදල් ඇමතිතුමා අදහස් කරන බව පේනව. නිලධාරි පිරි සක් මේ කොමිටිවලට පත් කර ඒ මඟින් බඩු මිළ බස්සන්න පුළුවන්යයි ආණ්ඩුව කල්පනා කරනවා නම් එය ලොකු මුලා වක වැටීමක් බව මම කියන්න කැමතියි. නිලධාරීන් බඩු මිළ බැස්සීම සඳහා කට යුතු කරන අන්දම ගැන අපි දන්නවා. අපේ අත්දැකීමේ හැටියට නිලධාරීන්ගේ කටයුතු කිරීම සාකච්ඡාවලටත්, චක්‍ර ලේඛන නිකුත් කිරීමටත් සීමා වෙනවා. ඒ නිසා අපට නම් කොයි අන්දමකින් වත් බලාපොරොත්තු වෙන්න බැහැ, නිලධාරීන්ගෙන් සමන්විත කොමිටි මඟින් බඩු මිළ බැස්සීමේ කාර්යය ඉටු වේය කියා.

ජීවන වියදම බැස්සීම සඳහා ගන්නා ලොකු පියවරක් හැටියට සලකන්න පුළු වනි, ජනතා කොමිටි පත් කිරීම. නමුත් ඒ කොමිටි හරියට ක්‍රියාත්මක වන්නට නම් ඒවාට පාරිභෝගිකයින්ගේ—විශේෂ යෙන්ම ගම්බද පාරිභෝගිකයින්ගේ— නියෝජිතයින් ඇතුළු කරන්න ඕනෑ. එසේ කළොත් පමණයි, ජීවන වියදම බැස්සීමේ ප්‍රශ්නය සාර්ථක ලෙස නිරා කරණය කරගත හැක්කේ.

ජීවන වියදම බැස්සීම සඳහා තවත් යෝජනාවක් අයවැය කථාවෙන් ඉදිරි පත් කර තිබෙනවා. ඇමති අනුකාරක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යාලෙගම මයා.]

සභාවක් පත් කරනවායයි කියනවා. මීට පෙරත් ඇමති අනුකාරක සභා පත් කර තිබෙනවා. පසු ගිය රජයත් ඇමති අනුකාරක සභා පත් කළා. නමුත් මට නම් විශ්වාස කරන්න බැහැ, ඇමති අනුකාරක සභා පත් කිරීමෙන් මේ කාර්යය හරිහැටි ඉටු කරන්න පුළුවන් වේය කියා. කොයි තරම් යෝජනා අයවැය ලේඛනයෙන් ඉදිරිපත් කළත් ජීවන වියදම බැස්සීමේ කාර්යය කෙරෙන හැටි ගැන අපි දන්නවා.

මම මාතලේ දිස්ත්‍රික්කය උදාහරණයක් වශයෙන් ගත්තනම්, මාතලේ මන්ත්‍රී ආසන 4 කින් සමන්විත විශාල දිස්ත්‍රික්කයක්. නමුත් මාතලේ මුළු දිස්ත්‍රික්කයටම පත් කර සිටින්නේ මිළ පාලක පරීක්ෂකවරුන් දෙදෙනයි. මේ මිළ පාලක පරීක්ෂකවරුන්ට ගමන් ගාස්තුව වශයෙන් ලැබෙන්නේ මාසයකට රුපියල් 40 යි. මේ තරම් විශාල දිස්ත්‍රික්කයකට පත් කර ඇති මිළ පාලක පරීක්ෂකවරුන් දෙදෙනාට ගමන් ගාස්තු වශයෙන් මසකට ලැබෙන්නේ රුපියල් 40 බැගින් නම් අපට අවදාවත් ඔවුන්ගෙන් විශාල සේවයක් බලාපොරොත්තු වන්නට පුළුවන්කමක් නැහැ. මාතලේ කච්චේරියේ තිබෙන්නේ ජීප් රථ දෙකයි. එහි මණ්ඩලීය නිලධාරීන් 15 ක් 16 ක් පමණ සිටිනවා. ඒ සියලුම දෙනාගේ පාවිච්චි සඳහා තිබෙන්නේ මේ රථ දෙක පමණයි. යම් යම් අවස්ථාවලදී මිලපාලක පරීක්ෂකවරුන්ට මේ ජීප් රථ පාවිච්චි කරන්න බැරිවී තිබෙනව. එසේ වී තිබෙන්නෙ, ජීප් රථ දෙකක් කොහෙත්ම ප්‍රමාණවත් නොවන නිසයි. මාතලේ නගරයෙ පමණක් නොවෙයි අනිකුත් නගරවලත් තිබෙන කඩවලට ගිහින් බැලුවොත් පෙනේවි, වෙළෙන්දන් අසාධාරණ මිලට බඩු විකුණන අන්දම. පාලන මිලට කිසිම බඩුවක් ලබා ගන්න බැරි තත්ත්වයක් අද තියෙනව. ඊට හේතුව මිල පාලක නිලධාරීන්ගෙ අදක්ෂකම නොවෙයි. ඔවුන්ගෙ සේවයට අවශ්‍ය කරන යම් යම් පසසුකම් නිසියාකාර සලස්වා නොදීමයි. මේ රටේ ජීවන වියදම පහත හෙලා දූෂණ ක්‍රියා නැති කරන්න කොතරම් දුරට මහන්සි ගත්තත් යම් යම් දුර්වල අවස්ථා පැනනැගුණු විට ඒවා නැවත නැවතත් නැගී එනව. පාරිභෝගිකයාට අවශ්‍ය කරන බඩු නියම මිලටත් නියම වේලාවටත් ලබාගන්න පුළුවන්කමක් නැතිනම් කුමන ලෙසකින්වත් සැනසීමකට පත් වන්නට බැහැ.

අද මේ රටේ නොයෙකුත් සංස්ථා ඇති කර ගෙන යනව. ඒ අතරම වාණිජ සංස්ථාවක්ද ඇති කළොත් මෙරට ජනතාවගෙ ජීවන වියදම පහත හෙළීමටත්, පිටරටින් ගෙන්වනු ලබන බඩු කලට වේලාවට ලබා ගැනීමටත්, අසාධාරණ ලෙස මුදල් උපයන තොග වෙළඳුන් ඉවත් කරන්නත් අවස්ථාව සැලසෙනව. එසේම, ඒ මගින් විදේශීය විනිමය මීට වඩා හොඳින් ආරක්ෂා කරගැනීමටද හැකි වන අතර බඩු මිල වැඩිකම හා බඩු හිඟය නැති කර, පාරිභෝගිකයාට වුවමනා දේ සාධාරණ මිලට ලබා දෙන්නත් හැකි වෙනව.

අප රට නියෝජනය කරන තානාපතිවරුන් නොයෙක් රටවල සිටිනව. අපේ රටට වුවමනා කරන බඩු බාහිරාදිය පිටරටවලින් ගෙන්වා ගන්න වුවමනා වූ අවස්ථාවලදී විශාල වියදමක් දරා ඒ රටවලට නියෝජිතයින් පිටත් කරන්න සිදු වී තිබෙන බවත් අපි දන්නව. අර විධියෙ වාණිජ සංස්ථාවක් බිහි කළොත් තානාපති කාර්‍යාලවල සහායත් එම කටයුත්ත සාර්ථක කර ගැනීම පිණිස ලබා ගන්න පුළුවනි. ඒවට පත් කර සිටින වෙළඳ නිලධාරීන් මගින් මීට වඩා පහසුවටත් ඉක්මණටත් ඒ ඒ රටවල් සමග සම්බන්ධකම් ඇති කරගෙන වෙළඳ ගිවිසුම්වලට බැඳී කටයුතු කරන්න පුළුවන් වෙනව. මේ හේතුකොටගෙන පිටරටවලින් මේ රටට ගෙන්වනු ලබන දේ නිසියාකාර ලබා ගැනීමට හැකි වන අතර මේ රටින් පිටරටවලට යවන දේ කරදරයක් නැතිව අලෙවි කර ගැනීමටත් හැකි වෙනව.

ගිවිහැටියේ හදිසියේ බඩු හිඟයක් ඇති කර රටේ ජනතාව පෙළන්ට තරම් ශක්තියක් තොග වෙළෙන්දට දැන් තිබෙනව. මේ පිළිබඳව අපට අත්දැකීම් තිබෙනව. වෙළඳ පොළේ ඕනෑ තරම් බඩු තිබෙද්දී, වෙළෙන්දාට හිතුනොත් වැඩි ලාභයක් ලබා ගන්ට ඕනෑ කියා, හෙට පුළුවන් රට පුරා බඩු හිඟයක් ඇති කර වුවමනා ලාභය ලබාගන්ට.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ තරම් විශාල බලයක් හා ශක්තියක් මේ තොග වෙළඳුන්ට තිබෙනව. තමන්ට වුව මනා අන්දමට රට ගෙනයන්ට පුළුවන් තරම් ශක්තියක් ඔවුන්ට තිබෙන බව මේ කරුණුවලින් පෙනී යනව. ඒ අන්දමට මේ රටේ වැඩි ජනතාව පෙළන්නට ඉඩ නොහැර, මේ රටේ වැඩි ජනතාවගේ සුභ සිද්ධිය සලසන්ට රජය කල්පනා කරනව නම් ඊට ප්‍රතිකර්මයක් යෙදිය යුතුයි. වෙළඳුන් සුළු පිරිසගේ සුභසිද්ධියට වඩා මේ රටේ සාමාන්‍ය ජනතාවගේ සුභසිද්ධිය සඳහායි, රජය ක්‍රියා කළයුතුව තිබෙන්නෙ. අප කල්පනා කළයුත්තේ වැඩි ජනතාව ගේ සුභසිද්ධිය උදෙසා කටයුතු කිරීමට නම්, මේ සැම දෙයකටම එකම පිළියම වශයෙන් කළයුත්තේ වෙළඳ සංස්ථාවක් ඇති කිරීම බව මගේ විශ්වාසයයි.

ගරු කථානායකතුමනි, අයවැය කථා වේදී කියවුණා, මේ රටේ ගොවිතැන් කළ හැකි එහෙත් අස්වද්දා නැති බිම් ප්‍රමාණය සියයට 19 ක් බව. මේ අන්දමට අක්කර දහස් ගණනක් පුරන්වීමට ඇති හේතු ගැන සොයා නොබලා ගරු මුදල් ඇමතිතුමා කියනව, අවුරුදු 3 කදී රට ස්වයංපෝෂිත කරන්ට කුඹුරු අක්කර ලක්ෂ ගණනක් වගා කරන්ට බලාපොරොත්තු වෙනවාය කියා. රට ස්වයංපෝෂිත කිරීම සඳහා අවුරුදු 3 ක් ඇතුළත හාල් ටොන් 50,000 ක් නිපදවීමට එතුමා අදහස් කරනව. මේ රටේ ජනගහනය වැඩි වන අන්දම ගැන කල්පනා කරන විට මේ ප්‍රමාණය කිසිසේත්ම සෑහෙන්නෙ නැහැ. අවුරුද්දකට සියයට 2.8 බැගින් අවුරුදු 3 කදී ජනගහනය 9,25,000 කින් පමණ වැඩි වෙනව. මුදල් ඇමතිතුමා කල්පනා කරන්නෙ අවුරුදු 3 කදී හාල් ටොන් 50,000 ක් නිපදවා මේ රටට අවශ්‍ය හාල් ප්‍රමාණය සැපයීමට නම් වැඩිවන ජනගහණය අනුව කල්පනා කර බලන විට එය ප්‍රමාණවත් වන්නේ කෙසේදැයි මා අහනව. අවුරුදු 3 අවසානයේදී ජනගහණය ලක්ෂ 9 කින් පමණ වැඩි වෙනව. ඒ ලක්ෂ 9 ට තවත් හාල් ටොන් අඩු ගණනේ 36,000ක් පමණවත් අවශ්‍යයි. එසේ නම් ඒ කාලය වන විට වැඩිවන ජනගහණය ටත් සමග හාල් ටොන් 86,000 ක් පමණ මේ රටට අවශ්‍ය වෙනව. වගා කළ හැකි එහෙත් වගා නොකළ සියයට 19 ක් පමණ වූ ඉඩම් ප්‍රමාණය වගා නොකිරීමේ හේතු ගැන සොයා නොබලා මේ විධියේ විශාල ව්‍යාපාරයක් ඇරඹීමට පියවර ගැනීම මං කල්පනා කරන්නෙ නැහැ, නුවණට හුරු වැඩක් කියා. අක්කර ලක්ෂ ගණනක් අද පුරන් වී තිබෙන්නේ ඒවාට අවශ්‍ය වාරි මාර්ග පහසුකම්, ජල පහසුකම් නැති නිසාය කියා මා විශ්වාස කරනවා.

මේ විධියට අක්කර දහස් ගණනක් වගා කිරීම වැනි විශාල පියවරක් ගැනීම ලේසි පහසු වැඩක් නොවෙයි. මෙවැනි විශාල ව්‍යාපාරයක් ආරම්භ කරන්නට පෙර මේ රටේ ඉඩම් අක්කර දහස් ගණන් පුරන් වී තිබීමේ හේතු සොයා බැලිය යුතුයි. සොයා බලා ඒවාට පිළියම් යෙදිය යුතුයි. ඊට පසුව මේ ව්‍යාපාර ආරම්භ කළොත් පමණයි ගරු කථානායකතුමනි, එයින් නියම ප්‍රයෝජනය ලබන්නට පුලුවන් වන්නෙ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය අවසාන වේගන එනවා.

යාලේගම මයා.
(திரு. யாலேகம)
(Mr. Yalegama)

ගරු කථානායකතුමනි, මට නියම වී තිබුණු කාලය අවසන් වුණත් තමුන්නාන්සේගේ අවසරය ඇතිව තවත් වචන ස්වල්පයක් කථා කරන්නට මම අදහස් කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කාරක සභා අවස්ථාවේදී කථා කරන්නට ඉඩ ලැබෙයි.

යාලේගම මයා.
(திரு. யாலேகம)
(Mr. Yalegama)

ගරු කථානායකතුමනි, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වගා කිරීම සම්බන්ධයෙන් වචන කීපයක් කිය යුතුව තිබෙනවා. තමන් සතු ඉඩමක් කඩමක් නැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යාලේගම මයා.]

නිසා ගොවිතැනක් බතක් කර ගන්නට පිළිවෙලක් නොමැති ගොවියන් ලක්ෂ ගණනක් අද මේ රටේ සිටින බව අප දන්නවා. එවැනි තත්ත්වයක් තිබියදී, මේ රජය අයවැය පණතින් කර තිබෙන්නේ කුමක්ද? බ්‍රිතාන්‍ය පාලනය මේ රටේ පැවති කාලයේදී මුඩු බිම් වැනි පණත් මගිනුත් වෙනත් නොයෙක් කූට උපක්‍රම මඟිනුත් මේ රටේ දුප්පත් ජනතාවට තිබුණු ඉඩකඩම් ටික කොල්ලකාගෙන විදේශීය කොම්පැනිවලට විකුණා රබර්, කොකෝ ආදී ද්‍රව්‍ය වගා කිරීමට කටයුතු සැලැස්සුවාක් මෙන්, අද මේ රජයත් ආහාර ද්‍රව්‍ය වගා කිරීමේ මුවාවෙන් ඉඩම් අක්කර දහස් ගණන් මුසාජීලා වැනි විදේශීය කොම්පැනිකාරයින්ට දී ඔවුන් ලවා ආහාර ද්‍රව්‍ය වගා කරන්නට සූදානම් වෙනවා. උතුරු පළාතේ සමහර ගරු මන්ත්‍රීවරුත් මගේ අදහස අනුමත කරනවා ඇති. උදාහරණයක් වශයෙන් අපි මිරිස් වගාව ගැන කල්පනා කර බලමු. අද උතුරු, දකුණු ප්‍රදේශවල මිරිස් වගාව ඉතාමත් සාර්ථක වී තිබෙනවා. පසුගිය රජය විසින් මේ රටේ ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කරන්නන් ධෛර්යමත් කිරීම සඳහා එහි නියමිත මිළ වැඩි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිරිස් වගාව ඉතාමත් සාර්ථක ලෙස කෙරීගෙන ගියා. නමුත් අද මිරිස් වගාවට ඉතාමත් භයානක තත්ත්වයක් උදා වී තිබෙනවා. මිරිස් ගහක් වැඩී ලොකු වී එහි කරල් දෙක තුන හටගන්නා අවස්ථාව වන විට මිරිස් ගහේ කොළ සම්පූර්ණයෙන්ම හැලී ගොස් පලදාව අඩුවන තත්ත්වයකට පත්වන අන්දමේ රෝගයක් පැතිරීගෙන යනවා. සෑම ප්‍රදේශයකම වාගේ මෙය තිබෙනව. මෙන්න මේවා ගැන සොයා බලා නිසි විධියට පිළියම් යොදන්නේ නැතිව ඒ වගාවන් සාර්ථක කර ගන්නට බැහැ.

ගරු කථානායක තුමනි, අවසාන වශයෙන් තවත් වැදගත් කරුණක් කිය යුතුව තිබෙනවා. ගොවිතැනට හොඳහැටි හුරුපුරුදු වී සිටින ගොවි ජනතාවට, ආහාර ද්‍රව්‍ය වගා කිරීම සඳහා අවශ්‍ය ඉඩකඩම්, අවශ්‍ය පොහොර ආදිය සපයා දීම කොම්පැනිවලට ඉඩම් දෙනවට වඩා ප්‍රයෝජනවත් වන්නට පුලුවනි. එම ගොවීන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදෙසුත් අවශ්‍ය සහනාධාරත් ලබා දෙමින් ඔවුන් ගොවිතැන් කටයුතු සඳහා උනන්දු කර වීමේ වැඩ පිළිවෙලක් යෙදුවොත් ගම්බද ගොවි ජනතාවට විශාල සෙතක් සැලසෙන බව මගේ විශ්වාසයයි. බ්‍රිතාන්‍ය පාලකයෝ මේ රටේ ඉඩකඩම් කොල්ලකාගෙන විදේශීය කොම්පැනිවලට බාර දුන්නා වගේ මේ රජයත් මේ රටේ දුප්පත් ගොවි ජනතාවට අයිති විය යුතු ඉඩකඩම් ටික උදුරා කොම්පැනි කාරයින්ට දී ඔවුන් ලවා මිරිස් වගා කරවීමට ගන්න පියවර ජනතා ද්‍රෝහී වැඩක් හැටියට හඳුන්වා දෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

පූ. භා. 11.15

**ජෝර්ජ් අබයගුණසේකර මයා.** (හඟුරන්කෙත)

*(திரு. ஜோர்ஜ் அபயகுணசேக்கர—ஹங்குரங்கெத்த)*

(Mr. George Abeyagoonasekera—Hanguranketa)

ගරු කථානායක තුමනි, ජාතික රජයේ පළමුවැනි අයවැය ලේඛනය පිළිබඳ විවේචන සහ විනිශ්චයන් ඉදිරිපත් කරමින් නොයෙකුත් කථා මෙම ගරු සභාවෙහි කෙරෙන මේ අවස්ථාවේදී, මා නියෝජනය කරන හඟුරන්කෙත ප්‍රදේශවාසීන්ගේත් මගේත් හෘදයංගම ස්තුතිය මේ අයවැය ලේඛනය ඉදිරිපත් කළ ගරු මුදල් ඇමති තුමාට පළමුවෙන්ම පිරිනමනවා.

මේ අයවැය ලේඛනයෙහි නියත වශයෙන්ම අන්තර්ගත විවිධ සංවර්ධන යෝජනාවලිය සංවිධානාත්මක සැලැස්මවල් අනුව ක්‍රියාත්මක කිරීමේ වගකීම භාර වී ඇත්තේ අපේ ගරු අග්‍රාමාත්‍ය තුමාණන් ප්‍රධාන කොට ඇති කැබිනට් මණ්ඩලයටයි. එම කාර්යය සාර්ථක කර ගැනීමෙහිලා එය භාරව සිටින එකී සම්භාවනීය පිරිසට අපගේ නොමසුරු සහයෝගය සහ ආධාරය හැම අවස්ථාවේම හැකි තරමින් පිරිනැමීමට අප සූදානම් බව ප්‍රකාශ කරන අතර එම සහයෝගයෙන් සාර්ථක ප්‍රතිඵල මුළු රටටම ලැබේවායි ආශිංසනය කරන බව සඳහන් කරන්න කැමතියි.

අද සිට අවුරුදු හතකට අටකට ඔබ්බේ පටන් ගත් ආර්ථික පරිහානිය දිනෙන් දින දියුණු තියුණු වෙමින් වඩියක් වඩියක් පාසා එහි ස්වභාව ක්‍රම ක්‍රමයෙන් උග්‍ර තත්වයකට පැමිණි බව පසුගිය ආදායම් වර්ෂය සඳහා ඇති වූ අයවැය ලේඛන වාර්තාවලින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සක්සුදක් සේ හොඳින්ම කාටත් පෙනී ගියා. පසුගිය කාලයේදී බලයට පත් වී සිටි හවුල් හෝ වවුල් හෝ සභාග හෝ අංශභාග හෝ කවර නාමයන්ගෙන් නමුත් හඳුන්වනු ලැබිය හැකි ආණ්ඩුවලින් ගෙන යන ලද වගකීමෙන් තොර, අත්තනෝම තික, අදූරදර්ශී, ක්‍රියා මාර්ගයන් අප දන්නව. ඒ ආණ්ඩුව එවැනි ක්‍රියා මාර්ගයන් අනුගමනය කරමින් මේ රට පාලනය කළා. එවැනි දුර්වල, දූෂිත, කුසීත පාලනයක දරුණු විපාකයක් වශයෙන් තාපය, භීතිය සහ ශෝකය යන මේ ත්‍රිවිධ දෝෂයන් පද නම් කොට ඇති, එසේත් නැත්නම් පසු බිම් කොට ඇති ආර්ථික පරිහානියකින් මේ රටේ බහුතර ජනයා පෙළෙමින් සිටි බව කීම කිසි සේත් අතිශයෝක්තියක් නම් නොවෙයි.

ගරු කථානායකතුමනි, මෙම අයවැය ලේඛනය ඉදිරිපත් කර ඉදිරි ආදායම් වර්ෂය පිළිබඳ විසර්ජන කෙටුම්පත දෙවැනි වර කියවිය යුතුයයි යෝජනා කරමින් තමන්ගේ කථාව කළ ගරු මුදල් ඇමතිතුමා මෙම අයවැය ලේඛනය ආර්ථික අර්බුදයක් මධ්‍යයෙහි ඉදිරිපත් කරන්නට තමන්ට සිදු වුණාය යනුවෙන් ප්‍රකාශ කළේ ඔන්න ඔය කාරණය නිසයි. වියලි මිරිස් කරල, රතු ළූනු ගෙඩිය, සොයා ගන්න තිබුණු දුෂ්කරතාවන් සමග ගම්බද ගොවි ජනතාවට වුවමනා කරන උදැල්ලත් කම්කරුවන්ට වුවමනා කරන දැකැත්ත සහ මිටියත් ගන්න බැරිව, විලි වහගන්න අඳින්න ගන්න වස්ත්‍රයක් යාර තුනට සීමා කරනු ලැබීම නිසා පමණක් නොව ස. තො. ස. ආයතනය, සමුපකාරය, ලංගමය, මහජන බැංකුව යනාදි ආයතන වලින්ද හිංසා පීඩාවලට භාජන වෙමින් සිටි අසරණ අහිංසක ගම්බද ජනතාව එම තත්ත්වයෙන් මිදෙන්නට හැකි අවස්ථාවක් කවදා ලැබේදෝයි බල බලා, පුල පුලා සිටියේ යම්කිසි සහනයක් මගින් සැනසිල්ලක් ලබාගන්නයි. අද අපේ ගමේ ගොඩේ ඉන්න කිරිබණ්ඩලත්, අප්පුහාමිලත්, නිලමේලත්, මැණිකේලත්, හාමිනේලත්, නෝනලත්, ඒ වගේම නගරබද පළාත් වල ඉන්න පුරවැසි පෙරේරත් මිසිස් පෙරේරත් ඔවුන්ගෙ දරු දැරියනුත්, නුදුරු කාලයේ යහපත් අනාගතයක් ඇති වීමේ ලකුණු තිබෙනවය කියා දැන ගැනීමෙන්, සන්තෝෂකට පත් වෙලා ඉන්නව.

ගරු කථානායකතුමනි, මේ සිල්ලර අය වැය ලේඛනය—ළූනු මිරිස් අයවැය ලේඛනය—ගැන විරුද්ධ පාර්ශ්වයේ ඉන්න අපේ ගරු මිත්‍ර මන්ත්‍රීතුමන්ලා මොනවා කිව්වත්, එය සාධාරණ අයවැය ලේඛනයක් බව එතුමන්ලා සිතින් විශ්වාස කරන බව නොකියා බැහැ. ඒ වගේම මේ අය වැය ලේඛනය ඉදිරිපත් කළ මේ නිහත මානී, නිර්ව්‍යාජ, අවංක, උත්කෘෂ්ට ගති ගුණවලින් හෙබියාවූ, බොහෝ කලක් ගුරු වෘත්තියෙහි නිරත වී සිටි වන්නි පුත්‍රයා තමන්ගේම ස්වභාව ගැබ් වී ඇති යහපත් අයවැය ලේඛනයක් මේ රටට ඉදිරිපත් කළ බව අපට කියන්න පුළුවනි. ඒ වාගේම මා අවුරුදු 25 කට වැඩි කාලයක සිට දන්නා අඳුනන, කලක් ගුරු වෘත්තියේ සිටි ඒ වන්නිනායක හිටපු ඉස්කෝලෙ මහත්මයා අවශෙෂ රජයේ සේවකයන්ට මෙන්ම හිතුවක්කාර විප්ලවකාරී අදහස් ඇති අනික් ගුරු මහත්වරුන්ටත් ආදර්ශයක් වේවාය කියා මම ප්‍රාර්ථනා කරනව.

පසුගිය රජය මගින් ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ හෝ කෙරුණු අක්‍රමිකතාවන් හා භාෂා ප්‍රශ්නය පිළිබඳව ඇති වූ කණගාටුදායක හා කනස්සලු භාවය ගැන කල්පනා කිරීමෙන් හෝ මේ රටේ ඇති වුණු වෙනත් සංවේගජනක කරුණු ගැන කල්පනා කිරීමෙන් හෝ යම් යම් ආදර්ශාත්මක පාඩම් උගෙනීමට අපට අවස්ථාව ලැබුණත්, මා හිතනවා කථානායකතුමනි, ඒවා ගැන කල්පනා කර පශ්චාත්තාප වීම නිෂ්ප්‍රයෝජන කාර්යයක්ය කියා. එක්තරා පණ්ඩිත වාක්‍යයක් තිබෙනවා, කථා කළ වචනයත්, විදපු හීතලයත්, ගත වුණ කාලයත්, නැති වුණ ප්‍රයෝජනවත් අවස්ථාවත් යළි ලබා ගන්නට බැහැ කියා.

"The spoken word
The sped arrow
The lost opportunity and
The time already spent or gone—are irretrievable."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් අබයගුණසේකර මයා.]

I do not know who said that ; whoever said that had said it for the benefit of the public men and politicians.

මෙම අයවැය ලේඛනයෙන් ඉදිරිපත් කර ඇති කෘෂිකර්මාන්ත සංවර්ධන ව්‍යාපාර පුළුල් කිරීමෙනුත් විශෙෂයෙන්ම ගොවිතැන් සහ කාර්මික ව්‍යාපාර ආරම්භ කිරීමට පෞද්ගලික ආයතන වලට අනුබල හා අනුග්‍රහය දීමෙනුත්, මේ රටේ ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩි වී, ආහාර ද්‍රව්‍ය සුලභ වී ජීවන වියදම අඩු වී යනවාට කිසිම අනුමානයක් නැහැ. ආදායම් බදු සහ වෙනත් බදු ක්‍රම සඳහා දී ඇති සහනයත්, සාමාන්‍ය ජනාවට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා ඇති කර තිබෙන තීරු බදු සහනයත් ආදිය මෙම අය වැය ලේඛනයේ විශිෂ්ට ලක්ෂණ හැටියට සලකන්න පුළුවන්.

මෙම අය වැය යෝජනා වලින් නියම ප්‍රතිඵල ලබා ගැනීමට නම් ආණ්ඩුව විසින් ගත යුතු තවත් ක්‍රියා මාර්ග කීපයක් තිබෙනව. ජනතාවට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ බඩු බාහිරාදිය තොග වශයෙන් ලබා ගැනීම, ඒවා විනාශ නොකර ආරක්ෂා කිරීම, සාධාරණ ලෙස සහ නියම මිලට පාරිභෝගිකයාට බෙදා දීම ආදිය සංවිධානාත්මකව කළ යුතු ක්‍රියා මාර්ග කීපයක් බව මෙහිදී සඳහන් කළ යුතුව තිබෙනව. අපේ රටේ ඇති ආහාර බඩු ගබඩාවල දැනට කෙරෙන දූෂණ පාසල් දරුවන් පවා හොඳ හැටි දන්නව. බඩු බාහිරාදිය ගබඩා කරන කළමනාකාරවරුන් අද දවසේ ඉතාමත් දූෂිත තත්ත්වයකට පත් වී සිටින බව මා නොකීවාට මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් දන්නවා ඇති. එම නිසා මේ යෝජනා වලින් යම් බදු සහනයක් ලබා ගැනීමට නම් ඒ සඳහා යම් යම් සංවිධානාත්මක පිළිවෙළවල් ඇති කරන්න ඕනෑ. විශෙෂයෙන්ම අද දවසේ මිල පාලක පරීක්ෂකවරුන් සම්බන්ධයෙන් අපට අසන්නට ලැබෙන චෝදනා ගැන බලන විට ඔවුන්ගේ සේවය ඒ තරම් සතුටුදායකය කියා අපට පිළිගන්නට පුළුවන්කමක් නැහැ. එම නිසා රජයේ සේවයේ යෙදී සිටින අතිකුත් නිලධාරීන් සිය රාජකාරිවලට අමතර වශයෙනුත්, ග්‍රාම සංවර්ධන නිලධාරීනුත්, ග්‍රාම සේවක මහත්වරුත්, පොලීසියේ හා සුරා බදු දෙපාර්තමේන්තුවේ පරීක්ෂක මහත්වරුනුත් ආදි සියලුම නිලධාරී මහතුන් මිල පාලක නිලධාරීන් හැටියට පත් කිරීම සුදුසුය කියා මම යෝජනා කරනවා.

අත්‍යවශ්‍ය පාරිභොගික ද්‍රව්‍ය සම්බන්ධයෙන් දීප ව්‍යාප්ත සමාන මිළ ක්‍රමයක් ඇති කිරීම ඉතාමත් යෝග්‍ය බව ඊළඟට මතක් කරන්නට කැමතියි. දැනට ලංකා දුම්කොළ කොම්පැනිය මගින් නිෂ්පාදනය කරන සිගරට් සම්බන්ධයෙන් දීප ව්‍යාප්ත සමාන මිළ ක්‍රමයක් තිබෙනවා. ඒ වගේම රජය මගින් නිෂ්පාදනය කරනු ලබන අරක්කුවලටත් දීප ව්‍යාප්ත සමාන මිළ ක්‍රමයක් තිබෙනවා. එසේ නම් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවලටත් ඒ විධියේ මිළ ක්‍රමයක් ඇති කිරීමට හැකි විය යුතුයි. එසේ කළ හොත් රජයේ කටයුතුවලට පහසුවක් සැලසෙනවාක් මෙන්ම මහජනයාටත් ලොකු පහසුවක් ලැබෙනවා.

ගරු කථානායකතුමනි, දේසේ හැටියට බාසේ කීවාක් මෙන්, බදු ක්‍රම පිළිබඳව කාලානුරූප සංශෝධනයක් ඇති කිරීමට යෝජනා කිරීම ගැන මා ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. වැදගත් ජාතික සේවයක් කරන පෞද්ගලික වෙළෙඳ ව්‍යාපාර පවත්වා ගෙන යන අයටත් සෑම ආධාරයක්ම අනුබලයක්ම දීමට ක්‍රියා කළ යුතුව තිබෙනවා.

සමුපකාර ක්‍රමය ගැන සුපරීක්ෂාකාරීව සොයා බලා කටයුතු කළ යුතු අවස්ථාවක් එළඹී තිබෙන බවත් මතක් කරන්නට කැමතියි. සමුපකාර ක්‍රමයේ ප්‍රාණ වායුව හා සමාන ණය දෙන සමිති අහෝසි කිරීම නිසාත් එහි දියුණුවක් වශයෙන් ඇති වූ සමුපකාර බැංකුව මහජන බැංකුව හැටියට හදිසියේ පරිවර්තනය කිරීම නිසාත් දැන් කලින් මෙන් ගම්වැසියන්ට සහනයක් නොලැබෙන බව කියන්නට පුළුවනි. එහෙම නැත්නම් සමුපකාර බැංකුව හදිසියේ මහජන බැංකුව හැටියට පරිවර්තනය කිරීමෙන් බලාපොරොත්තු වූ සේවය දැන් ගම්වැසියන්ට නොලැබෙන බව කියන්නට පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරයකු ප්‍රකාශ කෙළේ සිංහල උදැල්ලෙන් ගොවි තැන් කරන බවයි. නමුත් රට උදැල් ලෙනුත් මෙරට වැසියා ගොවිතැන් කරන බව අප දන්නවා. යකඩ බඩුවල මිළ අඩු කිරීම නිසා සිංහල උදැල්ල පාවිච්චි කරන අයට පමණක් නොව දැකැත්ත මිටිය පාවිච්චි කරන කම්කරුවාටත් සහන යක් ලැබෙන බව මතක් කරන්නට කැමතියි.

ඊළඟට ගොවිතැන සඳහා කොම්පැනිවල ට දෙන්නට යන ඉඩම් ගැනත් මතක් කරන්නට ඕනෑ. මේ ඉඩම් දෙන්නට යන්නේ 1935 ඉඩම් ආඥාපනතට පට හැනිව නොවෙයි. ඒ නීතිය උල්ලංඝනය නොකර ජල පහසුව නැති දුප්පත් ගොවීන් ට වගා කරන්නට අපහසු ඉඩම් තමයි, කොම්පැනිවලට දෙන්නට යන්නෙ. අනික් අතට ඒවා දෙන්නේ බදු ක්‍රමයටයි. එසේ දීමෙන් කවදාවත් අවැඩක් වන්නේ නැහැ.

දුම්කොළ ගැන කථා කළ මන්ත්‍රීවරයකු සඳහන් කළා දුම්කොළ කොම්පැනිය අදහස් කරන අන්දමට ගොවියාට වැඩ කරන්නට සිදු වන බව. නමුත් කෘෂිකර්ම දෙපාර්ත මේන්තුව පරීක්ෂාකාරී වී ගොවියාගේ යහ පත සඳහා ක්‍රියා කරනවා ඇති.

සඳහන් කළ යුතු තවත් කාරණයක් නම්, රජයේ සංවර්ධන කටයුතු කිරීමටත්, රජයේ අදහස් නිසි පරිදි ඉෂ්ට කර ගැනී මටත් රජයේ සේවකයන්ගේ සහයෝගය සහ ආධාරය අවශ්‍යය යනුවෙන් ගරු මුදල් ඇමතිතුමාගේ කථාව අවසාන කරන්නට පෙර රජයේ සේවකයන්ගෙන් කළ ඉල්ලීමයි. ඇත්ත වශයෙන්ම ඒ සහයෝග ය සහ ආධාරය ලැබෙන්නට ඕනෑ. අවුරුදු 28ක් රජයේ සේවයේ යෙදුණු කෙනකු වශයෙන් මා දන්නව, රජයේ සේවකයන් ගෙන් සිදු වන සේවය එතරම් වැදගත්ය, ප්‍රයෝජනවත්ය කියා සලකන්නට බැරි බව. මේ රජයේ සේවකයන්ගේ අවංක, අකලංක සේවයේ අවශ්‍යතාවය සනාථ කරමින් තම කථාව අවසාන කළ අප කව් රුත් ගරු කරන පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු වන ආචාර්ය එන්. එම්. පෙරේරා මහතා විසින් කාලෝචිත ප්‍රකාශ යක් කළා. එසේ කරමින්, දැනට යල් පැනපු, යටත්විජිත යුගයේ නෂ්ටාවශේෂ යක් සැටියට අද විද්‍යමාන වන කච්චේරි ක්‍රමය අහෝසි කළ යුතුය කියන යෝජනා ව ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම ඒ යෝජනාව රත්රන් යෝජනාවක් බව මා මේ ගරු සභාවට ප්‍රකාශ කරන්න සතුටුයි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මා නියෝජනය කරන වන දුර්ග, ගිරි දුර්ග ප්‍රදේශය ගැන වචන සවල්පයක් නොකියා බැහැ. මේ කොට්ඨාශයේ දියුණුව සඳහා සංවර්ධන සැලැස්මක් ඇති කළත්, ගමන් පහසුව හා ප්‍රවාහණ පහසුව නැති නම් කව දාවත් ඒ පළාතේ දියුණුවක් ඇති කරන් නට බැහැ. තවමත් බර කරත්ත යුගයට නොව තවලම් ගොන් යුගයට සීමා වී සිටින මේ රටේ ගැමි ජනතාවට සහනයක් ලබා දීම අත්‍යවශ්‍ය බව සඳහන් කරන අතරම ඒ සම්බන්ධව කටයුතු කරන උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂමට සැලකිය යුතු මුදලක් වෙන් කිරීමෙන් විශාල සේවයක් කර ගැනීමට පුළුවන් වේයයි මා බලා පොරොත්තු වන බව ප්‍රකාශ කරන්නට සතුටුයි.

ගරු කථානායකතුමනි, එළවළු වගාවෙන් නිහඩව, නිශ්චලව විශාල සේවයක් කරන දුප්පත් ගැමි ජනතාවගේත්, තේ සහ දුම් කොල වගා කිරීමෙන් විශාල ධනස්කන්ධ යක් රජයට ලබා දෙන්නාවූ දුප්පත් ගැමි ජනතාවගේත් දියුණුව පිණිස දැනට කර තිබෙන වැඩ කටයුතු ගැන කථා කරන්නට සිදු වී තිබෙන්නෙ ඉතාමත් සංවේගයෙන්. එමනිසා ඒ වචන සවල්පය ගරු ඇමති තුමන්ට මතක් කරමින් මේ කියන ලද කරුණු ජාතික රජයේ විශේෂ සැලකිල්ල ට භාජන වේවායි ප්‍රාර්ථනා කරමින්, ලාංකිකයන් වන අප සියල්ලන්ටම සෞභාග්‍යය ළඟා වේවායි, වාසනාවන්ත අනාගතයක් උදා වේවයි ආශිංසනය කර මින් මගේ කථාව අවසාන කරනව.

පූ. භා. 11.34

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)

ගරු කථානායකතුමනි, හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසු, අඹගමුව කොට්ඨාශයේ පළමු වැනි මන්ත්‍රී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හේමචන්ද්‍ර සිරිසේන මයා.]

වරයා වශයෙන් නැවතත් මේ ගරු සභාවට පත් වී ආ මට කථා කරන්ට අවස්ථාව ලැබීම ගැන මගේ සන්තෝෂය ප්‍රකාශ කරන්න කැමතියි. අකුරණ ඡන්ද කොට්ඨාශයේ බණ්ඩාරනායක ප්‍රතිපත්ති අනුගමනය කරන පීඩිත පන්තියේ ජනතාව සැහීමකට පත් කිරීමට තරම් සේවයක් මා නියෝජනය කළ පසුගිය රජයෙන් ඉටු කරන්න ශක්තිය ලැබුණු නිසා දෙවැනි වතාවටත් මේ ගරු සභාවට මා පත් කර එවූ අකුරණ ඡන්ද කොට්ඨාශයේ බණ්ඩාරනායක ප්‍රතිපත්ති අනුගමනය කරන ජනතාවට මගේ අවංක ආදර ස්තුතිය පළමු කොටම පුද කරනව. මා මේ ගරු සභාවේ අය වැය වාතීා 5ක් පිළිබඳ විවාදයන්ට සහභාගි වුනා. පසුගිය රජයේ ඒ අය වැය වාතීා 5න්ම මා කලින් කී පරිදි සෑහෙන සේවයක් සිදු වී තිබෙනව. දැනට බිහි වී තිබෙන ජාතික රජයේ පළමු වැනි අයවැය වාතීාව පිළිබඳව නොයෙක් අදහස් මේ ගරු සභාව ඉදිරියේ තබා තිබෙනව. මන්ත්‍රීවරුන් විසින් කරන්ට යෙදුණු කථා පිළිබඳව හෝ ගරු ඇමතිවරුන් විසින් කරන්ට යෙදුණු කථා පිළිබඳව හෝ කරුණින් කරුණට පිළිතුරු දීමට මා අදහස් කරන්නේ නැහැ. ඒ කෙසේ වුවත් ගරු රාජ්‍ය ඇමතිතුමාගේ ප්‍රකාශයක් පිළිබඳව මගේ වැටහීමේ හැටියට යමක් කිව යුතුව තිබෙනව. එතුමාට අගෞරවයක් නොවන ආකාරයටත්, එතුමා විවේචනය නොවන ආකාරයටත් ඒ පිළිතුර දීමට මා බලාපොරොත්තු වෙනව.

ගරු කථානායකතුමනි, එතුමාගේ කථාවේදී එතුමා සඳහන් කර තිබෙනවා මාර්ක්ස්වාදී අයවැය ලේඛනයක් සකස් කරන්නට ජාතික රජය කොහෙත්ම සූදනම් නැති බව. එහෙත්, ජාතික රජයේ බොහෝ ඇමතිවරුන් හා මන්ත්‍රීවරුන් විසින් මේ ජාතික රජය සමාජවාදී රජයක්ය කියා ප්‍රකාශ කර තිබෙනව. එසේ නම්, ඒ රජයේ අයවැය ලේඛනය සමාජවාදී අයවැය ලේඛනයක් විය යුතුයි. සමාජවාදයක් බිහි වුණා නම්, එය බිහි කළ රජය නුදුරු අතීතයේදී සමාජවාදී ආර්ථික සංවර්ධනයක් පිළිබඳ සැලැස්මක් ලෝකයට ඉදිරිපත් කළ කාල් මාර්ක්ස් තුමාගේ ආර්ථික සැලැස්ම වැනි සමාජවාදී ආර්ථික සැලැස්මක් සකස් කළ යුතු බව මා ප්‍රකාශ කරන්න කැමතියි.

බොහෝ දෙනෙක් ආගම් පිළිබඳ ප්‍රශ්න ඉදිරිපත් කරන අවස්ථාවලදී මාර්ක්ස්වාදය, ආගම් හා කිට්ටු සම්බන්ධ කමක් ඇති දශීනයක් හැටියට කථාකරන බව අපට පෙනීගොස් තිබෙනව. ගරු කථානායකතුමනි, කාල් මාර්ක්ස් පඬිතුමා ආගමක් පිළිබඳ න්‍යායයක් දේශනා කළ පුද්ගලයෙක් නොවෙයි. ආගම් කර්තෘවරුන් කීප දෙනෙක් ලෝකයේ පහළ වුණා. තමන් විශ්වාස කරන ඒ ආගම් ඇදහීමෙන් මනුෂ්‍යයන් බලාපොරොත්තු වන්නේ ඔවුන්ගේ පරලොව විමුක්තිය ලබා ගැනීමයි. ඒ සඳහා කිසි යම් ප්‍රතිපත්ති සම්ප්‍රදායක් මත ජීවිතය ගත කිරීමයි මිනිසුන් කරන්නේ. කාල් මාර්ක්ස්තුමා එවැනි දේශනාවක් කළ තැනක් මට නම් තවම සොයා ගන්නට ලැබී නැහැ. එහෙත් එතුමා පෙන්වා තිබෙන ආර්ථික සංවර්ධනය භෞතිකවාදී දර්ශනයක් මතයි සකස් කර තිබෙන්නේ. අපි සමාජවාදී නම් ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් රටේ ජනතාවට හානියක් වේය කියා කොහොමටවත් විශ්වාස කරන්න පුළුවන්කමක් නැහැ. අපට වුවමනා කරන ආර්ථික සැලැස්මවල් සකස් කර ගැනීම සඳහා ලෝකයේ පහළ වූ ඇතැම් සමාජවාදී නායකයින්ගේ අදහස් අනුගමනය කරනවා මිස ලෝකෝත්තර විමුක්තිය සොයා ගැනීම සඳහා කාල් මාර්ක්ස්ගේ සාක්කුවට අත දැමීම සුදුසු නැති බවත් ලෝකෝත්තර විමුක්තිය කාල් මාර්ක්ස්ගේ සාක්කුවේ නැති බවත් තමුන්නාන්සේ පිළිගන්නවා ඇති.

ගරු කථානායකතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේදීත් පිටස්තර රැස්වීම්වලදීත් නොයෙක් වර ප්‍රකාශ කර තිබෙනවා, එතුමා බණ්ඩාරනායක ප්‍රතිපත්ති අනුගමනය කරන කෙනෙක්ය කියා. එතුමා බණ්ඩාරනායක ප්‍රතිපත්ති අනුගමනය කරනවා නම්, මේ රටට ගැලපෙන මේ රටේ දුප්පත් පීඩිත පන්ති ජනතාවගේ ඕනෑ එපාකම් සපිරෙන ආකාරයේ ආර්ථික පදනමක් ඔස්සේ අයවැය වාර්තාවක් ඉදිරිපත් කරන්නට තිබුණු බව මා කියන්න කැමතියි. එතුමා පිළිබඳව රටේ නොයෙකුත් තැන්වල නොයෙකුත් චෝදනා ඉදිරිපත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරනවාය, ඒ ගැන එතුමා කනගාටු වෙනවාය, එබඳු චෝදනා ඉදිරිපත් කිරීමෙන් වළකින්නය, කියා පසු ගිය දිනක මේ ගරු සභාවේදී එතුමා කළ දේශනයේදී විරුද්ධ පාර්ශවයෙන් ඉල්ලීමක් කළා. විරුද්ධ පාර්ශවයේ කිසිවෙක් එතුමාගේ පෞද්ගලික චරිතය පිළිබඳව හෝ එතුමා පිළිබඳව කිසිම අන්දමක විවේචනයක් කළාය කියා මතකයක් මට නැති බව කියන්න කැමතියි.

ගරු කථානායකතුමනි, ධනවාදී ආර්ථික ක්‍රමය පිළිබඳව මා ලබා ඇති අත්දැකීම් අනුව තමුන්නාන්සේගේ සැලකිල්ල යොමු කිරීම සඳහා මා කියන්න ඕනෑ, මේ රටේ වැඩ කරන දුප්පත් කම්කරු ජනතාවගේ ශ්‍රමයත්, ඔවුන් උපයන ධනයත් නොයෙක් ක්‍රමයේ බදු මගින් රජය ලබා ගන්නා බව. රජය සංවර්ධන වැඩ කටයුතු සඳහා එසේ ලබාගන්නා ධනය මේ රටේ උසස් පෙළේ වෙළඳ ව්‍යාපාරිකයන් විසින් රජයෙන් ගසා කෑමේ ක්‍රමයක් මේ අයවැය වාර්තාවෙන් පිළියෙළ කර තිබීම ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ. උසස් පෙළේ වෙළඳ මහතුන් රජයේ ධනස්කන්ධය ගසා කනවා පමණක් නොවෙයි. දුප්පත් මහජනතාවගේ ශ්‍රම ශක්තියත් ඔවුන් උපයන ධනයත් ගසා කෑමට ඔවුන්ට පුළුවන් වන විධියට, පහසුකම් සැලසෙන විධියට මෙම අයවැය වාර්තාව සකස් කර තිබීම ගැන මගේ කනගාටුව නැවතත් ප්‍රකාශ කරන්න ඕනෑ.

ලෝකයේ යම් තරමක් ගණින්කාරයන් සිටිනවා නම්, මේ ගරු සභාවේ මෙයට ඉහතින් තිබුණු ආණ්ඩුවල හෝ කවර ආණ්ඩුවක හෝ ගණින්කාරයන් සිටියා නම්, ඒ හැම ගණින්කාරයකුටම වඩා ඉතාමත් තීක්ෂණ, සම්‍යක් උපාය දන්නා කුට වෙළඳ ව්‍යාපාරිකයන් මේ රටේ සිටිනවා. ඔවුන්ට දඬුවම් කිරීමට, ඔවුන්ගේ ඒ කුට වැඩවලට දඬුවම් කිරීමට. ඒවා නැති භංග කිරීමට, නවම කිසිම රජයකට පුළුවන් වුණේ නැති බව මා කියන්න කැමතියි. එබඳු ව්‍යාපාරිකයන් අඩපන කර ජනතාවට යහපතක් සැලසීමට නම් ඉහතින් සඳහන් කළ කාල් මාක්ස්ගේ ආර්ථික සැලැස්මෙන් මිස වෙනත් කිසිම මගකින්—කුට වෙළඳ ව්‍යාපාරිකයන් මැඩලන්නට—නුපුළු-

වන් බව මා තමුන්නාන්සේගේ මාර්ගයෙන් ජාතික රජයට මතක් කරන්න කැමතියි.

ගරු කථානායකතුමනි, මේ රටේ විශාල ජනකායක් රැකීරක්ෂා විරහිත තත්ත්වයකට පත්ව සිටින බව, රැකීරක්ෂා ප්‍රශ්නයට මුහුණ දී ඇති බව, තමුන්නාන්සේ පිළි ගන්නවා ඇති. ජාතික රජය, මෙවැනි ප්‍රශ්න විසඳීමට බලාපොරොත්තු වන මාර්ගය—මේ අයවැය වාර්තාවේ පෙන්නුම් කර තිබෙන මාර්ගය—ගැන සෑහීමට පත් වෙන්න කොහෙත්ම නුපුළුවන් බව මා කියන්න කැමතියි. ගම්බද ප්‍රදේශවල වැඩි වීගෙන එන අපේ උගත් තරුණ පෙළට රැකීරක්ෂා දෙන්නට අදහස් කර ගෙන සිටින්නේ වියලි කලාපයේ ඉඩම් සංවර්ධන ව්‍යාපාරවලට පිටත් කර හැරීමෙනුයි. මේ කාරණය ගැන කල්පනා කර බලන විට, කොළඹ නගරයේ වෙළඳ ව්‍යාපාර යම් තරමක් තිබෙනවා නම් ඒ සෑම වෙළඳ ව්‍යාපාරයක්ම වාගේ විදේශිකයන් සතු බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. එසේම එම වෙළඳ ව්‍යාපාරවල සේවය කරන්නවුන් යම් තරමක් නම්, එයින් සියයට අනූවක් පමණ විදේශිකයන් බවත් තමුන්නාන්සේ පිළිගන්නවා ඇති.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன—சமூக சேவை அமைச்சர்)*
(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

ඇයි අවුරුදු නවයක් තිස්සෙ එළෙව්වෙ නැත්තෙ?

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)

පසුගිය රජය මේ පිළිබඳව ඉල්ලීමක් ඉදිරිපත් කළා. ගරු සමාජසේවා ඇමතිතුමා ඒ ප්‍රතිපත්තිය අනුගමනය නොකරන නිසා, ඉන්දියානුවන් මේ රටින් පිටමං කිරීමට එතුමා විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මේ සභාවේදී ඡන්දය පාවිච්චි කළ බව තමුන්නාන්සේ පමණක් නොවෙයි, මේ රටම දන්නවා ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හේමචන්ද්‍ර සිරිසේන මයා.]

ගරු කථානායකතුමනි, මේ අයවැය ලේඛනයෙන් වෙළඳ ව්‍යාපාර රජයේ රැකී රක්ෂා සහ වෙනත් වෘත්තීන් ධනේශ්වර පන්තියේ තරුණයින්ට දීමට මාර්ගය පාදා තිබෙනවා. අපේ ගම්බද තරුණ තරුණී යන් වියළි ප්‍රදේශයේ සංවර්ධනයට යවා ඔවුන් ලවා ගොවිතැන් කරවා ඔවුන් උපද වන ධනය කොල්ලකා ගැනීමටත්; ඒ වාගේම විදේශීය සහ ස්වදේශීය ධනේශ්වර පන්තියට එම ප්‍රදේශවල වෙළඳ ව්‍යාපාර ඇති කිරීමටත්, ඒ මගින් අර දුප්පත් ගම් බද තරුණ තරුණියන් උපදවන ධනය සූරා ගැනීමටත් මේ අයවැය ලේඛනයෙන් පහසුකම් සලසා දීම ගැනත් මගේ බලවත් කනගාටුව ප්‍රකාශ කරනවා.

ඊයේ කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා ප්‍රකාශයක් කර තිබෙනව. ඇත්ත වශයෙන්ම ඒ ප්‍රකාශය මාත් අනුමත කරනව. මේ රටට අනවශ්‍ය භාණ්ඩ රාශියක් දැන් නිෂ්පාදනය කරන බව එතුමා කිව. එසේ නම් අවශ්‍ය තර මට අවශ්‍ය භාණ්ඩ නිෂ්පාදනය කර වැඩි මිළට ඒවා විකුණන්නට ඉඩ නොතබා සාධාරණ මිළට පාරිභෝගිකයා අතර බෙදා හැරීමට දැන් අවස්ථා පැමිණ ඇති බව මා කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාට මතක් කරන්න සතුටුයි.

ඊළඟට, රජයේ ඇතැම් දෙපාර්තමේන්තු වල පවතින කඩාකප්පල්කාරී වැඩ පිළි බඳව නොයෙක් අන්දමේ ප්‍රකාශ මහත් රාශියක් කරගෙන යනව. ඒවා සම්බන්ධ යෙන් මේ අවස්ථාවේදී මා මතක් කරන් නට සතුටුයි, තමන් බලාපොරොත්තු වන ආකාරයට වැඩ කටයුතු සාර්ථක කර ගන් නට බැරි වන විට පැන නැගෙන චෝදනා කඩාකප්පල්කාරීන් පිට පවරා නිදහස් වීමට උත්සාහ කිරීම රජයකට තරම් නො වන බව.

ගරු කථානායකතුමනි, මේ රටේ රාජ්‍ය තන්ත්‍ර ගණනාවක් තිබුණු බව තමුන් නාන්සේ දන්නවා ඇති. ව්‍යවස්ථාදායක මන් ත්‍රණ සභා යුගයක් පැවතුනා. ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාව මගින් රටේ ප්‍රශ්න විස දෙන්නේ නැත කියා මහජන උද්ඝෝෂණ යක් ඇතිවීගෙන එන විට ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය ඇතිවුණා. එයිනුත් ප්‍රශ්න විසදෙන්නේ නැත, අපට නිදහස ලබා ගන්න මේ ක්‍රමයෙන් බැරිය, යනාදී උද් ඝෝෂණ ඇතිවීගෙන එන විට පක්ෂ ක්‍රමය තිබෙන පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය මේ රටේ බිහිවුණා. පාර්ලිමේන්තු ක්‍රමය අනුව එවකට රාජ්‍ය පාලන කටයුතු භාර ගෙන සිටි එක්සත් ජාතික පක්ෂයේ රජයෙන් මේ රටේ ප්‍රශ්න විසදෙන්නේ නැත යන චෝදනාව මහජනය තුළින් පැන නැගීමේ ප්‍රතිඵලයක් වශයෙන් හිටපු අගමැති බණ්ඩාරනායක තුමාගේ නායකත්වයෙන් ඇති වූ සමාජවාදී රජයක් අවුරුදු ගණ නක් තුළ පැවතුණා. ඒ ආණ්ඩුවෙනුත් ප්‍රශ්න විසදෙන්නේ නැත කියා උද්ඝෝෂණයක් ඇතිවී දැන් මේ ජාතික යයි කියා ගන්නා රජය බිහිවූ බව තමුන්නාන්සේලා පිළිගන්නවා ඇති. පක්ෂ ක්‍රමය යටතේ නොයෙක් පක්ෂවලින් රටේ ප්‍රශ්න විසඳා ගැනීමට ජනතාව බලා පොරොත්තු වෙනවා. ඒ අනුව මේ ජාතික රජය රටේ ප්‍රශ්න විසඳාවිය කියා ජනතාව බලාපොරොත්තුවක් ඇති කරගෙන සිටින් නේවී නමුත්, මේ රජයෙනුත් එම ප්‍රශ්න නොවිසඳුනහොත් යම්කිසි අවස්ථාවකදී මහ ජනතාව ස්ථිර වශයෙන්ම, ඒකාන්තයෙන් ම, මාක්ස්වාදය කරාවත් ගොස් ඒ මගින් තම ප්‍රශ්න විසඳා ගැනීමට සූදානමින් සිටින බව ප්‍රකාශ කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

පූ. භා. 11.50

**ඩොනල්ඩ් ජේ. රණවීර මයා.** (නුවර එළිය)

*(திரு. டொனல்ட் ஜே. ரணவீர—நுவரெலியா)*

(Mr. Donald J. Ranaweera—Nuwara Eliya)

සුමන සමන් දිව්‍ය රාජ්‍යාට භාරවූ, බුදු රජාණන් වහන්සේගේ පාද ස්පර්ශයෙන් පවිත්‍ර වූවාවූ, සමන්තකූට පර්වත අඩවියේ වාසය කරන උඩරට ගැමි ජනතාව වෙනු වෙනුත් නුවරඑළිය ඡන්දදායක කොට්ඨාශ යේ මා හිත මිත්‍ර සියළුම ජනතාව වෙනු වෙනුත් අපේ ජාතික ආණ්ඩුවේ පළමුවැනි අයවැය ලේඛනයට ප්‍රශංසා කරමින්, මේ වැනි විවාදයක් 1956 පටන් අද දක්වා නොතිබුණු බවත් මා පළමුවෙන්ම ප්‍රකාශ කරන්නට සතුටුයි. 1956 පටන් අද දක්වා මෙවැනි උතුම් අයවැය ලේඛනයක් ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වූයේ නැහැ. මේ අය වැය ලේඛනය හරියට මහා කාන්තාරයක විශාල දිය බුබුලක් ඇති වීම වාගෙයි.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්‍ය එන්. එම්. පෙරේරා) මාක්ස්වාදය ගැන කථා කරමින් මාක්ස්වාදය නිසා බුද්ධ ශාසනය නැති වන්නේ නැතැයි ප්‍රකාශ කළා. මාක්ස්වාදීන් තලල්ලේදී පඤ්ඤා දස්සි හිමියන්ට කළ හිරිහැර ගැන තමුන්නාන්සේ දන්නවා ඇති. උන්වහන්සේට වෙඩි තැබීමට තුවක්කු එල්ල කළ බව අපට හොඳට මතකයි. ටිබට් රටේ මහා සංඝරත්නයට මාක්ස්වාදීන් කළ හිරිහැර කරදර ගැන මුළු ලෝකයම දන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
දකුණු වියට්නාමයේ ?

**රණවීර මයා.**
*(திரு. ரணவீர)*
(Mr. Ranaweera)
හාමුදුරුවරුන්ට උණු වතුර වක්කර, උන් වහන්සේලාගේ අත්වලට දම්වැල් දමා හිරිහැර කළ අන්දම ගැන අපි දන්නවා. අපේ රටේ අපේ පක්ෂය පමණක් නොවෙයි, ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන තවත් පක්ෂ තිබීම ගැන අපි විරුද්ධ වන්නේ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන විරුද්ධ පක්ෂයක් අත්‍යාවශ්‍ය බව අපේ රාජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා. යම් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයකට මාක්ස්වාදීන් ඇඳුනොත් එය හරියට පිළිකාවක් ඇදීමක් වාගේ වෙනවා. ඒ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය නැත්තටම නැති වෙනවාට කිසිම සැකයක් නැහැ. බෝගල පතලේ අඩි දහස් ගණනක් යට කම්කරු මහත්වරු වැඩ වර්ජනය කර විෂ වායු යවන විට යටියන්තොට මන්ත්‍රීතුමා සිටියේ කොහිදැයි අපි දන්නවා. එතුමාගේ සමාජවාදී ප්‍රතිපත්ති ගැන කල්පනා කරන විට ජේකිල් සහ හයිඩ් පොත මතක් වෙනව. දවල් මිගෙල් ඊ ඩැනියෙල්. එතුමා ක්‍රියාවේ යෙදීමට බලාපොරොත්තු වන්නේ මහපාරෙත් වේදිකාවලත් මොර දෙන සමාජවාදයයි. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්‍ය එන්. එම්. පෙරේරා) නුවර එළියට ආ වේලාවෙ කියා තිබෙනව, මා පිදුරුතලාගල කන්ද උඩට ගෙන ගිහින් තල්ලුකර දමනවය කියා. නමුත් තල්ලු වෙලා ගියෙ මා නොවෙයි. තල්ලු වෙල ගියෙ, පරාජයට පත් වෙච්ච ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ මන්ත්‍රීවරයාය කියා තමුන්නාන්සේලාට මතක් කරනව. මා ලෑස්තියි, යටියන්තොට ගරු මන්ත්‍රීතුමා එක්ක පිදුරුතලාගල කන්ද උඩට නගින්න. මට හිතන්න බැහැ, එතුමට ඒ කන්ද උඩට මාත් සමග එන්න පුළුවන් වේද කියා. සමහරවිට මට එතුමව කර තියාගෙන යන්න වෙයි. ඒ කන්ද උඩට නැගල මාව එතනින් පුළුවන්නම් තල්ලු කර දමන්නය කියා මම එතුමට ආරාධනය කරනව.

මට ප්‍රථම කථා කළ අකුරණ පළමුවන ගරු මන්ත්‍රීතුමා (හේමචන්ද්‍ර සිරිසේන මයා.) කීව, කාල් මාක්ස් ගැන. මා කියවූ මාක්ස්වාදී පොත් අනුව මට පෙනී ගියෙ, කාල් මාක්ස්ට සමාන කාලකණ්ණි පුද්ගලයෙක් මේ මුළු ලෝකයෙම සිටියෙ නැතෙයි කියායි. අන්තිමට කන්න නැතිව ඔහු තමන්ගෙ කොට්ටෙත් විකුණලයි, කෑම කෑවෙ.

**ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා. (හපුතලේ)**
*(திரு. டபிள்யூ. பீ. ஜீ. ஆரியதாச—ஹப்புத்தளை)*
(Mr. W. P. G. Ariyadasa—Haputale)
ඒ අනුන්ට වැඩ කරලයි. එයාට හොඳට පොහොසත් වෙන්න තිබුණා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
මේ ගොල්ලො පැදුර ගෙනාව.

**රණවීර මයා.**
*(திரு. ரணவீர)*
(Mr. Ranaweera)
ගරු කථානායකතුමනි, පසුගිය මැතිවරණයෙදී මොන මෝස්තරයෙ අසාධාරණකම් මේ රටේ ඇති වුණාද කියා මා දන්නව. ශ්‍රී ලංකා-කොමියුනිස්ට්-සමසමාජ පක්ෂ 1965 මාර්තුවල පැවැත්වූ මැතිවරණය ගැන මගේ අදහස මෙයයි: මගේ ආසනයට යට වෙච්ච කෑල්ලෙ මෙතරම්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රණවීර මයා.]

අසාධාරණ මැතිවරණයක් කිසිම කලක ඇති වුණාය කියා මට හිතෙන්නෙ නැහැ. අපේ අත්තනගල්ලෙ ගරු මන්ත්‍රීවරිය (සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.) නුවරඑළියෙ රැස්වීමකට ආ වෙලාවේ, බස් 60 කට වැඩි සංඛ්‍යාවකින් එතුමියගෙ පිරිස නුවරඑළියට ගෙනිච්ච බව අපි දන්නව. අපේ ගරු අගමැතිතුමා වැනි, හතර වරක් අගමැති වෙච්ච ශ්‍රෙෂ්ඨ උතුම් කෙනෙක් නුවරඑළියට එන වෙලාවෙ බස් එකක්වත් යෙදුවෙ නැත කියා මම ප්‍රකාශ කරන්න ඕනෑ. 1964 දී කමිස නිෂ්පාදනය කිරීමට ශත 66 ගණනෙ රෙදි යාර 150 ක් මේ රටට ගෙන්වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ හිතෛෂියෙක් අන්තිමේදී ඒවා යාරයක් රුපියල් 3 බැගින් විකිණූ බව අපි දන්නව. ඒව පසුවට එළි වේවි.

අපි ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන නිසත්, ඊට දක්වන ලැදිකම නිසත් ගෙන ගිය සටනෙ ප්‍රතිඵලයක් වශයෙන් මේ අවස්ථාවෙ මෙම සභාවෙ සිට වචන සවල්පයක්වත් කතා කරන්න අවස්ථාව ලැබී තිබෙනව. රුසියාව ගැන කතා කරන විට ඒ රටේ සිටි අගමැතිවරුන් කීප දෙනෙක් ගැන මතක් වෙනව, කෘෂේෆ්, මැලෙන්කොෆ්, බුල්ගනිං යනාදි අගමැතිවරුන් අගමැති පදවියෙන් නෙරපුනාට පස්සෙ කොයි ලෝකෙ සිටිනවද කියලවත් දැනගන්න නැහැ. නමුත් පසුගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවේ අගමැතිවරිය අගමැතිකමින් පරාජයට පත් වුණාට පසුව එතුමියට අවස්ථාවක් ලැබී තිබෙනව විරුද්ධ පාර්ශ්වයෙ නායිකාව හැටියට මෙම සභාවෙ අසුන් ගන්න. ඒ ගැන අපි ආඩම්බර වෙන්ට ඕනෑ. නමුත් ඒකාධිපති ප්‍රතිපත්ති ඇති කොමියුනිස්ට්-සමසමාජ වැඩ පිළිවෙල අනුව හැඩ ගැසුණොත්, කවර කලකදීවත් මේ රටේ එවැනි නිදහසක් ඇති නොවන බව මෙහිදී මතක් කරන්න කැමතියි.

ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩුව පළිගන්නවාය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව පළිගත්තේ නැත ආදී වශයෙන් ගරු මන්ත්‍රීවරුන් කීපවිටක්ම මේ ගරු සභාවේදී කියනව මට ඇසුන. එහෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව තිබෙද්දී කඳපොල මහා වි[illegible] ධනපාල නමැති උප ගුරු මහත්මයෙක් එක්සත් ජාතික පක්ෂයේ හිතෛෂියකුගේ භූමදානයකට සහභාගි වුණාය කියා පාත පාසැලකට මාරු කර යැව්ව. මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මයා.) නුවරඑළියට පැමිණි අවස්ථාවක කොඩියක් ඔසවන්ට යාමේදී ලණුව කැඩුණු නිසා හාවාඑළිය පාඨශාලාවේ සේවය කළ සිංහල ගුරු මහත්මයෙක් බොහෝ දුර පාසැලකට මාරු කර යැවූ බව කණගාටුවෙන් මතක් කරන්ට ඕනෑ. පළිගත්තේ නැතැයි කියන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව පළිගැනීම් කරනු ලැබුවේ ඔය අන්දමටයි.

පසුගිය ශ්‍රී ලංකා, සමසමාජ, කොමියුනිස්ට් ආණ්ඩුව තිබුණ කාලයේ පළිගැනීමේ චේතනාවෙන් මොන තරම් ඉක්මණින් පත්‍ර පනත් ඉදිරිපත් කළාදැයි අපි දන්නව. ඒ කාලය තුල පත්‍ර පනත් 14 ක් ඉදිරිපත් කළා. පත්‍ර තිබෙන නිසා තමයි, සෑම පක්ෂයකම තිබෙන අඩුපාඩුකම් මේ රටේ ජනතාවට දැනගන්ට පුළුවන්කම ලැබී තිබෙන්නෙ. රුසියාව, චීනය වැනි රටවල පත්‍ර තිබෙන්නේ ආණ්ඩුව අතේයි. ආණ්ඩුව කියන දේවල් තමයි ඒ රටවල පත්‍රවල පළ වෙන්නෙ. මේ රටේ පත්‍ර නොතිබුණා නම් මනුෂ්‍යයන්ට නිදහසේ තම ආගම අදහන්ට ඇති ඉඩකඩ නැතිවී යනවා පමණක් නොව රටත් නැත්තටම නැතිවී යනවාට සැකයක් නැහැ.

ගරු කථානායකතුමනි, මගේ කථාව අවසාන කරන්ට පෙර නැවතත් වරක් මේ උතුම් අය වැය ලේඛනය කෙරෙහි මගේ ප්‍රසාදය පළ කරන්ට ඕනෑ. විශේෂයෙන් නුවරඑළියේ ඡන්ද කොට්ඨාශයේ කීප දෙනකුට මේ අය වැය ලේඛනයෙන් විශාල සහනයක් ලැබී තිබෙන බව මේ ගරු සභාවේදී මතක් කරන්න කැමතියි. උදළු, අලවංගු ආදී ගොවි ජනතාවට අවශ්‍ය උපකරණවල මිළ අඩු කිරීමට මේ අය වැය ලේඛනයෙන් කර තිබෙන යෝජනාව නුවරඑළි ප්‍රදේශයේ පොදු ගොවි ජනතාවට ලැබුණු විශාල සහනයක් බව ප්‍රශංසා පූර්වකව සඳහන් කරන්ට කැමතියි. එමෙන්ම පොහොර ආදී නොයෙක් ද්‍රව්‍යවලට මේ අය වැය ලේඛනය මගින් පහසුකම් සලසා තිබීම නිසා ඒ ප්‍රදේශයේ එළවළු හා මල් ආදිය වගා කරන්නන්ට විශාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සහනයක් ලැබී තිබෙනව. ලාම්පු තෙල් වල මිළ අඩු කිරීමෙන් වත්තිවල ජීවත් වන ඉතා දිළිඳු මිනිසුන්ට විශාල සහන යක් සැලසුනු බව මතක් කරන්නේ ප්‍රීති යෙන්. ඒ මන්ද? සෑම කොළනියකම වගේ මිනිසුන් පාවිච්චි කරන්නේ ලාම්පු තෙල් නිසයි. මේ අය වැය ලේඛනය ගැන මා මීට වඩා කථා කරන්ට අදහස් කරන් නෙ නැහැ. 1965 පිහිටුවූ මේ නව ජාතික ආණ්ඩුවේ අය වැය ලේඛනයෙන් පොදු ජනතාවට විශාල යහපතක් සැලසී තිබීම අප කාගේත් සන්තෝෂයට කරුණක් බව ප්‍රකාශ කරමින් මගේ කථාව සමාප්ත කරනව.

අ. භා. 12.6

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

ගරු කථානායකතුමනි, ජාතික රජය විසින් ඉදිරිපත් කරන ලද අය-වැය ලේඛනය සම්බන්ධව යමක් කියන්නට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂයට පත්වන අතර මේ අවස්ථාවේදී මගේ කථාව ආරම්භ කරන්නට මත්තෙන් සඳහන් කළ යුතු විශෙෂ කරුණක් තිබෙන බව කියන්නට කැමතියි. ගරු රාජ්‍ය ඇමතිතුමා දියතලා නගරයට පැමිණි අවස්ථාවේදී එහි පැමිණෙන ලෙස මටද ආරාධනා කළ බව එතුමාගේ කථාවෙහි සඳහන් වුණා. විශාඛා විද්‍යාලයේ සිටින මගේ ළමයකුට හදිසි අසනීපයක් සෑදීම නිසා මට එදා ඒ ආරාධනය අනුව දියතලාවට පැමිණෙන් නට අවකාශයක් ලැබුණේ නැහැ. මගේ නොපැමිණීම ගැන ගරු රාජ්‍ය ඇමතිතුමා තුළ කිසියම් වැරදි හැඟීමක් ඇති වුණාදෝ යන සැකය නිසයි මේ වචන කීපය මා ප්‍රකාශ කරන්නෙ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

නෑ. එවැනි වැරදි හැඟීමක් ඇති වුණේ නෑ.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

මිළඟට ගරු කථානායකතුමනි, මගේ හිත මිත්‍ර නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමාගේ (ඩොනල්ඩ් රණවීර මයා.) කථාවෙන් පසුව මගේ කථාව කරන්නට ලැබීම ගැන මා සන්තෝෂ වන බව කිය යුතුයි. හිටපු අගමැතිණිය නුවරඑළියේ රැස්වීමක් සඳහා ගිය අවස්ථාවේදී එම රැස්වීමට බස් හැටකින් සෙනග ගෙන ආ බවත් උන් නැහේලාගේ රැස්වීම් එකකටවත් බස් වලින් හෝ වෙනයම් වාහනයෙකින් හෝ සෙනග නොගෙනා බවත් නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා. මේ සම්බන්ධයෙන් මා එක් කරුණක් කියන්නට සතුටුයි. උන්නැහේ ලාගේ රැස්වීමක් අවසානයේදී කෙරුණු ස්තුති යෝජනාවක් මට අහන්නට ලැබුණා. එම ස්තුති යෝජනාවේදී මෙන්න මෙහෙම කිව්වා. "ගම්පොල ප්‍රදේශයෙන් පැමිණි පිංවතුන්ට අපගේ කෘතඥතාව පළ කරන අතර වැලිමඩ ප්‍රදේශයෙන් පැමිණි ජනතාවටද අපගේ කෘතඥතාව මෙම සභා වේදී ප්‍රකාශ කරනවා".

**රණවීර මයා.**
*(திரு. ரணவீர)*
(Mr. Ranaweera)

ඒක බොරුවක්. එහෙම කිව්වෙ නෑ.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

ගරු කථානායකතුමනි, එදා අගමැති ණියගේ රැස්වීමට වාහනවලින් සෙනග ගෙන ගියායයි කීම ගැන මම ඇත්ත වශ යෙන්ම පුදුම වෙනවා. එය අසථානයේ කරන චෝදනාවක්, කියන බොරුවක් බව මම මේ අවස්ථාවේදී කියා සිටිනවා. එවැනි දෙයක් සිදු වුණේ නෑ. ඒ කෙසේ වෙතත්, මෙම ගරු සභාවේ කාලය ඒ සඳහා ගත කරන්නට මම බලාපොරොත්තු වන්නෙ නෑ.

ගරු කථානායකතුමනි, පසුගිය රජය මේ රටේ පාලනය ගෙන යන කාලයේදී මේ රටේ විශාල දියුණුවක් ඇති වුණු බව හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]

අබයගුණසේකර මයා.) නොපිළිගන්නා බව එතුමාගේ කථාවට ඇහුම්කන් දීගෙන සිටින විට මට අවබෝධ වුණා. නමුත් ගරු කථානායකතුමනි, ඒ ගරු මන්ත්‍රීතුමා බදුලු කච්චේරියේ උප දිසාපතිවරයා වශයෙන් කටයුතු කරන කාලයේදී නොයෙක් අවස්ථාවල අප සමග කියා තිබෙනවා, පසු ගිය රජයෙන් රටට විශාල සේවයක් යහපතක් සිදු වුණා කියා. එසේ සිදු වුණු සේවාවන් ගැන අප සමග සමහර අවස්ථා වලදී සාකච්ඡා කරලත් තිබෙනවා. "කියන්නා මොන විධියට කිව්වත් අහන්නා සිහි බුද්ධියෙන් ඇසිය යුතුය" කියන ප්‍රස්තා පිරුළක් තියෙනවා. 1956න් පසු 1965 දක්වා කාලය තුළ, ඉන් පෙර කවදාවත් සිදු නොවුණු තරම් විශාල සේව යක් මේ රටට පසුගිය රජයෙන් සිදු වුණු බව 1956 යේ මන්ත්‍රීවරුන් වශයෙන් අද මේ ගරු සභාව ඉදිරියේදී අපට බියක් නැතිව කියන්නට පුළුවනි; ජනතාව ඉදිරි යේ කියන්නට පුළුවනි.

ඊළඟට ගරු කථානායකතුමනි, පසුගිය රජය කාලයේ මේ රටෙහි ඇති වුණු කර්මාන්ත සංවර්ධනය ඉතා සුළු සංවර් ධනයක් හැටියට පෙන්නුම් කරන්නට සමහර ගරු මන්ත්‍රීවරුන් උත්සාහ කළා. ඒ ගැන මා ඇත්ත වශයෙන්ම කණගාටු වෙනවා. එදා අපේ රටට පිටරටවලින් ගෙන්වන ලද සබන් කෑල්ල පවා මෙහි නිෂ්පාදනය කරන්නට පටන් ගත්තෙ 1956 න් පසුව නේද කියා මම අහනවා. රැවුල කැපීමෙන් පසු මුහුණේ ගාන පියර වික පවා—මේවා "ලග්ෂරි ගුඩ්ස්' හැටියට සමහර අය හඳුන්වන නමුත්—එදා අපට පිටරටින් ගෙන්වන්නට සිදු වී තිබුණා නේද? ඒ සඳහා අපේ මුදල් කොපමණ පිටරට ඇදී ගියාද? මේ අනුව අපේ රටේ කර්මාන්ත දියුණුව ගැන කල්පනා කර බලන විට අපට සන්තෝෂ වන්නට පුළු වන්කමක් නැද්ද? මෙකී දේවල් සියල් ලක්ම පාහේ—සියේට සියයක්ම පාහේ— දැන් මේ රටේම නිෂ්පාදනය වෙනවය කියන්න මේ අවස්ථාවේ අපට පුළුවන් කමක් නැද්ද? විරුද්ධ පාර්ශවයේ සිටි යත්, ආණ්ඩු පක්ෂයේ සිටියත් ඒ ගැන අපක්ෂපාත ලෙස කල්පනා කළොත් ඒ විධියට කියන්න බැරිකමක් නෑ. 1956 න් මෙහා පැත්තෙ කර්මාන්ත සංවර්ධනය අතින් කරන ලද වැඩ නිසා යම්කිසි ප්‍රයෝ ජනයක් ඇති වූ බවට තර්ක කරන්න ඉඩ තිබෙනව අපට. මේ අනුව කල්පනා කර බලන විට යම්කිසි සංවර්ධනයක් වුණු බව පිළිගන්නවා නම් ඒ සම්බන්ධයෙන් කියන්නට පැකිලෙන්න වුවමනාවක් නැති බව කියන්නට කැමතියි.

රජයේ වැඩ තැපැල් හා විදුලි සන්දේශ ඇමතිතුමා යම්කිසි තැනකදී කරන ලද ප්‍රකාශයක් ගැන මට අහන්න ලැබුණා. එතුමා කියා තිබෙනව, මේ රටේ පාරවල් සම්බන්ධව කිසිම වුවමනාවක් ඇතිව පසු ගිය ආණ්ඩුව වැඩ කර නැහැ කියා. මේ රටේ පාරවල් ඉතාමත් නරක තත්ත්වය කට පහත බැස තිබෙනවය යනුවෙන් එතුමා යම්කිසි ස්ථානයකදී කියා තිබෙනව. කොළඹ සිට බදුල්ල දක්වා ඇති මහා මාර් ගය ඔස්සේ ඔබතුමා ගමන් කළොත් ඔබ තුමාටම පෙනී යනවා ඇති, පසුගිය අවුරුදු කිහිපය තුළදී පාළම් කීයක් හරිගස්සල තියෙනවද කියන කාරණය. දිරච්ච පාළම් කීයක් අලුත්වැඩියා කර තිබෙනවද යන්න තමුන්නාන්සෙට දකින්න ලැබෙනවා ඇති, කොළඹ සිට බදුල්ල දක්වා පාරේ ගියොත්. ඔය විධියට පාළම් හැදීම ආදි වැඩ කටයුතු වෙනුවෙන් මුදල් වියදම් කරන් නෙ නැතිව මුදල් ඉතිරි කරනවා නම්, ඉඩම් සංවර්ධනය සඳහා මුදල් වියදම් කරන්නෙ නැතිව මුදල් ඉතිරි කරනවා නම්, පාසල් සඳහා මුදල් වියදම් කරන්නෙ නැතිව මුදල් ඉතිරි කරනවා නම්, මහ ජනයා මොනවා නොකියාවිද? 1956 සිට 1965 දක්වා ගත වූ අවුරුදු කිහිපය තුළදී මා නියෝජනය කරන හපුතලේ ඡන්ද දායක කොට්ඨාශය තුළ පමණක් පාසැල් ගොඩනැගිලි 61 ක් හදන්න පුළුවන් වී තිබෙන බව සන්තෝෂයෙන් මතක් කරන්න කැමතියි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

හැම ආසනේකටම ඔය විධියට වැඩ කරල තියෙනවද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

ඇයි නැත්තෙ? පසුගිය ආණ්ඩුව පැවති කාලයේදී වෙනස්කමක් දක්වා ක්‍රියා කළේ නැහැ; පක්ෂය කුමක්දැයි නො සලකා කළයුතු වැඩ කළා. ඒක එහෙම නොවේය කියන්න පුළුවන්කමක් නැහැ. ඉන්නවා නම් එවැනි චෝදනාවක් කරන්න මන්ත්‍රීවරයෙක්, කරුණා කරල ඉදිරිපත් කරන්න. එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකු වන මහියංගනේ ගරු මන්ත්‍රීතුමා දන්නවා ඇති ඒ කාලයේදී එතුමා නියෝජනය කළ කොට්ඨාශයේ වැඩ පක්ෂ භේදයෙන් තොරව කළ බව. අධ්‍යාපන කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා නම් මේ ගරු සභාවේදි කිව්වා වගේ මත කයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් නියෝජනය කරන ලද කොට්ඨාශවලට පමණයි වැඩ කර තිබෙන්නෙ කියල. එසේ කීම ගැන මා කනගාටු වෙනව. ඒ විධියට ක්‍රියා නොකර තිබිය දීත් එසේ කීම හොඳ මදි. මහියංගනේ කොට්ඨාශයේ වැඩ කළ ආකාරය ගැන එහි මන්ත්‍රීතුමා සාක්ෂි දරනවා ඇති. එසේ නොවෙයි නම් මේ අවසථාවේදී ඒ ගැන එතුමට කියන්න පුළුවනි. යම් කොට්ඨාශයක වැඩ යම් විධියකින් අතපසු වී ගියා නම්, එසේ වී ගියේ සමහර විට ඒ කොට්ඨාශයේ මන්ත්‍රීවරයගෙ අදක්ෂකම නිසා වෙන්න පුළුවනි. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට මහියංගනය නියෝජනය කළ ඉඩම් ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා නැවතත් එම කොට්ඨාශයට තෝරා පත් කර ගනු ලැබුවෙ එතුමාගෙන් සිදු වූ අවංක සේවය නිසා නොවෙයිද?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

හොඳයි, එහෙම නම් ඉලංගරත්න මැති තුමාට ඒ ආසනය දිනාගෙන එන්ට බැරි වුණේ උන්නැහේ අවංක සේවයක් නො කෙරුණු හින්දද?

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

උන්නැහෙගෙ පරාජයට හේතු ගණනාවක් තිබෙන්ට ඇති. ඒක අවංක සේවයේ අඩුවක් නිසාම වුණු දෙයක් නොවෙයි. කෙළෙහිගුණ සැලකීම සම්පූර්ණයෙන්ම සැම දෙනා අතින්ම සැම දෙනා වෙනු වෙන්ම, හැම විටම ඉෂ්ට වෙන දෙයක් නොවෙයි. ඉලංගරත්න ඇමතිතුමා අතින් මේ රටේ ජනතාවගේ යහපත සඳහා සිදු වී තිබෙන විශාල සේවය තමුන්නාන්සේ හොඳාකාර දන්නව. පොදු ජනතාවගේ යහපත සඳහා යම් ඇමතිවරයෙකු අතින් විශාල සේවයක් වෙලා තිබෙනවා නම් ඒ ඉලංගරත්න ඇමතිතුමාගෙන් බව මට ප්‍රීති යෙන් කියන්න පුළුවනි. නැතෙයි කියන්න කාටවත් බැහැ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

අපේ රටේ උදවිය කෙළෙහිගුණ නො දන්න අයය කියන්න බැහැ.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

මා අදහස් කළේ අපේ රටේ ජනතාව ගැන පොදුවේ එවැන්නක් ප්‍රකාශ කිරීමට නොවෙයි. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් වුණත් දැන ගන්න ඕනෑ, ඒ පැත්තේ මන්ත්‍රීවරුන්ට වුණත් ඇතැම් අවසථාවල තමන් බලාපොරොත්තු වුණු තරම් සාධාරණය ඉටු නොවී ඇති බව. ඒක පිළිගන්න ඕනෑ. ඉලංගරත්න ඇමතිතුමා අතින් අවංක සේවයක් වී නැතැයි කාට වත් කියන්න බැහැ. තෙල් සංසථාව ගැන කල්පනා කර බලන්න. එයින් සේවයක් වුණා. ඇත්තක්, ඒක. ඒක බොරුවකැයි කියන්න පුළුවන්කමක් නැහැ. තවත් කොතෙක් දේ එතුමා කළාද? එතුමා භාර ගත් හැම වැඩක්ම ඉතා දක්ෂ අන්දමට එතුමා කළ බව අපට කියන්න පුළුවනි. ඒ කෙසේ වෙතත් සාමාන්‍ය කතාවක් තියෙන්නෙ: "කතඤ්ඤූ කතවෙදී පුග්ගලො දුල්ලභො ලොකස්මිං"—කෙළෙහි ගුණ සලකන පුද්ගලයෝ ලෝකයේ දුර්ලභයි, ඒකයි තේරුම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

මේ රටේ ඉන්නෙ කෙළෙහිගුණ සලකන්නෙ නැති මිනිසුන්ය කියලද එත කොට කියන්නෙ ?

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

නැහැ, නැහැ, කෙළෙහිගුණ සලකන පුද්ගලයෝ දුර්ලභයි, මුළු ලෝකයේම. ඒකයි මා කිව්වෙ. සියලු රටවැසියන්ටම අගෞරවයකට මා කියන දෙයක් නොවෙයි ඒක. සියලු දෙනාම නියම විධියට කෙළෙහිගුණ සලකනවා නම්, ඔය ආණ්ඩු පක්ෂයේ ඉස්සරහ පේළියේ පවා සමහර විට කෙළෙහිගුණ කියන එක සමහර අවසථාවල අමතක කර දැමූ උදවිය ඉන්නෙ. ඒක කියන්න පුළුවනි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

සම්පූර්ණ ඇත්ත.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

ගරු කථානායකතුමනි, ඔය පැත්තෙ ඉන්න සමහර ගරු මන්ත්‍රීතුමන්ලා කීප දෙනෙක්ම කිව්වා මීට පස්සෙ මේ රටේ පාලනය ගෙන යන්නෙ එතුමන්ලාය කියල. එහෙත් එතුමන්ලාගෙ පැත්තෙ ඉදිරි පෙළේ ඉන්න රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා ප්‍රකාශයක් කර තිබෙනව, 1975 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය නැවතත් වරක් මේ රටේ අගමැතිණිය වෙනවය කියල. නමුත් ඒ කාලයෙන් බාගයක් ගිය විට එතුමිය නැවතත් මේ රටේ අගමැති වන බව මා කියනවා. ඒ මගේ අදහසයි. එක්කෝ රාජ්‍ය ඇමතිතුමාගේ අදහස ඇත්ත වන්නට පුළුවනි. නැත්නම් මගේ අදහස ඇත්ත වේවි. නමුත් ඔය විධියේ සිතුවිලි හිතේ තබාගෙන ක්‍රියා කරන විට ප්‍රජාතන්ත්‍රවාදය අනුව වැඩ කරන්නට පුළුවන් වේද කියන එක නම් මට සැකයි.

පෞද්ගලික අංශය මගින් මේ රට සංවර්ධනය කිරීමට මේ ආණ්ඩුව බලාපොරොත්තු වන බව අයවැය ලේඛනය අනුව පෙනී යනවා. මේ රටේ දැනට ආර්ථික භංගත්වයක් තිබෙන බවත් ඊට හේතුව පසුගිය රජය බවත් මේ අතර රජය විශ්වාස කරන බව පෙනී යනවා. ආර්ථික භංගත්වයෙන් ගොඩ ඒම සඳහා පෞද්ගලික අංශයේ උදව් ලබා ගත යුතු බව රජය කියනවා. මේ අන්දමට කියන විට අපට කිසියම් බියක් ඇති වෙනවා. අපත් ලෝකයේ නොයෙක් රටවල ඇවිද තිබෙන අයයි. නොයෙක් රටවල නොයෙක් ක්‍රම දැක තිබෙනවා.

**එම්. එච්. එම්. නයිනා මරික්කාර් මයා. (අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(ஜனாப் எம். எச். எம். நயினா மரிக்கார்—நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. M. H. M. Naina Marikkar—Parliamentary Secretary to the Minister of Justice)

දැක්කට ඉගෙන ගෙන නැහැ.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

උප ඇමතිතුමාට නම් සමහර දේවල් ඉගෙන ගන්නට බැරි වුණා. ඒ ගැන අප කනගාටු වෙනවා. මේ රට බටහිර ජර්මනිය වගේ, නැත්නම් ජපානය වගේ එසේ නැත්නම් අමෙරිකා එක්සත් ජනපදය වගේ දියුණු කළ යුතුයයි සමහරුන් විශ්වාස කරනවා. එක්සත් ජනපදය ගැන කථා කරන්නේ ඒ රට කිරියෙන් පැණියෙන් උතුරණ කිසි අඩුපාඩුවක් නැති රටක් හැටියට සලකාගෙනයි. යම් රටක් පහත් කර කථා කිරීමට හෝ යම් රටකට අමුතු ගෞරවයක් ලැබෙන ලෙස කථා කිරීමට හෝ මා අදහස් කරන්නේ නැහැ. මා කථා කරන්නේ මධ්‍යසථවයි. ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් නගරයේ තිබෙන දුප්පත්කම සමහර විට නමුන්නාන්සේ දැක ඇති. මා ළඟ තිබෙන "Look" සඟරාවේ ඇති ඒ පිළිබඳ ලිපියකින් කොටස් කීපයක් දූන් මා කියවනවා :

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"Look"—4th June, 1963.

"Just beyond the Capitol, where senators and congressmen vote $100 billion a year to obtain the good, secure life, begins an area where filth, crime and poverty form a trinity of squalor."

මේ ලියවිල්ල දිගටම කියවාගෙන යන විට තමුන්නාන්සේට පුදුම හිතෙන්නටත් ඉඩ තිබෙනවා.

". . . . Even churches have installed thug-proof iron bars to protect their female clerical workers from the danger of attack."

ඊළඟට මෙසේත් සඳහන් වෙනවා.

"It is a city where responsibility is shredded. Congress refuses to let this Federal stepchild rule itself. It is a city where illiteracy increased slightly in the last decade, while declining in all the states. It is a city with scandals in its welfare program, bribery and corruption in its distribution of surplus foods, leniency in its courts and shock and alarm spreading among those of its respectable citizens who have not fled to the suburbs.

'This city is not far from an explosion,' says Father Cletus Gillson, director of a Catholic mission in a high-crime district. 'The disease is spreading fast. Children are living like animals. The schools are in a horrible mess.'"

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

පොත මුද්‍රණය කර තිබෙන්නේ කොහේ ද?

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

ඇමෙරිකාවෙ මයි. ඇමෙරිකා එක්සත් ජනපදයේ තිබෙන්නෙ ධනවාදය බව තමුන්නාන්සේ දන්නවා ඇති. සමහර විට එක්කෙනකුට තිබෙන ධනය සම්බන්ධව බැලුවොත් එහි කෙළවරක් නැහැ. ඒ වගේම දුප්පත්කමින් සහ හාමතේ ජීවත් වන අය ගැන බැලුවොත් ඒ අයගෙන් කෙළවරක් නැහැ. ඒ නිසා මා කියන්නේ, පෞද්ගලික අංශය තර කිරීමට යාමේදී ඔය විධියේ ධනපති වාදයක් ඇති වීමට ඉඩ තිබෙන බවයි. අප කළ සේවයට වඩා හොඳ සේවයක් මේ රටේ ජනතාවට කරන්නට තමුන්නාන්සෙලා පුළුවන් නම් ජාතික අභිවෘද්ධිය ප්‍රාර්ථනා කරන් අවංක මන්ත්‍රීවරු හැටියට අපි බොහොම සතුටු වෙනව. නමුත් රජයේ පාලනය තබා ගැනීම සඳහා කොටස් කීපයක් සම්බන්ධ කරගෙන ඔය දේ කරනව නම් සමහර විට ඔය විධියේ භයානක තත්ත්වයක් ඇති වන්න නොදී කටයුතු කරන්න පුළුවන් විය හැකි බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න සතුටුයි.

සිංහල වෙළඳ සංගමය පසුගිය කාලයේ දී මොන මොනා විධියේ අදහස් ඉදිරිපත් කළාද යන්න තමුන්නාන්සෙලාට මතක ඇති. නමුත් තමුන්නාන්සේලා දැන් ගෙන යන වැඩ පිළිවෙළේ හැටියට මේ රටේ ආනයන අපනයන වැඩ කොටස් කවදාවත් මේ රටේ ජනතාවට කරන්ට ලැබෙන්නෙ නැහැ. තමුන්නාන්සේලා වීසා බද්ද සම්පූර්ණයෙන් නැති කළා. මේ දේවල් කියන විට අප ජාති භේද අවුස්සන, මේ රටේ කලකෝලාහල ඇති කිරීමට කටයුතු කරන පිරිසක්ය කියා තමුන්නාන්සේලා කියන්නට පුළුවනි. නමුත් තමුන්නාන්සේලාට කවදාවත් අපට ඒ චෝදනාව කරන්න බැහැ. ඊට හේතුව ඒ විධියේ අදහස් දරණ අය අද තමුන්නාන්සේලා එකට සම්බන්ධ කරගෙන සිටීමයි. තමුන්නාන්සේලාගේ පැත්තෙ ඉන්න අය ජාති වාදය සම්බන්ධව කළ ප්‍රකාශ මා ළඟ තිබෙනව. නමුත් ඒවා කියවන්නට ගියොත් මට කථා කිරීමට තිබෙන කාලය ගත වන නිසා මම ඒවා කියවීමට බලාපොරොත්තු වන්නෙ නැහැ. ඔතැන සිටින ගරු මන්ත්‍රීතුමී කියාපු දේ මට කියන්නට පුළුවනි. වැලිමඩ හිටපු මන්ත්‍රී රාජරත්න මහතා කියාපු දේ මට කියන්නට පුළුවනි. ඒ සියල්ලක්ම කියන්නට මම බලාපොරොත්තු වන්නෙ නැහැ. නමුත් ඒ වැලිමඩ හිටපු මන්ත්‍රී රාජරත්න මහතා අපේ ආණ්ඩුවෙන් අස් වී යන අවස්ථාවේදී කළ ප්‍රකාශයෙන් කොටසක් මම මේ අවස්ථාවේදී කියවන්න බලාපොරොත්තු වෙනව. මා මේ කියවන්නේ 1956 අගෝස්තු 14 වැනි දා හැන්සාඩ් වාර්තාවේ 529 වැනි තීරුවෙන් :

"මාගේ ඉල්ලා අස්වීමට තුඩු දුන් ක්ෂණික හේතුව නම් පෙඩරල් වාදීන්ගේ ඊනියා ත්‍රිකුණාමලේ ගමන නහනම් කිරීමට අගමැතිතුමා විරුද්ධ වීමයි. මෙය ඊනියා ගමනක් යැයි මා හඳුන්වන්නේ, මෙය සාමකාමී පෙළපාළියක් යැයි කිසි සේත් පිළිගත නොහැකි නිසාත්, මෙය ඇමෙරිකානු අධිරාජ්‍යවාදීන්ගේ ආධාරයත් දකුණු ඉන්දියානු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]
විශාල ද්‍රවිඩස්ථාන් ව්‍යාපාරයේ ආධාරයත් ඇතිව අප රට බලෙන් අල්ල ගැනීමට, යටපත් කර ගැනීමට, සකස් කරන ලද සැලැස්මක පළමුවෙනි පියවරක් නිසාත්ය. මා මෙසේ මේ ත්‍රිකුණාමලේ ආක්‍රමණය නහනම් කරන්නටයැයි අගමැතිතුමාගෙන් ඉල්ලා සිටියේ, පසුගිය මාස දෙක තුළදී පෙඩරල් වාදීන් විසින් යාපනයේ බෞද්ධ විහාරස්ථාන කෙලෙසූ නිසාත්, ත්‍රිකුණාමලේදීත්, මඩකලපුවේදීත්, ගල් ඔයදීත් ඩොට් සිල්වා වැනි අහිංසක ලද බොළඳ අසරණ සිංහල දැරියක් හා කාන්තාවන් පෙඩරල් වාදීන් විසින් දූෂණය කර මරුමුවට පත් කළ නිසාත් ය."

ඒ අය මේ පැත්තෙ නැහැ. ඒ අය තමුන්නාන්සෙලා ඔය පැත්තෙ තබාගෙන ජාති භේදය අවුස්සන්නෙ අපය කියනව. අපි යම් කිසි දෙයක් ගැන කථා කළොත් ජාති භේදය අවුස්සනවාය කියනව, කඩා කප්පල්කාරී වැඩ කරනවය කියනව. නමුත් අප ජාති භේද ඇති කරන පිරිසක්ය කියා තමුන්නාන්සේලාට කියන්න බැහැ.

මම මේ අවස්ථාවේදී මේ රජයට විශේෂ කාරණයක් කියන්න කැමතියි. පසුගිය මාසයේදී සමුපකාර තොග වෙළඳ ආයතනයේ සේවය කරන සේවකයන්ට, ඔවුන්ගේ සේවය ඒ ආයතනයට අවශ්‍ය නැත කියා ලියුම් යවා තිබෙනව. මේ රටේ දහස් සංඛ්‍යාවකට රැකීරක්ෂා සපයනවය කියා තමුන්නාන්සෙලා පොරොන්දු දුන්න. එසේ නම් ඔය විධියට සේවකයන් අස් කිරීමෙන් තමුන්නාන්සේලා බලාපොරොත්තු වන්නේ පලි ගැනීමටය කියා ප්‍රකාශ කරන්නට පුළුවනි. මගේ ඒ අදහස සමහර විට වැරදි වන්නට පුළුවනි. මගේ ඒ අදහස හරි හෝ වේවා, වැරදි හෝ වේවා, තමුන්නාන්සේලා ඔවැනි දේ කරන්න එපා. සමහරවිට තමුන්නාන්සේලා ඔය පැත්තේ ඉන්නට පුළුවන්. තමුන්නාන්සේලාගේ ඉස්සරහ පෙළේ සිටින වගකීමක් ඇති රාජ්‍ය ඇමතිතුමා පිළිගන්නවා මේ රටේ යම්කිසි ප්‍රජාතන්ත්‍ර වාදයක් තිබෙනවා නම් ඒ ප්‍රජාතන්ත්‍ර වාදය අනුව මේ පැත්තේ සිටින අය ඒ පැත්තෙත් ඒ පැත්තේ සිටින අය මේ පැත්තේත් ඉන්නට පුළුවන්ය කියා. ඒ නිසා මේ රටේ දියුණුව සඳහා වැඩ කරන මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාගෙන් එකක් ඉල්ලා සිටිනව. අපේ පාර්ලිමේන්තු ලේකම්තුමා එහා පැත්තේ සිටිනවා. ඔබ පෙනෙනවා. කාරුණික පාර්ලිමේන්තු ලේකම්තුමා කරුණාබරව කල්පනා කර බලා ඒ ලියුම් ටික කරුණාකර අස් කර ගෙන ඒ සේවයේ යෙදී සිටින්නට ඒ සේවකයින්ට ඉඩ දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ඔය විධියේ ප්‍රශ්න රාශියක් අපේ කොට්ඨාශවල බලපවත්වනවා. මේ ගුරු මාරුකිරීම් ආදිය දැන්වත් නවත්වන ලෙස මා ඉල්ලනව. ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ අවස්ථාවේ මෙතන නැතත් මා එතුමාගෙන් එකක් අහන්න කැමතියි. උතුරේ හෝ නැගෙනහිරේ එක ගුරුවරයෙක්වත් ඔය විධියේ වරදකට සම්බන්ධ වී නැහැ කියන එක ගැන එතුමා ලජ්ජා විය යුතුයි. සමහර විට අධ්‍යාපන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා හිතනවා ඇති, උතුරේ හා නැගෙනහිරේ සිටින ගුරුවරුන්ගේ දැනුම මීට වඩා හොඳ නිසා ඒ අය මෙවැනි දේවලට පෙළඹුනේ නැහැ කියා. එහෙත් මා කියන්න සතුටුයි නොයෙක් තැන්වල මෙබඳු දේවල් සිදු වී තිබෙන බව. ඔවැනි සිද්ධියක් සම්බන්ධව ඒ ප්‍රදේශයේ එක ගුරුවරයෙකුටවත් චෝදනාවක් එල්ල වී නැහැ. අපේ ඡන්ද කොට්ඨාශවල නම් ඕනෑ තරම් තිබෙනව.

ගරු කථානායකතුමනි, වැල්ලවාය ප්‍රදේශයේ මා අවුරුදු ගණනාවක සිටම අඳුණන එක්සත් ජාතික පක්ෂයට ලැදි ගුරුවරයෙක් සිටියා. එක්සත් ජාතික පක්ෂයෙන් ඒ ආසනය තරඟ කළ අපේක්ෂකයා ඔහුට ගිහින් කිව්වා "අනේ ඉස්කෝලෙ මහත්මයෝ මේ වාරයේ මට ටිකක් වැඩ කරන්න ඕනෑ" ය කියා. ඉස්කෝලෙ මහත්මයා යූ. එන්. පී. කාරයෙක් වුණත් ඔහු කීවා, "අනේ මහත්මයා මම නම් කවදාවත් ඔය ඉලෙක්ෂන් වැඩවලට කැමති නැහැ" කියා, අර අපේක්ෂකයා හිතුවා මේ ගුරුවරයා වැඩ කරන්නෙ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටය කියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉදිරිපත් වූ අපෙක්ෂකයාත් ගොස් ඔහුට උදව් කරන්නය කියා මේ ගුරුවරයාගෙන් ඉල්ලා සිටියා. එවිට ඔහු කියා තිබෙනව, "අනේ මහත්මයා මා කාටවත් උදව් කරන්නේ නැහැ; මාත් පරණ යූ. එන්. පී. කාරයෙක්" ය කියා. අන්තිමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මොකක්ද වුණේ? එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් ව පැරදුණු තැනැත්තා ගොස් මේ ගුරුවරයා මාරු කළා. සමහර අවස්ථාවල අපිත් දෙපාතර්මේන්තුවලට ටැලිෆෝන් කර ඇසූ විට අපටත් ඇත්ත කියන මහත්වරු සිටිනවා. ඒක කඩා කප්පල්කාරී ක්‍රියාවක් නොවෙයි. බොරු කියන්න බැරි මහත්වරු ඇත්ත කියනව. ඒ නිලධාරියා අපට කිව්ව, මේක සිදු වී තිබෙන්නේ මෙහෙමයි කියල. යු. එන්. පී. ඉස්කෝලෙ මහත්මයාට යු. එන් පී. අපේක්ෂකයාම තව්වු කළා. ඔය දේවල් සිදු වෙන්නෙ ඔන්න ඔය විධියටයි. ඔය දේවල් කවදාවත් තෝරා බේරා ගන්න බැහැ. සමසමාජකාරයා කවුද, ශ්‍රී ලංකා කාරයා කවුද, යු. එන්. පී. කාරයා කවුද කිය තෝරා ගන්න පුළුවන් කමක් නැහැ. ඒ නිසා මේවා නතර කරන ලෙස මා ඉල්ලනව.

ගරු කථානායකතුමනි, මා ළඟ තිබෙන මේ "දවස" පත්තරයේ ප්‍රවෘත්තියක් තිබෙනව "මැතිනියගේ නැවිල්ල තව පික කලකටයි" කියා. කවුද මේ කියන්නෙ? අපේ ඉඩම් ඇමති සහ සභා නායක සී. පී. ද සිල්වා මහත්මයායි.

එහි මෙහෙමත් කියා තිබෙනවා:

"ලිපි ගිනි මොළවන තෙක් දිය සැළියේ
සැපයක් යයි කකුළුව දිය කෙළියේ"

ඇත්ත වශයෙන්ම උන්නැහේ ඒ සම්බන්ධව කල්පනාකර බලනවා නම්, මේ කියා තිබෙන කියමන උන්නැහේටම කියා ගන්නා එකක් බව මා තමුන්නාන්සේලාට කියන්න සතුටුයි. මැතිනියගේ රැස්වීම් වලට එදා 10,000 ක් සිටියා නම් අද 15,000 ක් සිටිනවා. තමුන්නාන්සේලා ඒක නැතෙයි කියන්නෙ නැහැ. මා දන්නෙ නැහැ, මැතිනිය මේ රටේ අගමැති වේවිද කියල. ඒ ගැන කිසිවක් මට කියන්න බැහැ. ඇයි? වැඩි කල් මේකේ කරන්න බැරිලුනෙ. ඒ නිසා ඒ ගැන වැඩි දෙයක් කියන්න මා කැමති නැහැ. නමුත් එදා මැතිනියගේ රැස්වීම්වලට 10,000 ක් පමණ ජනකායක් සිටියා නම් අද 20,000 ක් පමණ සිටින බව කියන්න ඕනැ. ඒ නිසා එය කියන්නට තිබෙන්නෙ මැතිනියට නොවෙයි, අපේ මිත්‍ර සභානායකතුමාටයි කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. ඊට වඩා යමක් කථා කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. මගේ කථාව සඳහා දී තිබුණු කාලය දැන් අවසානයි. ඒ නිසා මගේ කථාව අසා සිටි ගරු මන්ත්‍රීවරුන්ටත් මට අවස්ථාව ලබා දුන් ගරු කථානායකතුමාටත් මගේ අවංකාදර ස්තුතිය පුද කරනව.

අ. භා. 12.31

**කේ. ඩබ්ලිව්. දේවනායගම් මයා. (කල්කුඩා)**

*(திரு. கே. டபிள்யு. தேவநாயகம்—கற்குடா)*

(Mr. K. W. Devanayagam—Kalkudah)

It gives me great pleasure to be able to take part in this Debate. Let me congratulate the Hon. Minister of Finance on having produced a classless Budget—a Budget that caters for every class in this country. Unlike other Budgets it does not teem with theories but is a Budget that is correlated to the real facts of life. Also let me state that this is a Budget introduced by a person who has made a deep study of human nature, assessed its needs and has reached right to its very depths. The Hon. Minister of Finance is also a veteran co-operator and, in producing a Budget which has varied purposes I believe, has reproduced the idea of a multi-purpose co-operative society wherein one serves the needs of the nation—all the various people in this country—in one single effort.

There is no gainsaying the fact that the task of the Hon. Minister of Finance is really an unenviable one. An analysis of the assets before 1956 shows clearly that this country had foreign assets which, at its peak, was the highest in the history of this land. Thereafter, from 1956 to 1965, foreign assets began to decline and the country began to consume more than it produced. In other words, the consumption of domestic goods and imports was more than the goods produced for domestic markets and for the export trade. Therefore, the economy of the country was in a state of decline.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දේවනායගම් මයා.]

To arrest this decline the S. L. F. P. Government introduced many plans. There were short-term plans and long-term plans--but all these plans failed to arrest this decline. There was an excess of expenditure over income and to bridge the deficits created thereby they began to draw on our foreign assets. In other words, the S. L. F. P. Government began to eat into the foreign assets which the U. N. P. had built up with so much toil and labour for the national security of this country. This was the real state of the economy of the country.

In 1964, the Hon. Minister of Finance of the Coalition Government said as follows at page 4 of his Budget speech :

"As a result of these adverse conditions leading to sharp reductions in the quantum of imports, there has been a shortage of many goods, and prices of all articles have visibly risen . . . . In spite of the acute foreign exchange difficulties and the high prices of imports which continue to operate to this day, the Government has continued to provide the basic foodstuffs namely, rice, flour and sugar in the same quantities and at the same prices as before."

In fact, what the Coalition Government was doing was merely providing the basic food of the people—flour, rice and sugar. This was the state in which the economy was when the present Hon. Minister of Finance took over. This is the inheritance the Hon. Minister of Finance received from the last Government.

Although this Government has begun from economic bankruptcy and economic nihilism, it will, with toil and hard labour, build up the economic structure of this country again and bring it to a state in which it will be a hundred times better than it was when it gave up office in 1956.

I would like at this point to refer to the brilliant defence put up by the hon. Member for Colombo South to a charge levelled against his party and him of propagating actively racial and communal strife in this country. He said in his speech :

"No, Sir, there would be no political party worthy of its name, the Sri Lanka Freedom Party, the Lanka Sama Samaja Party, the Ceylon Communist Party and others in this Opposition, if it did not recognize the fact that the problem of relations between the majority and minority communities has to be settled on a just and proper footing. We are ready to do that. Everybody wants that. Let there not be the slightest doubt on that question."—[OFFICIAL REPORT, 18th August, 1965 ; Vol. 61, cc. 372, 373.]

Very courageous words! If there was a genuine intention behind those words, and that genuine intention was given effect to, this country would be a paradise on earth. Let me remind the hon. Member for Colombo South (Mr. Bernard Soysa) that in the years prior to 1956, there was not one man or woman in this country who ever thought in terms of community or race. Let me also remind him of the years much prior to that when the election for the most educated man for the Colombo seat took place. In this election Sir Ponnambalam Ramanathan and Sir Marcus Fernando contested each other and Sir Ponnambalam Ramanathan was elected by the educated Sinhalese people. May I ask the the hon. Member for Colombo South whether the people at that time thought in terms of community or race? Thereafter, when Sir Ponnambalam Ramanathan, undertook his trip to England to plead the case of the Sinhalese leaders, did he think in terms of community or race? Then when the U. N. P. was formed by the then leaders of the party did they even in their wildest dreams think in terms of community or race? In fact, communal harmony was the ideal of the country during that time and every leader of every community stood shoulder to shoulder and marched forward working for the progress of this country.

But what happened to this communal amity thereafter or when was this harmony disrupted? To find

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the cause let us go back to 12th July, 1951, the day when the late Mr. Bandaranaike crossed over from the U. N. P. to the opposition. This was what he said on that day :

". . . . that power which should really be a means to an end, the end of performing a valuable service to the people, soon tends to become an end in itself, when the original purpose is lost sight of and all that remains is the desire for the securing, the entrenchment and the extension of power in the hands of those who wield it."—[OFFICIAL REPORT, 12th July, 1956 ; Vol. 10, c. 701.]

Sir, this was what the late Mr. Bandaranaike said on that occasion. In fact, his mind was teeming with this idea of power which was to be an end in itself.

The most significant feature at that time in this country was that there existed two political groups, the right and the left ; there were no linguistic or communal groups at that time, but it was the late Mr. Bandaranaike who fanned the flames of communal, linguistic and religious hatred. It was only thereafter that this country experienced communal strife of the worse type. Therefore, when the hon. Member for Colombo South says that the loudest peddlars of communal hatred come from the U. N. P., may I tell him that it is not so, that it was the Leader of the S. L. F. P. who was the creator of communal strife ; it was the S. L. F. P. leaders who cherished and nourished communal hatred and it is no wonder, therefore, to see the S. L. F. P. carrying on the same campaign. It is true that the L.S.S.P. has championed the cause of the minorities and that they have support among the minorities. It is an irony of fate that, on the one side, they try to create communal strife and, on the other, champion the cause of the minorities. Indeed, what strange bedfellows ! Communal hatred has infected the L. S. S. P. and its politics, and it has become a canker in the body politic of the L. S. S. P. Therefore, we have to tell the hon. Joint Member for Colombo South (Mr. Bernard Soysa) that there is no vindication of his statement that they are not a party to the communal hatred that is being preached in this country. It is also true that it is after the introduction of the so-called Bandaranaike policies that this country had to face the disruption of the communal amity that prevailed all those years.

Let me now refer to the Budget. The Budget that has been presented in fact embodies the policies of this Government. Before the election we stated in our manifesto the policies we profess, and thereafter we have reiterated in the Throne Speech the policies that we follow. This Budget seeks to implement those policies. You will see that from the beginning we have emphasized that the private sector has an important role to play in the economy of the country, and we have maintained that position right throughout. There is no contradiction in the policies that we have followed.

You will remember, Mr. Speaker, that the S. L. F. P. Government in their time also gave a place to the private sector and stated that it had a role to play. But, what happened in 1964 ? The taxes that were imposed on the private sector by the Budget of 1964 were so heavy that they crippled it ; they almost completely exterminated the private sector. The S. L. F. P. Government professed one policy and acted in direct contradiction of that policy. We may wonder why this is so. This is because there exists within the S. L. F. P. the contradiction of two ideologies—the Left and the Right. In politics one must either be Left or Right ; like oil and water they never mix. There is no half-way house.

All these years, from the very beginning, the S. L. F. P. Government had been following a tradition : they had always acted in conjunction with the Left. It is a fact of history that the late Mr. Bandaranaike and these comrades here came into an electoral pact ; and the S. L. F. P. became so aligned with them that the very existence of their Government

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දේවනායගම් මයා.]

depended on the support of the Left. The S. L. F. P. should have realized the significance of this position, but up to now they have not. It is to be regretted that they continue to have this mixed ideology. It is as if a man is standing in two boats with one leg in each boat, one boat drifting right and the other drifting left. The result in such a situation is that the man will surely sink to the bottom. The S. L. F. P. is a man with a leg in each boat.

May I at this juncture refer to the theme adopted over and over again by the hon. Members of the Opposition, that is, that the Budget presented by the National Government has been designed to help the capitalist classes in this country.

I really do not understand such a charge being made by the hon. Members on the Front Bench of the Opposition. May I ask the hon. Members on the Front Bench of the Opposition whether they are not in fact the greatest capitalists in this country. When one looks at the Government Benches and the Opposition Benches I can say with firm conviction that the greater capitalists are to be found in the Opposition ranks.

Today, the Government ranks are composed of poor Members. Yet the Members of the Opposition say that the Government is composed of capitalists. Is it only the Opposition that can have the privilege of having the interests of the poor at heart ?

May I also refer to the remarks made by the hon. Member for Akuressa (Dr. S. A. Wickremasinghe) ? He is so obsessed by American imperialism and the South Vietnam question that he refers to them whenever he stands up in this House and speaks. No speech of his is complete without reference to them. What is the sort of influence, may I ask him, that the Soviet Union is exercising in other countries ? If the Soviet Union can infiltrate into other countries and thwart the aspirations of those peoples, why should not the Americans try to help the people of Vietnam to maintain their individuality and to preserve the freedoms which everyone loves so well ?

The question of South Vietnam is a sore one to the Opposition because they know that it is the Americans who stand there against domination by the communists.

Therefore, Mr. Speaker, in conclusion I must say that although we have been left with this sad legacy of an utterly bankrupt economy and a country that has been divided by communal strife, we of the National Government shall endeavour by hard labour to build up the nation, and shall restore communal harmony and racial unity.

අ. භා. 12.52

**චම්ලි ගුණවර්ධන මයා.** (කළුතර)

*(திரு சம்ளி குணவர்தன—களுத்துறை)*

(Mr. Cholmondeley Goonewardene—Kalutara)

Mr. Speaker, let me at the outset congratulate the Hon. Minister of Finance on his maiden essay, if I may say so, at budget-making.

The Hon. Minister prefaced his speech by stating that we are in the throes of an economic crisis. I do not know whether he seriously believes it or whether he is merely repeating what his party propagandists have been going around and talking all over the country. Or, maybe, the Hon. Minister of Finance is making excuses and apologies in advance for the shortcomings and the pitfalls in his budgetary policy.

We are in an under-developed nation, and with other developing nations we have common problems. The state of our economy is not as healthy as it should be, but the present state of our economy is mainly due to the play of international forces which are largely beyond our control, and partially due to our inability to exploit the resources in this country to the full.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Further, we compare favourably with other Asian and African countries who are also victims of international finance-capital and imperialism. Our position is rendered more acute on account of the shackles of a colonial legacy. In addition our import and export trade is at the mercy of the world market.

ඔය දීපු ලණු ඇති. දුන් දෙන්න හදන්නේ දිරච්ච ලණු. දිරච්ච ලණු දුන් නිසා තමයි, අපේ ලණු ටිකවත් පිටරට යැවීමට නුපුළුවන් වූයේ. මම ගරු මුදල් ඇමතිතුමාගෙන් රැකීරක්ෂා ගිහය විසඳන්නටත් පුළුවන් වන කාරණයක් ඉල්ලා සිටිනවා. මුළු දකුණු පළාතේම වැඩියෙන් කෙරෙන කර්මාන්තය වන කොහු කර්මාන්තයට රජය පුළුවන් තරම් ආධාර දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. ඒ අතර තේ රබර් වගා වන්ට මෙන් පොල් වගාවටද පෝර සපයන ලෙසත්, දැනට දෙන සහනාධාර මුදල වැඩි කරන ලෙසත් මම ඉල්ලා සිටිනවා. එසේ කළොත් තව අවුරුදු ගණනකදී පොල් නිෂ්පාදනයෙන් දැනට ලැබෙන විදේශ විනිමයට වඩා විශාල ප්‍රමාණයක් ලබාගන්න පුළුවන් වේවි.

අපේ ධීවර කර්මාන්තය පිළිබඳව ගරු කර්මාන්ත හා ධීවර කටයුතු භාර ඇමතිතුමා විසින් ගෙන යනු ලබන වැඩ පිළිවෙළ ගැන අපි සන්තෝෂ වෙනවා. දොඩන්දූවේ අවුරුදු 500 ක් පමණ කාලයේ සිට පැවත එන ධීවර වරායක් තිබෙනවා. අපි දන්නවා, එවැනි ධීවර වරායවල් නැති තැන්වල කෝටි ගණන් වැය කර වරායවල් සාදන බව. දොඩන්දූව වරායට රුපියල් ලක්ෂයක්, නැති නම් අඩු ගණනේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රුපියල් 50,000 ක්, වියදම් කළොත් එය අංග සම්පූර්ණ වරායක් බවට පරිවර්තනය කරන්න පුළුවනි. මෙම වරාය ප්‍රතිසංස්කරණය නොකිරීමේ වරද කළේ මීට පෙර තිබුණු රජයය කියා මා කල්පනා කරනව. මා එම රජයට මතක් කර තිබෙනව, දොඩන්දූවේ වරාය සම්බන්ධයෙන් හොඳ වැඩ පිළිවෙළක් ගෙනියන්නය කියා. නමුත් කිසිවක් කළේ නැහැ. මෙම වරාය අද හෙටම ප්‍රතිසංස්කරණය කොට දියුණු තත්ත්වයකට පත්කරන්නය කියා මා මෙම රජයෙන් ඉල්ලා සිටිනව. එසේ කළාම දොඩන්දූවේ අයට එහෙම නැතිනම් මගෙ කොට්ඨාශයෙ අයට විතරක් නොවෙයි ලංකාවෙ රක්ෂාව නැතිව සිටින නොයෙකුත් පළාත්වල දහස් ගණන් ජනයාට රක්ෂාව ලැබෙනව.

ටයර් නිෂ්පාදනය ගැන මන්ත්‍රීවරුන් කීප පොළක් කථා කළා. ළඟදී, මට ටයර් දෙකක් ගන්න වුවමනා වෙලා මම ගියා දිවුලපිටියෙ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මයා.) හමු වෙන්න. එතුම කීව, ටයර් ඉවරයි; ඕනැ නම් බ්ලැක් මාර්කට් එකෙන් සමහරවිට ගන්න පුළුවන් වේවි කියා. මම ගියා "ටයර් ක්‍රාෆ්ට්" කොම්පැනියට පුරවාපු ටයර් දෙකක් ගන්න. ඒ විධියෙ කොම්පැනිවලට සහයෝගය දුන්නොත් මේ කර්මාන්තය දියුණු තත්ත්වයකට ගෙනෙන්න පුළුවනි. ඒ කොම්පැණිය විතරක් නොවෙයි, "ටයර් මාට්" කොම්පැනිය, රිචඩ් පීරිස් කොම්පැනිය යනාදී වශයෙන් ටයර් පිරවීම කරන ස්ථාන කීපයක් තිබෙනව. බ්ලැක් මාර්කට් එකෙන් ටයර් නොගෙන ලාබයට ටයර් සකස් කර ගන්න අපට පුළුවනි. එංගලන්තය ආදී රටවලින් එකක් රුපියල් 10 ට, 15 ට විතර "සෙකන්ඩ් හැන්ඩ්" ටයර් ගන්න පුළුවනි. ඒවා මෙහෙ ගෙනත් පිරෙව්වාම රුපියල් 60 ට, 70 ට විතර විකුණන්න පුළුවනි. එමගින් දහස් ගණනකට රැකී රක්ෂා ලැබෙනව. අපට මේ ක්‍රමයෙන් විදේශ ධනය වැඩි වැඩියෙන් ඉතිරි කර ගන්න හැකියි. [බාධා කිරීමක්] තමුන්නාන්සෙගෙ බ්ලැක් මාර්කට් කොම්පැනිය වගෙ නොවෙයි ඒක. අපි දන්නව, තමුන්නාන්සෙගෙත් බ්ලැක් මාර්කට් කොම්පැනියක් තියෙන බව. අපි ඕව කියනවිටත් ඒ අය විරුද්ධයි. අර විධියට ක්‍රියා කළාම, විශාල සංඛ්‍යාවකට රක්ෂාව ලැබෙනව විතරක් නොවෙයි විදේශ ගත ධනය පවා තරමක් දුරට වැඩි කර ගන්න පුළුවන් වෙනව ඇති. මා, මගේ කථාව හැකි පමණ ඉක්මණින් අවසන් කරන්න බලාපොරොත්තු වන නිසයි, මේ කරුණු කෙටියෙන් ඉදිරිපත් කරන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටට පිටරටවලින් බෙහෙත් ද්‍රව්‍ය ගෙන්වනව; සියඹලා, වේවැල් යනාදිය ගෙන්වනව. ඔය විධියේ දේ පිටරටවලින් නොගෙන්නුවාට මේ රටේම හරිගස්සා ගන්න අපට පුළුවනි. අපේ රටේ සමහර කැළෑවලට ගියාම දකින්න ලැබෙනව, සියඹලා යනාදිය ටොන් ගණනින් බිම වැටී නාස්ති වී යන බව. ඒව එකතු කරන්න කවුරුවත් යොදවන්නෙ නැහැ. තත්ත්වය එසේ තිබියදී පිටරටවලින් එවැනි ද්‍රව්‍ය ගෙන්වීම සඳහා දහස් ගණන් අපේ විදේශගත ධනය නිකරුණේ විනාශ කර දමනව. සියඹලා විතරක් නොවෙයි, වේවැල් යනාදියත් හොණ්ඩර ගණන් තිබෙනව, අපේ කැලෑවල. ඒ වේවැල් කපා ගන්නෙ නැහැ. නමුත් බායිල, බෝරකාරයො, සිංදිකාරයො මොකද කරන්නෙ ? මේ වේවැල් හෝණ්ඩරයකට රුපියල් 20ක් විතර ගෙවා ලබා ගෙන අපේ රටේ වේවැල් වැඩ කරන දුප්පත් කම්කරුවන්ට සහ වෙළෙන්දන්ට වැඩි මිලට විකුණනව. මා හොඳට දන්නව, මගෙ කොට්ඨාශයෙ පවුල් 200ක් විතර සිටින බව, වේවැල් කර්මාන්තයෙන් ජීවිකාව ගෙනයන. ඒ අය වේවැල් ගන්නෙ රුපියල් 80 ට 100 ට පමණ වැඩි මිලටයි. නමුත් අර අයට වේවැල් හොණ්ඩරයකට රුපියල් 20කට වඩා වැය වන්නෙ නැහැ. මට හොඳට මතකයි, මීට පෙර තිබූ රජයෙනුත් මේ ගැන ඉල්ලීම් කළ බව. මා එදා, එම අංශය භාර ඇමතිතුමාට මේ ගැන කීව. බෝරකාරයින්ට, ඉන්දියානුන්ට එහෙම මේ ආකාරයට වේවැල් ගේන්න ඉඩ දුන්නොත්, ඔවුන් හොණ්ඩරය රුපියල් 20කට විතර ගෙනැවිත් රුපියල් 80 ට 100 ට තරම විකුණාවි; එසේ වුණාම දුප්පත් ලාංකික වෙළෙන්දන්ට යන කල දසාව කුමක්ද කියා මා ප්‍රශ්න කළා. අඩු වශයෙන් සී. ඩබ්ලිව්. ඊ. එක මගින්වත් වේවැල් ගෙන්වන්න කියා මා ඉල්ලා සිටියා. නමුත් ඇහුම්කන් දුන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. ඊ. තිලකරත්න මයා.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේවා ගැන පරීක්ෂා කර බලා කටයුතු කරන්නය; වේවැල් ගෙන්වීම සහමුලින්ම නැති කරන්න එහෙම නැතුව වේවැල් ගෙන්වනව නම් තව කීප දෙනෙකුට එම කාර්‍යය පවරන්නය කියා. එසේ නොකළොත් රුපියල් 20 වේවැල් අපට ගන්න වෙන්නෙ සියයටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තෙල් පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානය ගැනත් වචන දෙක තුනක් කියන්ට ඕනෑ. තෙල් පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානය දකුණු පළාතට ගන්ට අපි නොයෙක් විධියේ වෑයම් කළ බව තමුන්නාන්සේට මතක ඇති. අද තෙල් පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානය ගැන කථා කළොත් ගඳ ගහනව.

**රාජා වෙලේගම මයා.**
*(திரு. ராஜா வெலேகம)*
(Mr. Raja Welegama)
තල තෙල් ද?

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)
තල තෙල් නොවෙයි; භූමි තෙල්. තමුන්නාන්සෙල කළ කැත වැඩ නිසයි, ගඳ ගහන්නෙ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තමුන්නාන්සෙත් ඒකට හවුල්කාරයෙක්.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)
හවුල්කාරයෙක් නිසා තමයි, පැත්තකට වුණේ. අපගේ ඉල්ලීම පරිදි තෙල් පිරිසිදු කිරීමේ කම්හල බූස්සේ පිහිටුවන්ට ක්‍රියා කළා නම් ඒ සඳහා සුදුසු ඉඩම් අක්කර දෙතුන් සියයක් ආණ්ඩුවට අයත් කර ගන්ට පුළුවන්කම තිබුණා. ඒ ඉඩම් පරීක්ෂා කර බලන්ට ගිය රජයේ නිලධාරීන් හා විවරටවලින් පැමිණි විශේෂඥයින් කියා සිටියා එය බූස්සේ පිහිටුවන්ට පුළුවන් කියා. එහෙත් අන්තිමේදී මොකද වුණේ? අදවන තුරුත් පිහිටුවන්ට බැරිව තිබෙනව. ඒ සඳහා යොදාගත් ඉඩම ඊට සුදුසු නැහැ. එක පැත්තකින් වතුර ගලා ගෙන යනවා; අනික් අතින් පාරවල් කැඩිලා; තවත් පැත්තකින් කන්ද. එය බූස්සේ පිහිටෙව්වා නම් අද සෑහෙන දුරට වැඩ කෙරෙනවා. එම නිසා මා ජාතික රජයෙන් ඉල්ලා සිටිනව, ඒ ගැන පරීක්ෂණයක් කරලා——

**සෝමරත්න සෙනරත් මයා.** (අම්පාරෙයි)
*(திரு. சோமரத்ன செனரத்—அம்பாறை)*
(Mr. Somaratne Senerath—Amparai)
ගඳගැහිල්ල ගැනද?

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)
——ඒ ගඳ ගැහිල්ල ගැන පරීක්ෂණයක් කරල, ගඳ නොගහන්ට වැඩ කරන්ට කියා. මා අවුරුදු ගණනක් තිස්සේ අය වැය ලේඛනවලට ඇහුම්කන් දුන්නා. ඒ කාලය තුළ මා අසා නැහැ—මට කලින් සිටින මන්ත්‍රීවරුන් අසා තිබෙනවාදැයි මා දන්නෙ නැහැ—කාටත් පොදුවේ සෙත සැලසෙන මෙවැනි අය වැය කථාවක්. [බාධා කිරීමක්] ලබන අවුරුද්දේ මීට වඩා හොඳ වෙයි. අවුරුදු 5 අවසාන වන විට තමුන්නාන්සේලා මේ පැත්තට ගන්න විධියේ අය වැය ලේඛන ඉදිරිපත් කරන්ට රජය බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනව.

අ. භා. 3.13

**සෝමවීර චන්ද්‍රසිරි මයා.** (කැස්බෑව)
*(திரு. சோமவீர சந்திரசிரி—கெஸ்பாவ)*
(Mr. Somaweera Chandrasiri—Kesbewa)

ඇමතිවරු මැතිව රු
මහ පිරිස මැද පිරිවැ රු
මූලාසනය ද රු
කතානායකතුමාණනි, ග රු

මෙදෘ අය වැය වි ක
විසඳා බලන එක එ ක
ලොකු ඇස් බැන්දුම ක
කියා මෙහි පළ කරන්නට හැ ක

එය ඉදිරිපත් ක ළ
මුදල් ඇමතිඳුගේ මො ළ
අපේ කවුගෙය තු ළ
පදස් සහ කලයුතුය නොපැකි ළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්නියේ මෙතර ම
විජ්ජා පාන අය හෙ ම
ඇතැයි යන වග මම
නොදැන සිටියෙමි මගෙ බොළඳ කම

කොළඹ සිට කොටු වේ
විජ්ජා අපත් දුටු වේ
එහැමට නොපටු වේ
වන්නි විජ්ජා විය පෙරටු වේ

මගෙ කවි කතා ව ට
පෙර පත්වූ විවාදෙ ට
රත්ගම කතාව ට
සබය පත් විය හරි හිනාව ට

රටට ලණු දෙන්න ට
වේවැල් පිමි පණින්න ට
වරායක් ගන්න ට
පරණ ටයරුත් ගෙන්නවන්න ට

සබාවෙහි උත්ත ම
ගති නොපා-පෑ වික්ක ම
මේ මැතිට ඔක්කො ම
සිනාසෙනු ඇත ගැහැණු රත්ග ම

වන්නිනායක මැ ති
විජ්ජාකරුය මෙහි ඇ ති
පොහොසත්තු සැනසෙ ති
දුප්පතා අසරණව වැළපෙ ති

බදු අඩු කළ හෙයින් පොහොසත් මිනිසා ගේ
ඒ අය ලබා ඇත සැනසීමක වේ ගේ
බඩු මිල විකක් අඩුකොට දුගී ජනයා ගේ
නින හොරකම් කරන්නට හැදුවා වා ගේ

එනමුත් නොහැක දුගී ජනයා රවටන් න
ඒ අය සමත් වෙති තතු වටහා ගන් න
බඩුවක් දෙකක් තඹ සතයක් අඩු වන් න
එන බව පැවසුමෙන් බෑ රට රවටන් න

අල බොම්බයි ළූනු මෑ ඇට පරිප් පු
ලාබෙට තිබෙයි කියතත් ද පලිප් පු
මුදලාලිලා වෙති කඩයෙදි කුලප් පු
කැවිලා මුදල් ඇමතිට අද කයිප් පු

මේ බඩු ලාබයෙන් එන කලකිරිල් ල කි
තව තව මඩේ මුළු රජයම එරිල් ල කි
දුගී ජනයාගෙ විපතට මුල පිරිල් ල කි
එකමත් එක රටක මෙය යොන් මැරිල් ල කි

බඩු මිල ලාබ කළ අන්දම හිතන රගේ
වැටහෙයි මුදල් ඇමතිගෙ මහ මොලයෙ අගේ
එ බඩු සියල්ලම එක්කොට බලන ලගේ
දුගී ජනයාගෙ පරලොව අත ළඟම වගේ

පරිප්පුව බුමි තෙලයෙන් පැසවා ලා
ඕසල් තෙලෙන් අල තම්බාගෙන කාලා
යකඩෙන් උදැල්ලෙන් වළ කප්පා දලා
දුගිනට සිටිය හැක සුවසේ වැළලී ලා

දුගිනගෙ මර උගුල අය වැය වැල මේකයි
ඒ අය සිටින්නේ මළ සොහොනේ ගේකයි
දනපති පන්තියේ තතු හරි ආලෝකයි
සිංහල දුගී ජනයා ගැන හද සෝකයි

අපගේ මුදල් ඇමතිඳු හරියට සූරයි
ජාතික රජය වණයේ කුණු හොරී හාරයි
මොහොතින් මොහොත මුළු රට විපතට මෝරයි
වන්නියෙ අයියනායක දෙවිඳුට බාරයි

යහපත් කෙනෙකි අප අග ඇමති සබඝට
සිරකරුවෙක්ව මැදි වී සිටියි පෙළකට
දුම්මොත් මගේ ජාතිය තවත් විපතට
ඔබ පරපුරම පත්වෙයි මහත් අඝසට

ඩී. එස්., එෆ්. ආර්., ඩී. සී. යන ගොල්ල
මුර දෙවි වරුය රැකි ජාතික මිණි නැල්ල
ඒ අය කළේ නැත රට කෙනකුට බිල්ල
ඔබගෙන් නොවේවා එය විපතට එල්ල

අගමැති තුමා සාධාරණ පුරිස යෙකී
විරිදුව සිටගෙනත් ඒ පුවත කිව හැකී
අවතාරයක් එනමුත් මුළු රටම දකී
ඒ අනිකක් නොවෙයි පස්සෙන් සිටින ඩකී

අගමැතිකම ළඟට රජ්යේ ඇමති කම
නරකද ඊට වැඩි ඒකාධිපති කම
කියමින් ඇමතිවරයෙක් රැකි ගිජු කම
ඒකයි ලබා ඇති අනවරය නරකම

සිහිනෙන් නිල ඇඳුම් ඇඳ හොඳට හැඩ වෙලා
තව හැඩ වෙවී කණ්නාඩියෙන්ද බල බලා
ඒ ඒකාදිපතිකම් ගියොත් සවි වෙලා
අසරණ මගේ ජාතිය යාවි වැන සිලා

පත්තර රකිනි ඒකදිපතිකමේ වැඩ
හිතවත්කම නිසා ඔහු හට ලැබේ ඉඩ
යුද ගජනාව අන ගෑ හැටි පනාගොඩ
ඉඟියක් කරයි හොඳ නෑ එන ලෙඩේ හැඩ

ගිය රජයට කියපි ඒකාදිපති කියා
එය බොරු වුණිය ඉවතට ඒකෙ ගඹ ගියා
දූන් මේ හත් හවුල පෙරමුණට යන නියා
පවසයි රට කොයිබද යන්නෙ දුර නියා

සිංහල මහා ජාතික හඬට කන නොදී
උතුරේ රට බෙදන උදවියට තැන දිදී
රැකි ගන්නට හැදුම තව නවත් නිල පොදී
ජාතික යන උතුම් ඒ පදයටද මදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෝමවීර චන්ද්‍රසිරි මයා.]

ජාතික රජයකට නම් ඉඩ දිය යුතුය
මෙය ජාතික නොවන බව සැලකිය යුතුය
රට බෙදනා අයට ඉඩ නොම දිය යුතුය
මහ ජාතිය නැසෙයි ඉන් එග දත යුතුය

අය වැය ලේඛනෙන් මෙහි ඉඩ ලැබෙන් නේ
මහ ජාතිය නැසෙන තැනටයි පෙනෙන් නේ
සිංහලයාට ඉන් විපතකි යෙදෙන් නේ
එවිපත ගැන කිම්ද නොතකා සිටින් නේ

සිරිමා රජය සිංහල ජාතිය රැක්කා
මේ හත් හවුල් රජයෙන් ජාතිය වික්කා
තව තව ගියොත් මේ බඳු විස්කම් දක්කා
මගෙ සිරිලක් මවට මතු වේවිද මක්කා

පැඩරල් පිළිල හෙළ දැ රුක වෙලී ඇත
වැඩිපුර ඉඩම් ඒ අයටම බෙදී ඇත
සිංහල බසට මරු පහරක් වැදී ඇත
මුළු ජාතියම අනතුරකට යෙදී ඇත

ජාතික සමගියක බොරු මුහුණක් බන්ද
පැඩරල් මනාලිය සරණය කොට කැන්ද
ඉක්මන් ගමන් අප අගමැති ගිය හින්ද
යූ. ඇන්. පියෙ අයත් අද බස් දෙති නින්ද

සිංහල ජාතියම ලා අනතුරක මරු
කුමටද රැකිමෙන් ඔය මහ පදවි ගරු
මේ හත් හවුල් රජයේ ගරු ඇමතී වරු
අත්තන ඇට කාපු පිරිසක නොවෙයි බොරු

ඔවුනට නොතේරෙයි උන් යන ගමනෙ දුර
ජනතාවගෙන් පලිගන්නට යොදයි මැර
මේ වැනි පලිගන්න රජයක් කිසිම වර
මා නම් දක නොමැත මගෙ දිවි අතර තුර

පලිගන්නා පිණිස ජනතා පිටට ඇත
විදිමත් නොවනු ඇත එක එක ඇමතී අණ
"පලීගන්නා දෙපාරතමේන්තුවශ" යන
රජයේ අංසයක් ළගදිම අරිනු මැන

දුන් වන්නියෙයි අපගේ ගුරු අරවු වික
කම්කරුවන්ට නැත සැනසුම කියන එක
මහජනයා මරති පොලිසියෙ සෙබලු රැක
ගරු අගමැතිතුමනි, මේ ගැන නැද්ද දුක

මහජනයාට සලසන දුක දැක ගන්න
ඕනෑ නේද පවුලක් දරුවෙක් ඉන්න
මතු දිනකවත් ජනතා දුක මැටහෙන්න
නරකද ළඟදි පෙලවාසියකට යන්න

නිල රුක ගැනුම දනපතීනගෙ පුරුද්දයි
හත් හවුලේ රජෙන් ජාතික පලුද්දයි
අයවැය ලේකනේ ශොඳටම අසුද්දයි
මා ඒ නිසා ඒකට හරි විරුද්දයි

අ. භා. 3.24

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කැස්බෑවේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද විකට අංගයෙන් පසුව මට කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන සතුටු වන්නේ සබා ගැබේ තිබුණු කාන්සිය නැති වී ගොස් තිබෙන නිසයි. එතුමාගෙ පද්‍ය මාලාවෙන් මතු වී පෙනෙන කාරණයක් නම් ඩී. එස්. සේනානායක මහතා මේ රට විදේශීන්ට පාවා නුදුන් බව දීර්ඝ කාලයකට පසුව හෝ එතුමා පිළිගෙන තිබීමයි. 1948 පෙබරවාරි 4 වැනිදා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගෙන් මේ රට මුදා ගත් වේලේදී ඩී. එස්. සේනානායක මහතා මේ රට නැවතත් අධිරාජ්‍යවාදීන්ට පාවා දී ඇති බව ප්‍රකාශ කළ පිරිසෙන් කැස්බෑවේ ගරු මන්ත්‍රීතුමාත් ප්‍රමුඛයකු බව අප දන්නවා. කලක් ගත වුණාට පසු දැන් එතුමා ඒ මතය වෙනස් කර තිබෙන බව එතුමාගේ කවි කථාවෙන් පැහැදිලි වෙනවා. ඒ ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ආණ්ඩුවේ මේ කුළුදුල් අයවැය ලේඛනය දරුණු නියංසායක් අවසාන කළ වර්ෂා පතනයක් වගෙයි. ඇළ වේලි සිඳී ගිය, ගස් කොළන් විනාශ වී ගිය, භව භෝග නැති වී ගිය මහා ආර්ථික නියංසායකට පසුගිය අවුරුදු 9 තුළ මේ රට මුහුණ දුන් බව සඳහන් වී තිබෙන්නේ පසුගිය වර අයවැය ලේඛනය ඉදිරිපත් කරමින් කථා කළ යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙහියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අයවැය වාර්තාව විවේචනය කළ විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලාට එක් ආරාධනයක් කරන්න මා කැමතියි. ඒ ආරාධනය මෙයයි: කරුණා කර පසුගිය අවුරුදු නවය තුළ මේ රට ඉදිරියෙහි තබන ලද එක් එක් අයවැය වාර්තාව පරීක්ෂා කර බලන්න. ඊළඟට මේ අභිනව ආණ්ඩුවෙන් ඉදිරිපත් කරනු ලැබ තිබෙන අය වැය වාර්තාවත් පරීක්ෂා කර බලන්න. ඒ අයවැය වාර්තාත්, මේ අයවැය වාර්තාවත් සසඳනය කර බලන්න. එසේ කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලන විට ඒ ගරු මන්ත්‍රීතුමන්ලාට මේ අයවැය වාර්තාවෙහි විශේෂ වෙනසක් තිබෙන බව පැහැදිලි ලෙස පෙනී යනවා ඇති. මොකක්ද ඒ විශේෂ වෙනස? දුර්භාග්‍ය සම්පන්න කඩතොලු මකා දමා, සෞභාග්‍ය සම්පන්න උල්පත් මේ අයවැය වාර්තාව මගින් පෑදී ඇවිත් තිබෙන බව ඒ විශේෂ වෙනස හැටියට එතුමන්ලාටත් පෙනී යනවා ඇති. එය එසේම බව මටත් දැන් තමුන්නාන්සේ ඉදිරියේ ප්‍රකාශ කරන්නට පුළුවනි.

අප ඉදිරියේ සාකච්ඡාවට භාජන වෙමින් පවතින මේ අයවැය යෝජනා විරුද්ධ පාර්ශ්වයේ ඇතැම් ගරු මන්ත්‍රීතුමන්ලා විසින් විවේචනයට භාජන කරනු ලබද්දී බොහෝ දුරට කාලය මිඩංගු කරන ලද්දේ මේ අයවැය යෝජනා ගැනම නොවෙයි; මේ රටේ යම් යම් ප්‍රශ්න සම්බන්ධයෙන් මෙතෙක් නොවූ කාරණා ගැනයි. අලුතින් පත් වී ආ සමහර ගරු මන්ත්‍රීවරුන් අවංක ලෙස කථා කරමින්, සමහර අඩුපාඩුකම් අපේ පාලන යන්ත්‍රයෙහි පවත්නා නිසා, මහජන අපහසුකම් මග හරවාලීමෙහි නොපොහොසත් අන්දමේ කොටස් නිසා, ඒ අන්දමට තිබෙන බව තමනුත් පිළිගන්න බව මේ ගරුතර සභාව ඉදිරියේ මතු කොට පෙන්වන්නට යෙදුණා. එවැනි අදහස් පළ කරන ලද අවස්ථාවලදී ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් අහන්නට යෙදුණා, ගත වුණු අවුරුදු නවයක කාලයක් තිස්සෙ ඒ සම්බන්ධයෙන් එවකට තිබුණු ආණ්ඩුවලින් කුමක් කරන ලද්දේද කියා. එතකොට මොකක්ද ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලට ලැබුණු උත්තරය? ඔව්, අපට ඒ ගැන සතුටුදායක යමක් කරන්නට බැරි වූ නිසා තමයි අප දැන් තමුන්නාන්සේලාට ඒ ගැන කියා සිටින්නෙ, කියන එකයි ලැබුණු උත්තරය. ඒකයි ඒ මන්ත්‍රීවරුන් කිව්වෙ. සම්පූර්ණ ඇත්ත. ඒක එහෙමම වෙන්න ඕනෑ. ඊයේ තවත් එක් ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, 1947 සිට 1956 දක්වා කාලයේදී අප මොකද කළේ කියා දැන ගන්න බලාපොරොත්තු වෙනවය කියා. ඒකත් ඇත්ත. ඒ බැරි වීම නිසා තමයි අද මේ අඩුපාඩුකම් නැති කරන්න උත්සාහ කරන්නෙ. ඒ සම්බන්ධයෙන් මට කියන්න තිබෙන්නෙ, 1947 සිට 1956 දක්වා ගත වූ ඒ කාලය තුළ එක්සත් ජාතික පක්ෂය විසින් කරන ලද විශිෂ්ට සේවය පිළිබඳව යම්කිසි විස්තරයක් කරන්නට මේ අවස්ථාවේදී අවශ්‍ය නොවන බව පමණයි. එහෙත් මේ අවස්ථාවේදී එකක් පමණක් සඳහන් කරන්නට ඕනෑ. 1956 එක්සත් ජාතික පක්ෂය මහා මැතිවරණයෙන් පරාජයට පත් වන අවස්ථාව වන විට අලුතින් පත් වූ ආණ්ඩුවට ඉතිරි කර ගියේ හිස් භාණ්ඩාගාරයක් නොවෙයි. එදා අලුතින් පත් වූ ඒ ආණ්ඩුවට එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව විසින් භාර දෙන ලද්දේ සෞභාග්‍ය සම්පන්න භාණ්ඩාගාරයක් බව සඳහන් කරන්නට පුළුවනි. මා කියන ඒ කාරණය ශ්‍රී ලංකා මහා බැංකුවෙන් නිකුත් කරන ලද වාර්තාවලින් තමුන්නාන්සේලාට පැහැදිලිව පෙනී යනවා.

පසුපස ආසනවල සිටින සමහර නවක ගරු මන්ත්‍රීවරුන්ගේ කථාවන්ගෙන් පැහැදිලිව ප්‍රකාශ කර සිටි හැටියට අද ඇති වී තිබෙන නොයෙක් විධියේ අකාර්යක්ෂමතාවන් සහ දූෂණ ක්‍රියාවන්, මහජන ජීවිතයේ යථා පැවැත්වීමට අවශ්‍ය වැඩ පිළිවෙළවල් පසුගිය නව අවුරුද්ද තුළදීම සිදු නොවූයේ නම්, තමුන්නාන්සේලා අවංකවම බලාපොරොත්තු වෙනවාද, මේ ආණ්ඩුව බලයට පත් වීමෙන් පසු ගත වී තිබෙන මේ මාස හතරහමාර නැත්නම් පහ තුළදීම සම්පූර්ණ කර දීම කළ හැකි දෙයක්ය කියා? මා ඒ ප්‍රශ්නය විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් අහන්න කැමතියි. එහෙත් මා එකක් පමණක් තමුන්නාන්සෙට කියන්නට කැමතියි. අප මේ ආණ්ඩුවේ වැඩ කටයුතු භාර ගත් මොහොතේ පටන්ම අපේ ගරු අග්‍රාමාත්‍යතුමා සහ මුළු කැබිනට් මණ්ඩලයත්, එසේම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීන් සියලු දෙනාමත්, මේ රටේ පාලන යන්ත්‍රයේ භාරදූරත්වය දරණ හැම දෙනාමත් වෑයම් කරන්නෙ පසුගිය නව අවුරුද්දෙදි මේ රට ඇද දමන ලදුව තිබුණු මහා ප්‍රපාතයෙන් ගොඩ ගැනීමට බව නවක ගරු මන්ත්‍රීවරුන් වෙත ප්‍රකාශ කරන්නට සතුටුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය රජයේ හිටපු මන්ත්‍රීවරුන් පවා, හිටපු ඇමතිවරුන් පවා මේ සභා ගැබේ නැගිට කථා පවත්වද්දී කළේ කුමක්ද? ඔවුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

කළේ පසුගිය කාලයේ කරන්නට බැරි වූ යම් යම් වැඩ කටයුතු පිළිබඳ විවේචන ඉදිරිපත් කිරීමයි. එදා ආණ්ඩු පක්ෂයේ සිටි—අද විරුද්ධ පාර්ශ්වයේ සිටින—සමහර ගරු මන්ත්‍රීවරුන්ට මේ ජාතික රජය ආරම්භ වූ පසු විශේෂ නිදහසක් ලැබී තිබෙන බව මම ප්‍රකාශ කරන්න සතුටුයි. ඒ නිදහස නම් තමන්ගේ අදහස් නිර්භයව ප්‍රකාශ කරන්නට අවසථාව ලැබීමයි. පසුගිය රජයේ පාලන කාලයේ, ඒ රජයේ ගරු මන්ත්‍රීවරුන්ට ඇති වී තිබුණු අමාරුව කුමක්ද? ආණ්ඩු පක්ෂයේ රැස්වීමකදී පවා නැගිට රජයේ වැරදි පෙන්වා දෙන්නට, අඩුපාඩු පෙන්වා දෙන්නට එදා ඔවුන්ට නිදහස නොතිබුණු බවට අද විරුද්ධ පාර්ශ්වයේ සිටින, එදා ආණ්ඩු පක්ෂයේ සිටි සමහර ගරු මන්ත්‍රීවරු සාක්ෂි දෙනවාට කිසි සැකයක් නැහැ. එදා ආණ්ඩු පක්ෂයේ වරදක් ගැන කථා කළොත්, විවේචනය කළොත්, අද විරුද්ධ පාර්ශවයේ නායිකාව—එදා අගමැතිනිය—කීවේ මෙහෙම විවේචනය කරනවා නම් මම ඉල්ලා අස් වෙනවා එසේ නැත්නම් පාර්ලිමේන්තුව විසුරුවා හරිනවා කියායි. එතැනින් කථාව හමාරයි. එවැනි තත්ත්වයක් තිබුණේ නැද්ද කියා සොයා බලන ලෙස මම ඉල්ලා සිටිනවා. පසුගිය රජයේ හිටපු ඇමතිවරුන්—විශේෂයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිවරුන්—කළ කථා පරීක්ෂා කර බලන විට ඒ තත්ත්වය පැහැදිලිව පෙනෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අළුත් රජය ආරම්භ වූ පසු ප්‍රධාන විවාද 3 ක් කෙරුණා. රාජාසන කථාව පිළිබඳ විවාදය, අධ්‍යාපන ඇමතිතුමාට විරුද්ධව ඉදිරිපත් කළ විශ්වාසභංග යෝජනාව පිළිබඳ විවාදය සහ මේ අයවැය විවාදය ඒ ප්‍රධාන විවාද තුනයි. මේ විවාද තුනේදීම විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් වැඩි හරියක්ම කළේ පසුගිය රජය කාලයේ නොකෙරුණු දේ ගැන විවේචන ඉදිරිපත් කිරීම බව මම නැවතත් තමුන්නාන්සේට මතක් කරන්නට සතුටුයි. ඒ නිසා ඇත්ත වශයෙන්ම ඒ විධියේ විවේචන සම්බන්ධව අපි අනුකම්පා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අයවැය වාර්තාව ගැන මට එකක් පැහැදිලි ලෙස කියන්නට පුළුවනි. මෙතෙක් ඉදිරිපත් කරන ලද වෙනත් අයවැය වාර්තාවලට වඩා වෙනස් මගක්, අළුත් මගක් මේ අයවැය වාර්තාව ගෙන තිබෙන බව කියන්නට පුළුවනි. මොකක්ද ඒ අළුත් මග? පසුගිය කාලයේ අයවැය වාර්තා පරීක්ෂා කර බලන විට පැහැදිලිව ඉස්මතු වී පෙනෙන අංගය කුමක්ද? බදු බරින් මිරිකී සිටින, ජීවන වියදම් බරින් මිරිකී සිටින, වෙනත් දහසකුත් එකක් කරදරවලින් මිරිකී සිටින ජනතාව තළා පෙළා ඒ ජනතාවටම තව දුරටත් හිරිහැර කරදර වන විධියේ බදු පනවා ඔවුන් මිරිකා ලබා ගත් දෙයින් ඒ අයවැය වාර්තා සම්පූර්ණ කර ගන්නට උත්සාහ කර තිබෙන බව, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ අයවැය වාර්තා දෙස බලන විට තමුන්නාන්සේට පෙනී යනවා ඇති. මෙතෙක් ගිය මාර්ගය වෙනස් කොට, රටේ බුර බුරා ඇවි ඇවී නැගෙන ප්‍රශ්නවලට පිළියමක් සෙවීම පිණිස, අර දුක් විඳින නොයෙක් බදු බරින් පීඩා විඳින ජනතාවටම තව දුරටත් හිරිහැර නොකොට වෙනත් මාර්ගයකින් ඒ අයවැය පියවීමට අළුත් පියවරක්, ප්‍රගතිශීලී පියවරක්, සාධාරණ පියවරක් මේ අළුත් ගරු මුදල් ඇමතිතුමා රැගෙන තිබෙන බව මේ අයවැය වාර්තාවෙන් පැහැදිලි ලෙස පෙනී යනවා.

මේ අයවැය වාර්තාවේ අත්‍යාවශ්‍ය, දින පතා ජීවිතයට අවශ්‍ය දේවලට තීරු බදු නැහැ; ආදායම් බදු නැහැ; මිල අඩු කිරීමක් හැර වැඩි කිරීමක් නැහැ. මේ අයවැය වාර්තාවේ තවත් උසස්ම අංගයක් නම් එයින් කිසි කෙනකුට රිද්දා නැති වීමයි. ඒ සමගම මේ අයවැය වාර්තාවේ හිහයකුත් නැහැ. මේ අයවැය වාර්තාව සම්මත වූ පසු මේ විධියට අයවැය වාර්තා ඉදිරිපත් කරන්නේ කෙසේද කියා, ලෝකයේ නොයෙක් රටවලින් අපේ ගරු මුදල් ඇමතිතුමාගේ උපදෙස් සොයනවාට මට කිසිම සැකයක් නැහැ. එතුමා විශිෂ්ට වාර්තාවක් ගොඩ නැංවූවා. ඊයේ කථා කළ කම්කරු නිවාස හා රැකී රක්ෂා පිළිබඳ ගරු ඇමතිතුමා කීවා වගේ අපේ ගරු මුදල් ඇමතිතුමා සාමාන්‍ය ජනතාවගේ අදහස් උදහස් පිළිබඳ වැටහීමක් ඇති, ගම්බද ජනතාව සමග ආශ්‍රයෙන් ලබා ගත් ගුණවගාවක් ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇමතිවරයෙක් නිසා එතුමා මේ විධියේ අයවැය වාර්තාවක් ඉදිරිපත් කිරීම මට පුදුමයට කරුණක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ මුදල් ඇමතිතුමා ගිය අවුරුද්දේ විරුද්ධ පාර්ශ්වයේ සිටින විට එවකට සිටි මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ අයවැය වාර්තාව විවේචනය කරමින් කළ කථාව මා කියවා බැලුවා. එතුමාගේ කථාව පාවිච්චි කොට එතුමාගේ මූණට වීසි කර කියන්නට කිසිම දෙයක් එදා එතුමා කළ කථාවේ තිබුණේ නැති බව මා විරුද්ධ පාර්ශ්වයේ අයට කියන්න කැමතියි. මන්ද, එදා එතුමා යම්කිසි ප්‍රතිපත්තියක් අනුව කථා කළා නම් ඒ ප්‍රතිපත්තිය උඩම ගොස් මේ අය වැය වාර්තාව සම්පාදනය කර තිබෙන බව පැහැදිලියි. මෙපමණ හොඳ අයවැය වාර්තාවක යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට (ආචාර්ය එන්. එම්. පෙරේරා) පෙනුණු ලොකුම අඩු පාඩුව මොකක්ද? ඇත්ත එතුමාට පෙණුනු ඒ අඩු පාඩුව නම් මේ අය වැය වාර්තාවේ තිබෙනව. එතුමාට පෙණුනු අඩුපාඩුව නම් "සෝෂියලිසම්" කියන වචනය නැතිවීමයි. යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගේ කථාව මා බොහොම හොඳින් ශ්‍රවනය කළා. එතුමා පුන පුනා කීවේ නිකමටවත් "සෝෂියලිසම්" කියන වචනය මෙයට සම්බන්ධ කර නැත කියන එකයි. තරහ ගිහින් බොහොම වේගයෙන් කිව්වා, මේ අයවැය වාර්තාවේ කිසිම තැනක සමාජවාදය කියන වචනය නැත කියල.

මේ අයවැය වාර්තාවේ තිබෙන ලොකුම අඩු පාඩුව ඒකයි. කොතරම් සමාජ විරෝධී වැඩ පිළිවෙලක් තිබුණත් සමාජවාදී කියන වචනය කොතනක හරි දැම්මොත් සෝරම හරි. එතුමන්ලා පිළිගෙන තිබෙන සමාජ වාදයෙත් අප පිළිගෙන තිබෙන සමාජ වාදයේත් ලොකුම වෙනස ඕකයි. සමාජ වාදය කියන්නේ කුමකටද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සිටිනව. හිටපු උප ඇමතිවරයෙක් සිටිනව. මට සන්තෝෂයි දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමාත් (ආර්. ජී. සේනානායක මයා.) දැන් මෙහි සිටීම ගැන. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප නායක ධුරය දැන් පිළිගෙන තිබෙනවලු. එතුමාට මගේ [ගෞරව]යක් තිබෙනව. එතුමා කවදත් මාක්ස් වාදීන්ට විරුද්ධව නැගී සිටින කෙනෙක්. නැහැ කියන්න එතුමාට බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියන්න ආවේ සමාජවාදය පිළිබඳ ප්‍රශ්නයයි. මා තමුන්නාන්සේලාගෙන් අහනවා තමුන්නාන්සේලාගේ සමාජවාදය පිළිබඳ න්‍යාය ධර්මය කුමක්ද කියා. අපි දන්නව මාර්ක්ස්වාදීන්ගේ න්‍යාය ධර්මය කුමක්ද කියන එක. එනම්, සියල්ලම රජය සන්තක කිරීමයි. සියල්ලම රජය අතට ගෙන, මධ්‍යස්ථානයකින් පාලනය කොට, දේශපාලන බලය, රටේ ආර්ථික බලය, සමාජ ක්‍රමය, අධ්‍යාපනය ආදී සියල්ලම එක තැනකට එක්කොට රජයේ ඒකාධිකාරයක් ඇති කොට ඒ මගින් පාලනයක් ගෙන යෑම තමයි මාර්ක්ස්වාදී සමාජවාදය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමාජවාදය කුමක්ද කියා මා අහන්න සතුටුයි. ඒ පක්ෂයේ නොයෙකුත් ප්‍රතිපත්ති ප්‍රකාශන ආදිය දෙස බලන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමාජවාදය ඒ සමාජ වාදය සමග එකඟත්වයක් තිබෙන බවක් අපට පෙනෙන්න නැහැ. මන්ද? මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාගේ (මෛත්‍රීපාල සේනානායක මයා.) කථාව අසාගෙන සිටින්නට මට අවස්ථාව ලැබුණා. එතුමා කී සමාජවාදය මාර්ක්ස්වාදී කොමියුනිස්ට් සමාජවාදයට වෙනස්. නමුත් මොන විධියකට මේ කණ්ඩායම් දෙක එකට හවුල් වී මේ රටේ සමාජවාදයක් ඇති කරන්නට ක්‍රියා කළාද, ක්‍රියා කරනවාද කියා මට නම් හිතාගන්න බැහැ. අප පිළි අරගෙන තිබෙන සමාජවාදය සාධාරණ සමාජ වාදයක්. අපේ සමාජවාදී වැඩ පිළිවෙළ අනුව හැම අංශයකටම ස්ථානයක් තිබෙනව. පසුගිය පක්ෂ සම්මේලනයකදී සම්මත කරගත් අපේ පක්ෂයේ ප්‍රතිපත්ති හා ප්‍රකාශන අරගෙන කියවා බැලුවොත්, පෞද්ගලික අංශයටත් පොදු අංශයටත් සමුපකාර අංශයටත් ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනවල විශේෂ තැනක් දී තිබෙන බව තමුන්නාන්සේලාට පෙනෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් ගරු මුදල් ඇමතිතුමා කළ කථාවේ සඳහන් වැද [ගත්] අංශයක් සම්බන්ධව තමුන්නාන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

සේගේ සැලකිල්ල යොමු කරවන්නට සතුටුයි. ඒ අංශය නම් සංවර්ධනයයි. දීර්ඝ කාලයකට පසු මේ රටේ සංවර්ධනය සඳහා විශේෂ අඩිතාලමක් මේ අයවැය ලේඛනයෙන් දමා තිබෙන බව මගේ හැඟීමයි. ඒක ඉතාමත් වැදගත් දෙයක්. එදිනෙදා දෛනික ප්‍රශ්න සම්බන්ධව සිත යොමු කර අයවැය ලේඛනය ඒවාට පමණක් සීමා නොකර, රටේ අනාගත සංවර්ධනය ගැන විශේෂ පරිශ්‍රමයකින් කල්පනා කර පිළියෙළ කරගත් සංවර්ධන වැඩ පිළිවෙළක් පිළිබඳ යෝජනා රාශියක් මේ අයවැය ලේඛනයට ඇතුළත් කර තිබෙනව. ඒක ඉතාමත් වැදගත් අංගයක්. යම් සැලැස්මක් අනුව මේ සංවර්ධන කටයුතු කළයුතුව තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. මේ සංවර්ධන කටයුතු තනිකරම රජය මගින් කරගෙන යන්නට පුළුවනි. ඒකාධිපති වාදය පවතින රටවල, මාක්ස්වාදය පවතින රටවල එය කර තිබෙනවා. නමුත් සම්පූර්ණයෙන්ම රජයේ ඒකාධිකාරයක් ඇති කර ගෙන රජය මගින් පමණක් රටක සංවර්ධන කටයුතු කිරීමෙන් වෙන්නේ වහල් සමාජයක් ඇතිවීම පමණයි. රජයේ ඒකාධිකාරයත් සමග ඇතිවන්නේ නිදහස් මිනිස් පරපුරක් නොවෙයි, වහල් ජනතාවක්. ඒ ප්‍රතිපත්ති අපි සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කර තිබෙනව. අපේ රාජාසන කථාවේ සඳහන් කළ යෝජනා පදනම් කර ගෙන දැන් මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාවලින් අපි රජයේ ඒකාධිකාරය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කර තිබෙනව. රජයත්—ඒ කියන්නෙ පොදු අංශයත්—පෞද්ගලික අංශයත් ඒ වාගේම සමුපකාර අංශයත් කියන අංශ තුනම සම්බන්ධවී කරන සංවර්ධන වැඩ පිළිවෙළකුයි අපි පිළිඅරගෙන තිබෙන්නෙ. එවැනි සංවර්ධන වැඩ පිළිවෙළකින් පමණක් නිදහස් සංවර්ධනයක් ඇතිවෙනවාය කියායි අප විශ්වාස කරන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය රජය ගෙන ගිය කර්මාන්ත සම්බන්ධව විශේෂ විස්තරයක් හිටපු කර්මාන්ත ඇමතිතුමා වන මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මයා.) මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට යෙදුණා. අපේ ආණ්ඩුවේ කර්මාන්ත පිළිබඳ ඇමතිතුමා අපේ ප්‍රතිපත්ති විස්තර කර දුන් අවස්ථාවේදී අවාසනාවකට මෙන් මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ සිටියෙ නැහැ. අපේ කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා සංඛ්‍යා ලේඛන ඇතිව අපේ කර්මාන්ත ප්‍රතිපත්තිය පිළිබඳ විස්තර පැහැදිළි කර දුන්නා. ඒ වාගේම පසුගිය ආණ්ඩුව විසින් මොන විධියේ කර්මාන්ත වැඩ පිළිවෙළක් ගෙන ගියාද කියාත් එතුමා පැහැදිලි කර දුන්නා. කිසිම සොයා බැලීමක්, වගවිභාගයක් නැතිව, කාර්මික විශේෂඥයන්ගේ උපදෙස් නැතිව ගෙන ගිය කාර්මික වැඩ පිළිවෙළක් නිසා ඇතිවී තිබෙන අවුල් තත්ත්වය ඊයේ කර්මාන්ත ඇමැතිතුමා විසින් අපට පැහැදිළි කළා. ඒ කරුණු පැහැදිළි කරනවාත් සමගම ජාතික රජයේ කර්මාන්ත පිළිබඳ ප්‍රතිපත්ති මොනවාද කියාත් ගරු සභාවට පැහැදිළි වුණා. පෞද්ගලික අංශයත් පොදු අංශයත් එකට එකතු වී මේ රටේ අවශ්‍යතාවන්ට මුහුණ දිය හැකි අන්දමින්, කර්මාන්ත පිළිබඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන බව එතුමා ප්‍රකාශ කරන්නට යෙදුණා.

අපේ මුදල් ඇමතිතුමා හිඟයක් නැති අයවැය වාර්තාවක් ඉදිරිපත් කළා පමණක් නොවෙයි, රටේ අවශ්‍යතාවයන්ට අවශ්‍ය ප්‍රමාණ මුදල් හදල්ද වෙන් කර තිබෙනවා. මුදල් ඇමතිතුමාගේ කථාවේ සිංහල අනුවාදයේ 29 වන පිටුව වෙත තමුන්නාන්සේගේ සැලකිල්ල යොමු කරවීමට මම කැමතියි. එහි මෙසේ කියා තිබෙනවා :

"ලබන වර්ෂය සඳහා වූ ප්‍රාග්ධන ඇස්තමේන්තුවලින් ගාලු වරායත්, කන්කසන්තුරේ වරායත් තව දුරටත් දියුණු කිරීම සඳහා මුදල් වෙන් කර තියෙනවා. ජාතික නිවාස අරමුදලට ණය දීම සඳහා වෙන් කරන ලද මුදල, රුපියල් 1 කෝටි 50 ලක්ෂයේ සිට රුපියල් 2 කෝටි 50 ලක්ෂය දක්වා වැඩි කර තියෙනවා. ඒ මුදල උපයෝගී කරනු ලබන්නේ අඩු ආදායම් ලබන්නන් හා මධ්‍යම පංතිකන්ද වෙනුවෙන් තට්ටු ගෙවල් ඉදි කිරීම සඳහායි. අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වැඩ සඳහා රුපියල් 2 කෝටි 30 ලක්ෂයක මුදලක් වියදම් කරනු ලබන අතර, කාර්මික අධ්‍යාපනයත්, විශ්ව විද්‍යාල අධ්‍යාපනයත් සඳහා තවත් රුපියල් 20 ලක්ෂයක් වියදම් කරනවා ඇති. තවත් ශිෂ්‍යයින් 72,000 කට ඉඩකඩ සලසාලීම සඳහා මීළඟ වර්ෂය තුළදී තවත් පාසල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

600 ක් තරම් ගොඩනගනු ඇතැයි ඇස්තමේන්තු කර තියෙනවා. පේරාදෙණියේ දෙවැනි වෛද්‍ය විද්‍යාලය සඳහා අභ්‍යාස ආරෝග්‍යශාලවක් ගොඩ නැඟීමටත් කර්මික විද්‍යා ආයතනයට උපකරණ මිළයට ගැනීම සඳහත් ප්‍රතිපාදන සලසා තියෙනවා. විද්‍යාගාරවලට උපකරණ සැපයීම සඳහා වර්තමාන මුදල් වර්ෂයේ සලසා ඇති ප්‍රතිපාදනය වන රුපියල් 10 ලක්ෂය ලබන වර්ෂයේදී රුපියල් 30 ලක්ෂය දක්වා වැඩි කර තියෙනවා. සෞඛ්‍ය සේවාවන් පිළිබඳව රුපියල් 1 කෝටි 20 ලක්ෂයක් වන ප්‍රාග්ධන ආයෝජනය, ප්‍රධාන වශයෙන්ම උපයෝගී කරනු ලබන්නේ ජල සැපයීම් යෝජනා ක්‍රම සඳහා උපකරණ මිලදී ගැනීමත්, ආරෝග්‍යශාලා දියුණු කිරීමත් සඳහායි. රටේ ප්‍රධාන විදේශ විනිමය ඉපැයුම් මාර්ගයක් හැටියට දේශ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමටත් රජය අදහස් කරනවා."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නොයෙක් බාධක හිරිහැර මධ්‍යයේ අළුත් බදු බරක් පටවන්නේ නැතිව, හිඟයක් නැති අයවැය ලේඛනයක් ඉදිරිපත් කර ඇති අතර, අත්‍යාවශ්‍ය මහජන පහසුකම් සඳහාද මුදල් වෙන් කර තිබෙන ආකාරය එයින් තමුන්නාන්සේට පෙනී යනවා ඇති.

විරුද්ධ පාර්ශ්වය මේ විවාදයේදීත්, පිටතදීත් මහජනයා අතරට ගෙන යන ප්‍රචාරයකට මේ අවස්ථාවේදී පිළිතුරු දීමට මම කැමතියි. මේ විවාදයේදී කථා කළ මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මයා.) කිව්වා, ජාතික රජය ඩී. එස්. සේනානායක මැතිතුමාගේ ඉඩම් ප්‍රතිපත්තිය වෙනස් කර තිබෙනවාය කියා. මේ අයවැය කථාව පරීක්ෂාවෙන් කියවා බැලුවා නම් එය සම්පූර්ණ බොරුවක් බව පැහැදිලිවම පෙනෙනවා ඇති. එදා ඩී. එස්. සේනානායක මැතිතුමාගේ ඉඩම් ප්‍රතිපත්තියට එකඟ නොවූ අය පවා අද ඒ ප්‍රතිපත්තිය උසස් කොට සැලකීම අපේ සතුටට කාරණයක්. අතිරේක ආහාර ද්‍රව්‍ය වගා කිරීම පිණිස සමහර වෙළඳ සමාගම්වලට ඉඩම් දීම සම්බන්ධයෙන් මේ ප්‍රචාරය ගෙනයන බව තමුන්නාන්සේ දන්නවා ඇති. මොකක්ද අප කර ඇති යෝජනාව? ගම් පළල් කිරීමෙ යෝජනා ක්‍රමයට අවශ්‍ය නොවන, ජනපද ඇති කිරීමෙ වැඩ පිළිවෙළට අවශ්‍ය නොවන, ප්‍රධාන වගාවන් සඳහා නොයොදවන ඉඩම්; අවුරුදු 25 කට වැඩි සීමා සහිත කාලයකට බදු ඔප්පුවක් පිට වෙළඳ සමාගම්වලට දීමේ වැඩ පිළිවෙළක්, මේය. මෙම ඉඩම් මිරිස්, බොම්බයි ලූණු ආදී අතිරේක ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහායි, යොදවන්නෙ. නමුත් මොකක්ද පෙන්නුම් කරන්න වෑයම් කරන්නෙ? ඉඩම් ප්‍රතිපත්තිය වෙනස් කර—ඒ කියන්නෙ දුප්පත් ගොවීන්ට ඉඩම් දීම, ජනපද පිහිටුවීම, ගම් පුළුල් කිරීමෙ යෝජනා ක්‍රමය අනුව කටයුතු කිරීම, යනාදි වැඩ පිළිවෙළවල් සම්පූර්ණයෙන් නැති කර—කොම්පැණිවලට රජයේ ඉඩම් දෙන්න යනවාය කියන බොරු ප්‍රචාරයක් ගෙන යනව. මෙම වාර්තාවෙ පැහැදිලි කර දී තිබෙනව අතිරේක ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා අපේ ගැමි ජනතාවගෙ එතරම් උනන්දුවක් නැති බව. ඒක ඇත්ත. ඒ මොකද? රුපියල් 12 සහතික වී මිල ක්‍රමයක් එහෙම තියෙන නිසා, ඒ විධියෙ ගොවිතැන් වැඩවලට නිරත වීම වැඩියෙන් ලාබ ලැබෙන දෙයක් හැටියට කල්පනා කරන හෙයින් මේ රටේ ගැමි ජනතාව අතිරේක ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට වැඩි උනන්දුවක් දක්වන්නෙ නැති බව තමුන්නාන්සේ දන්නව. නමුත් අතිරේක ආහාර සඳහා අපේ රටේ ජාතික ධනයෙන් කොතරම් කොටසක් පිටරටවලට යවනවද කියන එක මෙම අයවැය ලේඛන වාර්තාවෙ සඳහන් කර තිබෙනව. ඒ සඳහා විශාල ධනස්කන්ධයක් වෙන් කරන්න සිදු වී තිබෙනව, විදේශ විනිමයෙන්.

ඊයෙ කථා කළ එක්තරා මන්ත්‍රීවරයෙක් කීව වාගෙ, දැනට අතිරේක ආහාර ද්‍රව්‍ය වගා වී තිබෙන ආකාරය ගැන සොයා බලන විට අවුරුද්දට අක්කර 100 ක් පමණයි, වගා වී තිබෙන බව කියන්ට පුළුවන් වන්නෙ. අවශ්‍යතාවය අනුව අක්කර තිස් දහසක්වත් වගා කරන්ට ඕනෑ. ඒ කාර්ය සඳහා අවුරුදු 300 ක් ගත වන බව ඒ මන්ත්‍රීතුමාත් ආණ්ඩුව වෙනුවෙන් ප්‍රකාශ කළා. ඒ තත්ත්වයට අප මුහුණ දෙන්නෙ කොහොමද? ඒ සඳහා එක වැඩ පිළිවෙළයි, අනුගමනය කරන්න තිබුණෙ. එනම්, අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

ගම් පුළුල් කිරීමෙ වැඩ පිළිවෙළට අවශ්‍ය නොවන, ජනපද පිහිටුවීමෙ වැඩ පිළිවෙළට අවශ්‍ය නොවන, ඉඩම් ඉක්මන් ක්‍රමයකට අතිරේක ආහාර නිෂ්පාදනය සඳහා යෙද වීම ඉතාමත්ම අවශ්‍ය බව අපට පෙනී ගියා. සමහර අතිරේක ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය යම් විධියක දැනුමක් හා පළපුරුද්දක් ඇතුව කළ යුතුව තිබෙනව. එම නිසා ඒ වෙනුවෙන් අර විධියෙ ක්‍රමයක් ඇති කළාම සමහරවිට අපේ ජනතාවටත් ඒ මගින් අභ්‍යාශයක් ලබා ගන්න පුළුවනි. ඒ වැඩ පිළිවෙළ මීට පෙරත් මෙම සභාවට ඉදිරිපත් කර තිබෙනව. දොම්පෙ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) 1961-62 වර්ෂයෙ අයවැය ලේඛන කථාව කරද්දි මේ ප්‍රතිපත්තිය ගැන ප්‍රකාශ කළා. එදා නම්, "මෙම වැඩ පිළිවෙළ අපේ ඉඩම් ප්‍රතිපත්තිය නැති කර දමා එක එක කොටස්වලට ඒ ඉඩම් පාවා දීමේ වැයමක් "ය කියා කිසි වෙක් කීවෙ නැහැ. මා ළඟ තිබෙනව එතුමා කළ කථාවෙන් කොටසක්. හැන්සාඩ් වාර්තාවෙන් උපුටා ගත් පරිදි එම කොටස මෙසේයි :

"Even as much as we are prepared to encourage every form of genuine industrial enterprise with favourable incentives, we shall give every encouragement to large investors, who are prepared to open farms or new lands under paddy and other subsidiary food crops."—[OFFICIAL REPORT, 27th July 1961; Vol. 43, c. 945].

ඒ ප්‍රතිපත්තිය හරි. ඒකෙ කිසි වරදක් නැහැ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

එදා තමුන්නාන්සෙල ඒක හොඳයි කීවෙ නැහැ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

කිසි විරුද්ධයක් වුණේ නැහැ. තමුන්නාන්සෙ එදා මෙම ප්‍රතිපත්තිය ප්‍රකාශ කළ දවසෙ පළවූ හැන්සාඩ් වාර්තාව මා කියවා බැලුව. එදා විරුද්ධ පාර්ශ්වයෙ සිටි, අද ආණ්ඩු පක්ෂයෙ සිටින එක්කෙනෙක් වත් විරුද්ධ වෙලා නැහැ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

පිළිතුරු දෙන විට මම පෙන්වන්නම්.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ඒක සත්‍යයක්. අද තමුන්නාන්සේලා ඒ ප්‍රතිපත්තියට විරුද්ධ ව්‍යාපාරයක් ගෙන යනව. Subsidiary food crops—ආහාර ද්‍රව්‍ය පමණක් නොවෙයි, තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළට මේ කොටසත් ඇතුළත් වෙනව: "To open farms or new lands under paddy and other subsidiary food crops." අපේ ප්‍රතිපත්තියේ එහෙම දෙයක් නැහැ. මෙවැනි දේවල් කියාපාමින් සම්පූර්ණයෙන් කලින් තිබුණු ඉඩම් ප්‍රතිපත්තිය අහෝසි කර ලොකු කොම්පැනිවලට ඉඩම් පාවාදීමේ වැඩ පිළිවෙලක් අපි ගෙන යනවා යයි බොරු ප්‍රචාරයක් ගෙන යනව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයට යුතුකමක් තිබෙනව, ආණ්ඩුවේ වැඩ පිළිවෙළේ යම් වරදක් තිබෙනව නම් විවේචනය කරන්ට. ඒ විවේචනය බොරු එකක් වුණොත්, කවදාවත් ඊට ආයුෂ නැති බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. අපි පැහැදිලි කරන්ට ඕනෑ, ඩී. එස්. සේනානායක මහත්මයා මේ රටේ ඇති කළ ඉඩම් ප්‍රතිපත්තිය වඩාත් තහවුරු කරමින් අපි ඉදිරියට ගෙන ගියා පමණක් නොව, මේ රටේ දුප්පත් ජනතාවට ඇති ඒ ඉඩම් පිළිබඳ අයිතිවාසිකම් නැති කරන්ට කිසිදු දෙයක් මේ රජයෙන් කෙරී නැති බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අයවැය වාර්තාව සම්බන්ධයෙන් කෙරුණු ඇතැම් කථා ගැන කල්පනා කරන විට පෙනී යනව, ඇතැම් උදවියට මේ ආණ්ඩුව පිහිටුවූ අවස්ථාවේදී මේ රට තිබුණේ මොන විධියේ තත්ත්වයක්ද යන්න අමතක වී තිබෙන බව. හුඟක් දුරටම ඒක අමතක වී තිබෙනව. පසුගිය ආණ්ඩුව පරාජයට පත් වන අවස්ථාවේ රටේ තිබුණු භයානක ආර්ථික පරිහානිය අද බොහෝ දෙනෙකුට අමතක වී තිබෙනව. යම් යම් අවශ්‍ය දේවල් ලබා ගන්ට තිබුණු අමාරුව,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හිරිහැරය, කරදරය අද බොහෝ දෙනෙකුට අමතක වී තිබෙනව. නමුත් නාන්සෙ දන්නව, අද උදේ කාලයේ හපුතලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා.) කථා කරන විට හිටපු මුදල් ඇමතිවරයෙකු වූ කලක් වෙළඳ ඇමතිවරයා වශයෙනුත් සිටි ඉලංගරත්න මහත්මයාට විශේෂ ප්‍රශංසාවක් කළා. මා කියන්ට කැමතියි, මේ රටේ හුඟක් දුරටම පාරිභෝගිකයාගේ තත්ත්වය අවුල් වියවුල් කරන්නට හිටපු වෙළඳ ඇමතිවරයාගේ වැඩ පිළිවෙළ හේතු වුණා කියා.

කුමක්ද එදා තිබුණු තත්ත්වය? යම් දෙයක් ගන්ට ඕනෑ වුණාම පාවිච්චියට ගෙන අවසාන වූ දේ ගෙන යන්ට සිද්ධ වුණා. බැටරියක් ගන්ට පරණ බැටරි කැල්ල ගෙන යන්ටත්, බයිසිකල් ටයරයක් ගන්ට වුවමනා වූ විට පරණ ටයරයක් ගෙන යන්ටත් සිද්ධ වුණා. ඒ විධියේ තත්ත්වයක් එකල තිබුණා. පසුගිය මාස 5 තුළ ඒ තත්ත්වය හොඳ අතට වෙනස් වී තිබෙන බව ඒ ගරු මන්ත්‍රීවරු පිළිගන්නවාට සැකයක් නැහැ. තමන්ගේ නිවසේ පොළොව ටිකක් කැඩී තිබෙනව නම් එය හදාගන්න සිමෙන්ති රාත්තලක් දෙකක් ගන්ට බැරි තත්ත්වයක් එදා තිබුණේ. එකල ඊට අවසර පත්‍රයක් ගන්ට වුවමනා වුණා. එමෙන්ම ඒ අවසර පත්‍රය ගැනීම බොහොම අමාරු වැඩක්ව තිබුණා. අවසර පත්‍රයක් ලබා ගැනීමට ග්‍රාම සේවකයා එක්ක එන්ට ඕනෑ. ඔහු කැඩුණු තැන් බලා ආදායම් පාලක නිලධාරියාට රපෝර්තු කරන්ට ඕනෑ. ඊට පසු එය ඔහු ආණ්ඩුවේ ඒජන්තතුමාට යවනව. එතැනින් අවසර ලැබුණොත් තමයි, සතොසෙන් සිමෙන්ති රාත්තලක් ලබා ගන්ට පුළුවන් වුණේ. ඒ අවසර පත්‍රය ලැබී සිමෙන්ති රාත්තල ලබාගන්න විට කැඩී තිබෙන ප්‍රමාණය වැඩි වෙලා. දැන් සමහර ගරු මන්ත්‍රීවරුන් ඒ ඔක්කොම මතක නැති කර දමා කතා කරන බව පෙනෙන්නට තිබෙනවා.

ඊළඟට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද කෙරීගෙන යන තවත් විශේෂ ප්‍රචාරයක් නම්, විදේශ ආධාරවලට යට කර අපේ රට වික්කාය යන්නයි. මෙම ගරු සභාව තුළදීත් ඒ ගැන බොහොම තදින් කරුණු කියවුණා. මෙම සභාවෙන් පිටතදීත් ඒ සම්බන්ධව අද විශේෂ විවේචන ඇති වී තිබෙනවා. මා ඉතාමත් පුදුම වන්නේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමාම (ආචාර්ය එන්. එම්. පෙරේරා) මේ රට විකුණන කතාව කීම ගැනයි. විදේශ ආධාර නැතිව කවදාවත් මේ අමාරුකම්වලින් ගොඩ එන්නට බැරිය කියා මෙම ගරු සභාව තුළදීම මේ අවුරුද්දේදී ම—අප ආණ්ඩුව පිහිටෙව්වටත් පසුව—යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කියා තිබෙනවා. 1965 අප්‍රේල් මාසයේ 23 වැනි දා යටියන්තොට ගරු මන්ත්‍රී තුමා මෙන්න මෙහෙම කියා තිබෙනවා.

"අට මාසයක් මුදල් ඇමති වශයෙන් සිටි නිසා මට කියන්නට පුළුවන්, මුදල් අමාරුකම් තිබෙන්නෙ ලබන අවුරුද්දෙ නොවෙයි, මේ අවුරුද්දෙයි. විදේශ විනිමය අමාරුකම් තිබෙනවා. අපට ඒවාට මුහුණ පාන්නට සිදු වන්නෙ ඉදිරි හය මාසය තුළයි. පිටින් මුදල් ලබා නොගෙන ඒ අමාරුකම් වලින් බේරෙන්නෙ බැහැ. එම නිසා තමයි මා වැයම් කළේ ලෝක බැංකුවේ නියෝජිත පිරිසක් මෙහි ඇවිත් සාකච්ඡා කර කරුණු පහදා දී ඔප්පු කර මෙන්න මේ කාලයේදී සෑහෙන ආධාරයක් ලබා දෙන්නය කියා අවුරුදු 30ක 40ක ආධාරයක්, ක්‍රමානුකූලව අපේ විනිමය ආධාර කැපෙන්න. ඒ විධියේ වැඩ පිළිවෙලක් යොදා ගත්තේ නැත්නම් කවදාවත් අද තිබෙන ප්‍රශ්නවලින් මේ ආණ්ඩුවට ගොඩ වන්නට පුළුවන්ය කියා මා විශ්වාස කරන්නෙ නෑ."

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා රාජාසන කථාව පිළිබඳ විවාදයේදී 1965 අප්‍රේල් මාසයේ 23 වැනි දා කියු සැටියි ඒ. මුදල් ඇමතිව සිටි නිසා එතුමා එය දන්නවා. ඒ නිසාලු එතුමා ලෝක බැංකුවට ආරාධනා කර නියෝජිත පිරිසක් මෙහි ගෙන්වා ගන්නට වැයම් කළේ. නමුත් අද එතුමා මොකක්ද කියන්නෙ? අප මේ රට විදේශවලට—ඇමෙරිකාව, ජර්මනිය, කැනඩාව, මහා බ්‍රිතාන්‍ය ආදී අපට ආධාර කළ රටවලට—වික්කලු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් තවත් තර්කයක් ඉදිරිපත් කරන යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කියනවා, විදේශ ආධාර ගන්නට ගියොත් කවදාවත් අපේ ස්වාධීනත්වය රැක ගන්නට බැරි වෙනව ලු. එය එසේද කියා මම අහනවා. ලෝකයේ නොයෙක් රටවල් විශේෂයෙන්ම දියුණුවෙන් අඩු රටවල්, ස්වොත්සාහයෙන් දියුණුවන්නට තරම් ශක්තියක් නැති රටවල් ජාතික ධන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

නිදාන ස්වභාවික ධන නිදාන නොමැති රටවල්, දියුණු තත්ත්වයකට පත් වී සිටින්නේ ඒවාට උදවු කරන්නට පුළුවන් රටවලින් උදවු ආධාර ලබාගෙන බව තමුන්නාන්සේට පෙනී යනවා ඇති. විරුද්ධ—පක්ෂය—විශෙෂයෙන්ම සමසමාජ පක්ෂයත් කොමියුනිස්ට් පක්ෂයත්—සමාජවාදී රටවල් වශයෙන් පිළිගන්නා පෝලන්තය, යුගෝස්ලාවියාව, එක්සත් අරාබි ජනරජය, ඉන්දියාව ආදී මේ රටවල් විදේශාධාර ලබාගෙන නැද්ද කියා මම අහනවා. ලබාගෙන තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පෝලන්තය, යුගොස්ලාවියාව, ඉන්දුනීසියාව, "යුනයිටඩ් ඇරබ් රිපබ්ලික්" යනාදී රටවල් දෙස බලන විට අපට පෙනී යනවා, ඒ රටවල් නොයෙකුත් යෝජනාක්‍රම සඳහා නොයෙකුත් සංවර්ධන වැඩ පිළිවෙලවල් සඳහා ඇමරිකන් ආධාර ලබාගෙන තිබෙන බව. නමුත් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කියන හැටියට එවැනි ආධාර අප විසින් ලබා ගත්තොත් තමයි වරද. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමතිවරයා වශයෙන් සිටියදී ආධාර ගත්තානම් එහි වරදක් නැහැ. මේ ජාතික ආණ්ඩුවේ වන්නිනායක මුදල් ඇමතිතුමා ආධාර ලබා ගත්තොත් තමා වරද. මේ අනුව විරුද්ධ පැත්තේ ගරු මන්ත්‍රීවරුන් තමන්ගේ වාසියට යම් යම් තර්ක ඉදිරිපත් කළා මිස සාධාරණයක් යුක්තියක් නැතිව තර්ක ඉදිරිපත් නොකළ බව තමුන්නාන්සේට පෙනී යන්නට ඇති. දැනට මේ රජය පිහිටුවා ගත වී ඇත්තේ මාස 5යි. පසුගිය කාලයේදී මේ රටේ ඇති වූ නොයෙකුත් ප්‍රශ්නවලට සම්පූර්ණ පිළිතුරක් දෙන්නට මේ කාලය තුළ අපට පුළුවන්කමක් නොලැබුණු බව අප පිළිගන්නවා. මෙතරම් සුළු කාලයකදී එවැන්නක් බලාපොරොත්තු වීමත් වැරදියි. නමුත් රාජාසන කථාව මගින් මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අප පැහැදිලි ලෙස පෙන්වා දුන්නා. ඒ අතරම මෙම අයවැය ලේඛනය මගින් අපේ ක්‍රියා මාර්ගය පැහැදිලි ලෙස පෙන්වා දී තිබෙනවා.

පසුගිය මහා මැතිවරණයේදී එවකට පැවති ආණ්ඩුව පෙරලී ගියේ සාමාන්‍යයෙන් ආණ්ඩුවක් මාරුවන ආකාරයට නොවෙයි. පසුගිය මැතිවරණ සමයේදී ඒ්ගත වී තිබුණේ ඉතාමත්ම භයානක තත්ත්වයක් බව කාටත් මතක ඇති. එදා ප්‍රජාතන්ත්‍රවාදයට තර්ජනයක් එල්ල වී තිබුණා. එවැනි අවස්ථාවක ආණ්ඩු පෙරළියක් ඇති කොට බලයට පත් වූ මේ ජාතික ආණ්ඩුවට පැවරී තිබෙන ප්‍රධාන කර්තව්‍යය නම් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම බව අප පිළිගන්නවා. පසුගිය රජය සිය රාජ්‍ය කාලයේ අවසාන යුගයේදී ප්‍රවෘත්ති පත්‍ර රාජසන්තක කරගෙන හැම ප්‍රචාරක මාර්ගයක්ම රජය අතට ගෙන මොන විධියේ ඒකාධිපති වැඩ පිළිවෙලක් ගෙන යෑමේ වෑයමක් තිබුණාද කියා තමුන්නාන්සේ හොඳින් දන්නවා ඇති. එදා හවුල් රජයේ පිරිස බලයෙන් මත් වී සිටියා. ඔවුන් මොන විධියේ හිතුවක්කාර වැඩ පිළිවෙලකට ලෑස්ති වී සිටියාද කියන එක අපට වඩා හොඳින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් සහ එදා ආණ්ඩුවේ සිටි උදවිය දන්න බවට සැකයක් නැහැ.

ඔවුන් බලයෙන් මත් වුණා. එදා පළිගැනීම, අයුක්තිය, අසාධාරණය, දූෂණය රජ කරවන්නට පටන් ගත්තා. කවදාවකවත් පරාජය කරන්නට බැරි පිරිසක් හැටියටයි, ඔවුන් කථා කෙළේ. එදා සිටි අගමැතිණිය සහිරා විද්‍යාලයේදී ප්‍රකාශ කෙළේ තමන් පාලනය කරන්නට කිසිම කෙනකු නැති බවයි. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් යටතේ ඒ විධියේ ප්‍රකාශවලට ඉඩක් තිබෙනවා යයි මා හිතන්නේ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් යටතේ පාලකයන් පාලනය කිරීමට තමන්ට හැකි බව පසුගිය මහා මැතිවරණයේදී මේ රටේ ජනතාව පෙන්වා දුන්නා. මේ රජය තුළ සිටින පිරිස වුණත් බලයෙන් මත් වී කාටවත් තමන් පාලනය කරන්නට බැරි යයි සිතාගෙන කටයුතු කරනවා නම් එය ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙලට එකඟය කියා හෝ ප්‍රඥගෝචරය කියා හෝ පිළිගත නොහැකියි. ඒ නිසා බලය ලැබුණු වහාම, ආණ්ඩුව පිහිටු වූ වහාම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කිරීමේ වැඩ පිළිවෙල ස්ථිර කිරීම සඳහා ක්‍රියා කිරීමට අපට සිදු වුණා. මේ නිසා අද කාටත් සැනසුම් සුසුම් හෙළන්නට පුළුවන් තත්ත්වයක් මේ රටේ පවතිනවා. අද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඕනෑම කෙනකුට රජය විවේචනය කරන්නට පුළුවනි. ඕනෑම කෙනකුට පුවත් පත් මුද්‍රණය කරන්නට පුළුවනි. නමුත් එදා නම්, තිබුණු පුවත්පත් ටිකත් ආණ්ඩුවට ගන්නට ක්‍රියා කළා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ලංකා ගමනාගමන මණ්ඩලයෙ බස්වලින් ඒවා ගෙන යන්න පමණක් බැහැ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ඇයි නැත්තෙ? ජාතික පුවත්පත් ගෙන යාමේ නිදහස අදත් තිබෙනව.

**පී. ජී. බී. කෙනමන් මයා.** (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)
*(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)*
(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

"ඩේලි නිවුස්" වැනි පත්තර ගෙන යන්න නම් අදත් ඉඩකඩ තියෙනව.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ඔව්, ජාතික පුවත්පත් ගෙන යන්න එදත් ඉඩකඩ තිබුණා, අදත් තිබෙනව.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

ලේක් හවුස් ආයතනයෙ පත්තරත්, ටයිම්ස් ආයතනයෙ පත්තරත් බස්වලින් ගෙන යන්ට පුළුවනි.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ජාතික පුවත්පත්වලට අදත් නිදහස තිබෙනව.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ඔය කියන පත්තරවලට නම් ඒ නිදහස එදත් තිබුණා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

මා තමුන්නාන්සෙට කියන්න කැමතියි, අපට ඒ වැදගත් කර්තව්‍යය කරන්නට සිද්ධ වුණු බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය අවුරුදු නවය තුළ මේ රට මත කඩා වැටුණු භයානක උවදුර හෙවත් පිළිලය නම් අපේ ජාතික සමගිය නැතිවීම බව තමුන්නාන්සේ දන්නව. නොයෙකුත් හේතු උඩ අපේ රට දෙකට තුනට බෙදුණු බව තමුන්නාන්සේත් දන්නව. අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (අනිල් මුණසිංහ මයා.) එතුමගෙ කථාව කරගෙන යද්දී කිව්වා, මොනම සංවර්ධන වැඩ පිළිවෙළක්වත් රටේ දියුණුව පිණිස ක්‍රියාත්මක කරන්නට බැරිය කියා, ජාතික සමගියත්, සාමූහික වගකීම පිළිබඳ යථාවබෝධයත් ජනතාව තුළ නැත්නම්. ජාතීන් අතර අන්‍යෝන්‍ය විශ්වාසයත් නැත්නම් සංවර්ධනයක් ඇති කරන්නට බැරි බව එතුමා එතුමගෙ කථාවෙන් පැහැදිලි ලෙස කිව්වා. ඒක සම්පූර්ණ ඇත්ත. අප පාලනය භාර ගන්න විට මේ රටේ ජාතීන් අතර මොන විධියේ සැකයක්, අමනාපයක් සහ අසමගියක් තිබුණාද යන්න තමුන්නාන්සේ දන්නව. ඒ අවස්ථාව වන විට මේ රටේ කොයි විධියේ කණගාටුදායක තත්ත්වයක් තිබුණේදැයි කීවොත් එවකට රටේ පාලනය භාරගෙන සිටි, බලතල දරාගෙන සිටි, නිලතල උසුලමින් සිටි ඇතැම් ගරු මැති ඇමතිවරුන්ට —ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන්ට— මේ රටේ යම් යම් කොට්ඨාශවලට ගමන් බිමන් යන්නට පවා බැරි තත්ත්වයක් තිබුණු බව කවුරුත් දන්නව. විශේෂයෙන්ම ලංකාවේ උතුරටත්, නැගෙනහිර ප්‍රදේශයටත් යන්නට බැරි තත්ත්වයක් ඒ කාලයේ තිබුණා. එය කිසි සේත් සතුටුදායක තත්ත්වයක් නම් නොවන බව නොපිළිගන්න කෙනෙක් ඇත කියා මා කල්පනා කරන්නෙ නැහැ. එය ඉතා භයානක තත්ත්වයක් බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. ඒ නිසා එවකට මේ රටේ ජාතීන් අතර බල පාමින් තිබුණු ඒ සැකය, අමනාපය සහ අසමගිය නැති කර නියම් සමගිය, මනාපභාවය සහ විශ්වාසය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

තහවුරු කර ගැනීම අත්‍යවශ්‍ය බව අපේ ගරු අග්‍රාමාත්‍යතුමා කල්පනා කළ බව කියන්නට සතුටුයි. මේ ආණ්ඩුව පිහිටුවනු ලැබීමෙන් පසු එකී සැකයත්, අමනාපයත්, අසමගියත් නැති වී ගොස් මුළු ලංකාවෙම සිටින පුරවැසියන් නියම සහෝදරයින් මෙන් එක්සත්ව අත්වැල් බැඳ ගෙන ක්‍රියා කරන්නට පටන් ගත් බව කියන්නේ බලවත් සන්තෝෂයකිනුයි. ගත වූ මේ පස් මාසය තුළ එවැනි තත්ත්වයකට මේ රට පමුණුවාලන්නට අපේ ගරු නායකයාණන්ගේ ප්‍රමුඛත්වයෙන් පුළුවන් වුණාය කියන්නට කැමතියි. ඒ සේවය නිසා එතුමට මුළු රටම ණයගැති විය යුතුව තිබෙනව.

ඒ කොයි හැටි වෙතත් අද මේ සම්බන්ධයෙන් වෙනත් ආකාරයක විශේෂ ප්‍රචාරයක් දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමාගේ (ආර්. ජී. සේනානායක මයා.) නායකත්වයෙන්, ප්‍රධානත්වයෙන්, රට පුරා ගෙන යනු ලබන බව තමුන්නාන්සේට පෙනී යන්නට ඇති. එම විශේෂ ප්‍රචාරයෙන් කියන්නෙ මේ ආණ්ඩුව භාෂාව පාවා දුන්නාය, ද්‍රවිඩ ජනතාවට රට පාවා දුන්නාය, යනාදි කරුණුයි. කා එක්කද මේ ප්‍රචාර ගෙන යන්නෙ? ලංකා සමසමාජ පක්ෂයත් එක්කයි මෙවැනි ප්‍රචාර ගෙන යන්නෙ. එහෙත් අපේ මේ ආණ්ඩුව පැහැදිලි ලෙස ප්‍රකාශ කර තිබෙනවා, සිංහල භාෂා පණත සහ දෙමළ භාෂාව පිළිබඳ විශේෂ විධිවිධාන පනත යටතේ අපේ භාෂා ප්‍රතිපත්තිය ගෙන යනවා මිස ඉන් පිටස්තර කිසිම දෙයක් කරන්නෙ නැති බව. ඒ කාරණය අප පැහැදිලිවම මේ රටට ප්‍රකාශ කර තිබෙනව. ඒ අනුවයි අද මේ ආණ්ඩුව ක්‍රියා කරගෙන යන්නෙ. එහෙම කරද්දීත්, අද දඹදෙනියෙ ගරු මන්ත්‍රීතුමා වැනි උදවිය ඔය ලංකා සමසමාජ පක්ෂයත් සමග එකතු වෙලා ප්‍රචාරය කරගෙන යනව අප රට පාවා දෙනවය, භාෂාව පාවා දෙනවය, ආදි වශයෙන්. දඹදෙනියෙ ගරු මන්ත්‍රීතුමාගේ සැලකිල්ලට යොමු කරන්නට කැමතියි 1963 අවුරුද්දේ දී "යුනයිටඩ් ඒසියා" කියන සංග්‍රහයට විශේෂ ලිපියක් සපයමින් පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.)—ලංකා සම සමාජ පක්ෂයේ ලේකම් මහතා—ලියා තිබෙණ කාරණය කෙරෙහි. එහි මෙන්න මෙසේ සඳහන් කර තිබෙනව:

"The Lanka Sama Samaja Party declare that both Sinhalese and Tamil should be the State languages in Ceylon. The attempt to make Sinhalese the only State language in Ceylon in the face of the opposition of the Tamil—speaking minority is unwise, unjust and is not in any way an attempt that can be carried out in practice."

අන්න එතුමා කළ ප්‍රකාශය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දෙගොල්ලන්ම අත්වැල් බැඳගෙන බොරු ප්‍රචාරයක යෙදෙනව. මොකක්ද මේ බොරු ප්‍රචාරය? අපි භාෂා ප්‍රතිපත්තිය පාවා දුන්නාය කියනව. නැහැ, අද අපි එකක් කර තිබෙනව. මඩකලපුවේ පළමු වන ගරු මන්ත්‍රීතුමා මේ ගරු සභාවේදී කළ වැදගත් ප්‍රකාශයෙන්ම ඒ බව තමුන්නාන්සේට පැහැදිළි වන්න ඇති. එතුමා මොකක්ද කීවේ? අපි දැන් මේ ජාතික ආණ්ඩුවට සම්බන්ධ වෙලා එකට වැඩ කරගෙන යනවාය, ජාතික ආණ්ඩුව ඇති කරගෙන තිබෙන ක්‍රියා මාර්ගය ගැන අපේ ප්‍රසාදයක් තියෙනවාය, ඒ වැඩ පිළිවෙළ හරියාකාර ඉෂ්ට වෙනවාට සැකයක් නැත; මේ විධියට සාධාරණ අන්දමින් මේ රජය ක්‍රියා කරගෙන ගියොත් අපේ ෆේඩරල් ඉල්ලීම් ඉවත් කර ගැනීමට අපි ලෑස්තිය කියා ඊයේ එතුමා ප්‍රකාශ කළා. මොකක්ද මේකෙන් පැහැදිළි වන්නෙ? මේ රටේ සුළු ජාතිකයන් අතර විශාල විශ්වාසයක් ඇති කරන්නට මේ රජයට අද පුළුවන්කම ලැබී තිබෙන බව මෙයින් ඉතා පැහැදිළි ලෙස පෙනී යන බව මම ප්‍රකාශ කරන්න සතුටුයි. එය සතුටුදායක දෙයක් නොවෙයිද?

අපේ දඹදෙණියේ මන්ත්‍රීතුමාට පුළුවන් වුනාද, ලංකා සමසමාජ පක්ෂයේ මාක්ස්වාදී ප්‍රතිපත්ති වෙනස් කරවන්ට? [බාධා කිරීමක්] බොහොම සන්තෝෂයි. ඒක කවදාවත් කරන්න පුළුවන් දෙයකුත් නොවෙයි. දඹදෙනියේ මන්ත්‍රීතුමා වැනි උදවිය අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නැවතත් සම්බන්ධ වී මේ රටේ නවත් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් තහවුරු කරන්නට ක්‍රියා කිරීම ගැන අපේ විශේෂ ප්‍රසාදය පළ කරන්නට ඕනෑ. නමුත් මා දඹදෙනියේ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ගරු මන්ත්‍රීතුමාට කියන්නට සතුටුයි, ඒ මන්ත්‍රීතුමා කෙරෙහි වැඩි විශ්වාසයක් නැති බව. ඒ මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ යම් තත්ත්වයකට පත් වුනොත් ඒ පක්ෂය නැති කර දමාවීය කියා ඒ මන්ත්‍රීතුමා කෙරෙහි බොහොම ලොකු අකැමැත්තක් තියෙනව. 1964 අගෝස්තු මස 14 වැනිදා, දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමා මේ සභා ගැබට එන විට යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කීවේ මොකක්ද? එතුමා කීවෙ මෙහෙමයි:

"There comes the political *kehetha* of this country, the man who has tried to ruin every political party of this country . . . ."

මා කියපු දෙයක් නොවෙයි, මේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමයි, මෙහෙම කීවෙ. අපි එහෙම කියන්නෙ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කා වැදී තිබෙන මාක්ස්වාදී උවදුර ඉවත් කොට එය ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් බවට පත් කරන්නය කියා අපි එතුමාට ආරාධනා කරනව. ඒ මන්ද? ප්‍රජාතන්ත්‍රවාදී විරුද්ධ පක්ෂයක් ඉතාමත් අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට අපට මුහුණ පාන්නට සිදු වූ ඉතාම වැදගත් ප්‍රශ්නය අල්ලස හා දූෂණයයි. පසුගිය කාලයේදී අල්ලස හා දූෂණය මොන තරම් තදින් මහජන ජීවිතයට ඇතුළු වී තිබුනද කීවොත්, එදා හිටපු ආණ්ඩු පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු පවා අමනාප වී ඉවත් වී ගියා. දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමා ඉවත් වුනෙත් අල්ලස් සම්බන්ධයෙන් නියම ක්‍රියා මාර්ගයක් එදා ආණ්ඩුව ගත්තේ නැත කියායි. මේ රටේ අල්ලස හා දූෂණය නැති කිරීම පිණිස පසුගිය අවුරුදු 9 තුළ ගත් ක්‍රියා මාර්ගය කුමක්ද කියා මම විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් අහනව. අල්ලසට අනුබල දුන්නා විනා වෙන මොකක්ද කළේ? ඉහළම තැන සිට පහළම තැන දක්වා අල්ලස මහජන ජීවිතයට කා වැදීගෙන යද්දී එදා ආණ්ඩුව නිසොල්මන්ව සිටියා; නිශ්ශබ්දව සිටියා. කිසිම ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ. මේ රජය බලයට පත් වූ වහාම ඉදිරිපත් කළ පනත්වලින් අල්ලස් පනත ප්‍රධාන වූ බව තමුන්නාන්සේල පිළිගන්නවා ඇති. එපමණක් නොවෙයි, තල්ගොඩපිටිය අල්ලස් කොමිෂන් සභාවෙන් වැරදිකරුවන් වූ අයට දඬුවම් දීමේ පනතක් වැඩි කල් යන්ට පෙර මේ සභාව ඉදිරියට පත් වන බව ප්‍රකාශ කරන්ට සතුටුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ සංවර්ධනය පිණිස පළාත් පාලන ආයතන මගින් විශේෂ සේවයක් සිදු විය යුතුව තිබෙන බව මගේ කථාව අවසාන කරන්නට මත්තෙන් මා කියන්නට කැමතියි. විශේෂයෙන් පළාත් පාලනය සම්බන්ධයෙන් සැහෙන ව්‍යාප්තියක් ඇති වීම පිණිස වැඩ පිළිවෙළක් ඇති වී නැති බව මේ සවල්ප කාලය තුළදී—මේ මාස 5ක කාලය තුළදී—මට පෙනී ගොස් තිබෙනව. විශේෂයෙන්ම අපේ ගම්බද ග්‍රාමීය පාලනය භාරව තිබෙන ගම්කාරිය සභා, සුළු නගර සභා, පළාත් ආණ්ඩු සභා වැනි ආයතනවලට නියමිත මුදල්වලින් ඒ ප්‍රදේශවල සංවර්ධන වැඩ පිළිවෙළවල් ගෙන යන්නට පුළුවන් කමක් නැති බව අපට පැහැදිලිව පෙනී ගියා. විශේෂයෙන්ම අපේ රට සාමූහිකව ගෙන, නැත්නම් පොදුවේ ගෙන, සංවර්ධනයක් ඇති කරන්න නම් අපේ පළාත් පාලන ආයතන මගින් ඒ සංවර්ධන වැඩ පිළිවෙළ සිදු කළ යුතුව තිබෙනව. ග්‍රාමීය කර්මාන්ත ව්‍යාප්තිය පිණිස යම් වැඩ පිළිවෙළක් ඇති කිරීමට ජලය සහ විදුලිය අවශ්‍ය බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. අපේ රටේ කොතරම් ඇළ දොළ ගංගා ආදිය ගලා ගියත් අපේ රටේ වැසියන්ට පාවිච්චියට අවශ්‍ය පිරිසිදු ජලය තවමත් ලබා ගන්නට බැරි තරමට අමාරු තත්ත්වයක තිබෙන බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. විශේෂයෙන්ම අපේ ගම්වල දියුණුව උඩ රටේ දියුණුව රඳා පවතිනව. ගම් සංවර්ධනය කළ ප්‍රමාණයට අපේ රටේ පොදු දියුණුව රඳී තිබෙන බව මේ රජය පිළිගෙන තිබෙනව. ඒ නිසා විදුලියත් ජලයත් පිළිබඳ පහසුකම් අපේ රට පුරාම ඇති කොට අපේ පළාත් පාලන ආයතන මාර්ගයෙන් ඒ සංවර්ධනය ඇති කරන්නට අපි වැඩ පිළිවෙළක් සකස් කර ගෙන යනවා.

මේ අවස්ථාවේදී මීට වඩා කථා කිරීමට මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය ආරම්භය පමණයි. ජාතික රජයට සම්බන්ධ වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

සිටින නොයෙක් පක්ෂවල නායකයින්ගේ කල්පනාව අද මේ රට වැටී තිබෙන දුක්ඛිත තත්ත්වයෙන් ගොඩ ගැනීමයි. රැකීරක්ෂා නැතිව පීඩා විඳින මේ රටේ ජනතාවට, විශේෂයෙන්ම දහ අටේ ඡන්ද බලය ලබා ගෙන අපේ බලය පිහිටුවීමට විශේෂ ධෛර්යයකින් ක්‍රියා කළ පිරිසට—අනාගත බලාපොරොත්තුව වන මේ රටේ තරුණ පරම්පරාවට—සුදුසු රැකියා සඳහා පුහුණු කිරීමට සවිර වැඩ පිළිවෙළක් අවශ්‍ය බව තමුන්නාන්සේ පිළිගෙන තිබෙනව. ඒ විධියට මේ රටේ අනාගත සෞභාග්‍යය ඇති කරන්නට මේ රජය හැම උත්සාහයක්ම ගන්නා බව ප්‍රකාශ කරමින් මගේ වචන සවල්පය අවසාන කරනව.

අ. භා. 4.25

**ආර්. ජී. සේනානායක මයා.** (දඹදෙණිය)
(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)
(Mr. R. G. Senanayake—Dambadeniya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමු වැනි වරට මේ අයවැය ලේඛනය ඉදිරිපත් කළ මගේ හිතවත් වන්නිනායක මුදල් ඇමතිතුමාට මා ප්‍රශංසා කරන්න ඕනෑ. කවුරුත් පිළිගන්නවා, එතුමා බොහොම හොඳ කෙනෙක්. එතුමාට කවුරුත් ගරු කරනවා. එමෙන්ම මගේ ඉතාමත්ම හිත මිත්‍ර කෙනෙක්. එමෙන්ම යම් වැඩකට බහින විට මහන්සි දරා ගෙන බොහොම කල්පනාවෙන් වැඩ කරන කෙනෙක් හැටියටත්, ලංකාවේ නැනක් දිනාගත් කෙනෙක් හැටියටත් අපි කවුරුත් එතුමාට ගරු කරනව. එහෙත්, එතුමා කොයිතරම් මහන්සි දැරුවත්, කොතරම් කරුණු සොයා ගත්තත්, කොතරම් දුරට අවංකභාවය තිබුණත්, එතුමා ගමන් කරන මාර්ගය නියම මාර්ගය නොවේ නම් එයින් ප්‍රතිඵලයක් ලබා ගන්නට බැරි බව කවුරුත් පිළිගන්න ඕනෑ. එතුමා මුදල් ඇමති තුමා වශයෙන් පත් කර තිබෙන්නේ, 1952 දී තිබුණු ඒ පරණ එක්සත් ජාතික පක්ෂයේ මුදල් ඇමති කෙනෙකු හැටියටමය කියන එක කියන්න ඕනෑ. ඒ පරණ එක්සත් ජාතික පක්ෂයේ මුදල් ඇමති කෙනෙක් කල්පනා කරන්නේ කොහොමද, අන්න ඒ පරණ ප්‍රතිපත්තියම පරණ න්‍යායම අදත් මේ අයවැය ලේඛනයෙන් මතු වන ලකුණු තිබෙනවා. එම නිසා එදා තිබුණු දුර්වලකම් මෙදාත් මතු වන ලකුණු තිබෙන බව මා කියන්න කැමතියි.

ප්‍රථමයෙන්ම රටේ සංවර්ධනයක් ඇති කිරීම සම්බන්ධව මේ ආණ්ඩුව තුළ ලොකු බලාපොරොත්තුවක් තිබෙන බව ප්‍රකාශ කළා. අයවැය ලේඛනය ඉදිරිපත් කරන විටත් ඒක නිතර නිතර කියවුණා. එපමණක් නොවෙයි. පුදුමාකාර විධියේ හවුලක් ඇති කර මේ ආණ්ඩුව පිහිටුවා ගත්තෙත් සංවර්ධනයක් ඇති කිරීමේ පරමාර්ථය නිසාමය කියා කියනව. ජාතික ප්‍රශ්න උඩ භේද වන විට පොදු දියුණුවක් ඇති කරන්නට අමාරුය, ඒ නිසා අපට සියළු දෙනාගේම සහයෝගය ලැබුණොත් ඒ සංවර්ධන පරමාර්ථය උඩ වැඩ කර ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් වෙනවාය යන හැඟීමයි මේ ආණ්ඩුව පිහිටුවන විට ජනතාව තුළ ඇති කළේ. මේ ආණ්ඩුවේ ප්‍රධානීන් අතර තිබෙන හැඟීමත් ඒකමයි. කොටස් වශයෙන් කල්පනා නොකර, අප අතර තිබෙන වාදභේද අමතක කර සියළු දෙනාම එකතුවී මේ රටේ සංවර්ධනයක් ඇති කරන්නට වුවමනාය කිව්ව. සිංහලකම අමතක කරමු. බෞද්ධකම අමතක කරමු. අපේ මූලික පරමාර්ථය එනම් රට සංවර්ධනය කරා ගමන් කරවමු, යන අදහස අනුවයි හත් හවුලක් ඇති කරල මේ සුළු ජාතික ආණ්ඩුව පිහිටෙව්වෙ. එසේ නම් දැන් මේ පිරිස කථා කරන්නෙ ඒ සංවර්ධනය කිරීමේ පරමාර්ථය අනුවමද? මේ පිරිස දැන් කුමක්ද කරන්නෙ? මේ. ගැන අපි ටිකක් දුරට කල්පනා කර බලමු.

මේ කොටස් එකතු වන විටම මා එදා කියා සිටියා, මේ එකතු වන්නේ පොදු මහ ජනතාවගේ යහපතකටවත් රටේ සංවර්ධනයක් ඇති කරන්නටවත් නොවෙයි, තම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සලකා ගෙනමය කියා. මේ එකතුවන්නේ තම තමාගේ කොටස කඩා ගැනීමේ අදහසින් විනා රටේ අනාගත දියුණුව සලකාගෙන නොවේය කියා මා එදා ප්‍රකාශ කළා. මා එදා ප්‍රකාශ කළ අදහස් දූන් ක්‍රම ක්‍රමයෙන් පැහැදිලි වේගන යනව. අද මේ අයවැය ලේඛනය සකස් කර තිබෙන්නෙ. ආඩි හත් දෙනා කැඳ හැළිය සෑදූ ආකාරයටයි. ආඩි හත් දෙනා කැඳ හැළියට කළ හරිය තමුන්නාන්සේලා දන්නවා. කැඳ හදනකොට හැම දෙනාගෙන්ම උදව්පදව් බලාපොරොත්තු වුනා හැම දෙනාම හාල් මිටක් දමයි කියන බලාපොරොත්තුව හැම දෙනා තුළම තිබුණා. නමුත් මේ ආඩි ටික එකතුවී අර විධියට කැඳ ගැන බලාපොරොත්තුවක් නැතිව හැම දෙනාම තම තමාගේ කොටස බලාගන්නයි අදහස් කරන්නෙ. එහෙම නැත්නම් ඇයි මේ කැඳ හැළියට රොඩු දමන්නෙ ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් බලන්න මේ කැඳ හැළියට දමා තිබෙන රොඩු. සංවර්ධනයක් උදෙසා ගමන් කරනවා නම්, ෆේඩරල් පක්ෂයේ නායකතුමකු වන මේ ආණ්ඩුවේ පළාත් පාලන ඇමතිතුමාට යුතුකමක් තිබෙනවාද භාෂා ප්‍රශ්නය අවුස්සන්න ? භාෂා ප්‍රශ්නය විශාල භේදයක් මතු කරන ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය මතු කරගෙන මේ ආණ්ඩුවෙන් යම්කිසි කොටසක් කඩා ගන්නට තැත් කරනවා නම් ඒක අර කැඳ හැළියට රොඩු දැමීමක් නොවෙයිද ? ජූලි මාසයේ 8 වැනි දා වන්නියසිංහම් චතුරශ්‍රයෙහි, මාවිට්ට පුරම් කියන නගරයෙහිදී පළාත් පාලන ඇමතිතුමා කළ ප්‍රකාශයක් දැන් මා මේ කියවන්නෙ :

"First of all they have agreed to make Tamil the language of administration in the Northern and Eastern Provinces. They will in addition grant rights of the Tamil-speaking persons in the rest of Ceylon to transact their business with the Government in Tamil. We have agreed to accept this as a settlement for the time being without abandoning our main aim of parity as a lasting solution to our problem."

ඇමතිවරයා මේ ප්‍රකාශය කර තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ මූලික පරමාර්ථවලට අනුකූලවද ? නැගෙනහිර සහ උතුරේ පාලන භාෂාව විය යුත්තේ දෙමළ පමණයි කියායි එතුමා ප්‍රකාශ කර තිබෙන්නෙ. මේ ප්‍රශ්නය මතු කරන්නේ ඇමති මණ්ඩලයේ සිටින වැදගත් ඇමතිවරයෙක්.

සංවර්ධනය පරමාර්ථය වශයෙන් තබාගෙන යන මේ ගමනේදී මෙවැනි ප්‍රකාශවලින් උපකාරයක් වෙනවාද ? කවදාවත් වෙන්නේ නැති බව පිළිගත යුතුයි. උතුරේ සහ නැගෙනහිර පාලන භාෂාව දෙමළ පමණයයි හංගන්නේ නැතිව ප්‍රසිද්ධියේම කියනවා. ලංකාවේ ඉතිරි ප්‍රදේශවල දෙමළ භාෂාවට නිසි තැන දෙනවලු. දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා සිංහල පමණක්ය යන ප්‍රතිපත්තිය පිළිගත් මේ අගමැතිතුමාගේ අමාත්‍ය බලමණ්ඩලයේ ඇමතිවරයෙක් මෙවැනි ප්‍රකාශ කරන විට අගමැතිතුමා මේ පිළිබඳව ගන්නා ස්ථිර පියවර කුමක්දැයි රටට ප්‍රකාශ කළ යුතුයි. දෙම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) මේ පිළිබඳව ප්‍රශ්නයක් ඇසූ විට වෙල්වනායගම් මහත්මයා මොනවා කිව්වත් අපේ පරණ ප්‍රතිපත්තිය වෙනස් වූයේ නැත කියා උත්තර දුන්නා. එහෙම කියා නිදහස් වෙන්න පුළුවන්ද ? ඇමති මණ්ඩලයේ එක්තරා වගකීමක් තිබෙන්න වුවමනා නේද ? පිටුපස සිටින මන්ත්‍රීවරයෙක් නම් මෙවැනි ප්‍රකාශ කළත් කමක් නැහැ. නමුත් රටේ වගකීමක් දරන ඇමතිවරයෙක්, පළාත් පාලන ඇමතිවරයා, කියනවා නම්, රජයේ භාෂා ප්‍රතිපත්තිය උතුරේත් නැගෙනහිරේත් දෙමළ භාෂාව පමණක්ය, ලංකාවේ ඉතිරි ප්‍රදේශවල භාෂා දෙකම භාවිතා කරනවාය කියා, ඒ පිළිබඳව අපේ සැලකිල්ල යොමු විය යුතුයි. එතකොට ලංකාවේ කොතනකවත් තනිකර සිංහල ඇත්තේ නැහැ. නමුත් උතුරේත්, නැගෙනහිරෙත් තනිකර දෙමළ. මේකද, සංවර්ධනය සඳහා එකතු වූ ආඩි හත් දෙනාගේ වැඩ පිළිවෙල ? ඒ එක ආඩියෙක් කොටසක් කඩාගන්නට වැයම් කරන ආකාරයයි.

අනික් ආඩියා අපේ තොන්ඩමන් සහෝදරයායි. එතුමා මොකක්ද කියන්නේ ? එතුමා මේ ආණ්ඩුවට එකතුවෙලා සිටිනවා, ආධාර උපකාර දීම පිණිස. පෞද්ගලික ප්‍රශ්න පැත්තකට දමා රටේ සංවර්ධනය සඳහා එකතු වුණායයි කියනවා. නමුත් සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාත්මක කරන්නේ සතුටින් යන අය පමණක් පිටත් කිරීමෙන්යයි කියනවා. එවකට අගමැතිව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිටි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය දිල්ලි නගරයේ සිට මේ ගිවිසුම අත්සන් කිරීමට මත්තෙන් එවකට විරුද්ධ පාර්ශ්වයේ නායකයාව සිටි ඩඩ්ලි සේනානායක මහත්මයාට ටෙලිෆෝන් කර මේ ආකාරයට ගිවිසුම ඇති කරගෙන තිබෙනවාය, ඊට විරුද්ධත්වයක් තිබෙනවාද කියා ඇසුවා. එදා අගමැතිණිය විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාගේ අවසරය ලබාගෙනයි, ඒ ගිවිසුම අත්සන් කළේ. එතුමාත් මේ ගිවිසුම පිළිගත්තා. එහෙම නම් මේ ආණ්ඩුවේ සිටින හත්වන ආඩියා කියන්නේ කොහොමද, සතුටින් යන පිරිස පමණයි යවන්නේ, කියා ? ඔන්න ඒ ආඩියාත් මේ කැඳ හැලියට රොඩු මිටක් දැම්මා. හත් හවුලේ කැඳ හැලිය සෑදීමට හාල් මිට දැමීමට මේ ආඩි හත්දෙනා එකමුතු වුනත් දැනටම ආඩි දෙන්නෙක් මේ කැඳ හැලියට රොඩු මිටවල් දෙකක් දමා තිබෙනවා. එහෙම නම් මේ සංවර්ධනය සඳහා ඇති කර ගත්තායයි කියන කැඳ හැලියට මොනවා වේද ?

සංවර්ධනය ඇති කිරීමට මූලික කරුණු කිහිපයක් සම්බන්ධ වෙනවා. පෞද්ගලික අංශයෙන් සංවර්ධනයක් බලාපොරොත්තු වෙනවා නම් එක්තරා වාතාවරණයක් ඇති කරන්න වුවමනායි. ආණ්ඩුවෙන් සංවර්ධනය ඇති කරනවා නම් එවැනි වාතාවරණයක් අවශ්‍ය වන්නේ නැහැ. නමුත් මහජනතාව පෞද්ගලික අංශය සංවර්ධනය සඳහා එකතු කර ගන්න වුවමනා නම්, ඒ සඳහා ඔවුන්ගෙ උපකාරය ලබා ගන්න උවමනා නම්, ඔවුන්ට අවශ්‍ය කරන පරිසරය හරි ගස්සන්න ඕනෑ. එය කළ විටයි, මුදල් යොදවන්නෙ. එවැනි පරිසරයක් නොමැති නම්, කොතරම් ආණ්ඩුවලින් ආධාර උපකාර කළත්, මුදල් දුන්නත්, බදු අඩු කළත්, ඉඩම් දුන්නත් හරියන්නෙ නැහැ. පෞද්ගලික අංශයෙ පරිසරය සම්පූර්ණ නැති නම් යෝග්‍ය නැතිනම් සුදුසු නැති නම් කොතරම් සහන දුන්නත් ප්‍රතිඵල නැහැ. ඒ බවට පෙන්වන්න ඕනෑ තරම් සාක්ෂි තිබෙනව.

ඩී. එස්. සේනානායක යුගයෙ—නිදහස ලබා ගත්තට පසුව—කර්මාන්ත සංවර්ධනයක් ඇති කිරීමට පුළුවන් තරම් පුද්ගලයන්ට ආධාර දුන්න; ගොවිතැන් කිරීමට ආධාර දුන්න. නමුත් එය සිදු වුණේ නැහැ. මොකද සිදු නොවන්න හේතුව ? බදු බර නිසාද ? ඒ කාලෙ ගෙවන්න තිබුණෙ ආදායම් බද්ද පමණයි. ඒ ඉතාම සුළු බරක්. නමුත් බදු බරින් මිරිකී සිටින නිසා මුදල් ඇති අයට එවැනි කටයුතු සඳහා යෙදෙන්න බැරිකමක් ඒ කාලෙ තිබුණය කියන්න බැහැ. ඒ කාලෙ සල්ලි තිබුණ, අවස්ථාව තිබුණ. නමුත් පුද්ගලයන් ඉදිරිපත්වී කර්මාන්ත පටන් නොගත්තෙ ඇයි ? නිදහස ලැබුණට මොකද කාර්මිකයට, වෙළෙන්දට පුද්ගලික සංවර්ධන කටයුතු කිරීම සඳහා ඒ කාලෙ තිබුණු සංවර්ධන පරිසරය, වාතාවරණය සුදුසු නැති වුණා ; එමනිසා එවැනි කටයුතුවලට මුදල් යෙදුවෙ නැහැ. එහෙයින් ඩී. එස්. සේනානායක උන්නැහෙගෙ අතට ගන්න සිදු වුණා, සංවර්ධන ක්‍රමය. එසේ අරගෙන, ආණ්ඩුව මගින් පමණක් සංවර්ධනය ඇති කළා.

ඒ කාලෙ පෞද්ගලික ආයතනවලින් කිසිවක් කෙරුණු බවක් පෙනෙන්නෙ නැහැ. ගොවිතැන් අංශයෙන් වේවා, කර්මාන්ත අංශයෙන් වේවා, බදු බරක් නැති යුගය කදී පවා මුදල් යොදවන්න පුද්ගලයන් ඇස්තිවුණේ නැහැ. ඒ කාලෙ ඉතිහාසය ගැන බලන විට සම්පූර්ණයෙන්ම රජයෙන් කළ කොටස පමණයි, එතුමට පෙන්වන්න තිබුණේ. එය බොහොම වැදගත් සංවර්ධන කොටසක් බව පිළිගන්න ඕනෑ. විශෙෂයෙන් ගොවිතැන් අංශයෙන් විශාල කොටසක් කර තිබුණ. ඒ කාලෙ තමයි, ගිරිතලේ වැව බැන්දෙ. ඒවගෙ පරාක්‍රම සමුද්‍රය, ඇලහැර, මිනිපෙ, නුවරවැව ව්‍යාපාරය, බත්මැඩිල්ල, දේවහුව, ගල්ඔය, කන්තලේ වැව, වලවේ ව්‍යාපාරය, හුරුලු වැව යනාදී දේ කළෙත් ඒ කාලෙ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

ඔව කළේ පරාක්‍රම බාහු රජ්ජුරුවොද, සී. පී. ද සිල්වා මහත්මයාද ?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

ඩී. එස්. සේනානායක යුගයෙ රජයෙන් කෙරුණු සංවර්ධන කොටස එසේ පෙන්වන්න පුළුවනි. එසේම කර්මාන්ත අංශය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැන කියන්න තියෙන්නෙත්, රජයෙන් කළ කොටස ගැන පමණයි. සිමෙන්ති කම්හල, පරන්තන් ගි ලවන කම්හල, වාලච්චේනෙහියි කඩදාසි කම්හල, සීදුවෙ තෙල් කම්හල, ලෙදර් fපැක්ටරිය, ප්ලයිවුඩ් කම්හල රජයෙන් කෙරුණු හරියයි. මෙවැනි දේ සඳහා පුද්ගලයන් තමන්ගෙ මුදල් යෙදෙව්වෙ නැහැ. බදු බරක් නැති කාල යෙදි තමන්ට හිමි මුදල් තමන්ගෙ රටේ සංවර්ධනය සඳහා නොයෙදවූ බව හිතේ තියාගන්න ඕනැ. ඒ කාලෙ කරදර රාශියක් තිබුණා. සමහරවිට පුද්ගලයන්ට නියම විධියට සංවර්ධන කටයුතුවල යෙදෙන්ට බැරි හේතු තිබුණා. එකක් නම්, නිදහස ලැබුණු විගසම මේ රටේ සිටි සුද්දන් කල්පනා කළේ රට සංවර්ධනය කරන්ට නොවෙයි; පුළුවන් තරම් ඉක්මණින් රට හැර පැන යන්ටයි. "අපේ පාලනයෙන් රට ගැලවුණා, උඹලගෙ පාලනය අපට වුවමනා නැත" කියා මේ රටේ සිටි සුදු වෙළඳ ව්‍යාපාරිකයන් හා කාර්මිකයන් තමන්ගේ කොටස් විකුණා සල්ලිත් අරගෙන පැන ගිය බව අප කවුරු කවුරුත් දන්නව. කර්මාන්ත දියුණුවට අවහිරයක් වශයෙන් තවත් කාරණයක් තිබුණා. අප නිදහස ලබන අවස්ථාවේදී මෙරට සතුව විශාල විදේශ විනිමය මුදලක් තිබුණා. යුද්ධයෙන් පසු එය අපට බේරුම් කර දෙන්ට එංගලන්ත ආණ්ඩුවට සෑහෙන කාලයක් ගත වුණා. ඔවුන් අවුරුදු පතා කොටස් වශයෙනුයි, ඒ මුදල් අපට නිදහස් කර දුන්නෙ. අපිම හම්බ කර ගත් මුදල්, යුද්ධයෙන් පසු එංගලන්ත ආණ්ඩුවට එකවර ගෙවන්ට බැරි වූ නිසා, අපට වුවමනා හැටියට විදේශ විනිමය අත දිග හැර වියදම් කරන්ට පුළුවන් කමක් තිබුණේ නැහැ. එම නිසා කාර්මිකයන්ට පිටරටින් අවශ්‍ය බඩු ගෙන්වීමට අත දිග හැර විනිමය මුදල් දෙන්ට ලංකා ආණ්ඩුවට පුළුවන්කමක් තිබුණේ නැහැ. කාර්මිකයන්ට උපකාර කරන්ට අවස්ථාව තිබුණේ නැහැ.

මුළු බටහිර ලෝකයම යුද්ධයෙන් වැනසී තිබුණු ඒ කාලය යන්ත්‍ර, උපකරණ ආදිය ලබා ගන්ට පුළුවන් කාලයක් නොවෙයි. ඒ යුගය ඒ රටවල් තම රටවල කර්මාන්ත ශාලා හදා ගන්ට මහන්සි ගත් යුගයක් මිස අපට කර්මාන්තශාලා සාදා දෙන්ට ලැහැස්තිව සිටි යුගයක් නොවෙයි. එමෙන්ම ඒ කාලයේ විශේෂඥයින් පිට රටවලින් ලබා ගන්ට පුළුවන් කාලයක් නොවෙයි. මේ රටේ කර්මාන්ත දියුණුවක් ඇති නොවීමට ඒවාත් හේතු වශයෙන් දක්වන්ට පුළුවනි. අනික් කාරණය එතුමාගේ මුළු කාලය තුළදීම තුච්ඡුවකවත් විදේශ ආධාර ලැබුණේ නැහැ. එතුමාගේ කාලයේදී ඒ කරදර තිබුණා. පෞද්ගලික අංශය කර්මාන්ත වලට උනන්දු නොවන නිසා සංවර්ධනය කළ යුත්තේ රජයෙන්ම බව ඩී. එස්. සේනානායක අගමැතිතුමා අදහස් කළා.

නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයේ පාලන කාලය කොටස් දෙකකට බෙදා පෙන්වන්ට පුළුවන්. ඩී. එස්. සේනානායක මහත්මයාගේ යුගය එකක්. ඉන් පසු යුගය තවත් එකක්. ඩී. එස්. සේනානායක මහත්මයාගේ කාලයේදී කිසිම විදේශ ආධාරයක් ලැබුණේ නැහැ. එතුමාගෙන් පසු ඩඩ්ලි සේනානායක මහත්මයා අගමැති වුණා. ඒ කාලයේ මුදල් ඇමති වශයෙන් සිටියේ ජේ. ආර්. ජයවර්ධන මහත්මයා නිසා එය ජේ. ආර්. ජයවර්ධන යුගය යයි කිව්වට වරදක් නැතැයි මා කල්පනා කරනව. ඩී. එස්. සේනානායක මහත්මයාගේ යුගයේදී තිබුණු අවහිර කිසිවක් ජේ. ආර්. ජයවර්ධන යුගයෙදී තිබුණේ නැහැ. ඒ වනවිට විදේශ විනිමය අරමුදල නිදහස් කර තිබුණ නිසා ඕනෑ තරම් මුදල් තිබුණා. යන්ත්‍රෝපකරණ ලබා ගන්ට පුළුවන්කම තිබුණා. විශේෂඥයින් පිටරටවලින් ලබා ගන්ට පහසුකම් තිබුණා. එහෙත් නියෝජ්‍ය කථානායකතුමනි, 1952න් පසු—අද මේ රට සංවර්ධනය කරන්ට කථා කරන ආණ්ඩුව—රට සංවර්ධනය කරන්ට පියවර ගත්තද? එසේ නම් කළ සංවර්ධනය කුමක් ද?

ආණ්ඩුව මගින් හෝ වේවා පෞද්ගලික අංශය මගින් හෝ වේවා ඒ කාලයේ කිසිම සංවර්ධන කටයුත්තක් නොකළ බව සඳහන් කරන්ට පුළුවන්. මොකද මුදල් හිඟයක් නිසාද? ඕනෑ තරම් මුදල් තිබුණා. විශේෂඥයින්ගේ හිඟයක් තිබුණා ද? ඕනෑ තරම් විශේෂඥයින් ගෙන්වා ගන්ට පුළුවන්කම තිබුණා. බදු බර පැටවී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

තිබුණද? සාමාන්‍ය ධනපති කොටසට මා හිතන්නෙ බොහොම ටිකයි, බදු ගෙවන්ට සිද්ධ වුණේ. එම නිසා මුදල් තිබෙන උදවියට ඒ මුදල් රට සංවර්ධනය කිරීමට යොදවන්ට ඉඩකඩ තිබුණා. යෙදුවද? නැහැ. හේතුව කුමක්ද? ඒ කාලයේ සිටි පඬිවරු හිතාගෙන හිටියේ පෞද්ගලික කර්මාන්තවලට යොදවන්ට නම් පුළුවන් තරම් විනිමය ආරක්ෂා කරන්ට ඕනෑ කියායි. විදේශ විනිමය ආරක්ෂා කිරීම විනා කර්මාන්ත දියුණුව ගැන හැඟීමක් තිබුණෙ නෑ. හාල් සේරුව ශත 25 ට දීගෙන එන විට විනිමය බැහැගෙන ගිය අන්දම අපට මතකයි. ඒ අවස්ථාවේදී හාල් සේරුවේ මිළ ශත 70 දක්වා වැඩි කරන්නට සිදු වුණු බව කවුරුත් දන්නවා. එසේ වීමට මූලික හේතුව කුමක්ද? මහ ජනයා අතේ වැඩිපුර මුදල් රැඳුනා. එසේ මුදල් වැඩිපුර තිබුණු නිසා රටට ගන්නට පුලුවන් ප්‍රමාණයටත් වඩා පිට රටවලින් බඩු ගෙන්නුවා. එසේ ගෙන්වන්නට ගෙන්වන්නට විනිමය බැහැගෙන යන්ට පටන් ගත්තා. එය ආරක්ෂා කිරීම පිණිස හාල් සේරුවේ මිළ ශත 70 දක්වා වැඩි කරන්නට සිදු වුණා.

ගරු නියෝජ්‍ය කථානායක තුමනි, කර්මාන්ත සංවර්ධනයක් ඇති කරන්නට වුවමනා නම් ධනවතුන්ගේ මුදල් ගැන නොවෙයි සැලකිය යුත්තේ. නිෂ්පාදන භාණ්ඩ ලබා ගැනීමට රටේ දුප්පත් ජනතාව අතේ සල්ලි තිබෙනවාද කියා බැලිය යුතුයි. භාණ්ඩවල අවශ්‍යතාවයක් ඇති වී තිබෙනවානම්, ඒවා ලබා ගන්නට පොදු ජනතාව පොහොසත්ව සිටිනවානම්, අන්න එවැනි අවස්ථාවකදී තමයි කර්මාන්ත දියුණු කරන්නට පුලුවන් වන්නෙ. මහජනතාව දුප්පත් නම් කොපමණ මෝල් ඇම්මත් වැඩක් නෑ. මන්ද? ජනතාවට ඒ නිපදවන දේ ලබා ගන්නට වත්කමක් නැහැ. කර්මාන්ත යුගයක් ඇති කරන්නට වුවමනානම් මහ ජනතාව අතට මුදල් ලැබෙන ක්‍රමයක් සකස් කරන්නට ඕනෑ.

දිවංගත ගරු බණ්ඩාරනායක මහත්මයාට මේ අදහස පෙනී ගොස් එතුමා ඒ අවස්ථාවේදී වැඩි වී තිබුණු හාල් මිළ ක්‍රමක්‍රමයෙන් අඩු කළා පමණක් නොව මහ ජනතාවගේ ආදායම් මාර්ග ක්‍රමක්‍රමයෙන් වැඩි කළා. පොදු ජනතාවගේ අතට පුලුවන් තරම් මුදල් ලැබෙන ක්‍රම සකස් කරන්නට උත්සාහ කළා. මහ ජනයා පොහොසත් වන්නට වන්නට, සීමාවක් දමා පිටින් එන බඩු ක්‍රමයෙන් නතර කළා. එවිට රටේ අවශ්‍යතාව උඩ කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය සම්පූර්ණ පරිසරය සකස් වුනා. කර්මාන්තයේ දියුණු තත්ත්වයක් ඇති කරන්නට නම් රටේ ජනතාවට මුදල් ශක්තිය ලබා දිය යුතු බව පැහැදිලි කරුණක්. මුදල් ශක්තිය ඇති වී භාණ්ඩයන්ගේ අවශ්‍යතාව ඇති වන විට පමණක් කාර්මිකයින්ට කියන්නට ඕනෑ නිෂ්පාදනය කරන්නට. කාර්මිකයින්ට ලාබ පෙනෙන අවස්ථාවක් ඇති වන විට ඔවුන් ඉබේම වාගේ නිෂ්පාදනයට උනන්දු වෙනවා. "ලාභ ප්‍රයෝජන තිබෙනවානම් තාප්ප බැඳලාවත් නතර කරන්නට බැරිය" කියන එක්තරා පෞද්ගලික හැඟීමක් තිබෙනවා. ලාභ පෙනෙන්නේ නැත්නම් කොයි තරම් බණ කිව්වත් ඒවා ඔවුන්ට ඇහෙන්නෙ නෑ. පුලුවන් තරම් අඩු මිළට මූලික ද්‍රව්‍ය සපයා එයින් තම ආදායම් මාර්ග ඇතිවන විධියේ පරිසරයක් මහජනයා ඉදිරියේ තිබෙන විධියට ක්‍රියා කළොත් පමණයි කාර්මිකයින් උසිගන්වන්නට පුලුවන් වන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායක තුමනි, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව තිබිය දී ජේ. ආර්. ජයවර්ධන මහතා මුදල් ඇමති වශයෙන් සිටි කාලයේදී ඇති වුණේ මේ විධියේ පරිසරයක් නොවෙයි. ඒ කාලයේදී, මහජනතාව අතේ විශාල වශයෙන් මුදල් තිබීම භයානක දෙයක් වශයෙන් සැලකුවා. මහජනතාවගේ අවශ්‍යතාවන් අනුව නිෂ්පාදනයන් නොකෙරුන නිසා පිටින් බඩු ගෙන්වන්නට සිදු වුණා. ඒ කාලයේදී මහජනයා දුප්පත් කරන ප්‍රතිපත්තියක් අනුගමනය කළා. ඒ බව ගරු අගමැති තුමාගේ කථාවකින් ඔප්පු කරන්නට මම අදහස් කරනවා. 1953 අගෝස්තු මාසයේ 5 වැනිදා හැන්සාඩ් වාර්තාවෙහි මෙසේ සඳහන් වෙනවා:

"By taking away the purchasing power we have reduced the overall Budget deficit. Because you have to pay more for your rice, you buy less of other things. Surely it must follow. Does any

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

hon. Member maintain that most of the people are going to buy the same quantity of rice at the increased price and at the same time buy the same quantity of other things that they purchase now? They must cut down on certain things. Therefore if extra money is spent in importing more rice, there will be less or other things imported. That is my argument in regard to this matter."—[OFFICIAL REPORT, 5th August, 1953; Vol. 14, cc. 1630-1.]

ආහාර මිල නැංගොත් අතේ තිබෙන මුදල් ඒ සඳහා වියදම් කරන්නට මහජනයාට සිදු වෙනවා. අතේ තිබෙන මුදල් වැය වී ගිය විට වෙනත් බඩු ගන්නට මහජනයාට පුළුවන්කමක් නැහැ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මහජනයා දුප්පත් වෙනවා. ආහාර මිළ නැංගොත් අතිරේක බඩු මිළදී ගැනීමට මහජනයාට ශක්තියක් නැති බව අමුතුවෙන් කියන්නට වුවමනා කරන්නේ නැහැ. මේ ධර්මය උඩයි, ශත 25 ට තිබුණු හාල් සේරුවක මිළ ශත 70 දක්වා වැඩි කෙළේ.

ඒ කාලයේ සංවර්ධනය ගැන කල්පනා කර බලමු. කළ වැඩක් පෙනෙන්නට නැහැ. ආණ්ඩුව විසින් සාදන ලද වැවක් නැහැ; කර්මාන්ත ශාලාවක් නැහැ. ඒ වගේම පෞද්ගලික අංශය මගින් සාදන ලද කර්මාන්ත ශාලා ආදියක් ගැන පෙනෙන්නටත් නැහැ. මේ වර ඉදිරිපත් කර තිබෙන අයවැය ලේඛනයත් එදා 1952 දී තිබුණු ප්‍රතිපත්තියම පදනම් කොට සකස් කර තිබෙන බව කියන්නට පුළුවනි. මේ අය වැය ලේඛනයෙහි තිබෙන්නේත් එදා පිළිගත් න්‍යායමයි. එදා ඒ න්‍යාය අනුව යමක් කරන්නට බැරි වුනා නම් මෙදාත් ඒ ප්‍රතිඵලයම ඇති වෙනවා නේද? [බාධා කිරීමක්] ඩී. එස්. සේනානායක යුගයේදී නම් කර්මාන්ත කීපයක්ම ආරම්භ කළා. Cement, Paranthan Chemicals, Valachchenai Paper Factory, Seeduwa Oil mills, Leather Factory, Plywood Factory යන මේ ඔක්කොම පටන් ගත්තේ ඩී. එස්. සේනානායක යුගයේදීයි.

රාජ්‍ය අංශය මගින් කර්මාන්තාදියක් කරන විට පරිසරය ගැන සලකන්නට වුවමනා නැහැ. වාතාවරණය ගැන සලකන්නට වුවමනා නැහැ. ඒවා ගැන සලකා බලන්නේ පෞද්ගලික අංශයයි. පෞද්ගලික අංශය සංවර්ධනය සඳහා යොදවන්නට වුවමනා නම් ඊට නිසි පරිසරයක් ඇති කරන්නට ඕනෑ. පෞද්ගලික අංශයෙන් මුදල් යෙදවෙන්නේ එතකොටයි. නමුත් එදා එවැනි පරිසරයක් සකස් කෙරුනෙ නැහැ. [බාධා කිරීමක්].

ඔව්, එදා සිටි කර්මාන්ත ඇමතිතුමා ආණ්ඩු පැත්තේ ඉදිරි පෙළේ ඉන්නවා. එතුමා එදා වැඩ කරගෙන ගියා තමයි. නමුත් මුල් ආරම්භය සිදු වුණේ ඩී. එස්. සේනානායක යුගයේදීයි. ඩඩ්ලි සේනානායක යුගයේදී රාජ්‍ය අංශය මගින් හෝ වේවා පෞද්ගලික අංශය මගින් හෝ වේවා ඇති කරන ලද කර්මාන්තයක් ගැන පෙනෙන්ට නැහැ. [බාධා කිරීමක්] ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව විසින් පටන් ගන්නා ලද කර්මාන්ත තිබෙනවා. නමුත් නාන්සේලාගේ කාලයේදී ඒවායින් ප්‍රතිඵල ලැබේවි. මා තරයේ මතක් කරන්නේ මේ රටේ යූ. ඇන්. පී. කර්මාන්තයක් ආරම්භ වුණා නම් එසේ ආරම්භ වුණේ ඩී. එස්. සේනානායක යුගයේ මිස ඩඩ්ලි සේනානායක යූ. එන් .පී. යුගයේදී නොවන බවයි. ප්‍රතිපත්තියේ වැරදිකම නිසා ඩඩ්ලි සේනානායක යුගයේදී රාජ්‍ය අංශයෙන් වේවා පෞද්ගලික අංශයෙන් වේවා කිසිම කර්මාන්තයක හෝ සංවර්ධනයක් ඇති වුණේ නැහැ.

වැඩිපුර සල්ලි තිබුනොත් බාහිර වශයෙන් නොයෙකුත් බඩුබාහිරාදිය ගන්නා නිසා එය වැළැක්වීම පිණිස ආහාර ද්‍රව්‍යවල මිළ නැංවීම එදා අනුගමනය කළ ධර්මයයි. ආහාරය සඳහා හැකි තාක් අඩුවෙන් වියදම් කර ඉතිරි මුදලට වෙනත් බඩු ගන්න යනව. වැඩි වැඩියෙන් බඩු ගන්න ගියාම බඩු තව තවත් පිට රටවලින් ගෙන්වන්න වෙනව. බඩු වැඩි වැඩියෙන් ගෙන්වන්න ගෙන්වන්න අපේ රටේ විදේශීය විනිමය පිරිහෙනව. ඒ නිසා විනිමය ආරක්ෂා කර ගන්න නම් බඩු ගෙන්වීම අඩු කරන්න ඕනෑ. බඩු ගෙන්වීම සීමා කරන්නට සිද්ධ වෙනව. ඒක එක ක්‍රමයක්. අනෙක් ක්‍රමය මෙයයි: ජනතාවගේ ආහාර මිළ වැඩි කළාම ඔවුන් ළඟ තිබෙන මුදලින් වැඩි කොටසක් යනවා ආහාර ගන්න. එතකොට වැඩිපුර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

මුදලක් අතේ ඉතිරි වෙන්නෙ නැහැ. අතිරේක මුදලක් අතේ ඉතිරි නොවන නිසා එම පුද්ගලයාට උසස් ජීවන තත්ත්වයක් අනුව ජීවත් වීමට වුව මනා කරන වෙනත් බඩු මිළයට ගන්න බැරි වෙනව. බඩු මිළයට ගන්න බැරි තත්ත්වයක් ඒ මගින් ඇති වුනොත් වැඩි පුර බඩු ගෙන්වන්න වුව මනා කරන්නෙ නැහැ. ඒ මාර්ගයෙන් වුණත් අපේ විනිමය ආරක්ෂා කරන්න පුළුවන් වෙනව. ආහාර ද්‍රව්‍යවල මිළ වැඩි කිරීමෙනුත් පිටින් එන බඩු ප්‍රමාණය අඩු කළ හැකියි. ඒ අදහස අනුවයි හාල් මිල වැඩි කළේ.

දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා අනුගමනය කළේ ඊට සම්පූර්ණයෙන් ප්‍රතිවිරුද්ධ වූ ප්‍රතිපත්තියක් බව කියන්න පුළුවනි. මහජනයා අතේ වැඩිපුර මුදල් තිබෙන්න ඕනෑ නිසා එතුමා එවකට තිබුණු හාල් මිළ ශත පහළේ සිට ශත තිස්පහ තෙක් අඩු කළා. එතුමා එයිනුත් නතර වුණේ නැහැ. පුළුවන් තරම් ණය මුදලුත් දුන්නා. මහජනතාවගේ පඩිත් වැඩි කළා. ඒ අන්දමට ක්‍රියා කිරීමෙන් සාමාන්‍ය ජනතාවගේ අතේ විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරිවන විධියේ වැඩ පිළිවෙළක් ඇති කළා. එසේ කිරීමෙන් පසු පිටරටවලින් එන බඩු සීමා කළා. ඒ ක්‍රමය ටික කාලයක් පවතින්නට ඉඩ හැරීමෙන් රට අභ්‍යන්තරයේ විශාල මුදල් තොගයක් ගැවසෙන්නට පටන් ගත්තා. මෙසේ වුනත් රටේ බඩු හිඟයක් ඇති වුනා. එවැනි පරිසරයක් තුළ එනම් රටේ මුදල් තිබෙන ප්‍රමාණයට බඩු නැති විට තමයි පෞද්ගලික කර්මාන්ත කරුවන්ට බඩු නිෂ්පාදනය කිරීමේ නිරතවීමට වැඩි වැඩියෙන් ඉඩ කඩ ලැබෙන්නෙ. එතකොට ලාබ ප්‍රයෝජනත් පෙනෙනව. කර්මාන්ත දියුණු කරන්න දියුණු කරන්න මේ රටේ බඩු හැදීම දියුණු වෙනව. බඩු හදන්න හදන්න බඩුවල තිබෙන හිඟය අඩු වෙනව. ඒ සමගම බඩු මිලත් අඩු වෙනව. එතකොට බඩු හිඟය නැති වෙනව. ඒ බව තමුන්නාන්සෙට මතක් කරන්න කැමතියි. එම නිසා මේ ආණ්ඩුවත් අර පරණ ප්‍රතිපත්තියමද අනුගමනය කරන්නෙ? එහෙම නැත්නම් දිවංගත බණ්ඩාරනායක උන්නැහෙගෙ ප්‍රතිපත්තියද අනුගමනය කරන්නෙ? මා ඒ ප්‍රශ්නය අහන්න කැමතියි.

පරණ ප්‍රතිපත්තියම නැවතත් වරක් අනුගමනය කරන්න සූදානම් වන බවක් මට පෙනී යනව. මන්ද, මේ පාර ලෝක බැංකුවෙන් උපදෙස් ගන්න ගිය අවස්ථාවේ ලැබුණු උපදෙස් අනුව ඒ විධියටයි අපට නිගමනය කරන්න සිද්ධ වෙලා තිබෙන්නෙ. "හාල් වෙනුවෙන් උඹලා වියදම් කරන මුදල බොහොම වැඩියි. උඹලට කන්න බොන්න ණය මුදල් දෙන්න බැහැ. මේ රටේ සාමාන්‍ය මිනිසාගේ මූලික ආහාරය වන හාල් මිළ වැඩි කරපන්. එතකොට අපි උඹලට ණය දෙන්න ලැස්තියි." ඒ කාලෙ, 1952 දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන පාලක වශයෙන් හිටපු ජෝන් එක්ස්ටර් මහත්මයා කිව්වෙ ශත 25 බැගින් තිබුණු හාල් සේරුවක මිළ ශත 75 කරපන් කියලයි. ඒ උපදෙස් අනුව වැඩ කරන්න ගිහිල්ලා තමයි එක්සත් ජාතික පක්ෂය විනාශ වුණේ. මෙදත් මේ ලෝක බැංකුව කියන්නේ "හාල් සේරුව ශත 25 බැගින් දෙන්ට බැහැ" කියලයි. "ඒක වැඩි කරපන් කියනව ලෝක බැංකුවෙන්. "ලෝකයේ පවතින මිළ ගණන් අනුව උඹලත් හාල් විකුණපල්ලා. ඊට අඩු මිළකට හාල් සපයන්ට එපා. ඒ කටයුත්ත එක පාරටම කරන්නට බැරි නම් උඹලා සුළු වශයෙන් දැන්වත් ඒ කටයුත්ත පටන් ගනිල්ලා. ශත පහ දහය බැගින්වත් මිළ නංගාපල්ලා. එතකොට ණය මුදල් දීම ගැන සලකා බලන්න අපි ලැස්තියි. එහෙම නොකරතොත් අපි මුදල් දෙන්නෙ නැහැ" කියලයි ඒ අය කියන්නෙ. ඒක මේ ආණ්ඩුව දන්නව. ඒ වුණාට ඔය පසුපස අසුන්වල ඉන්න ඇතැම් මන්ත්‍රීවරුන් නොදන්නවා ඇති. එතුමන්ලා නොදන්නවට මොකද ඉදිරිපස අසුන්වල ඉන්න අය දන්නවා. කන්න බොන්න කියල ඉල්ලුවට මුදලක් ණයට දෙන්නෙ නැහැ. "සංවර්ධන ව්‍යාපාරයක් සඳහා මුදල් යොදවනවා නම් පමණක් ණයට සල්ලි දෙන්න අපි ලැස්තියි" කියලයි ලෝක බැංකුව කියන්නෙ. "සංවර්ධන ව්‍යාපාරවල යෙදෙනවා නම් ඊට ඉස්සර වෙලා කළ යුත්තේ තමුන්නාන්සේලාගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආහාර මිළ නැංවීම තමයි" කියන තර්ජනය ඇතිවයි උපදෙස් දී තිබෙන්නෙ. දැන් ණය මුදල්වලින් කොටසක් දීල තියෙනව. හෙට අනිද්දා හාල් මිල ශත 5 ක් වත් වැඩි කරාවිය කියා දැන් බලාපොරොත්තුවෙන් ඉන්නව. වැඩි කරන්නෙ නැතිව බැහැ. තව ටික දවසක් යන විට තව ශත 5 ක් වැඩි කරනව.

**ගරු එම්. එච්. මොහමඩ් (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති)**
*(கௌரவ எம். எச். முகம்மது—தொழில், தொழில் காண், வீடமைப்பு அமைச்சர்)*
(The Hon. M. H. Mohamed—Minister of Labour, Employment and Housing)

I can assure the hon. Member that there will be no increase in the price of rice.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

මා මේ අවවාදයක් හැටියට කියන දෙයක් නොවෙයි. නමුත් තමුන්නාන්සෙලට ණය දෙන පිරිස ඔය අදහස කීවෙ නැද්ද?

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

දවල් හීනයක්.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

ලෝක බැංකුවෙන් ඒක කී බව කව්රුත් පිළිගන්න ඕනෑ. මේක ප්‍රසිද්ධියෙම කියන දෙයක්. හොඳයි, කීවෙ නැත්නම්, කමක් නැහැ. එහෙම කරයිද නැද්ද කියා වැඩි කල් යන්න පෙර බලන්න පුළුවන්. මේක පෙඩරල් පක්ෂය සමග තියෙන රහස් ගිවිසුම වගේ රහසෙ තියා ගන්න බැහැ. හාල් මිළ වැඩි කළොත් වැඩි කල් යන්න පෙර ඒක හෙළි වෙනව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

රහස් ගිවිසුමක් නැහැ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

අගමැතිතුමා ඒ ෆේඩරල් ගිවිසුම ගැන කියන්නෙ නැත්තෙ ඇයි? අපට අයිතිවාසිකමක් නැද්ද ඒ ගිවිසුම ගැන දැනගන්න? අපේ භාෂාවට, අපේ රටට බලපාන දෙයක් ගැන දැන ගන්න මන්ත්‍රීවරුන්ට අයිතියක් නැද්ද? රටට අයිතියක් නැද්ද? අගමැතිතුමා ගිවිසුමක් අත්සන් කරල තියෙන්නෙ මුළු රට වෙනුවෙන්. ඩඩ්ලි සේනානායක හැටියට නොවෙයි, අගමැති හැටියටයි, ඒ ගිවිසුම අත්සන් කරල තියෙන්නෙ. අගමැති හැටියට එතුමාගේ අත්සන මුළු රටටම හිමි දෙයක්. ඒ නිසා ඒ දෙදෙනා අතර තියෙන රහස් ගිවිසුම කුමක්ද කියා මුළු රටටම කියන්න ඕනෑ. ඩඩ්ලි සේනානායක සහ චෙල්වනායගම් දෙන්නා අතරේ ඕනෑ තරම් රහස් ගිවිසුම් තියෙන්න පුළුවන්. නමුත් අගමැතිතුමා අත්සන් කරන ගිවිසුම මුළු රටටම හිමි එකක්. අද ඒක රහසේ තියෙනව. නමුත් මේක රහසේ තියා ගන්න බැහැ.

අපට උදව් දෙන පිරිස ගැන වැඩි විශ්වාසයක් තියන්න එපා. හාල් හිඟයක් ඇති වූ අවස්ථාවේදී මේ පිරිසගේ උදව් ඉල්ලුවම ඒ උදවියගේ කොන්දේසි අනුව අපට ආධාර ලබා ගන්නය කියා තර්ජනය කළා. මා වෙළඳ ඇමති වශයෙන් සිටි නිසා මා දන්නව, තිබුණු තර්ජනය ගැන. එදා ඒ ආණ්ඩුව බේරා ගන්න පුළුවන් වුනේ මා අත්සන් කළ ගිවිසුම නිසයි. අපට කෝටි 40 ක වාසියක් ලැබුනා. ඒක තමුන්නාන්සේ දන්නව. (බාධා කිරීමක්) තමුන්නාන්සෙලා අද කන්නෙත් චීන හාල්. ඒ නිසා තමුන්නාන්සෙලට හැම විටම තර්ජනයක් ඇති වෙනව. ඒ තර්ජනය ඇති වන්නෙ, උදව් ගන්නට යන අවස්ථාවේදී උදව් දෙන පිරිස එය පුළුවන් තරම් තමන්ගේ දේශපාලන ප්‍රයෝජනයට යොදා ගන්නට උත්සාහ කරන නිසයි. ඇමෙරිකාවෙන් උදව් ගැනීම ගැන අද බොහොම දෙනා කථා කරනව. ඇමෙරිකාවෙන් උදව් ගන්න රටවල් බොහොම තියෙනව. යුද්ධය අවසාන වූ වහම ඇමෙරිකාව චියෙං කායි ෂෙක්ට උදව් දුන්නා. යුද්ධායුධ දුන්න; මුදල් දුන්න; උපදෙස් දුන්න. ඇමෙරිකාවෙන් නොකළ දෙයක් නැහැ,



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

චියෙං කායි ෂෙක් බලයට පත් කරන්න. නැපෝලියන් එල්බා දූපතේ රජ කළා වගේ අද චියෙං කායිෂෙක් ෆෝර්මෝසා දූපතේ ඉන්නවා. චියෙං කායි ෂෙක් ක්‍රිස්තියානි කාරයෙක්. ඒ කුරුසකාරයා, ඇමෙරිකන් කාරයන්ට කන් අදින තැනත්තා මුළු චීන යේම ජනතාවගේ නායකයෙක් හැටියට පිළිගනීවිද? කොමියුනිස්ට් කාරයන් නැති කරන්නට ඇමෙරිකන් කාරයා චීනයට ගියාම අවසානයේදී වුනේ මුළු චීනයම කොමියුනිස්ට් වීමයි. කොරියාවට ගියා උදව්වට. සිග්මන්රී නායකයා කර ගත්තා. සිග්මන්රීත් කුරුසකාරයෙක්. එතනත් වුනේ මොකක්ද? යුද්ධයක් ඇති වුනා. රට බෙදුනා. බාගයක් කොමියුනිස්ට් වුනා. ඉතිරි හරියට මක් වුනාද දන්නෙ නැහැ. වියට්නාමයට ගියා. උදව් කළා. මොකක්ද වෙලා තියෙන්නෙ? අද එතනත් ඇමෙරිකන් කාරයො පසු බසිනවා.

උදව් කරන්න බුරුමයට ගියා. උදව් කර රහස් ගිවිසුමක් ඇති කර එතන ෆේඩරල් ආණ්ඩුවක් ඇති කරන්නට උත්සාහයක් කළා. බුරුමයේ ආණ්ඩුව ඒ ගිවිසුම ඉරා දමා ඔවුනුත් පන්නලා දමල දැන් චීනයත් සමග මිත්‍ර ගිවිසුමක් අත්සන් කර තිබෙනවා. පකිස්ථානයට මුදල්වලින් උදව් කළා. අද පකිස්ථානය ඉන්නේ මොන පැත්තේද කියා අපි කල්පනා කරන්න ඕනෑ. මේ හැම දේකටම හේතුව රටට විරුද්ධව තමන් බලයේ තබන්නට වෑයම් කරන ආණ්ඩුව දක්කන්න වීරිය කිරීමයි. රටේ මහජනතාවගේ කැමැත්තට විරුඬව උදව් ගන්නා විට ඒ උදවියගේ ආධාර මුදල් නිසා ආණ්ඩුව දක්කන්න උත්සාහ කරනවා, රටේ මහජනතාවගේ අවසරයට විරුද්ධව. එය අවසාන වන්නේ සම්පූර්ණ යෙන්ම ඒ ආණ්ඩුව කඩා වැටී රට බලා පොරොත්තු නොවුණු දේවල් සිදු වෙලයි. බලන්න චීනයේ වුණු සිද්ධිය. බලන්න කොරියාවේ වුණු සිද්ධිය. බලන්න වියට් නාමයේ වුණු සිද්ධිය, බලන්න බුරුමයේ වුණු සිද්ධිය, බලන්න පකිස්ථානයේ වුණු සිද්ධිය, දැන් අපටත් එය එන ලකුණු තිබෙනවා. ආධාර ගන්නට ඕනෑ නම් අපි පුළුවන් තරම් ආධාර ගන්නට ඕනෑ රටේ ජනතාවගේ කැමත්ත අනුව, ඔවුන් පෙන්වන මාර්ගයේ ගමන් කිරීමෙනුයි. එහෙම නම්, විදේශ ආධාර මුදල් ගත්තාට කමක් නැහැ. එහෙත් විදේශික ආධාර මුදල්වලින් රටේ ජනතාව යන මාර්ගය වෙනස් කොට වෙනත් මාර්ගයක දක්කන්න හැදුවොත් වැඩේ වරදිනවා. වරදින තැන එතනයි. ඒ නිසා මේ ගැන ප්‍රවේසම්වී ඒ උදව් උපකාර ලබා ගන්නය කියා මා කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත දියුණුව සඳහා පෞද්ගලික කර්මාන්තකරුවන් උසිගැන්වීම සඳහා අපේ මුදල් ඇමතිතුමා විසින් විශාල වශයෙන් ධනය තිබෙන කොටස්වලට බදු බර අඩු කර තිබෙනවා. ධනය තිබෙන කොටස්වල බදු බර අඩු කළොත් රටේ සංවර්ධනය සඳහා ඒ උදවිය උපයෝගි කර ගන්න පුළුවන් වේය කියා ගරු මුදල් ඇමතිතුමාගේ හැඟීමක් තිබෙනවා. ඒ නිසා දුප්පත් ජනයාට දුන් සහනය දවසකට තඹ සල්ලියක්ය කියා කලින් කථා කළ අය කිව්වා. ඒවගේම පොහොසත් උදවියට දවසකට රන් පවුමක සහනයක් දුන් බවත් කියන්න සිදු වී තිබෙනවා. දුප්පතාට සල්ලියයි, පොහොසතාට රන් පවුමයි. ධනය හිමි අයට දෙන වැඩි ආධාරය නිසා ඒ මුදල රටේ සංවර්ධනයට යොදවාවිය කියා අදහස් තිබෙනවා. නමුත් සංවර්ධනය ඇති වන්නේ මා කලින් කී ආකාරයටයි. රටේ මුදල් තත්ත්වය වැඩි වී තිබෙනවා නම්, එක්තරා අවස්ථාවක මුදල් උද්ධමනය රටේ දියුණුවට උපකාරී වෙනවා. ඇතැම් අය කල්පනා කරනවා එය භයානක රෝගයක්ය කියා. "ඉන්ෆ්ලේෂන්" කියන්නේ "වාත රෝගයක්." නමුත් එයින් සීමා සහිතව ප්‍රයෝජන ගන්නවා නම් රටක් දියුණු කරන්නටත් එය අවශ්‍යයි. හැබැයි සීමා රහිතව උද්ධමනය දියුණු වී ගෙන ගියොත් මුදලේ වටිනාකම අන්තිමටම නැති වෙන්න පුළුවන්.

යුද්ධයෙන් පසු ජර්මනියේ මුදල්වල වටිනාකම කොපමණ පහතට බැස තිබුණාද කියනවා නම්, පාන් ගෙඩියක් ගන්නට මුදල් පෙට්ටියක් ඔසවාගෙන යන්නට සිදු වුණා. ඒ අන්දමට පත් වන්නට ඉඩ හැරීම භයානකයි. නමුත් සීමා සහිත උද්ධමනයක් ඇති වෙනවා නම්, ඒක ප්‍රයෝජනයි. මේ උද්ධමනය ඇති වන්නට හේතුව බඩු හිඟවී මිල වැඩිවීමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බඩු හිඟයක් ඇති කිරීම ඉතාමත් අවශ්‍ය දෙයක්. පිටරටවලින් ගෙන්වන බඩු හිඟ කරන විට මේ රටේ බඩු නිෂ්පාදනය වෙනව. මේ රටේ බඩු නිෂ්පාදනය වෙන්න වෙන්න කර්මාන්ත දියුණුවක් ඇති වෙනව. ඒ අතරම මහජනයාට රක්ෂාත් ලැබෙනව. අපේ සිරිමාවෝ බණ්ඩාරනායක රජයෙන් ඉෂ්ට කළේ අන්න ඒක තමයි. ඒ කාරණය ආඩම්බරයෙන් කිව යුතුව තිබෙනව. ඩඩ්ලි සේනානායක මහත්මයා ගේ ආණ්ඩුව කාලයේ මේ රටේ එක කර්මාන්ත ශාලාවක් තිබුණාය කියන්න පුළුවන්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිරිමාවෝ බණ්ඩාරනායක රජයෙන් කළ කර්මාන්ත දියුණුව මේ ලැයිස්තුවෙන් පෙනෙනව. මා දැන් එය කියවනව:

Breweries, bottled toddy, kerosene cookers, electrical accessories, electrical fans, electrical wires and cables and rubber covered cables, electrical motors, tractors, marine output motors, artificial leather, enamel hollow-ware, dehydrated vegetables, jams, marmalades, canned fish, spaghetti, footwear, spun and curled coir fibre, rubberized fibre, paints, industrial labels, printing of playing cards, polythene films, estate containers, metal and plastic torches, P.V.C. rigid pipes, umbrella ribs, brassieres, metal tubes, air conditioners, clocks, watches, carbon paper, fountain pens, socks, synthetic textiles, sewing machines, sand and emery paper, zip fasteners, cheese and butter, tooth paste, hair cream, talcum powder, baking powder, footstools, wire nails, bolts and nuts, barbed wire, motor vehicle accessories, delivery tricycles, dry cell radios, sheet glass, hair pins and clips, water pumps, corrugated cardboard, cotton and woollen carpets, nylon fishing nets, metal fittings, metal doors, asbestos cement corrugated sheets, metal toys, plastic Vynyl toys, brake linings, chocolates, cement building blocks, fibre suit cases, razor blades, antiseptics, glue, metal policy, terrazzo tiles, metal containers, accumulators, pane and sheet glass and glass bottles, and so on.

මේ සියළුම කර්මාන්ත ඇති කළේ සිරිමාවෝ බණ්ඩාරනායක රජයයි.

**ෆේස්ටස් පෙරේරා මයා.** (වෙන්නප්පුව)
(*திரு. பெஸ்றஸ் பெரோரா—வென்னப்புவ*)
(Mr. Festus Perera—Wennappuwa)
පගා කර්මාන්තය?

**ආර්. ජී. සේනානායක මයා.**
(*திரு. ஆர். ஜீ. சேனநாயக்க*)
(Mr. R. G. Senanayake)
පගා කර්මාන්ත ගැන කථා කරන්නට එපා. මාත් හිටිය යූ. එන්. පී. එකේ. මම දන්නව උන්නැහෙල කළ හරිය. අපිට ඒව හොඳට මතකයි. තමුන්නාන්සේලා දන් මේ වීසා බද්ද නැති කර තිබෙනව. වීසා බද්ද නැති කර තිබෙන්නේ මක් නිසාද? ඊට එකම පරමාර්ථයක් තිබෙනව. ඒ මොකක්ද? පක්ෂයට මුදල් සොයන්නයි. [බාධා කිරීම්] මට මතකයි; තමාගේ පාස්පෝට් එක දික් කර ගන්න නම් ඒ කාලෙ රුපියල් 15,000 ක් දෙන්න ඕන: රුපියල් 5,000 ක් තෝල්කයාට; රුපියල් 10,000 ක් පක්ෂයට. එක්සත් ජාතික පක්ෂයේ අරමුදල වැඩිපුරම තර කළේ මේ වීසා බල පත්‍ර දික් කිරීමෙන්. ඒක ප්‍රසිද්ධියේම කළ දෙයක්. [බාධා කිරීම්] වීසා බද්ද නැති කළේ මේ රටේ සංවර්ධනයක් ඇති කරන්වද? රුපියල් 400 ක් ගෙවන්න බැරි මෝල් හිමියා කව්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ දන්නවා, මේ රටේ සිටින බෝතල් කාරයින්ට, ගෝනි කාරයින්ට, අන්න ඒ විධියේ අයට නම් රුපියල් 400 ක් ගෙවන්න අමාරුයි. නමුත් විශාල කර්මාන්ත ශාලා හිමි ධනපතියන්ට රුපියල් 400 ක් ගෙවන්න බැරිද? "ලංකාවට ගියොත් මට රුපියල් 400 ක් ගෙවන්න වෙනව, ඒ නිසා මම ලංකාවට යන්නෙ නැහැ" කියන ධනපති කර්මාන්ත ශාලා හිමියකු සිටිනවාද? බෝතල්කාරයින්ට, පරණ පත්‍රකාරයින්ට, ගොනිකාරයින්ට නම් රුපියල් 400 ක් ගෙවන්න අමාරු වෙන්න පුළුවන්. ඒ නිසා මේ වීසා බද්ද නැති කර තිබෙන්නේ මේ රටේ කර්මාන්ත දියුණුවක් ඇති කිරීම සඳහා නොවෙයි. මේකෙන් තමයි පගා ඇති කරල තිබෙන්නෙ. වීසා බද්ද නැති කළේ එක්සත් ජාතික පක්ෂයට මුදල් හම්බ කර ගන්නයි.

රජයේ කර්මාන්තවලට පරිසරයක් හෝ වාතාවරණයක් වුවමනා කරන්නේ නැහැ. පෞද්ගලික කර්මාන්ත දියුණු කිරීම සඳහා සුදුසු වාතාවරණයක් අවශ්‍යයයි මුදල් ඇමතිතුමා කියනවා. පෞද්ගලික අංශය මඟින් කර්මාන්ත දියුණු කිරීම සඳහා බදු සහන දුන්නාට මදි. එක්තරා වාතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

වරණකුත් තිබෙන්න ඕන. ඒ වාතාවරණය නම් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ පහසුවෙන් අලෙවි කරගැනීමට පුළුවන්කම තිබීමයි. සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණියගේ කාලයේදී එවැනි වාතාවරණයක් මේ රටේ තිබුණු බව මේ කී ලැයිස්තුවෙන් පෙනී යනවා. සාමාන්‍ය මහජනයා අතේ ඒ භාණ්ඩ ගැනීමට මුදල් තිබුණා. ඒ නිසා ඒ භාණ්ඩ විකුණා ගැනීමට පුළුවන්කම ලැබුණා. ඒ නිසාම කාර්මිකයින් කිසි බියක් සැකක් නැතිව භාණ්ඩ නිෂ්පාදනය කළා. ඒ සුළු කාලය තුළදී කර්මාන්ත හාර සිය ගණනක් ඇති වූ බව ඒ ලැයිස්තුවෙන් පේනවා. කර්මාන්ත ඇති කිරීමට ප්‍රධාන වශයෙන් ඉවහල් වනුයේ නිෂ්පාදනයන් අලෙවි කිරීමට ඇති පහසුවයි. එවැනි අවස්ථාවක් සලසා දුන් විට පෞද්ගලික අංශය කර්මාන්ත පටන් ගැනීමට ඉදිරිපත් වන බව දැන් ඔප්පු වී තිබෙනවා.

ආදායම් බද්දෙන් නිදහස් කළ තරමට පෞද්ගලික අංශය කර්මාන්ත දියුණු කිරීමට ඉදිරිපත් වන්නේ නැහැ. ඒ සඳහා අවශ්‍ය වාතාවරණයක් තිබිය යුතුයි. මුදල් ඇමතිතුමා මෙන්න මේ ද්‍රව්‍ය වැඩි වශයෙන් මේ රටට අවශ්‍යයයි කියනවා : මිරිස්, රතුලූනු, අර්තාපල්, ධාන්‍ය වර්ග, සුදු ලූනු සහ සියඹලා. එතුමා කියනවා මේවා රටට බොහොම අවශ්‍ය දේය, මේවා ගෙන්වීම සඳහා කෝටි 17ක් වැය වෙනවාය, ඒ නිසා ඒවා මෙහිම වගා කරන්න වුවමනාය කියා. ඒවා වගා කිරීම සඳහා එතුමා ඉඩම් දෙනවාය, ඒ ඉඩම් වගා කිරීම සඳහ වැය වන මුදල් අයබදුවලින් නිදහස් කරනවාය කියාත් කියනවා. එසේ කියන අතර එතුමා මේ විදියටත් කියා තිබෙනවා :

"Another measure I propose is to totally abolish import duties on kerosene oil, chillies, potatoes, Bombay and red onions, dhal, gram and peas . . . ."—[OFFICIAL REPORT, 9th August, 1965; Vol. 61, c. 118.]

මේ ද්‍රව්‍යවල මිළ බස්සන්නයි, එතුමාගේ අදහස. එතකොට ප්‍රශ්නයක් මතු වෙනවා, මිළ බස්සනවා නම්, කවුද මේවා වගා කරන්නෙ, කියා. මේ ද්‍රව්‍යවල මිළ බස්සන විට ඒවා වගා කිරීමත් ටිකෙන් ටික අඩු වෙනවා. ඒ නිසා එතුමාගේ අදහස කවදාවත් ඉටු නොවන බව අපට කියන්න පුළුවනි. එතුමා ඉඩම් අක්කර කෝටියක් පමණ නාඩාර්ලාටත්, චෙට්ටියාර්ලාටත් දේවි. ඔවුන් බදුවලිනුත් නිදහස් කරාවි. නමුත් එතුමා බලාපොරොත්තුවන කිසිවක් ඒ ඉඩම්වල වැවෙන එකක් නැහැ. ඒ ඉඩම් ලබාගන්නා උදවිය කියාවි, මේ ද්‍රව්‍ය වගා කිරීමෙන් කිසිත් ලාභයක් ඇත්තේ නැත, ඒ නිසා අපි වෙනත් වගාවන් ඇති කරනවාය කියා.

ඒ නිසා පාරිභෝගිකයාට අවශ්‍ය භාණ්ඩවල මිළ බස්සන්න වුවමනා නම්, මිළ බසින විට නිෂ්පාදනයෙන් වැඩි ලාභයක් නැති වන නිසා නිෂ්පාදනය කිරීමේ කට යුත්ත පෞද්ගලික අංශයට භාර නොදී රජය මඟින්ම කළ යුතුයි. මේ අවශ්‍ය ද්‍රව්‍ය පිටරටින් ගෙනෙන තෙක් බලා නොසිටින අතර ඒවා දුප්පත් මහජනයාට පහසු මිළට ලබාදිය යුතු නම් කළ යුත්තේ ඒවා වගා කිරීම රජය අතට ගැනීමයි. විශාල ඉඩම් කොටස් පුද්ගලයන්ට භාර දී ලූණු, මිරිස් වවන්න යනවාය කියන අදහස හරි යන්නෙ නැහැ. ඩී. එස්. සේනානායක තුමාගෙ මූලික ප්‍රතිපත්තියක් තිබුණා මේ රටේ රජයෙ ඉඩම් තියෙනව නම් ඒවා තිබිය යුත්තෙ දුප්පත් මහජනයාට බෙදා දීම පිණිස පමණය කියන ප්‍රතිපත්තියයි, ඒ. එවැනි ඉඩම් ධනපතීන්ට දෙන්නෙ නැත යන අදහස එතුම තුළ තිබුණා. නමුත් මේ රටේ ධනපතියන්ටත් නොවෙයි, විදේශික ධනපතියන්ට අපේ වතු ටික බෙදා දෙන්නට යනව. පෙනෙන්නෙ නැද්ද, අද කඳුකරයෙ සිදු වී තිබෙන හරිය ? එය දැක දැකත් මේ ඉඩම් ටික බෙදන්න යනව, අපේ රටට හිමිකමක්වත් කිව නොහැකි පිරිසකට. කඳුකරයෙ නැවත වරක් අමුතු ප්‍රශ්නයක් ඇති කළා. සුද්ද අපේ වතු ගත්ත. ඔවුන් ඒව අතහැර යන විට දීල යන්නෙත් ඒ වතුවල වැඩ කළ දෙමළ කංකානිලටයි. ඒ අනුව සිංහලයින්ට අයිතියක් කියා ගන්නවත් හම්බ වෙන්නෙ නැහැ. ඉන්දියානු බැංකුවලින්, ඉන්දියානු සංවිධානවලින් මෙවැනි ඉඩම් භාර දීගෙන යනව, ඒ පිරිසට. 1955 සිට 1965 දක්වා පර්ගුසන්ස් ඩිරෙක්ටරිය" බලන විට අපට පේනව ඒ අවුරුදු 10 තුළ කොතරම් ඉඩම් ප්‍රමාණයක් ඉන්දියානුන්ට විකුණා හෝ භාර දී ගොස් තිබෙනවද කියා, සුද්දන් විසින්. සුද්දන්ට දුන්නු වතුවලට, එසේ සිදු වුණා. නැවත වරක් මේ රටේ වගා කරන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තියෙන ඉඩම් ටික මුසාජිස්ලට, ජෑපර්ජිලාට, බෝරාකාරයින්ට, නාඩාර්ලට සහ චෙට්ටියාර්ලට එහෙම බෙදා දුන්නම අපට යන කල දසාව කුමක්ද?

අද අපේ රටේ ජනතාවට ඉඩම් හිඟ තත්ත්වයක් ඇති වී තිබෙනව. වගාව සඳහා ඉඩම් ඉල්ලන පිරිස් මගෙ කොට්ඨාශයෙ අනන්තවත් සිටිනව. ඒ අයට ඉඩම් ලැබෙනවද? අක්කරයවත් නැතෙයි කියනව. තියෙන ඒව නාඩාර්ලට, බෝරකාරයින්ට දෙන්න යනව. කල්පනා කර බලන්න, මෙය යුතු වැඩක්ද කියා. නාඩාර්ලට තියෙන කැක්කුම මොකක්ද මෙහාට ඇවිත් ලූණු වගා කරන්න තරම්. බෝරාකාරයින්ට තියෙන කැක්කුම මොකක්ද, මෙහාට ඇවිත් මිරිස් වවන්න තරම්. ලාබ ප්‍රයෝජන තියෙනව නම් අපේ අයට ඒව නොදෙන්නෙ ඇයි? මේ ගැන ප්‍රසිද්ධියෙම කියා තිබෙනව. මා ළඟ ප්‍රකාශන නැහැ. බෝරාකාරයින්ට නාඩාර්ලාට දැනටමත් ඉඩම් දී තිබෙන බවයි පෙනෙන්නෙ. මෙච්චර කලක් ආරක්ෂා වෙලා තිබුණු ඉඩම් ටික ඒ අයට පවරා දෙන්ට යනව.

මේ ආණ්ඩුව ඩී. එස්. සේනානායක උන්නැහෙගෙ පින්තූරය පමණයි ගත්තෙ. එතුමගෙ එක ප්‍රතිපත්තියක්වත් ගත්තෙ නැහැ. එතුමගෙ යූ. එන්. පී. එකය කියා කියන්න තියෙන්නෙ, ඡන්ද කාල ගහන පින්තූරවලින් පමණයි. ඒ ආකාරයට රට හැම තැනම යනව, ඩී. එස්. සේනානායක උන්නැහෙගෙ නමින් ඡන්දය දීපල්ල කිය කියා. ඉඩම් ආරක්ෂා කිරීම පිළිබඳව වූ උන්නැහෙගෙ ප්‍රධාන ප්‍රතිපත්තිය මේ ආණ්ඩුව කාල දම්ම. එම නිසා රජයේ ඉඩම් බෙදා දෙනව නම් ඉල්ලන ඉල්ලන පලියට විදේශිකයන්ට නොදී ක්‍රියා කරන හැටියට මා ඉල්ලා සිටිනව. කඳුකරය විදේශීන්ට යාම නිසා ඇති වී තිබෙන කර දර මොනවාද කියා දැනගෙන කටයුතු කරන ලෙස ඉල්ලා සිටින අතර අපේ කැලෑ ප්‍රදේශ ටිකත් ඒ තත්ත්වයට දමන්න එපාය කියා තරයේ මතක් කරනව.

තවද කර්මාන්ත ඇති කිරීමෙදි එක්තරා බියක් තියෙනව කුඩා රටවල කර්මාන්ත දියුණුවෙත් එක්තරා සීමාවක් තියෙනව. යම් කර්මාන්තයක් සඳහා විශාල ඇත් ටරියක් දැම්මොත් වැඩි කලක් යන්න පෙර, සමහර විට හය මාසයක් යන්නත් පෙර, ලංකාවට වුවමනා බඩු තොගය සම්පූර්ණයෙන් නිෂ්පාදනය වන්න පුළුවනි. යම් බඩුවක් හදන්න එක් කෙනෙකුට දුන්නොත් එතන ඒකාධිකාරිත්වයක් නැතිනම් ආඥාදායකත්වයක් ඇති වෙනව. එම නිසා තුන් හතර දෙනෙකුට තරඟයක් ඇති වන පරිදි බෙදා දෙන්න සිදු වෙනව. එසේ කළ විට නිෂ්පාදනය වුවමනාවට වඩා වැඩි වෙනව. එවිට කර්මාන්තශාලා එක එක වසන්ට සිද්ධ වෙනව. බලන්න අද මේ රටේ ගිනිපෙට්ටි කර්මාන්තයට සිද්ධ වෙලා තිබෙන දේ කුමක්ද කියා. මුළු ලංකාවටම වුවමනා ගිණිපෙට්ටි ප්‍රමාණය සම්පූර්ණයෙන් තනිව නිපදවන්ට පුළුවන් කර්මාන්තශාලා 10 ක් 15 ක් පමණ මෙරට තිබෙනව. ඒ හැම එකකටම පුළුවන්, ලංකාවට වුවමනා ගිණිපෙට්ටි ප්‍රමාණය තනිව හදන්ට. හැමදෙනාටම කර්මාන්තයේ යෙදෙන්ට වුවමනා නිසා "උඹ නිපදවන්ට ඕනෑ මෙච්චරයි, උඹ නිපදවන්ට ඕනෑ මෙච්චරයි" ආදි වශයෙන් ඒ කර්මාන්තශාලා වල නිපදවීම සීමා කර තිබෙනව. එසේ කරන විට කොතරම් දුර්වල බඩු නිෂ්පාදනය කළත් ගන්ට සිද්ධ වෙනව. වෙන කරන්ට දෙයක් නැහැ. එතැන තරඟයක් නැහැ. හොඳ බඩු විතරක් ගන්ට පුළුවන් කමක් නැහැ. හොඳ බඩු මෙන්ම නරක බඩුත් එක්තරා සීමාවකටයි, හදා තිබෙන්නෙ. එම නිසා කර්මාන්තශාලා වැඩිවන විට ඒ හැම කර්මාන්තයක්ම මේ අන්දමට සීමා කරන්ට එන්නට සිද්ධ වෙනව. හැම බඩුවකටම "කෝටා" ක්‍රමය දමන විට කිසිම තත්ත්වයක් නැති බඩු හදන්ට පටන් ගන්නව. "කෝටා" එකක් ලැබුණාම බඩු හොඳට හදන්ට මහන්සි ගන්නෙ නැහැ. ව්‍යාපාරය දියුණු කරන්ට උත්සාහ කරන්නෙ නැහැ. කොච්චර හොඳින් කළත් නිපදවන්ට ඉඩ ලැබෙන්නෙ සීමාසහිත ගණනක් නිසා ඒ තරම් උනන්දුවක් ගන්නෙ නැහැ. එම නිසා ලෝකයේ හැම දෙනාම කර්මාන්ත දියුණු කිරීම අවශ්‍යයයි කියන පලියට ලංකාවෙත් කර්මාන්ත පටන් ගන්ට එපා. ලෝකයේ අනිත් රටවල කරන දේවල්, මේ රටේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පටන්ගන්ට එපා. අපට ඔබින්නෙ, අපට දක්ෂ ලෙස කරන්ට පුළුවන්කම තිබෙන්නෙ, කෘෂිකර්මාන්තයයි.

අද ලෝකයේ ඉතා හොඳ තේ නිපද වන්නේ ලංකාව බව තමුන්නාන්සේ දන්නව. අපේ තේ අක්කරයකින් නිපද වන්නෙ තේ රාත්තල් 700 යි, නැත්නම් වැඩිම වුණොත් 1,000 යි. රට පුරාම නිපදවන තේ ප්‍රමාණය එකතු කර එය නිපදවන බිම් ප්‍රමාණය සමග සසඳා බලන විට අක්කරයකින් තේ රාත්තල් 1,000ක් වැඩිම වුණොත් ලැබෙයි. එහෙත් " වෙජිටේ ටිව් ප්‍රොපගේෂන් " කියන අළුත් ශාස්ත්‍රීය ක්‍රමය අනුව අක්කරයට තේ රාත්තල් 3,000ක් 4,000ක් පමණ ලබාගන්ට පුළුවනි. දැන් තේවලින් ලංකාවට යම් ආදායමක් ලැබෙනව නම් එමෙන් තුන් ගුණයක ආදායමක් ඒ ක්‍රමයට කටයුතු කිරීමෙන් ලබා ගන්ට පුළුවන්. කිසිම කරදරයක් නැහැ. අපට විශේෂඥයින් සිටිනව. පුරුදු පුහුණු මිනිසුන් සිටිනව. වෙනත් උදවියට අප සමග තරඟ කරන්ට පුළුවන්කමක් නැහැ. අපට තිබෙන්නෙ සශ්‍රීක පොළොවක්, තේ වගා කිරීමට.

අපට එක්තරා කාලයක රබර් අක්කරය කින් ලැබුණේ රාත්තල් 200ක පමණ ප්‍රමාණයක්. එහෙත් අද සොයාගෙන තිබෙනව, අක්කරයකින් රබර් රාත්තල් 2,000ක් 3,000ක් ලබා ගන්ට පුළුවන් ක්‍රම. මලයාවේ තිබෙනව, අක්කරයකින් රබර් රාත්තල් 3,000ක් ලබා ගන්ට පුළුවන් වතු. දැනට ලංකාවේ අක්කරයකින් ලැබෙන්නෙ රබර් රාත්තල් 300 නම් එය රාත්තල් 1,500 දක්වා වැඩි කර ගත්තොත් ජාතික ආදායමට රබර්වලින් එකතුවන මුදල් ප්‍රමාණය දැනට වඩා 5 ගුණයකින් වැඩි වෙනවා නේද?

පොල් ගැන බලමු. පොල්වලින් මෙරටට ලැබෙන ආදායම විශාල එකක් වශයෙන් අප සලකනව. එහෙත් අපට පොල් කර්මාන්තයෙන් ලබාගන්ට පුළුවන් ආදායම ඔපමණද? පොල් කර්මාන්තයේ දියුණු තත්ත්වයේ මුදුන් පෙත්තට අපි නැගලද? අපේ පොල් අක්කරයකින් සාමාන්‍යයෙන් ලැබෙන්නෙ ගෙඩි 1,500යි. එහෙත් මගේ කොට්ඨාශයේ සිටින ශාස්ත්‍රීය ක්‍රම අනුව වගා කරන දක්ෂ වැවිලිකරුවන් පිරිසක්, ඔවුන් අක්කර යෙන් පොල් ගෙඩි 6,000ක් කඩනව. පොල් අක්කරයකින් ගෙඩි 6,000ක් කඩන්ඩ පුළුවන්. දැන් අක්කරයකින් කඩන්නෙ කීයද? 1,500 යි. එහෙම නම් තව හතර ගුණයකින් නිපදවන පොල් ප්‍රමාණය වැඩි කර ගත හැකි නේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට වුවමනා විදේශ විනිමය ලබා ගැනීමට අපට ඔබින්නෙ නැති, අපට කරන්ට බැරි, කර්මාන්ත ආරම්භ කිරීමට රජය උත්සාහ ගන්නව. මොකද? ලෝකයේ හැමතැනම කරන නිසා අපේ රටෙත් ඒක කරනව. කර්මාන්ත වලට දීගෙන යන උපකාර අනුව වැඩි කල් යන්ට පෙර අපි හදන බඩු පවා සීමා කරන්ට සිද්ධ වෙනවා ඇති. මේකට මෙපමණ " කෝටා " එකක්, අනික් එකට මෙපමණ "කෝටා" එකක් යනාදී වශයෙන් " කෝටා " නොහොත් සීමා කරගෙන යන්නට සිදු වෙනව. අප පිටස්තර කර්මාන්ත ගැන නොසිතා කෘෂිකර්මාන්තය ගැන කටයුතු කරනවා නම් අපට අමුතුවෙන් ශාස්ත්‍රඥයින් ගෙන්වන්නට වුවමනා වන්නෙ නෑ. ජාතික ආදායම හතර පස් ගුණයකින් වැඩි කර ගැනීමට පුලුවන්කම තිබෙන අපේම විශේෂඥයින් මේ රටේ සිටිනවා. එසේ කරන අවස්ථාවකදී අප විසින් දෙනු ලබන ආධාර සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී විමසා බැලීම සුදුසුයි. එන්. එම්. පෙරේරා මුදල් ඇමතිතුමාගේ වාර්තාවක එවැනි ආධාර සම්බන්ධ විස්තරයක් සඳහන් වී තිබෙනවා. තේ නව වගාවක් සඳහා අක්කරයකට රුපියල් 3,000ක ආධාරයක් දෙන බවත් දැනට අක්කර 5,000ක් ඒ අනුව වගා කර තිබෙන බවත් එම වාර්තා වෙහි සඳහන් වෙනවා. ඒ අක්කර 5,000න් 1,000ක් බදුල්ල, බණ්ඩාරවෙල, නුවරඑළිය යන ප්‍රදේශවලත් අක්කර 4,000ක් මැදරට හා පාතරටත් වගා වී තිබෙන බව සඳහන් වෙනවා. අක්කරයකට රුපියල් තුන් දහසක ආධාරයක් දීලත් දැනට වගා වී තිබෙන්නෙ අක්කර පන් දාහක් පමණයි. නමුත් දැන් වැඩි දෙනා තේ නව වගාව ගැන උනන්දු වක් දක්වනවා. නුවරඑළිය-බණ්ඩාරවෙල ප්‍රදේශයේ තේ වගාව අයිතිව තිබෙන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විදේශිකයින්ටයි. නව වගාව ගැන වැඩි උනන්දුවක් දක්වන්නේ අපේ මිනිසුන් පමණයි ; විදේශිකයන් නොවෙයි.

ඊළඟට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රබර් ගැන බලමු. රබර් ගැන එම වාර්තාවේ මෙසේ කියා තිබෙනවා :

"So far as the programme for 1964-65 is concerned the target to be maintained has been kept at the previous year's level of 15,000 acres."

රබර් නව වගාව සඳහා අක්කරයකට ආධාර වශයෙන් රුපියල් දාහක් දෙනවා. ගිය අවුරුද්ද වන විට අක්කර 15,000ක් නව වගාව සඳහා පිළියෙල වී තිබෙන බව කියා තිබෙනවා.

ඊළඟට අපේම සිංහල වැවිලි කර්මාන්තයක් වන පොල් වගාව ගැන මෙසේ කියා තිබෙනවා :

"With seedlings distributed from 19.2 thousand acres in 1961 to 23,000 acres in 1963."

අක්කර දහස් 19.2 සිට 23 දහ දක්වා පොල් නව වගාවට පිළියෙල වී තිබෙනවා. නමුත් පොල් වගාව සඳහා දෙන ආධාරය කුමක්ද ? රුපියල් සියයක්වත් නැ. බලන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි පුදුම විධියේ පරතරයක් තිබෙනවා නේද ? තේ නව වගාවට රුපියල් 3,000 යි, රබර් නව වගාවට අක්කරයකට රුපියල් දහයි. නමුත් අපේම මිනිසුන් විසින් කරනු ලබන අපේම සිංහල වැවිලි කර්මාන්තයට ලැබෙන්නේ රුපියල් සියයක් තරම් සුළු මුදලක් පමණයි. රජයේ යුතුකමක්ව තිබෙන්නේ අපේම ජනතාවට අයිතියක් ඇති මූලික වගාවක් වන පොල් වගාවට වැඩි සැලකිල්ලක් දක්වා වැඩි ආධාරයක් දීමයි. මුදල් ඇමති දැන් මේ ස්ථානයෙහි සිටින නිසා මා මේ කරුණ විශේෂයෙන් මතක් කරනවා. තේ වගාව සඳහා අක්කරයකට රුපියල් 3,000ක් දෙන අතර පොල් වගාව සඳහා අක්කරයකට රුපියල් සියයක් පමණක් දීම යුක්තියක්ද කියා මා අහනවා. තේ වගාවෙන් ප්‍රයෝජන ලැබෙන්නේ විදේශික වතු අයිතිකාරයන්ට හා විදේශික කම්කරුවන්ටයි. පොල්වලින් යම් ප්‍රයෝජනයක් ලැබෙනවා නම් එසේ ලැබෙන්නේ ස්වදේශික වතු අයිතිකාරයන්ට හා ස්වදේශික කම්කරුවන්ටයි. ස්වදේශිකයන් රුපියල් 100 බැගින් ආධාර ලබා ගෙන අක්කර 23,000ක් වගා කර තිබෙනවා. විදේශිකයන් රුපියල් 3,000 බැගින් ආධාර ලබාගෙන අක්කර 5,000ක් වගා කර තිබෙනවා. මේ දෙකේ වෙනස පේනවා නේද ? මේ හැම අතින්ම කල්පනා කර බලන විට අපේ කෘෂිකර්මයෙහි දියුණුවක් අවශ්‍ය බව පෙනෙනවා. එය කර්මාන්ත දියුණුවට වඩා වැදගත් බවත් ඒ සමගම කියන්නට කැමතියි.

ගොවිතැන දියුණු කළහොත් එයින් ලැබෙන අමු ද්‍රව්‍ය අලෙවි කර ගන්නට බැරි වේදැයි සමහරුන් තුළ සැකයක් ඇති වන්නට පුළුවනි. දැනට ලෝකයේ නිෂ්පාදනය වැඩි බවට මතයක් තිබෙන නිසා අපේ සමහර උදවියටත් ඉහත කී විධියේ හැඟීමක් ඇති වන්නට ඉඩ තිබෙනවා. පසුගිය ලෝක යුද්ධයට පෙර මේ රටේ නිපද වූ අමු ද්‍රව්‍ය සියල්ලම ගියේ යුරෝපයේ මධ්‍යස්ථානවලටයි. ඒ කාලයේ බටහිර යුරෝපයේ හා ඇමෙරිකාවේ ජනගහනය 45 කෝටියක් පමණ වුණා. ඒ 45 කෝටියේ ජීවන තත්ත්වය උසස් අන්දමින් තබාගැන්ම සඳහා කුලීකාර තත්වයෙන් ක්‍රියා කොට මේ රටේ අමු ද්‍රව්‍ය එංගලන්තයට යැව්වා. අපේ අමු ද්‍රව්‍යවලින් ඉහත කී 45 කෝටියේ ජනගහනය බොහොම හොඳ ජීවන තත්ත්වයක් ඇති කරගෙන සන්තෝෂයෙන් ජීවත් වුණා. අපේ රබර්වලින් ටයර් සාදාගත්තා. අපේ කොහු ටිකෙන් කොට්ට මෙට්ටා සාදා ගත්තා. අපේ තේ අමු ද්‍රව්‍යයක් වශයෙන්ද පාවිච්චි කරමින් පැකට්වල පුරවා විශාල මුදලක් ලබා ගත්තා. නමුත් දැන් යුද්ධයට පසුව ඇති වී තිබෙන තත්ත්වය මොකක්ද ? දැන් දකුණු ආසියාවේම කෝටි 60 ක අමුතු ජනගහනයක් සිටිනවා. දකුණු ආසියාවේ ජනගහණයේ ජීවන තත්ත්වය අගා සිටුවීම පිණිස ඇති කරන කර්මාන්තයන් සඳහා අමු ද්‍රව්‍ය වුවමනා වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

හැම පැත්තෙන්ම කර්මාන්ත දියුණුව සඳහා විශාල ලෙස මුදල් යොදවනවා. කාර්මික ඉන්දියාවක් ඇති කිරීම සඳහා විශාල ලෙස මුදල් යොදවාගෙන යන බව අප දන්නවා. ඒ වාගේම පාකිස්ථානය, බුරුමය, සියමය, යන රටවල්ද කර්මාන්ත දියුණු කිරීමට ක්‍රියා කරනවා. මේ සඳහා අමු ද්‍රව්‍යය අවශ්‍යයි. චීනයේ කෝටි 60 ක ජනගහනයක් සිටිනවා. චීනයත් කාර්මික වීම සඳහා ලොකු උත්සාහයක් ගෙන කටයුතු කරනවා. මේ හැම රටකටම අමු ද්‍රව්‍ය වුවමනායි. යුද්ධයට පෙර බටහිර යුරෝපයේ හා ඇමෙරිකාවේ සිටි කෝටි 45 ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ඒ තරම් අමු ද්‍රව්‍ය ප්‍රමාණයක් වුවමනා වුනා නම්, අද මේ තරම් ජනගහනයක් සිටින දකුණු ආසියාවේ හා චීනයේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා කොතරම් අමු ද්‍රව්‍ය ප්‍රමාණයක් වුවමනා වෙනවා ඇද්ද? හැම රටක්ම අද කර්මාන්ත දියුණුව සඳහා මුදල් යොදවනවා. අපේ රටත් ඒ සඳහාම මුදල් යොදවනවා. එහෙත් අමු ද්‍රව්‍ය නිෂ්පාදනයට මුදල් යෙදවීම බොහොම අඩුයි. අමු ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩි කිරීමට, කොටින්ම තේ, රබර්, පොල් නිෂ්පාදනය වැඩි කිරීමට, අප මෙතෙක් ගෙන තිබෙන උත්සාහය කිසි සේත්ම ප්‍රමාණවත් වන්නේ නැහැ. නමුත් මේ රටේ කර්මාන්ත දියුණු කිරීම සඳහා තමුන්නාන්සේලා කෝටි 50 ක පමණ මුදල් යොදා තිබෙනවා. එහෙත් එයින් සුළු කොටසක්වත් වියදම් වුණාද අපේ තිබෙන මූලික අමුද්‍රව්‍ය කොටස නිෂ්පාදනය කරන්නට? ලෝකයට වුවමනා කරන අමු ද්‍රව්‍ය සම්බන්ධයෙන් මතුවට විශාල හිඟයක් ඇති වෙනව. කර්මාන්ත දියුණු වන්න දියුණු වන්න අමු ද්‍රව්‍ය වැඩි වැඩියෙන් අවශ්‍ය වෙනව. ස්වාභාවික න්‍යායයක් පමණයි ඒ. එතකොට අපේ රටේ මුදල් තත්ත්වය ආදායම් තත්ත්වය ක්‍රම ක්‍රමයෙන් වැඩි කර ගන්න අවස්ථාවක් අපට ලැබෙනව. ඒ නිසා අමු ද්‍රව්‍ය සම්පාදනය වැඩි කිරීමෙන් මෝල්වලට වුවමනා කරන දේ වැඩි වැඩිය සපයන්න මතුවට පුළුවන් වෙනවා. ඒවා වැඩි මුදලකට විකුණා ගැනීමටත් අපට පුළුවන් වන බවට කිසිම සැකයක් නැහැ.

හැම දාම අප යුරෝපය දෙසම බලාගෙන ඉන්න හොඳ නැහැ. දැන් ඒ අයගේ කාලය ඉවරයි. ඒ කාරණය අප පැහැදිලි ලෙස තේරුම් ගන්න ඕනෑ. ආසියාවේ දැන් විශාල අන්දමින් කර්මාන්ත වැඩි දියුණු වෙමින් පවතිනව. ආසියාවේ එක් රටක පමණක් දැන් ලෝකයේ ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ඉන්නවා. කෝටි හැටක් පමණ වූ විශාල ජනකායක් දැන් ආසියාවේ එක් රටකම ඉන්නවා. චීනයේ, මගෙ හිතේ කෝටි හැටක් පමණ ඉන්නවා. චීනයේ ඉන්න සියලු දෙනාම සපත්තු පාවිච්චි කරන්න පටන් ගත්තොත්, රබර් සපත්තු පාවිච්චි කරන්න පටන් ගත්තොත්, ඒ සඳහා රබර් විශාල ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. එතකොට ලෝකයේ විශාල රබර් හිඟයක් ඇති වේය කියනව. මිනිසුන්ගෙ ජීවන තත්ත්වය දියුණු වෙන්න වෙන්න වැඩි වැඩියෙන් කර්මාන්ත සඳහා අමු ද්‍රව්‍ය අවශ්‍ය වෙනවා. එතකොට කර්මාන්ත දියුණු කිරීමට මහ ජනතාව උසි ගන්න ගන්නා ඉන්න වෙන්නෙ නැහැ. ඒවා දියුණු වෙන්න දියුණු වෙන්න වැඩි කාලයක් යන්න ඉස්සර වෙලා අපට වැඩි වැඩියෙන් ප්‍රයෝජන ලැබෙන්න පටන් ගන්නව. එතකොට ගිනිකුරු කර්මාන්තය සම්බන්ධයෙන් ඇති වුණු තත්ත්වය ඇති වෙන්න ඉඩ නෑ.

මේ රටේ දියුණු කරන්න පුළුවන් කර්මාන්තයක් තමයි කෘෂිකර්මාන්තය. තේ, රබර්, පොල් වැවීමේ කර්මාන්තය වැඩි දියුණු කරන්න පුළුවනි. ඒ වගේම මේ රටේ විනිමය වැඩි වශයෙන් වියදම් වන වී ගොවිතැනත් වැඩි දියුණු කර ගන්න ඕනෑ. ඒ නිසා ගරු මුදල් ඇමතිතුමාට මම මතක් කරන්න ඕනෑ, කර්මාන්ත කර්මාන්ත කියන අදහස පමණක් භාර ගන්නෙ නැතිව, අපේ අනාගතය රැඳී තිබෙන දේ ගැන කල්පනා කර ක්‍රියා කරන ලෙස. තේ, රබර් සහ පොල් වැනි දේවල් යුරෝපයේ වගා කරන්න බැහැ. ඒ රටවල උදවිය අපෙන් අරන් ඒවා පාවිච්චි කරන්න ඕනෑ. අපේ පොළොවෙන් අපට හරි හම්බ කර ගන්න පුළුවන් නම් අප

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යුරෝපයෙන් එන දේවල්ම ගන්න බලන්නෙ නැතිව අපට වගා කරන්න පුළුවන් දේවල් අපේ රටේම වගා කරගෙන වැඩි දියුණු කරගෙන වැඩ කරන්න ඕනෑ බව මතක් කරන්න කැමතියි.

අවසාන වශයෙන් කර්මාන්ත දියුණුවට අවශ්‍ය ඉතාමත් වැදගත් දෙයක් ගැන සඳහන් කරන්න කැමතියි. ආණ්ඩුවක්ය කියන එක පත් වුණායින් පස්සෙ අවුරුද්දක් දෙකක් නැතිනම් පහක්ම වුණත් තිබෙන්න පුළුවනි. වැඩිම වුණොත් ආණ්ඩුවක් පවත්වාගෙන යන්නෙ අවුරුදු පහයි. වරින් වර බලයට පත් වන ආණ්ඩු ටික කලක් බලයේ රැඳී ඉඳල ඉවත් වී යනවා. එතකොට තව ආණ්ඩුවක් බලයට පත් වෙලා එනවා. ඒ විධියට ආණ්ඩු මාරු වෙනවා. ඒ නිසා කර්මාන්ත වෙනුවෙන් මුදල් යොදවන කාර්මිකයන් කල්පනා කරන්නෙ ඒ ගැනයි. මා මේ තරම් මුදලක් මේ කාර්මික ව්‍යාපාරය සඳහා යොදවනවා. මේ තරම් මුදලක් වියදම් කරනවා. විශාල මුදලක් හිරවෙලා තියෙනවා. ඒ කර්මාන්තය කරගෙන යාම සඳහා මේ ආණ්ඩුවෙන් මට උදවු උපකාරත් ලැබෙනවා. යම් කිසි අවස්ථාවක මේ ආණ්ඩුව මාරු වුණොත්, ඒ වෙනුවට වෙනත් ආණ්ඩුවක් බලයට පත් වුණොත්, අලුතින් බලයට පත් වී එන ඒ ආණ්ඩුව මගේ මේ කර්මාන්තයට මොනවා කරාවිද කියා ටිකක් කල්පනා කරනවා. අලුතින් ආණ්ඩුවක් බලයට ඇවිත් මගේ කර්මාන්තය ජනසතු කරාවිද කියන බියක් කර්මාන්ත සඳහා මුදල් යොදවන්නන් තුළ ඇති වෙනවා. ඒ නිසා ඒ අය මුදලක් යොදන්නෙ බොහොම කල්පනාකාරීවයි. ඒ නිසා අප දන්න විධියට නම් කර්මාන්තයක දියුණුවට අවශ්‍ය දේශපාලන පරිසරය තිබිය යුතුයි. එක් ආණ්ඩුවකින්ම ආධාර ලැබීම පමණක් කාර්මිකයන් ධෛර්‍යවත් කිරීමට ප්‍රමාණවත් නැහැ. විරුද්ධ පාර්ශ්වයේ ගරු නායකතුමිය ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරනවාදැයි යන්න ගැන කාර්මිකයින් සෝදිසි කරනවා. ඒ අය ඒ ගැන අහනවා, බලනවා. ඒ නිසා කාර්මික දියුණුවක් ඇති කරන්නට නම් අපේ—විරුද්ධ පාර්ශ්වයේ—උපකාරයත් වුවමනා කරන බව හිතන්න ඕනෑ. අපෙන් විපරම් කරන උදව්යට සතුටුදායක පිළිතුරු ලැබුණොත් තමයි බියක් නැතිව කර්මාන්ත පටන් ගන්නට හැකි වන්නෙ. තමුන්නාන්සේලා අදහස් කරන කර්මාන්තය අප බල යට ආවාම හෙට අපි ජනසතු කරනවය කියල අප කිව්වොත් තමුන්නාන්සෙලාට පුළුවන්ද ඒ කර්මාන්තය සාර්ථක ලෙස දියුණු කරගෙන යන්න? විරුද්ධ පාර්ශ්වයේ ගරු නායක මැතිණියගෙනුත් අසාවි මැතිණියත් මෙවැනි ව්‍යාපාර ජනසතු කරනවද කියල. ජනසතු කරනවය කිව්වොත් පමණයි බියක් නැතිව කර්මාන්ත ආරම්භ කරන්නෙ. මා දැන් තමුන්නාන්සෙට ප්‍රකාශ කරනව ලුක්මන්ජීලාටත් බෝරාකාරයින්ටත් මේ රටේ කර්මාන්ත කරගෙන යාමට ඉඩ දුන්නොත් අප බලයට පත්වී ආවාම ඒවා ජනසතු කරනවා කරන වාමයි කියන එක. අප බලයට ආ දවසට ඒක කරනවාමයි.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

කවුද ඒවා දුන්නෙ මන්ත්‍රීතුමනි?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

කල් තියාම ඒ බව තමුන්නාන්සෙලාට මා කියනවා. මේ රටේ ජනතාව කර්මාන්ත පටන් ගත්තොත් දියුණු කළොත් කවුරුත් ඒකට ගරු කරනවා. ඒවා ජනසතු කරන්න අපේ බලාපොරොත්තුවක් නැහැ. නමුත් යම් යම් පෞද්ගලික ප්‍රයෝජන පිට, තමුන්නාන්සෙලාගෙ පක්ෂවලට මුදල් දුන්න පලියට, තමුන්නාන්සෙලා විදේශිකයන්ට අක්කර දාහ, දෙදහ දෙන්න ගියොත්, එහෙම දීල බෝරකාරයන්ට කැලෑවල කර්මාන්ත කරන්න දුන්නොත් තමුන්නාන්සෙලා ඉන්න තෙක් පමණයි, ඔය කර්මාන්ත කරන්න පුළුවන් වන්නෙ. තමුන්නාන්සෙලාගේ කර්මාන්ත දියුණුවට විරුද්ධ පක්ෂයේ උපකාරයත් ලබා ගත යුතු බව තමුන්නාන්සෙලා මතක තියා ගන්නට ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන ලෝකයේ හැම රටකම කර්මාන්ත දියුණුවක් ඇති වන්නට නම් ප්‍රජාතන්ත්‍රවාදී විරුද්ධ පක්ෂයකුත් ඒ රටේ තියෙන්නට ඕනෑ. ඒ දෙකේම සහයෝගය, ඇතිවයි කර්මාන්ත දියුණුව ඇති විය යුත්තේ. ආණ්ඩු පක්ෂය පමණක් ප්‍රජාතන්ත්‍රවාදය

Digitized by Noolaham Foundation. noolaham.org | aavanaham.org

අනුගමනය කරද්දී විරුද්ධ පක්ෂයේ හැම දෙයක්ම ජනසතු කරනවාය කියන ප්‍රතිපත්තිය අනුවම සිටිනවා නම් කර්මාන්ත දියුණුවක් ඇති කරන්නට බැහැ. අනික් ආණ්ඩුව ජනසතු කරනවාය කියන කර්මාන්තයකට මුදල් යොදවන්නට නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා මුදල් යොදවනවද කියා මම අහන්න සතුටුයි. [බාධා කිරීමක්] තමුන්නාන්සෙට මතක නැද්ද? [බාධා කිරීමක්]

**රණවීර මයා.**
*(திரு. ரணவீர)*
(Mr. Ranaweera)

අපි ඒවට නැහැ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

ඒ ගැන කථා කරන්න එපා, ලන්ඩන්වල තියෙන රන් පවුම් තොගය ගැන අපි දන්නව.

**රණවීර මයා.**
*(திரு. ரணவீர)*
(Mr. Ranaweera)

තමුන්නාන්සෙ ළඟයි, ඒවා තියෙන්නෙ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

ගෙදර කොච්චර සල්ලි තියෙනවද කියා සල්ලි තොගය මණින්නෙ රුලෙන්. එහෙම උදවියයි ඉන්නෙ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත දියුණු කරන්න නම් විරුද්ධ පක්ෂයේ සහයෝගය ඉතාම අවශ්‍යයි. අපි දන් ආණ්ඩු බලය ගත්තට පස්සෙ විරුද්ධ පක්ෂයට පුළුවන් තරම් විරුද්ධ කම් කරනවය, විරුද්ධ පක්ෂය මකා දමනවය කියන අදහස ඇති කර ගන්න එපා. අපි උපකාර වන්න පුළුවන් අවස්ථාවේදී ආණ්ඩුවට උපකාර වෙනව. විරුද්ධ පක්ෂයටත් යුතුකම් ඉෂ්ට කළ යුතු බව තමුන්නාන්සේලා හිතේ තියා ගන්න ඕනෑ. තමුන්නාන්සේලා විරුද්ධ පක්ෂයේ සිටිද්දී සමසමාජ පක්ෂයත් කොමියුනිස්ට් පක්ෂයත් සමග එකතු වෙලා පසුගිය ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දුන්නෙ නැද්ද? පසුගිය ආණ්ඩු කාලයේදී අපි පනත් සිය ගණන් ගෙනෙන්නට ඇති. ඔය සිය ගණනින් කීයකට, එක්සත් ජාතික පක්ෂය කොමියුනිස්ට් පක්ෂයෙන් හා සමසමාජ පක්ෂයෙන් වෙන් වෙලා ඡන්දය දුන්නද? හැම පනතකදීම සමසමාජ පක්ෂයත්, කොමියුනිස්ට් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් එකට අපට විරුද්ධව ඡන්දය දුන්නා. පනත් කීයක් සම්බන්ධයෙන් ඔය විධියට කරල තියෙනවද කියා බලන්න. එදා තමුන්නාන්සෙලා ඒ පක්ෂය සමග එකතුව අපේ පනත්වලට විරුද්ධව ඡන්දය දුන්න වගේ අද අපි ඒ අයත් සමග එකතු වෙලා තමුන්නාන්සෙලාගෙ පනත්වලට විරුඬව ඡන්දය දෙනව. මොකක්ද මේකෙ තියෙන වෙනස?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

තුන් හවුලෙන් ආණ්ඩු කළේ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

ඇයි, තමුන්නාන්සෙලාගෙ හත් හවුල පෙනෙන්නෙ නැද්ද? තමුන්නාන්සෙලාගෙ හත් හවුල මහජනයා ඉදිරියට ගියාම වන දේ තමුන්නාන්සෙලාට පෙනේවි. ඒ නිසා තමුන්නාන්සෙලාගේ මේ සංවර්ධන ක්‍රමය ගෙන යන්නට වුවමනා නම්, එයින් ප්‍රයෝජනය ලබා ගන්නට වුවමනා නම්, අපේ උදව්ව ඉතා අවශ්‍ය බව අමතක කරන්න එපා. අපි ජනසතු කරනවය කියන තර්ජනය ඉදිරිපත් කළොත් ඔය කව්රුවත් කර්මාන්තවලට මුදල් යොදවන්නෙ නැහැ. රටේ ජනතාවට ඉඩම් දෙනවා නම්, මුදල් දෙනවා නම්, රටේ ජනතාව නගා සිටුවීමට උත්සාහ කරනවා නම්, ඔවුන් යොදවන මුදලට ගරු කරල ඒ කර්මාන්ත ආරක්ෂා කරන්නට අපි සෑම වීමට උත්සාහ කරනව. නමුත් බෝරුකාර යන්ට, නාඩාර්ලට රටේ අක්කර දහස් ගණන් දෙනව නම්, කජු තියා මොනවා වවන්න ගත්තත්, අපට අවස්ථාව ලැබුනම ඔය ඉඩම්වලින් අපි ඔවුන් තල්ලු කරනවා කරනවාමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.50

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! At this stage, I shall be leaving the House. Will the Hon. Minister of Finance please move that the hon. Appointed Member, Sir Razik Fareed, do take the Chair?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

I move,

"That the Appointed Member, Sir Razik Fareed, do take the Chair."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, පත් කරන ලද මන්ත්‍රී ශ්‍රීමත් රසික් ෆරීඩ්, ඕ. බී. ඊ., මූලාසනාරූඪ විය.

*அதன்பிறகு உப சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து நீங்கவே, நியமன அங்கத்தவர், ஸ்ரீமான் ராசீக் பரீத், ஓ.பி.ஈ., தலைமை தாங்கினார்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* SIR RAZIK FAREED, O.B.E., [APPOINTED MEMBER], *took the Chair.*

අ. භා. 5.51

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, හොඳ වැදගත් කථාවක් විරුද්ධ පාර්ශ්වයේ දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමාගෙන් තමුන්නාන්සේටත් අපටත් අහන්න ලැබුණා. නමුත් අපි එතරම් ඒ කාරණය ගණන් ගන්නේ නැති හේතුවක් තිබෙනවා. ඒ මක්නිසාද කියනවා නම්, ඔහු ගැන තමුන්නාන්සේත් හොඳට දන්නවා ඇති. ඔහු දේශපාලන නායකයෙක වැඩි කලක් වැඩි වෙලාවක් සිටින කෙනෙක් නොවෙයි. සුළු පැය ගණනක් නතර වී තමන්ගේ බඩු මුට්ටු ආදියත් අකුලාගෙන වෙනත් නායකයෙකට යන කෙනෙක් නිසා ඒ ගැන මේ ආණ්ඩුව කිසිම කලබලයක් වෙන්නේ නැති බව මේ අවස්ථාවේ දී මතක් කරන්න කැමතියි. ඔහුගේ දේශපාලන මතයේ හැටියට හෝ වේවා, ඔහු බලාපොරොත්තු වන ආර්ථික තත්ත්වය අනුව හෝ වේවා, පුදුම විධියේ හැඟීම් රාශියක් එතුමා පෙන්නුම් කළා. මා හිතනවා එය ඒ පැත්තේම ගරු මන්ත්‍රීවරුන්ටත් ලොකු ප්‍රහේලිකාවක් වෙන්න ඇති. මා මේ එතුමාගේ කථාව ගැන පළමුවෙන්ම සඳහන් කරන්නේ එතුමාගේ කථාවේ උණුසුම යන්න කලින් පිළිතුරු දුන්නොත් හොඳයි කියා හිතුණු නිසයි. ඔහු ගැන තවදුරටත් කියනවා නම් එතුමා ජාතිවාදය හා ආගම් වාදය අවුස්සන බස්තම නිතරම පාවිච්චි කරන පුද්ගලයෙක්; එය හැඳිගාන කාල්ගාන බස්තමක් පාවිච්චි කරන පුද්ගලයෙක්. මේ ආණ්ඩුව බෝරාකාරයින්ට හා ඉන්දියානුකාරයින්ට මේ රටේ තැන දී, සිංහල ජාතිය පාගන්නට වෙනත් ජාතීන්ට ඉඩ දී, මේ ආණ්ඩුව හරියටම වෙනත් ජාතීන් පිරිසකට මේ රට කැප කරන්න යන ආණ්ඩුවක් හැටියට එතුමා පෙන්වා දෙන්නට උත්සාහ කළා. දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමාගෙන් මා එකක් අහනවා. ඔහු වෙළඳ ඇමති ධුරය දැරූ කාලයේ බෝරා කාරයින්ට කොතරම් උදව් කළාද? එතුමා මීට පෙර ආණ්ඩුවල ඇමතිකම් දැරූ කාලයේ එතුමා සිංහල වෙළෙන්දන් කීදෙනෙකුට උදව් කළාද කියා මා අහනව. [බාධා කිරීම්]

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

ප්‍රශ්නයක් අහන්න අවසර දෙනවාද කියා මා අහන්න කැමතියි. [බාධා කිරීම්]

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

එතුමාගේ ප්‍රශ්න අහලා ඉවරයි. මේ මගේ කාලය. මා අවස්ථාව දෙන්න කැමති නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
*(தலைமை தாங்கும் அங்கத்தவர் அவர்கள்)*
(Mr. Presiding Member)

The hon. Member is not giving way. [බාධා කිරීම්]

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

එහෙම නම් ප්‍රශ්න අහන්න එපා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

මා දඹදෙණියේ මන්ත්‍රීතුමාගෙන් ඒ ප්‍රශ්නය ඇහුවෙ නැහැ. මා මූලාසනයටයි ආමන්ත්‍රණය කරන්නෙ. මා සෑම ප්‍රශ්න යක්ම අසන්නෙ මූලාසනයෙනුයි. මා කථා කරන්නෙත් මූලාසනයටයි.

ඊළඟට දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමා ගෙන යන ව්‍යාපාරය ගැනත් මා මතක් කරන්නට සතුටුයි. ජාතිභේද, ආගම්භේද දේශපාලන ප්‍රතිපත්ති හැටියට අවුස්සනවා හැර වෙන කිසි දෙයක් කර ගන්න බැරිව ගැහෙන මේ පුද්ගලයා ඒ මගින් වත් මහජනයාගේ සිත දිනා ගන්න පුළුවන්ය යන හැඟීමෙන් මේ ස්ථානයෙහි පමණක් නොවෙයි මුළු ලංකාවේම ඔය නැටිය ගායනා කරගෙන යන බව තමුන් නාන්සේ දන්නවා ඇති. නමුත් ඒ සම්බන්ධව අප ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුව කිසිම හයක් නැහැ. මේක හත් හවුල් ආණ්ඩුවක් නොවෙයි දාහතර හවුල් ආණ්ඩුවක්ය කීවත් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්ති අනුව මේ රටේ සෑම කෙනෙකුම සහෝදර ප්‍රේමයෙන් බඳවා ජනතාවගේ දියුණුවට වැඩ කිරීමයි අපේ එකම පරමාර්ථය. එසේ නැතිව ජාති වශයෙන්, ආගම් වශයෙන් බෙදා එක් පිරිසකට පමණක් තැන දී අනිකුත් අය වහලුන් කිරීම නොවෙයි අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ඊළඟට, දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමා යම් පැත්තකට යනවාද ඒ පැත්තට කෙහෙතගෙ දසාව ලබන බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ නිසා අපේ පැත්තට නැතිව ඒ පැත්තට කෙහෙතගෙ දසාව ලැබීම ගැන අපි බොහොම සන්තෝෂ වෙනව. නමුත් ඒ අතරම මා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැන අනුකම්පා කරනව, ඒ පක්ෂයට කෙහෙතගෙ දසාව ලබා තිබීම ගැන. එතුමා දැන් බණ්ඩාරනායක මැතිතුමාගේ ප්‍රතිපත්ති වර්ණනා කරනව. බණ්ඩාරනායක ප්‍රතිපත්ති ගැන ඔය අද උදන් අනන ඒ ගරු මන්ත්‍රීතුමා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව පිහිටෙවු අවස්ථාවේදී ඒ ආණ්ඩුවට සහයෝගයක් දුන්නාද කියා මා ප්‍රශ්න කරනවා.

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.**
(අත්තනගල්ල)
*(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டார நாயக்க—அத்தனகல்ல)*
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

මොකද නැත්තෙ? දුන්න.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

එහෙම සහයෝගයක් දුන්නා නම් ඒ ආණ්ඩුවේ ඇමතිකමක් ලැබුණාද?

**නීල් ද අල්විස් මයා.** (බද්දේගම)
*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*
(Mr. Neal de Alwis—Baddegama)

සහයෝගය දෙන්නෙ ඇමතිකමට පමණක්ද?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ඊළඟට දඹදෙනියේ මන්ත්‍රීතුමා කොපමණ කල් ඒ ආණ්ඩුවට පක්ෂව සිටියාද කියා මා අසනව. කිසිම අවස්ථාවක කිසිම ආණ්ඩුවකටවත් නියම සහයෝගයක් නොදුන් එතුමා පලදාවක් නැති වඳ කෙහෙල් ගසකට සමාන කරන්නට පුළුවන් බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. [බාධා කිරීමක්] ඊට වඩා මා එතුමා ගැන කරුණු කියන්නට වුවමනා නැහැ. එතුමා පිළිබඳව මගේ විවේචනය දැන් අවසානයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, අයවැය ලේඛනය සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමටයි දැන් මා සූදානම් වෙන්නෙ. වෙනදා අයවැය විවාදවලදී දැක්වෙන උද්‍යෝගයත්, ලොකු තර්කත් මේවර දකින්නට ලැබුණේ නැහැ. විශේෂයෙන්ම විරුද්ධ පක්ෂයේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගේ (ආචාර්ය එන්. එම්. පෙරේරා) කථාව ගැන කල්පනා කරන විට, එතුමාගේ සාමාන්‍ය කථා ශෛලියත්, වෙනදාට දක්වන ධෛර්යයත්, වෙනදා මෙන් පහරවල් ගැසීමට තිබෙන ශක්තියත් මේ වාරයේ නොතිබුණු බව තමුන්නාන්සේට පෙනෙන්නට ඇති. ඒ මක් නිසාද? ඔහු කෝපයට පත්වූ, අදහස් බිඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැටුණු පුද්ගලයකු බව ඔහුගේ කථා වෙන්ම පෙනී ගියා. ඒ මක්නිසාද? අය වැය ලේඛනය පිළිබඳ අපේ අදහස් ප්‍රකාශ වූ විට තමන්ට අනාගතයක් නැති බවත් මේ අයවැය ලේඛනයට විරුද්ධව ඉදිරිපත් කරන්නට තරම් තර්කයක් නැති බවත් එතුමාට පෙනුනා. ඇත්ත වශයෙන්ම පසු ගිය අවුරුද්දේ තමන් ඉදිරිපත් කළ අය වැය ලේඛනය ආරක්ෂා කිරීමටත් ඔහුගේ දේශපාලන ප්‍රතිපත්ති තහවුරු කිරීමටත් කථා කළා විනා මේ අයවැය ලේඛනය සම්බන්ධයෙන් නියම තර්කයක් ඔහු ඉදිරිපත් නොකළ බව මා මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරනවා.

යම් ආණ්ඩුවක් අයවැය වාර්තාවක් ඉදිරි පත් කරන්නේ ඒ ආණ්ඩුවේ දේශ පාලන අදහස් අනුවයි. අපේ ආණ්ඩුවට පුළුවන්කමක් නැහැ, සමසමාජ පක්ෂයේ අදහස්වලට අනුවවත්, කොමියුනිස්ට් පක්ෂයේ අදහස්වලට අනුවවත්, ඒ දෙකට හවුල් වී මේ රටේ ජනතාව ඒකාධි පතිත්වයක් කරා ගෙනයාමට උත්සාහ කළ පක්ෂයක අදහස්වලට අනුවවත් අය වැය වාර්තාවක් ඉදිරිපත් කරන්න. අපි මේ අයවැය වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ අපේ දේශපාලන මතයන්ට අනුව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට මේ රට දියුණු කිරීම සඳහායි. එසේ නැතිව එක් එක් පුද්ගලයින්ගේ අදහස් සඵල කිරීමට වත් ඔවුන්ගේ අදහස් අනුව වැඩ කිරීමට වත් නොවෙයි. අපේ අදහස්වලට අනුව මේ රට සංවර්ධනය කොට මේ රටේ ජනතාව සුඛිත මුදිත කිරීමේ අදහසිනුයි, අපේ ගරු මුදල් ඇමතිතුමා මේ අයවැය වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ.

මට මතකයි, ඉලංගරත්න ඇමතිතුමා මේ සභාවේදී අයවැය වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ මන්ත්‍රීතුමා තුම්පනෙන් ආවත් ජනතාවගේ අභිවෘද්ධිය සඳහා සෑහෙන පියවර රාශියක් ඇතුළත් වාර්තාවක් ඉදිරි පත් කළා. නමුත් එතුමා දුන් පොරොන්දු බොහොමයක් ක්‍රියාත්මක වුනේ නැහැ. ඒ නිසා එයින් ජනතාව මුලා වුණා විනා ඔවුන්ට සෙතක් ඇති වූයේ නැහැ.

ඒ වාගේම මට මතකයි, දොම්පේ සමාජ වාදය අනුව ඉදිරිපත් වූ අයවැය වාර්තාව. අද බඩු මිළ ඉහළ නැග තිබෙනවාය, රෙදි පිළි නැත, අසවල් දේ නැත යනාදිය කිය මින් කෑගහන උදවිය එදා ඔවුන්ට බලය තිබියදී මොනවා කළේ දැයි මම අහනවා. බොහොම දෙනෙක් ඒ ප්‍රශ්නය අහන කොට කියනවා, අපේ කහල ගොඩවල් අවුස්සන්න වුවමනාවක් නැත, දැන් බල යේ සිටින්නේ තමුන්නාන්සේලාය, ඒ නිසා තමුන්නාන්සේලාගේ වැඩ ගැන කියන්නය කියා. නමුත් අවුරුදු ගණනක්ම පාලන බලය තමන් අතට ගෙන සිටි උදවිය මේ රටේ සංවර්ධනය පිණිස, ජනතාවගේ රැකීරක්ෂා හිඟ කමේ ප්‍රශ්නය විසඳීම පිණිස, දුප්පත් ගොවි කම් කරුවන්ට සහනය දීම පිණිස මොන විදියේ අයවැය වාර්තා ඉදිරිපත් කළා දැයි ඇසීම කාලෝචිත නොවේ දැයි මම අහනවා. ඒ අයවැය වාර්තාවෙන් ජනතා වගේ කෑම බීම, රෙදිපිළි, පොතපත ආදි සියළු දේකම මිළ ඉහළ ගියා.

ඊළඟට ඉරව්වටාචාර්යවරයෙක් මුදල් ඇමතිවරයකු වශයෙන් අයවැය වාර්තා වක් ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේදී අපි සන්තෝෂ වුණා, හුඟක් හොඳ අදහස් ඒ අයවැය වාර්තාවට අඩංගු වුණාය කියා. අපි කල්පනා කළා, ආර්ථික විද්‍යාව පිළිබඳ අද හස් බීපු, ඒවා නහරගත වී සිටින, ඕනෑම පදනමක් මත ප්‍රශ්න විසඳීමට පුළුවන් ඥාන ශක්තියක් ඇති කෙනෙක්ය, ඒ නිසා මේ රටේ ප්‍රශ්න හුඟක් විසඳාවිය කියා. නමුත් එතුමා ඒ අයවැය වාර්තාව සකස් කර තිබෙන්නේ යම් අවධියකදී සම් පූර්ණයෙන්ම මේ රටේ ඒකාධිපතිත්වයක් පිහිටුවීමේ පරමාර්ථයෙන් බව දැන් රහසක් නොවෙයි. නමුත්, එම අයවැය ලේඛනය විග්‍රහ කර බැලුවොත් පෙනේවි, තමන් යන මාර්ගය නොදැන එවැනි අය වැය ලේඛනයක් ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහයෝගය දී මලා වුණු බව. හොඳ දෙයක් තියෙනව නම්, එය ක්‍රියාත්මක වෙනව නම් අපි සන්තෝෂයි. ඒ එකක්වත් එලෙස කියාත් මක නොවුණු බව මතක් කරනව. එවකට මුදල් ඇමති තැන්පත් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) අයවැය ලේඛනය ඉදිරිපත් කරන වෙලාවේදී පෙන්නුම් කළා, ශත 25ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පොත් දෙනවය කියා. ඒ වගේම ආණ්ඩු වෙන් පොත් අච්චු ගහනවය කීව. මේ කටයුත්ත කුමන හේතුවක් නිසා ආණ්ඩුව භාර ගත්තද කියා තමුන්නාන්සෙ දන්න වද? පළමුවෙන්ම අච්චු ගහපු ඉංග්‍රීසි පොතේ කාගෙ නමද ලීවෙ? ඒක දන්නව ද? නිමල් මේරි පෙරේරා කියන නමයි ලීවෙ. තමන්ගෙ නම ප්‍රචාරය කර ගැනීමට——

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
පිරිමි නමක්ද, ගැණු නමක්ද?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
තමන්ගෙ දේශපාලන අදහස් ප්‍රචාරය කර ගැනීමට, ආණ්ඩුව මගින් මුදල් විය දම් කොට ඒ පොත් අච්චු ගසා ශත 25 ට දෙන්න කටයුතු කළා. ආගම ගැන බැලුවත් ඒ විධියයි. ආගම එපා වන විධියට, දවසින් දවස ක්‍රම ක්‍රමයෙන් ළමයින්ට ආගම පිළිබඳව තිබෙන ආශාව හීන වී යන විධියට, ක්ෂය වී යන විධියට පොත් පත් අච්චු ගැසීමට කටයුතු කළා. ඊළඟට යෝජනා කළා දින 5ක සතියක් ඇති කිරීම සුදුසුය කියා. ඒ කිසිවක් ඉටු වුණේ නැහැ. පෝය දිනයන් නිවාඩු කිරීම පිළිබඳව පොරොන්දුවක් දුන්න. ඒ එකක් වත් සපිර වුණේ නැහැ. බඩු මිල අඩු කරනව කීව. මොනවද අඩු වුණේ? අඩු වුණු දෙයක් නැහැ. සෑම ප්‍රශ්නයක්ම තිබුණට වඩා උග්‍ර වුණා. තමුන්නාන්සෙ දන්නව, රටේ තිබුණු තත්ත්වය තිබුණ වටත් වඩා උග්‍ර කළ බව. වුවමනාවට වඩා අය බදු පැනවීමෙන්, සාමාන්‍ය ධනයක් තිබුණු පුද්ගලයන් මිරිකා අරගෙන, ඔවුන් බිය කර මේ රටේ සෑම සංවර්ධනයකටම පහර ගැසූ බව තමුන්නාන්සෙ පිළිගන්නව ඇති. අපේ අයවැය ලේඛනයෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනා ක්‍රියාත්මක වීම ගැන හෝ නොවීම ගැන හෝ අවුරුද්දක් අවසාන වන විට බලන්න පුළුවනි. නමුත් අපි අද මේ විවේචනය ඉදිරිපත් කරන්නෙ ඔය පැත්තෙන් හදපු එකම අයවැය ලේඛනයක්වත් ක්‍රියාත්මක වුණේ නැති බව පෙන්නුම් කරන්නයි.

නොයෙකුත් කථාවලදී තමුන්නාන්සෙලාගේ දේශපාලනමය අදහස් එළිදරව් කළා. වැඩි වශයෙන් කියැවුණේ මෙම සභාවට ඉදිරිපත් කර තියෙන අයවැය ලේඛනය සම්බන්ධව නොවෙයි. තමන්ගෙ දේශපාලන අදහස්, රටේ තත්ත්වය යනාදි කරුණුයි, කියැවුණේ. බොහොම ස්වල්ප දෙයක් පමණයි අයවැය ලේඛනය සම්බන්ධව කියැවුණේ; නියම මාතෘකාව අනුව කියැවුණේ. තමන්ගේ දේශපාලනමය අදහස් තහවුරු කිරීම ගැනයි, හැම දෙයක්ම කියැවුණේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ අය, ඒ පක්ෂයෙ ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමෙ අදහසින් කථා කළා. මා තමුන්නාන්සෙලාගෙන් අහනව, මොකක් ද ඔය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයය කියන්නෙ, කියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැන කථා කරන පුද්ගලයන් දන්නවද, මොකක්ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයය කියන්නෙ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විස්තර කළ හැක්කෙ මෙසේයි: දක්ෂිණ අන්තවාදයත් නොවන, වාමාංශික අන්තවාදයත් නොවන, බුදුරජාණන් වහන්සේගේ මැද පිළිවෙත අනුව ගොඩ නංවන ලද සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදයක්. අන්න ඒකයි, නියම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්තිය. ඒ අනුව මා ගරු බණ්ඩාරනායක මැතිනියගෙන් සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ අයගෙන් අහනව, බණ්ඩාරනායක මැතිතුමාගෙ දේශනාවට අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයය කියන්නෙ, දක්ෂිණ අන්තවාදයක් නොවන, වාමාංශික අන්තවාදයක් නොවන පක්ෂයක් නම්, කෙසේද තමුන්නාන්සෙල වාමාංශිකයන්ට හේත්තු වුණේ, කියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
මොකද තමුසෙ දකුණට ගියෙ? [බාධා කිරීම්.]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

දකුණ ප්‍රජාතන්ත්‍රවාදීයි. වම ප්‍රජාතන්ත්‍රවාදී නොවෙයි. මම දකුණට හේත්තු වුණේ අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයක් නැති නිසයි.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

දකුණට හේත්තු වුණාද ?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයක් නැහැ කියා මා කියනව. වාමාංශික අන්තවාදීන් සමග අත්වැල් බැඳගෙන ක්‍රියා කරනව නම්, ඒ අදහස් ක්‍රියාත්මක කරන්ට අනුබල දෙනව නම්, මේ රටේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කරන්නේ ජාතියේ අනාගතය වැළලීමයි ; මේ රටේ ජාතියේ නිදහස පාවා දීමයි : බණ්ඩාරනායක මැතිතුමාගේ නම විකිණීමයි.

ආණ්ඩු බලය තිබෙන කාලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පොරොන්දු වුණා, රැකී රක්ෂා ප්‍රශ්නය විසඳනවාය, දුගී පැල්පතේ සිටින මිනිහාට උළු මාළිගා හදා දෙනවාය, පොල් අතු වහල වෙනුවට උළු වහල ලබා දෙනවාය, ජීවන බර අඩු කර ඕනෑ විදියට කන්ට බොන්ට අඳින්ට දෙනවාය, ගරු බණ්ඩාරනායක මැතිනියගේ දරුවන්ට දෙන අධ්‍යාපනයම ගමේ ගොඩේ පැල්පතේ ජීවත්වන දරුවන්ටත් ලබා දෙනවාය. කියා. එහෙම නම් අපි කවුරුත් සන්තෝෂයි. එහෙත් මේ රටේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳුවේ කොහොමද ? රක්ෂා දීමේදී උසස්ම තනතුරු දුන්නෙ තම තමන්ගේ ඇමතිවරුන්ගේ නෑදැයින්ට පමණයි.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

පැරදුණු අයට නම් දුන්නෙ නැහැ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

මා නම් වශයෙන් කියන්ට කැමතියි, දී තිබෙන රක්ෂාවල්. එමෙන්ම අපට විශාල කාර් වුවමනා නැත. අප තමුන්නාන්සේලා සාමාන්‍ය රෙදි බැනියම් අඳින උදවියය, අපි ගමේ ගොඩේ ජීවත්වන සිංහල කථා කරන පුද්ගලයන්ය, අපට හාමුදුරුවනේ කියන්ට වුවමනා නැත, තමුන්නාන්සේලාත් අපිත් එකයි, ආදි වශයෙන් මැතිවරණ පොරොන්දු දුන්න. එහෙත් අන්තිමේදී කුස්සිවල ඉන්න ගෑණුන්ටත් හාමුදුරුවනේ කියන්ට සිද්ධ වුණා. අප කුල භේදය සලකන්නෙ නැත කිව්ව. එහෙත් කුල භේදයෙන් හරිත, ආගම් භේදයෙන් හරිත, ජාති භේදයෙන් හරිත දේශ ද්‍රෝහී පිරිසක් හැටියටයි, දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ක්‍රියා කරන්නෙ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන අංශය දෙස බලමු. මේ රටේ ලක්ෂ ගණනක් උගත් තරුණයන් පාරේ රස්තියාදු වෙනව. ඔය කියන දරුවන්ට දෙන අධ්‍යාපනය තබා ඒ මිදුලකවත් ගමේ ගොඩේ දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්ට පුළුවන්ද කියා මා අහනව. ගම්බද දරුවන්ට එහෙම තැනක් තිබුණේ නැහැ. දවසින් දවස වැඩි වන ලක්ෂ ගණන් ජන ගහණය අනුව සමාන්තර වැඩ පිළිවෙළක් නැති නිසා රට අන්ත පරිහාණියකට දැමූ බව රහසක් නොවෙයි.

ඊළඟට මා කියන්ට කැමතියි, ලංකා සම සමාජ පක්ෂය හා ලංකා කොමියුනිස්ට් පක්ෂය ගැන. අප ඒ අයට ගරු කරනව විරුද්ධ වුණත්, යම්කිසි දේශපාලන ප්‍රතිපත්තියක් අනුව කිසි කෙනෙකුට ඒවා පාවා නොදී ඒ දේශපාලන අදහස් මුදුන්පත් කර ගැනීමට සටන් කරන පිරිසක් වශයෙන්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වගේ එක්කෙනාට හේත්තු වී බලය ලබාගෙන තම අදහස් විකුණන පිරිසක් නොවන නිසා මා ඊට වඩා දහස් වාරයක් ගරු කරන බව මතක් කරනව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකා සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය යම් දක මේ රටේ බිහි වුණාද, එදා සිටම බලය ඇල්ලීමේ උප ක්‍රමයක් උඩ දේශපාලන න්‍යාය ධර්මය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න]

වශයෙන් අනුගමනය කළේ, කඩාකප්පල් කාරී ව්‍යාපාරයක් ගෙන යාමයි. මේ රටේ ජාතික ධනය නැති කිරීමට, මේ රටේ ජනතාවගේ සමගිය නැති කිරීමට මේ රටේ නොයෙකුත් අවුල් වියවුල් ඇති කොට ඒ මඟින් එළියට ඒමට උත්සාහ ගත් පිරිසක් බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. [බාධා කිරීම්] ගරු සභාපති තුමනි, වදින කොට මේ උදවියට බොහොම අමාරු වෙනව. ඒ අයගේ හැටි එළිවන විට බොහොම අමාරු ඇති වෙනවා. දියෙන් ගොඩ දැමූ මාලු වගේ දඟලනවා.

ගරු සභාපති තුමනි, එදා මේ රටේ ඩී. එස්. සේනානායක මහත්මයා ආණ්ඩු කළ කාලයේදීත්, ඉන් පසු ඩඩ්ලි සේනානායක මහත්මයා ආණ්ඩු කළ කාලයෙදිත්, බණ්ඩාරනායක මහත්මයා ආණ්ඩු කළ කාලයෙදිත්, බණ්ඩාරනායක මැතිණිය ආණ්ඩු කළ කාලයෙදිත්—

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

ඇයි කොතලාවල මහත්මයා ආණ්ඩු කළ කාලයේ ?

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)
(The Hon. N. H. A. M. Karunaratne)

ඔව්, කොතලාවල මහත්මයත් මේ රට ආණ්ඩු කළා. දහනායක මහත්මයත් ආණ්ඩු කළා. ඔය කවුරු ආණ්ඩු කරන කාලවලදිත් මේ රට දියුණු කරන්නට ඉඩක් නොදී වැඩ වර්ජන දහස් ගණන් ඇති කොට මේ රටේ ජාතික ධනය සම්පූර්ණයෙන්ම නැති කර දමන්නට රුකුල් දුන් පිරිසක් තමයි මේ සමසමාජ පක්ෂයත් කොමියුනිස්ට් පක්ෂයත්. ගරු බණ්ඩාරනායක මැතිණිය මේ රටේ අගමැති වශයෙන් කටයුතු කරන කාලයේදී අවුරුදු ගණනක්ම යුද්ධ හමුදාවේ ආරක්ෂාවෙ ඇතිව පාලනය කරන්නට සිදු වුණේ කාගේ වරදින්ද ? සමසමාජ කොමියුනිස්ට් පක්ෂවල අය ඒ කාලයේදී දහස් ගණන් වැඩ වර්ජන ඇති කළා. නැව්වලින් බඩු බෑමට පිළිවෙලක් නැති වීම නිසා කෝටි ගණන් වටිනා බඩු නැති නාස්ති වී ගියා. නැව්වලට කෝටි ගණන් වන්දි ගෙවන්නට සිදු වුණා. ඒ විධියට කෝටි ගණන් ජාතික ධනය විනාශ කිරීම මුළු ජාතියටම ගැසූ පහරක් නොවේද කියා මම අහනවා. ඉර හඳ උලා කැවාක් මෙන් මේ රට කා දැමූ මේ පිරිස අද මේ ස්ථානයේ මහා ජාතික මමත්වයක් තිබෙන පිරිසක් හැටියට කෑ ගහනවා. ගරු සභාපති තුමනි, කිසිම ආණ්ඩුවකට සහයෝගය නොදී මේ රටේ ජනතාවගේ මිනිස් අයිතිවාසිකම් පවා වළලන්නට උත්සාහ කළ, මනුෂ්‍යයාගේ උත්පත්ති දායාදයන් වන කථා කිරීමේ සහ ලිවීමේ නිදහස නැති කරන්නට උත්සාහ කළ මේ වගේ දේශද්‍රෝහීන්ට මේ රටේ තැනක් තිබෙනවද කියා මම අහනව.

ගරු සභාපති තුමනි, අපි අද උත්සාහ කරන්නේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නටයි. අපගේ පරමාර්ථය ප්‍රජාතන්ත්‍රවාදයයි. මිනිසා විසින්, මිනිසාගේ වුවමනාවන් අනුව මිනිසාගේ යහපත තකා ගෙන යන පාලනයක් ඇති කිරීමයි අපේ පරමාර්ථය. අපේ දේශපාලන න්‍යාය ධර්මය ඒකයි. ඔය කෑගහන සම සමාජ කොමියුනිස්ට් වාදීන්ගේ දේශපාලන න්‍යායයන් අනුව, ඒ අයගේ ආණ්ඩුවකට විරුද්ධව වැඩ වර්ජන ඇති කළොත් දෙන දඬුවම මොකක්ද කියා ඔවුන් ප්‍රසිද්ධියේ කියා සිටින්නට ඕනෑ. ගුරුවරයෙක් වේදිකාවකට නැගී කථා කළොත් ඒ අයට දෙන දඬුවම මොකක්ද කියන ප්‍රශ්නයට ඔය සමසමාජ කොමියුනිස්ට් වාදීන් උත්තරයක් දිය යුතුයි. බස් ඩ්‍රයිවර් මහත්වරු වැඩ වර්ජනයක් ඇති කළොත් දෙන දඬුවම මොකක්ද ? ඔවුන් දෙන එකම දඬුවම ඒ මිනිසුන් බල්ලන් වගේ වෙඩිතියා දැමීමයි. නමුත් එය ප්‍රසිද්ධ වේදිකාවල කියනවද ? ඒක කියන්නට බයයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

තමුන්නාන්සේලා ගුරුවරුන්ට මොකද කළේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)
(The Hon. N. H. A. M. Karunaratne)

ඔව්, අපට ගුරුවරුන් නොයෙක් විධියට බැන්නා, විරුද්ධකම් කළා. නමුත් අප මොකක්ද කළේ? ගුරුවරුන් පිකදෙනකු මාරු කළා පමණයි. නමුත් කොමියුනිස්ට් ධර්මය අනුව එවැනි ගුරුවරුන්ට මොකද කරන්නෙ? බල්ලන් වගේ වෙඩි තියා දමනවා නේද? මේවා කියන විට විරුද්ධ පැත්තේ සිටින ගරු මන්ත්‍රීවරුන්ට බොහොම අමාරු ඇති වන බව අප දන්නවා. මේ අපේ ජාතිය වහල් බවට පත් කිරීම සඳහා ආගම් ප්‍රතික්ෂේප කරන ඉර හඳ උලා කෑ, ජේතවනාරාමයට ගල් ගැසූ ධන කුවේරයන් අතලොස්සකට ඉඩ දෙන්නට බැහැ. ධනපතියන් හංග වේවායි කිය මින් පොදු ජනතාව මුළා කිරීමට දඟලන ලංකාවේ සිටින විශාලම ධනපතියන් පිරිසට, බලය සඳහා දඩයමේ යන දේශද්‍රෝහී පිරිසට, මේ රටේ වැසියා උත්පත්තියෙන්ම ලැබූ දායාදය වූ උත්තම මිනිස් නිදහස පාවා දෙනවාදැයි මා ප්‍රශ්න කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම අයවැය ලේඛනය ගැන කථා කළ විරුද්ධ පැත්තේ සමහර ගරු මන්ත්‍රීවරුන් මෙහි "සමාජවාදය" යන වචනය දක්නට නැතැයි කනගාටුව ප්‍රකාශ කළා. මුලින්ම එසේ සඳහන් කෙළේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමායි. ඔව්, උන්නැහේලාගේ සමාජවාදය ගැන නම් අප මෙහි සඳහන් කෙළේ නැති බව ඇත්තයි. අප සඳහන් කෙළේ අපේ සමාජවාදය ගැන මිස කාගේ වත් සමාජවාදය ගැන නොවෙයි. කටින් සමාජවාදය දේශනා කරමින් තුවක්කු වෙන් බයිනෙත්තුවෙන් මිනිසා පාලනය කරන සමාජවාදයට අප එකඟ නැති බව මතක් කර දිය යුතුයි.

මා දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. සාමාන්‍ය යෙන් සැහෙන ධනයක් තිබෙන සංවර්ධන කටයුතු සඳහා වියදමක් දරන්නට පුළුවන් කම තිබෙන පෞද්ගලික අංශයද මේ රට සංවර්ධනය කිරීමේ කර්තව්‍යය සඳහා සම්බන්ධ කර ගත යුතුයයි අපේ දේශ පාලන ප්‍රතිපත්තිවලට අනුකූලව අප කල්පනා කරනවා. මෙතෙක් කල් යමක් කමක් තිබෙන උදවිය පාගා ගෙන වැක්ස් මගින් ඔවුන් සූරා කෑ නමුත්, එසේ ගත් මුදල් දුප්පතාගේ හිතසුව පිණිස නොයෙදූ බව කිව යුතුයි.

පසුගිය ආණ්ඩුව මේ රටේ කර්මාන්ත ඇති කළ ආකාරය ගැන ගරු කර්මාන්ත ඇමතිතුමා ඊයේ හොඳ හැටි විස්තර කර දුන්නා. පසුගිය කාලය තුළ කිසිම දෙයක් සම්බන්ධයෙන් මේ රට ස්වයංපෝෂිත කර නැති බව බොරුවක් නොවෙයි. මේ රට දියුණු කිරීමේ කර්තව්‍ය යේදී ගොවිතැනත් කර්මාන්තත් සමාන්තරව යා යුතු බව අප පිළිගන්නවා. පසු ගිය කාලයේදී අපේ විදේශීය තැන්පත් මුදල්වල පරිහානිය ඇති වුණා මිස මේ රටේ කර්මාන්ත දියුණුවක් හෝ කෘෂිකාර්මික දියුණුවක් හෝ කුමන දෙයක් සම්බන්ධ යෙන් වුවද සවයංපෝෂිත භාවයක් හෝ ඇති වුණේ නැහැ. මේ රට සවයංපෝෂිත කිරීමේ නියම වැඩ පිළිවෙළක් පසුගිය කාලය තුළ තිබුණේ නැහැ. එක පැත්තක් පමණක් බලා වැඩ කළ නිසා මේ රට අන්ත පරිහානියකට පත් වුණා. ඉඩම්ද තිබෙනවා නම්, මුදල් වියදම් කරන්නට පුළුවන් පිරිසක්ද සිටිනවා නම්, ඒ පිරිසට ඒ ඉඩම් තාවකාලික වශයෙන් පවරා ඒවා වගා කිරීමට ක්‍රියා කිරීම වැරදිද? ඒ වගේම දහස් ගණනක් සිටින උගත් තරුණ තරුණියන්ට රක්ෂා සැපයීමට මෙතෙක් කල් නිසි වැඩ පිළිවෙළක් යොදා නොතිබුණු නමුත් අප ඒ සඳහා මාර්ග යොදා තිබෙනවා. පසුගිය ආණ්ඩුව වගේ අපේ කර්මාන්ත බොරු නම්වලින් පෙනී සිටින බෝරාකාරයන්ට නොදී ලාංකිකයන්ට දෙන්නට කටයුතු කරනවා. ඒ වගේම අප ප්‍රතිපත්තියක් හැටියට දෙමළ භාෂාවට මේ රටේ යම්කිසි සථානයක් දෙනවද, ඒ දීම කරන්නෙ දිවංගත බණ්ඩාරනායක ගරු අගමැතිතුමා ක්‍රියාත්මක කරන්න උත්සාහ කළ, එසේම එතුමාගේ බලාපොරොත්තුව වී තිබුණු, එම දෙමළ භාෂාව පිළිබඳ පනත අනුවම ක්‍රියාත්මක කරමින් දෙන දීමක් බව මා මේ අවස්ථාවේදී තමුන්නාන්සෙට මතක් කරන්න කැමතියි. මේ රටේ රාජ්‍ය භාෂාව සිංහල භාෂාව වෙලයි තිබෙන්නෙ. ඒ බවත් මතක් කරන්න කැමතියි. කොපමණ තර්ජනය කළත් ඒ සම්බන්ධ යෙන් වෙනසක් නොවන බවත් කරුණා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න]

වෙත් මතක් කරන්න කැමතියි. මා සඳහන් කළ ඔය ප්‍රතිපත්තියට විරුද්ධව යමක් අප ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන්නෙ නැහැ. බෞද්ධයින්ට, මේ රටේ හිමි වියයුතු නියම ස්ථානය සම්පූර්ණයෙන්ම ලබා දෙන අතර අනෙකුත් ආගම් අදහන සියල්ලන්ගේම සාධාරණ අයිතිවාසිකම් ආරක්ෂා කර දෙමින් ඒ උදවියත් සමග සහයෝගයෙන් මේ රටේ දියුණුව සඳහා වැඩ කරගෙන යාමට අප සූදානම් බවත් ඒ සමගම මතක් කරන්න කැමතියි. අයවැය ලේඛනයෙන් ඒ සියල්ලක්ම ඉදිරිපත් කර සෑම දෙනෙකුම ආරක්ෂා වන අන්දමටයි අප ක්‍රියා කරන්නෙ. එසේ නැතිව බල ලෝභයෙන් මත් වී තමන්ගෙ දේශපාලන අදහස් විකුණා හෝ එසේ නැත්නම් ඒවා උගස් කර හෝ කොමියුනිස්ට් පක්ෂයට හෝ සමසමාජ පක්ෂයට හෝ වෙන ඕනෑම යකෙකුට හෝ එකතු වී බොරු ප්‍රචාරයන් ගෙන යන පුද්ගලයන් පිරිසක් නොවෙයි අපි. සත්‍ය ලෙස කථා කරන්න සූදානමින් සිටින ඕනෑම කෙනෙක් මා කියන දේ නිවැරදි බව ප්‍රකාශ කරනවා නිසැකයි. එහෙම නම් විරුද්ධ පාර්ශ්වයේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලා පිළිගන්නවා ඇති විරුද්ධ පාර්ශ්වයේ ගරු නායකතුමිය එක්තරා කාලයකදී ප්‍රසිද්ධ සභා රැස්වීම් වලට ගිහිල්ලා කළ කථාවලදී ආචාර්ය එන්. එම්. පෙරේරා තමයි මගෙ සැමියා නොමරා මැරුවෙ යනුවෙන් ප්‍රකාශ කර තිබෙන බව.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

කවුද කිව්වෙ? අහගෙන හිටියද?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என்.எச்.ஏ.எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ඔය ඒකාධිපති වාදය ඔස්සේ ගමන් කරන්න බලාපොරොත්තු වන උදවියත්, ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන උදවියත් යන මේ දෙකොටස එකට පැහෙන්නෙ කොහොමදැයි මා අහනවා. එතකොට ඒක මොන දේශපාලන ක්‍රමයක්ද? මොකක්ද එයින් සිද්ධ වන්නෙ කියල මා අහනවා. ලංකා සමසමාජ පක්ෂයත්, කොමියුනිස්ට් පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එකට එකතුවී ආණ්ඩුවක් පිහිටුවා ගැනීම, ඒ කණ්ඩායම් එකට එකතු වීම හත් හවුලක් නම් නොවෙයි තමා. ඒ වුණාට ඒ තරම් අච්චාරු හැළියක් මේ ශ්‍රී ලංකාද්වීපයෙහි කවදාවත් බිහි නොවූ බව මා දැන් තමුන්නාන්සෙට මතක් කරන්න කැමතියි. ඔය අච්චාරුව නම් නියම ද්‍රව්‍යයන් සංයෝග වීමෙන් සෑදුණු අච්චාරුවක් නොවෙයි. නියම ද්‍රව්‍ය එකතු කර සාදාගත් අච්චාරුවක් නම් කන්නත් පුළුවනි. එහෙත් මේ විධියෙ, එකකට එකක් නොගැළපෙන ද්‍රව්‍ය සමූහයක් එකට එක් කර සාදා ගත් ඔය අච්චාරුව නම් බල්ලෙකුටවත් කන්න පුළුවන්කමක් නැති බව කියන්න කැමතියි. ඒ නිසාම ඒ අච්චාරු හැළිය මේ රටේ මහජනතාවට එපා වී වීසි කළ බව පමණක් මා මේ අවස්ථාවේ මතක් කරන්න කැමතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, අපේ මේ ජාතික ආණ්ඩුව කැඳ හැළියක්ය කියල කවුදෝ කියනව මට ඇහෙනවා. අප කැඳ නොවෙයි හදා තියෙන්නෙ. අපි ඔය කැඳ බොන ජාතියෙ මිනිසුන් එහෙම නම් නොවෙයි. ඔය වාගේ කැඳ ගොට්ටෝ නොවෙයි අපි. හොඳට හදා ගත් බිරියානි කන ජාතියෙ අයයි අපි. තවත් බොහෝ කථිකයන් ඉන්න නිසා මගේ කථාවට වැඩි වේලාවක් ගැනීමට මා බලාපොරොත්තු වන්නෙ නැහැ. එහෙත් මගේ කථාව අවසන් කරන්න පෙර එකක් කියන්න ඕනෑ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවිය කොයි තරම් පිළිතුරු දෙන්න හැදුවත් මා කනගාටු වෙනවා, ඒ උදවියගෙන් සිදු වුණු දේවල් මොනවද කියන එක ගැන දැන් මේ රටේ මහජනයා තීරණය කර ගෙන ඉවරයි. මේ රට වහල් භාවය කරා ගෙන යාමට, එසේ නැත්නම්, තම තමන්ගේ ආශාවන් මුදුන්පත් කර ගැනීමට, අගමැතිකම් සහ මැති ඇමතිකම් තහවුරු කර ගැනීමට ලංකා ජාතිය උගස් කළ පිරිසක් එහි සිටින බව තමුන්නාන්සෙත් පිළිගන්නවා ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවසාන වශයෙන් මා කියන්න කැමතියි, මහේශාක්‍යකමින් ජීවත් වීමට වෑයම් කළ ඇමතිවරු එක එක්කෙනා ක්‍රමානුකූලව අයින් වුනු හැටිත් ඔවුන්ගේ තත්ත්වය බැහැපු හැටිත් ගැන. මහජනයා බලවේගය ඒ උදවියට එරෙහිව නැගිගෙන ආ නිසයි එහෙම දෙයක් සිද්ධ වුණේ. ධනපති සමාජවාදය මේ රටෙන් තුරන් වුණු බව තමුන්නාන්සෙ දන්නව. ඒ අතර නියම සමාජවාදය යම්තම් හමාගෙන එන මඳ සුළං පාරක් වගේ රට තුළට ඇතුළු වේගන එන ආකාරයත් තමුන්නාන්සෙට පෙනී යනවා ඇති.

විරුද්ධ පාර්ශ්වයේ ගරු නායකතුමියගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැන මතක් කරන්න ඕනෑ. දැන් ඒ පක්ෂයේ හංසයා අවසාන සින්දුව කියනව. එයින් දිවංගත බණ්ඩාරනායක මැතිතුමාගේ නම කියැවෙනව. ඒ සින්දුව කියන ගමන් අවසන් වරට තටු ගහන බව තමුන්නාන්සෙට මතක් කරන්න කැමතියි.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
එච්චර ලේසි නැහැ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
අපි ඒ සෑම බලවේගයකටම දැන් සූදානම්. මේ රටේ ජනතාව දැන් ඉල්ලන්නෙ මොනවද? අවුරුදු නවයක් තිස්සේ ඔය විරුද්ධ පාර්ශ්වයේ දැන් සිටින ඇතැම් උදවිය මේ රට කාලා දැන් කජු පුහුලන් හපය වගේ කරලයි තියෙන්නෙ. ලක්ෂ කෝටි ගණන් මහජන මුදල් වලින් විශාල ලෙස කළ දේ මොනවද? විශාල සුඛෝපභෝගී කාර් අරන් මුළු රට බංකොලොත් කළා නේද? මේ රට නැවතත් සංවර්ධනය කොට ප්‍රකෘතිමත් කිරීමේ භාර දූර කටයුත්තයි දැන් අපට තියෙන්නෙ. ඒක දවසෙන් දෙකෙන් කරන්ට පුළුවන්කමක් නැහැ. මාස තුනෙන් හතරෙන් අපෙන් අහනව, මෝලට උක් ගස් කෝ, කියා. මහවැලි ගඟ හැරෙව්වද කියා අපෙන් අහනව. කුඹුරු අස්වද්දා තිබෙනවද කියා අපෙන් අහනව. ඉපදුනු හැටියේ නැගිටලා ඇවිද්ද නවීරු හෝ මන්ත්‍රීවරයෙක් ඔය පැත්තෙ ඉන්නවද කියා මම අහනව. අවුරුදු 9 ක් පොල් ගාලා දැන් අරව කෙරුවද, මේව කෙරුවද, කියා අපෙන් අහනව. කිසි දෙයක් කර ගන්න බැරිව, රටේ ජාතික ධනය නැති කරල, තමන්ගේ පවුල්වල අයට පමණක් රැකීරක්ෂා හිමි කරගෙන, දේශද්‍රෝහීන් හැටියට මේ රටේ වැඩ කරල මොනවද කළේ කියා දැන් අපෙන් අහනව. මෝලක් හැදුව නම් ඒ මෝලට දවස් තුනකට සෑහෙන උක් ගස් නැහැ. කම්මාන්ත ශාලාවට අමු ද්‍රව්‍ය නැහැ. අමු ද්‍රව්‍ය නිපදවන්ට ක්‍රම සලස්වා නැහැ. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු පෙන්නුම් කරල දුන්නේ හිටපු ඉඩම් ඇමතිතුමා කිසිම සංවර්ධන වැඩක් කළේ නැත. දැන් මේ පැත්තෙ ඉන්නෙ ඒ වගේ කෙනෙක්ය කියායි. ඒ විධියේ පුද්ගලයෙක් හිටියානම් ඔහුගේ අදක්ෂකම බලා වහම ඔහු අස් නොකළේ මක්නිසාද කියා මම අහන්න කැමතියි. ඒ විධියේ සංවර්ධන වැඩ ගැන බලාපොරොත්තුවක් තිබුනා නම් තමුන්නාන්සේලා ඒ ඇමතිතුමා අස් කරන්ට ඕනෑ. නමුත් එතුමාව අස් කරන්නට ප්‍රථම එතුමා ඒ අය අස් කළ බව මම කියන්නට කැමතියි.

මම සී. පී. ද සිල්වා ඇමතිතුමාට ගරු කරනව, එතුමා ඒ පිරිස් අස් කර ආණ්ඩුවක් පිහිටුවීමට උදව් දීම ගැන. අපට විරුද්ධව මොන විධියේ චෝදනා නැගුවත්, දේශපාලන වේදිකාවල අපට විරුද්ධව මොන විධියට කථා කළත්, ඒ ආණ්ඩුවෙන් කෙරුණු වැඩත්, අප කරන්නට යන වැඩත් මහජනයා දන්නව. අපි අවුරුදු 5 ක් වැඩ කරගෙන යන විට, අපේ ප්‍රතිපත්ති අනුව, අපේ අයවැය ලේඛන අනුව අපට වැඩ කරන්න බැරි වුනොත් මහජනයා අතේ බලය තියෙනව, කතිරයක් ගැසීමෙන් අප පරාජය කරන්නට. මහජනයාට ඒ නිදහස තිබෙනව. නමුත් තමුන්නාන්සේලා අතට ආණ්ඩුව ගියොත් මේ ආත්මයේදී කතිර ගහන්න ලැබෙන්නෙ නැහැ. එහෙම වුනොත් අපට සිදු වන්නෙ තුවක්කුවට, බයිනෙත්තුවට බය වෙලා, ජීවිතයක් නැති ගස් ගල් වගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න]

ඉන්නයි. ඒ නිසයි, ප්‍රජාතන්ත්‍රවාදය රැකීමට අපේ මේ සටන ගෙන යන්නේ. බුද්ධාගම තියෙන මේ රටේ, වෙනත් ආගම් තියෙන මේ රටේ, ඒකාධිපති වාදයක් ගොඩ නංවා ලක්ෂ සංඛ්‍යාත ජනකායක් සපත්තුවට පාගාගෙන සිටීමට, ඉර හඳ උලා කාපු අතලොස්සකට මේ රටේ ජනතාවගෙන් කවදාවත් බලය ලැබෙන්නෙ නැති බව මම ප්‍රකාශ කරන්න සතුටුයි. ප්‍රජාතන්ත්‍රවාදය විකුණා, මේ රටේ මිනිස් අයිතිය උකස් කර බොරු ප්‍රචාර කරමින්, මේ රටේ බලයට පත් වන්නට සූදානම් වන මේ පිරිසට මේ රටේ මහජනයා පිළිතුරු දෙන්න සූදානම් බවත්, උපක්‍රම බලයෙන් අවුරුදු ගණනක් තිස්සෙ දඟල දඟලා සිට අද වෙඩි වැදී වියරු වැටුණු කොටින් මෙන් දඟලන මේ පුද්ගලයන්ට මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයෙන් තැනක් නොලැබෙන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 6.36

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
(Mr. T. B. Tennekoon—Dambulla)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප හා දීර්ඝ කාලයක් එකට වැඩ කළ තමුන්නාන්සේ මූලාසනයේ සිටින වේලාවකදී කථාකරන්න ලැබීම ගැන හා අප සමග දීර්ඝ කාලයක් පොල් ගෑ අපේ මිත්‍ර ගරු සමාජ සේවා ඇමතිතුමා කථා කළාට පසුව කථා කිරීමට ලැබීම ගැන මා ඉතාම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ නුවරට කිට්ටුව දුම්බර කියා ප්‍රදේශයක් තිබෙනවා. අපේ සමාජ සේවා ඇමතිතුමාගේ කථාවෙන් පසුව ඒ දුම්බර ගමේ මිනිස්සු මට මතක් වුණා. එක ගමක් තිබෙනවා කටුගස්තොටටත්, උඩතලවින්නටත් අතර. අපේ ගමට අල්ලපු ගමයි. ඒ ගම කොටස් දෙකකින් සමන්විතයි; එකක් එගොඩ ගම, අනික මෙගොඩ ගම. ඒ එක ගමක අය අනික් ගමේ අය හා යම් කලබලයක් ඇති වුණොත්, එදාට ඒ ගමේ හැම දෙනාටම කියනවා, "අර එගොඩ ගමේ අහවලා මෙහෙම දෙයක් කළා, ඒ නිසා උඹලා හැම දෙනාම අද මෙහා ගමේ වේල්ල උඩට එන්න ඕනෑ, අනික් ගමේ උදවියට බණින්න" කියා. ඒ විධියට මිනිසුන් එකතු කරගෙන අර අනික් ගමේ අයට බණිනවා. [බාධා කිරීම්] මා කියන කථාව අහගෙන හිටියොත් තේරේවි. ගරු වත්තෙගම මන්ත්‍රීතුමා (පී. බී. ඒ. වීරකෝන් මයා.) මේ ගම ගැන දන්නවා. අපි පොඩි කාලයේයි මේ තත්ත්වය තිබුණේ.

ඔය විධියට දෙගොල්ල දෙපැත්තට වී බැනගන්නවා. පළමු දවසේ මෙහා ගමට වී එහා ගමේ අයට බැන්න කෙනෙක් එහා ගමට ගියොත් අනික් පාර එහා ගමේ අයට එකතු වී මෙහා ගමේ අයට බණින්න පටන් ගන්නවා. ඊයේ මේ ගමේ අය හා එකතු වී එහා ගමේ අයට බැන්න පුද්ගලයාට එහා ගමට ගොස් ඔවුන්ට එකතු වූ විට අර ඊයේ බැන්න එක මතක නැති වෙනවා. අද බනින්නේ අනික් ගමේ අයටයි. ගරු සමාජ සේවා ඇමතිතුමාගේ කථාවෙන් පසුව මට මතක් වුණේ ඒකයි. උන්නැහේ අප හා පෞද්ගලිකවත්, පොදුවේත් කළ කථා අපට මතක තිබෙන නිසා, මට ඒ කථා මතක් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1936 ගැන මට හොඳට මතක තිබෙනවා. 1936 දී දැනට සිටින සමාජ සේවා ඇමතිතුමා කී කථාවමයි එදා මාත් කීවේ. 1936 දී ඇදිගම සාමාන්‍ය ජනතාව ධනවාදීන් සමග සටන ගෙන ගිය අවස්ථාවේදී එතුමාගේ පිරිසගෙ පැත්ත ගත් අපටත් වැදුණු පහරවල් ගුටි බැට හොඳට මතකයි. එමෙන්ම අපට ලැබුණු තාඩන පීඩන මට හොඳට මතකයි. දැනට කර්මාන්ත ඇමති ධුරය දරන අපේ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාටත් හොඳට මතක ඇති.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

දැන් මතක නැහැ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

එදා 1936 ගැන එතුමාටත් හොඳට මතක ඇති. [බාධා කිරීමක්] 1936 දී අපට නායකත්වය දුන් එතුමා කළ කටයුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දැනුත් අපට හොඳට මතකයි. එදා අප යම් කිසි ප්‍රකාශයක් කළා නම්, එදා අප යම් කිසි ප්‍රතිපත්තියක් අනුව ක්‍රියා කළා නම් ඒ ප්‍රකාශත් ඒ ප්‍රතිපත්තිත් 1936 දී කී ආකාරයටම දැනුත් ඉදිරිපත් කරන්නට අපට ශක්තියක් තිබෙන බව ස්ථිර වශයෙන්ම කියන්නට පුළුවන්. නමුත් දවසින් දවස වෙනස් වෙනස් ආකාරයට කථා කර තිබෙන අපේ සමාජ සේවා කට යුතු පිළිබඳ ඇමතිතුමා 1961-62 අයවැය ලේඛනය පිළිබඳව, දොම්පේ සමාජවාදය පිළිබඳව, මේ ගරු සභාවේ කථා කළ හැටි මා දැන් හැන්සාඩ් වාර්තාවෙන් පෙන්වන්නයි සූදානම් වෙන්නෙ. මෙන්න ඒ කථාව :

"ඉතින් එයින් මොකක්ද පිළිගන්නෙ? මේ රටේ සංවර්ධනයක් කෙරෙන්න ඕනැ. "අපි කපමු හාල් ආධාර මුදල" කියා තීරණය කළා. ඊළඟට දුප්පතාගෙ බඩටම වදින්න කිසිම අනුකම්පාවක් දක්වන්නෙ නැතුව ඔය අප්පලා එක පාරම හාල් සේරුවෙ මිල නැංගුවා. දුප්පත් පාසල් දරුවාට දීගෙන ආ කිරි වීදුරුවටත් බනිස් ගෙඩියටත් ගහලා අද මෙතන ලොකුවට ගර්ජනා කරනවා විලි ලජ්ජා නැතුව. එහෙම කරපු පුද්ගලයන්ගෙ තරම කාටද නොතේරෙන්නෙ? ඔය විධියට ක්‍රියා කළ පුද්ගලයන්ගෙ ඇත්ත වශයන්ම අනුගමනය කරන්නෙ සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදය නොව ඒකාධිපති ධනේශ්වරවාදී ප්‍රජාතන්ත්‍ර වාදයම බව පැහැදිලිව පෙනෙනවා. මේ පුද්ගලයෝ කවුද, ඔවුන්ගේ පාට මොකක්ද, යන්න ඉතාමත් පැහැදිලි ලෙස දැන් තමුන්නාන්සේට පෙනී යනවා ඇති. කවුස්සත් ඔවුන්ගේ පාට කොපමණ වෙනස් කළත් කවුස්සා කවුස්සාමයි. එසේම එක්සත් ජාතික පක්ෂයේ පුද්ගලයන් තමන් අනුගමනය කරන ප්‍රතිපත්ති ආදිය සම්බන්ධයෙන් කොපමණ පාට වෙනස් කර කථා කළත් ඔවුන් කවුද කියා අපට හඳුනා ගන්න පුළුවනි. අපට ඔවුන් හඳුනා ගන්නට බැරිකමක් නැති බවට මෙයම සාක්ෂියක් හැටියට සෑහෙනවා." (නිල වාර්තාව, 1961 අගෝස්තු 11; 43 වන කාණ්ඩය; තීරුව 1920)

ඒ අවුරුදු තුනකට පෙර සමාජ සේවා ඇමතිතුමා එක්සත් ජාතික පක්ෂය වර්ණනා කළ හැටි. ඊටපසු අපේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමති වශයෙන් අවසන් වරට 1964-65 අයවැය ලේඛනය ඉදිරිපත් කළ අවස්ථාවේදී සමාජසේවා ඇමතිතුමා කළ කථාවත් මේ හැන්සාඩ් වාර්තාවේ සඳහන් වෙනව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, අර අපේ මුස්ලිම් සහෝදරවරු තොප්පිය හරවන්නා, මාරු කරන්නා වාගේ සමාජ සේවා ඇමතිතුමාත් අද එකක් කියා හෙට තවත් එකක් කියනව හරියට අපේ කටුගස්තොට ගමේ මිනිසුන්වගේ. ඇත්ත වශයෙන්ම එක එක අවස්ථාවට එක එක විධියට කථා කරන්නට තරම් මේ අයට ආත්ම ශක්තියක් තිබීම ගැනයි මා පුදුම් වෙන්නෙ.

**අබ්දුල් බකීර් මාකර් මයා.**

*(ஜனாப் அப்துல் பாக்கிர் மாக்கார்)*

(Mr. Abdul Bakeer Markar)

I rise to a point of Order, Sir. The hon. Member in making that remark is insulting a community.

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரீ. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මා ඉදිරිපත් කළ උපමාවෙන් අපහාසයක් උණා නම් මා ඉතාමත් කණගාටුවෙනවා. ඒ වචන මා අස්කර ගන්නවා. තමුන්නාන්සේ දන්නවා සාමාන්‍යයෙන් ඒ විධියේ වචන අප කවදත් මේ ගරු සභාවේ පාවිච්චි කරන බව. මා ඒක කාටවත් අපහාසයක් කිරීමේ අදහසින් කී කථාවක් නොවෙයි.

1961 දී ආණ්ඩුවට විරුද්ධව ඉදිරිපත් වූ විශ්වාස භංග යෝජනාව විවාද වෙද්දී සමාජ සේවා කටයුතු භාර ඇමතිතුමා ඔතැනම සිටගෙන කළ කථාවේ සුළු කොටසක් මම දැන් කියවන්නම් :

"ගරු කථානායකතුමනි, කොයි තරම් හොඳ වැඩක් කරන්න හැදුවත් සදහටම විරුද්ධ වන්නටම සිටින, සුදු දේ කළුය කියා පෙන්වන්නට හදන ආත්මාර්ථකාමී ලෙස බලය ලබාගැනීමට උත්සාහ කරන දේශද්‍රෝහීන්ට මේ රටේ තැනක් නැති බව මම ප්‍රකාශ කරන්න කැමතියි. තමුන්නාන්සේලාගේ ද්‍රෝහීකම මහජනයා දැනගෙන තිබෙන බව මම කනගාටුවෙන් කියනවා. ප්‍රගතිය කරා ගමන් කරන ආණ්ඩුවකට විරුද්ධව කොපමණ විශ්වාස භංග යෝජනා ගෙනාවත් ඒ ආණ්ඩුව බිඳ හෙළන්නට බැරි බව ඉතාමත් පැහැදිලි දෙයක්. ඔවැනි නරක චේතනාවලින් ඉදිරිපත් කරන අදහස්වලින්, මෙම ආණ්ඩුව සමාජවාදය කරා තබන කිසිම පියවරක් වෙනස් කරන්නට බැරි බව තමුන්නාන්සේට පෙනෙනවා ඇති. පඹගාලේ පැටළුනාක් මෙන් සිටින, දියෙන් ගොඩගත් විට ගැහෙන මාළුවන් මෙන් සිටින, මේ අය විසින් ඉදිරිපත් කරන ලද මෙම විශ්වාස භංග යෝජනාව ගැන මගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]
කණගාටුව ප්‍රකාශ කරමින් මගේ වචන සවල්පය අවසන් කරනවා."—(නිල වාර්තාව, 1961 පෙබරවාරි 21; 42 වන කාණ්ඩය, තී. 2048.)

එතුමා එදා ඒ ගොඩේ සිටගෙන මේ ගොඩේ සිටි අයට කී විදියයි, එහි තිබෙන් නේ. මේ ගරු සභාවේ දී ඒ ඒ අවස්ථාවේ දී වෙනස් වෙනස් අන්දමේ කථා කීම තමන් නියෝජනය කරන ප්‍රදේශයට කරන අවනම්බුවක් බව මම ඒ ඇමති තුමාට මතක් කරන්න කැමතියි. එතුමා කළ මෙවැනි කථා සිය ගණනක් මට පෙන් වන්න පුළුවනි. එතුමා අප වාගේ රෙද්ද බැනියම අඳින කෙනෙක් නොවෙයි, හැම දාම. උන්නැහේ කාලයක් අප සමඟ රෙද්ද බැනියම ඇන්ද බව මට මතකයි. නමුත් දැන් උන්නැහේ වෙනස් වෙලා. ඇඳුමෙන් මෙන්ම කථාවෙනුත් වෙනස් වෙලා. දැන් අඳින්නේ කලිසම් කෝට්. කලිසම් කෝට් ඇඳගෙන සුද්දෙක් වාගේ සිටින නිසා මම හිතුවා, අද ඉංගිරිසියෙන් කථා කරාවිය කියා. හොඳ සූට් එකක් ඇඳ ගෙන සිටියත් සිංහලෙන් කථා කිරීම ගැන මම ඒ ඇමතිතුමාට ස්තුති කරනවා. [බාධා කිරීමක්]

ඇතැම් මන්ත්‍රීවරුන් මෙන් මම කථා කරන්න යන්නේ නැහැ, වේදිකාවල කියන කථා පිළිබඳව. මම මේ සභාවේදී කරන ලද කථා පිළිබඳවයි, සඳහන් කළේ. නමුත් සමාජ සේවා ඇමතිතුමා දැන් කථා කළේ අයවැය ලේඛනය පිළිබඳවද, නැති නම් වේදිකාවල කථා පිළිබඳවද කියා තමුන් නාන්සේලාට පෙනෙන්න ඇති. හොඳක් තිබෙනවා නම් කවුරු ගැන වුවත් එය කියන අතර වරදක් තිබෙනවා නම් එයත් කීම වරදක් නොවෙයි. මගේ වරදක් තිබෙනවා නම් තමුන්නාන්සේලා එය පෙන්නා දුන්නොත් මම පිළිගන්න ලැස්තියි. අපි සර්වනිර්දෝෂී, නිවන් දෙරට කතුලක් ලං කර සිටින උදවිය නොවෙයි. අපේ වැරදි තිබෙන්න පුළුවන්. ඒ වැරදි අපක්ෂපාත ලෙස, මෛත්‍රී සහගතව පෙන්වා දෙනවා නම් අපි ඒවා ගෞරව පූර්වකව පිළිගන්න කැමතියි. මෙම ගරු සභාවෙ පවත්වන ලද අයවැය ලේඛන විවාද 10 කට සහභාගි වීමෙ අවස්ථාව, අද වන විට මට ලැබී තිබෙනවා. කුමන පක්ෂ යෙන් ආවත් මධ්‍යම පළාතෙන්ම එම පුළුවන්කම ලැබුණේ මටයි. මේ අයවැය ලේඛනයත් සමග පිට පිටම අයවැය ලේඛන 10 කට සහභාගි වීමෙ අවස්ථාව මට ලැබීම ගැන මා සතුටු වන අතර— [බාධා කිරීම්] මට ඇහෙන්නෙ නැහැ. මේ ඉස්සරහට ඇවිත් කතා කරනව නම් ඒවට පිළිතුරු දෙන්ට පුළුවනි. මේ අය වැය ලේඛන විවාදයට පෙර අපේ රජ යෙන් ඉදිරිපත් කරන ලද අයවැය ලේඛන 9 කට මා සහභාගි වී තිබෙනව. අද, 10 වන වතාවෙ සහභාගි වන මෙම විවාදයට මුල් අයවැය ලේඛනය වෙනත් පක්ෂයකින් ඉදිරිපත් කරන ලද්දක්. පසුගිය අයවැය ලේඛන නවය දෙස කල්පනා කර බලන විට මට එකපාරටම——

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
මෙතරම් හොඳ එකක් පෙනෙන්න නැහැ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(M. T. B. Tennekoon)
මට පේනව, මෙම 10 වන අයවැය ලේඛ නයෙ තිබෙන වෙනස කුමක්ද කියා. අපේ සමාජවාදී අයවැය ලේඛනවලින් පිටස්තර ධනපති අයවැය ලේඛනයක් ලෙස මට මෙය හැඳින්විය හැකියි. මේ ගැන සිතෙන විට අපේ ගම්වල භාවිත වන පැරණි කවි යකුත් මට සිහිපත් වෙනව. සමහරවිට මේ කවිය ගම්බද ප්‍රදේශවලින් පැමිණ සිටින මන්ත්‍රීවරුන් සියළුදෙනාම වාගෙ අසා තිබෙන්ට පුළුවනි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
"ඇත්ත" පත්‍රයෙ දමන්න.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(M. T. B. Tennekoon)
මෙම අයවැය ලේඛනය පිළිබඳව මට කල්පනා වෙන්නෙ මේ පිළිවෙළටයි: [බාධාකිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මෙම සභාව පාලනය කරන්නෙ තමුන්නාන්සෙද එහෙම නැතිනම් මේ හැම දෙනාමද කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා දැනගන්න කැමතියි. හැමෝම අරෙ හෙත් මෙහෙත් ප්‍රශ්න අහනව. තමුන් නාන්සෙ කියන හැටියට නම් මට මෙම කථාව කර ගෙන යන්න පුළුවනි.

**මූලසනාරූඪ මන්ත්‍රීතුමා**
*(தலைமை தாங்கும் அங்கத்தவர் அவர்கள்)*
(Mr. Presiding Member)

කරුණාකර මා දිහා බලා කතා කරන්න; මා තමයි පාලනය කරන්නෙ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(M. T. B. Tennekoon)

බොහොම හොඳයි, එය දැනගත්ත එක. ඒක ලොකු වැදගත් කාරණයක්. අනික් අය ගැන මට වුවමනාවක් නැහැ. මෙම අයවැය ලේඛනය මට පෙනෙන හැටි දක්වීම සඳහා පැරණි කවියක් මා කියනව. මෙන්න, ඒ කවිය :

ගසට කෙටුම ගස මුල පාවුමෙන් දනෙයි
අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දනෙයි
හානා ගිය පානා අඩහැරෙන් දනෙයි
මිනිහා නොමිනිහා යන කඩිසරෙන් දනෙයි

[බාධාකිරීම්] කවියක් හොඳට ඇදල කියන්න ඕනැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்சா)*
(Mr. Bernard Soysa)

I rise to a point of Order, Sir. I should like to remind you that there was a Ruling in the 1956 Parliament which was contrary to the earlier accepted position that this was singing. The Ruling was that a Member is entitled to recite Sinhala *kavi* in the manner in which it should be recited. I want to bring to your notice that there was such a Ruling by Mr. Ismail who occupied that Chair.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
*(தலைமை தாங்கும் அங்கத்தவர் அவர்கள்)*
(Mr. Presiding Member)

The hon. Member can recite the *kavi* ; he cannot sing it. [බාධා කිරීමක්] මට බොහොම කනගාටුයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කවියෙන් කියවෙන්නෙ මහජනයා බලාපොරොත්තු වූ කිසිවක් මේ අය වැය ලේඛනයෙන් ලැබී නැති බවයි. මෙය සම්පූර්ණයෙන්ම ධනවාදී අය වැය ලේඛනයක් මිස සමාජවාදී අය වැය ලේඛනයක් නොවන බව පැහැදිලිව පෙනී යනව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ වියළි කලාපයේ ගම්වල ජීවත්වන මිනිසුන්—ගරු මුදල් ඇමතිතුමාත් නියෝජනය කරන්නෙ වියළි කලාපයේ ආසනයක්—ඉතා භයට පත්වී සිටිනව, ආණ්ඩුවේ වර්තමාන ඉඩම් ප්‍රතිපත්තිය පිළිබඳව. අප දන්නව, ඉතා දීර්ඝ කාලයක් හේන් වශයෙන් පාවිච්චි කළ මුඩු බිම් ඒ කාලයේ සුද්දන්ගේ ආණ්ඩුව මගින් අක්කරය සත 25 ට 50 ට සුදු කොම්පැණිකාරයන්ට අත්පත් කර දී අපේ ගම්වැසියන් ඔවුන්ගේ කුලිකරුවන් කළ බව. අද අපේ වියළි කලාපයේ ගම්වලට සිදුවී තිබෙන්නේත් එදා සිදුවූ දේමයි. එදා සුදු සුද්දන්ට ඉඩම් දුන්න වගේ අද විශාල වශයෙන් කළු සුද්දන්ට, කළු ධනපතින්ට ඉඩම් යායවල් වැවිත් සමග ඉතා සීඝ්‍රයෙන් ලබා දීමට රජය කටයුතු කරගෙන යනව. එම නිසා අපේ ගම්වල මිනිසුන් භීතියෙන් යුතුවයි සිටින්නෙ. සමහරවිට අස්වැන්න උපදින්ට පුළුවනි. එහෙත් ඉන්පසු ගම්වල අයට ඒ ධනපතින්ගේ කුලීකාරයන් වශයෙන් වැඩ කරනවා හැරෙන්ට වෙන කරන්ට දෙයක් නැති වෙනව. ගම්වැසියන්ට තිබුණු හේනක් කොටා ගැනීමේ නිදහස, පෞද්ගලික ගොවිතැනක් කර ගැනීමේ නිදහස නැතිවීගෙනයි යන්නෙ. දැන් ධනවත් පිරිස් ඒ ප්‍රදේශවල දවස් පතා සැරිසරනව. සැමදාම කණ්ඩායම් වශයෙන් ජීප් රථවලින් පැමිණෙන ධනවත් පිරිස්, කොම්පැණිකාරයන් අර වැව බලනව ; මේ වැව බලනව, අර මූකලාන බලනව ; මේ මූකලාන බලනව. ඔවුන් ඒ අන්දමට ඉඩම්, වැව් පරීක්ෂා කරගෙන යන අතර අපේ ගම්වල උදවිය භීතියෙන් පසුවෙනව. " අපට තිබුණු එකම දායාදය මේ කැලයක හේනක් කොටා ගැනීම පමණයි. මේ හත් හවුල් ආණ්ඩුව නිසා දැන් ඒකත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. බී. තෙන්නකෝන් මයා.]

නැති වෙන්ටයි එන්නෙ" යනාදි වශයෙන් කියමින් ගම්මුන් භීතියෙන් පසු වන බව මතක් කරන්ට කැමතියි.

ගරු සභාපතිතුමනි, දනට තිබෙන ඉඩම් ප්‍රතිපත්තිය ගැන—ඉඩම් ඇමතිතුමා ගැන මම කිසිවක් කියන්නෙ නෑ—නමුත් ඉඩම් ප්‍රතිපත්තිය ගැන වචන කීපයක් කියන්නට ඕනෑ. දනට තිබෙන ඉඩම් ප්‍රතිපත්තිය අපේ රටට කොහෙත්ම නොගැළපෙන ප්‍රතිපත්තියක් බව අවුරුදු 9 ක් තිස්සෙත් අපි කියා සිටියා, අදත් එයම කියනවා. ඒ ඉඩම් ප්‍රතිපත්තිය අපේ රටට හරියන්නෙ නැත්තේ මන්ද කියා මම කියන්නට කැමතියි. කණ්ඩලම ජනපදය, දේවහුව ජනපදය යන නමින් අපේ කොටසේ ජනපද දෙකක් තිබෙනවා. දේවහුව ජනපදයේ වැව බැඳ දී තිබෙනවා. එයින් වතුර ලැබෙන්නේ ඉඩම් කට්ටි දෙසීයයකට පමණයි. නමුත්, කාගේ අවාසනාවකට ද කියා මම දන්නෙ නෑ, ඉඩම් කට්ටි හය සියයකට වතුර දී තිබෙනවා, ඒ වැව යටතේ. එසේ වතුර දී තිබීම නිසා දන් අවුරුදු 12 ක් තිස්සේ අද වනතෙක් ඒ එකම ඉඩම් කට්ටියකවත් යල මහ දෙක වැඩ කරන්නට කවදාවත් බැරි වුණ නිසා එම ගොවීන් අද ඉතාමත් දුක්ඛිත තත්ත්වයකට පත් වී සිටිනවා.

දේවහුව ජනපදයේ මෙන්ම කණ්ඩලම ජනපදයෙත් ගොවීන් අද ඉතා අමාරු තත්වයකට වැටී සිටිනවා. අපේ ප්‍රදේශවල සාමාන්‍ය ගම්වල උදවිය නම් ගස්වල කොළවත් කා ජීවත් වෙයි. නමුත් මේ ජනපදවාසීන්ට එවැනි තත්ත්වයක් වත් නැහැ. වැව් බැඳීම, පාරවල් සෑදීම, ඇල වේලි බැඳීම, ආදී කටයුතු සඳහා ඉතා විශාල වශයෙන් මුදල් වියදම් කොට සාදා තිබෙන මෙම ජනපද වාසීන් අද ඉතාමත් අමාරු අඩියකටයි පත් වී සිටින්නෙ. ජනපද ව්‍යාපාර මඟින් මහජනතාවට උන්හිටි තැන් නැති කිරීම හැරුණු විට අවුරුදු දහයක් පහළොවක් ගත වීත් තවමත් ඒ ජනපදවාසීන්ට කොයි අන්දමකින්වත් ප්‍රයෝජනයක් ලැබෙන තත්ත්වයක් ඇති වී නැති බව අපට දන් තේරෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, අපේ ගම්වලට වැඩි වශයෙන් වුවමනා කරන්නේ ගෙවල් හැදීමවත් පාරවල් ඇමීමවත් නොව වියළි කලාපයේ යල මහ දෙක වැඩ කරගන්නට පුලුවන් වන අන්දමට වතුර ලබා දීමට යම් කිසි වැඩ පිළිවෙලක් යෙදීම බව ගරු ඉඩම් ඇමති තුමා අපේ පැත්තේ ඉන්දද්දී අප බොහෝ විට එතුමාට කියා තිබෙනවා. අපේ ගම්වලට වතුර ලබා දෙනවා නම්, අපේ ප්‍රදේශයේ වැව්වලට වතුර ටික ලබා දෙනවා නම්, ඊට වඩා ශාන්තියක් අපට වුවමනා නොකරන බව මම නොයෙක් අවස්ථාවල කියා තිබෙනවා. සුදු අලියකුට වියදම් කරන්නාක් මෙන් ජනපද හැදීම සඳහා වියදම් කරන මුදල නතර කර එයින් සාමාන්‍ය ගම්වල ජනයාට වතුර ලබා දීමට ක්‍රමයක් ඇති කිරීම ඉතා ප්‍රයෝජනවත් බව මා හැම විටම කියා තිබෙනවා. නමුත් කාගේ අවාසනාවකටද කියා මම දන්නෙ නෑ, කාගේ පාපයක් නිසාදැයි මම දන්නෙ නෑ, ගරු ඉඩම් ඇමති තුමා අපේ ඒ ඉල්ලීම කවදාවත් බාර ගන්නෙ නෑ.

ඉඩම් ප්‍රශ්නය ගැන එපමණයි. ඊළඟට භාෂා ප්‍රශ්නය ගැනත් වචනයක් දෙකක් කියන්නට ඕනෑ. අපි භාෂාව ගැන කථා කරන විට බොහෝ දෙනෙක් කියනව ජාතිවාදය ගැන කථා කරනවය කියා. අපි දේශපාලන ජීවිතයේදී කිසිම දවසක, ඔය කියන ජාති වාද, ආගම් වාද, කුල වාද, ආදිය ගැන කල්පනා කර නැති බව මට ස්ථිර වශයෙන්ම කියන්නට පුලුවනි. කිසිම දවසක ඔය ජාති, ආගම්, කුල, වර්ග බේද හිත ඇතුළේ තියාගෙන කටයුතු නොකළ බව මම මේ අවසථාවේදී විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. මුස්ලිම් වේවා, සිංහළ වේවා, ද්‍රවිඩ වේවා, මේ රටේ සිටින වෙනත් ජාතියක් වේවා, එක් එක් භාෂාව අල්ලාගෙන සටන් කිරීම නොවෙයි අපට වුවමනා කරන්නෙ. මේ සියලු දෙනාම එකම භාෂාවක් බාරගෙන නියම සහෝදරත්වයෙන් ජීවත් වන දවසක් ඇති වුණොත් පමණයි, මේ රටේ තිබෙන නොයෙකුත් සටන, නොයෙකුත් ආරාවල්, නොයෙකුත් අමනාපකම් නැති කර ගන්නට පුළුවන් වන්නෙ. මේ ආණ්ඩුව උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ භාෂා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙන් පමණක් වැඩ කටයුතු කරගෙන යන්නට ඉඩ දෙන බවටත් අනික් පළාත් වල දෙමළ සහ සිංහල භාෂාවලට සමාන තත්ත්වයක් දෙන බවටත් අද මේ රටේ සිංහල මහජනතාව පිළිගෙන ඉවරයි. ඒ අනුව බලන විට සිංහලයට රාජ්‍ය භාෂා තත්ත්වය තබා සම තත්ත්වයවත් ලංකාව තුළ නැති බව පෙනී යනවා. මෙය අපට ඉවසිය නොහැකි කාරණයක්. මේ ආණ්ඩුවේ සිටින සමහර උදවිය නම් භාෂාව කියන්නේ කන දෙයක්ද බොන දෙයක්ද කියාවත් දන්නේ නැහැ. ගිරවුන් මෙන් කිසිම අවබෝධයක් නැතිවයි, සමහරුන් කථා කරන්නේ. [බාධා කිරීමක්] මා කථා කරන්නේ නම් මගේ මුළු ජීවිතයම සිංහල භාෂාව වෙනුවෙන් කැප කර ඇති කෙනකු හැටියටයි. මහනුවර විද්‍යාලයට බැඳී ඉංග්‍රීසි 7 වැනි ප්‍රමාණයේ ඉගෙන ගනිමින් සිටියදී 1937 දී සිංහල භාෂා ප්‍රේමයෙන් යුතුව එම විද්‍යාලයෙන් අස් වී භාෂා සටන කරගෙන ගිය පිරිසට එකතු වී ක්‍රියා කළා. අපේ සමහර උදවිය කලිසම් ඇඳ ගත්තාම, ඉංග්‍රීසි ටිකක් කටේ ගා ගත්තාම, ඔය අතරතුරේදී මන්ත්‍රීකමකුත් ලැබුණාම ටිකක් මොළේ නරක් කරගෙන කටයුතු කරන බව මේ අවස්ථාවේදී නොකියාම බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
බුලත් විටකුත් ඕනැද?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(M. T. B. Tennekoon)
ඔව්, බුලත් විට කෑමත් බොහොම ලොකු අපහාසයක් හැටියටයි, ඒ අය සලකන්නේ. එක්සත් ජාතික පක්ෂයේ අය වගේ නොව අප නම් බුලත් විට කනවා. අප නම් බුලත් විටට ලොකු සැලකිල්ලක් දක්වනවා. බුදුරජාණන් වහන්සේට "දෑහැත්" නමිනුත් දෙවියන්ට "දළු මුර" නමිනුත් අප බුලත් පූජා කරනවා. ඒ තරම් වැදගත් තැනක් සිංහල ජන ජීවිතයෙහි බුලත්වලට හිමි වෙනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
අපත් බුලත් කනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
ගරු මුදල් ඇමතිතුමාත් බුලත් කනවාලු. නමුත් සමහර අයට නම් බුලත් ගැන ලොකු අමාරුවක් තිබෙන බව දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්ති ආරක්ෂා කිරීම ගැන ගරු සමාජසේවා ඇමතිතුමාත්, පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමාත් අපට කරුණු ප්‍රකාශ කළා. අප අපේ ප්‍රතිපත්ති ගැන දන්නා බවත්, ඒවා ආරක්ෂා කර ගැනීමට කාගෙන්වත් අපට උපදෙස් නො වුවමනා බවත් මේ අවස්ථාවේදී මතක් කරන අතර අපේ ප්‍රතිපත්ති ආරක්ෂා කිරීම ගැන උපදෙස් දෙන්නට මහන්සි නොවී තමතමන්ගේ කටයුතු ගැන නිසියාකාර වග බලා ගන්නා ලෙස මා ඒ අයට මතක් කරන ගමන්ම මට මේ අවස්ථාව ලබා දීම ගැන මූලාසනයටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 7.10

**අබ්දුල් බකීර් මාකර් මයා.**
*(ஜனாப் அப்துல் பாக்கீர் மாக்கார்)*
(Mr. Abdul Bakeer Markar)
Mr. Chairman, one common feature that prevails throughout the speeches that are delivered in the House is the fact that the Hon. Minister of Finance has been congratulated. I should like to do it in a more unorthodox way because, I think, the man to be congratulated is the Hon. Prime Minister, for he chose as Minister of Finance a person who is Ceylonese in every sense of the word, a person who has the common touch, a person who has identified himself with activities that can properly be described as Ceylonese, a person who, in the preparation of the Budget, has placed the emphasis on the needs of the Ceylonese population. That is the reason why

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබ්දුල් බකීර් මාකර් මයා.]
I congratulate the Hon. Prime Minister on his choice of a Minister of Finance.

Before I proceed I think it is my duty to point out and analyze the features in the Budget. Not only has the Budget been applauded by hon. Members on this side of the House, but the general public too has praised this Wanninayake Budget as being a common man's budget. Whatever may be said by hon. Members of the Opposition, one thing is clear, and that is that this is a Budget whereby the Government proposes to give the people their needs, to cater to the comforts of the people, and to see that every attempt is made to ease the troubles and tribulations that the people face.

The Hon. Minister has correctly analyzed the position of the country before this Government came into power. He has described it in very clear terms in the course of the Budget speech. In view of the criticisms made by hon. Members of the Opposition, I think his words bear repetition.

"The economy was in the grip of inflationary pressures created by large-scale deficit financing and unrestricted commercial bank credit expansion. The expansionary impact of the Budget was on the average about Rs. 162 million per year; bank credit to the private sector was increasing at about 18 per cent. per annum and the money supply was increasing at the rate of about 10 per cent. The consequence of all these was that the consumer prices too were rising at about 3 per cent. per annum ....."—[OFFICIAL REPORT, 9th August, 1965; Vol. 61, c. 49.]

He went on to deal at length with the manner in which the people were subjected to all sorts of difficulties. We mentioned what the Government proposes to do in order to give the people their needs. That is mentioned in the same volume of HANSARD. For the sake of emphasis I would once again read out this portion of the Hon. Minister's speech. It is as follows:

"The principal objective of the National Government is to achieve a higher rate of economic growth than in the past, thereby raising the real per capita income and the living standards of the people, and creating employment opportunities to absorb the growing labour force of the country. While the main emphasis would be on economic development, the National Government would also take measures to replenish the country's external assets, to augment the flow of essential supplies and to stabilize prices and living costs, as far as possible ....."—[OFFICIAL REPORT, 9th August, 1965; Vol. 61, c. 78.]

And then he gives the details of the various proposals.

He has unlike his predecessors stated specifically what are the items that he would take up first and also the manner in which he would implement them. For instance, he has realized the importance of providing employment to the thousands of youths who are out of employment. He does not speak in general terms but has specifically set out in his speech the various ways in which thousands of young men are to be employed and how he proposes to give others the means by which they can earn a living and contribute their share towards the development of the country. Those are the important features of the Budget.

Let us examine the criticisms levelled at the Government and the Budget speech. When you analyze it you will find that everybody has sung the same song to the same tune. They have talked about capitalism and mouthed slogans about the private sector. They have made every attempt to criticize the unity that has

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

been brought about by the National Government. Further almost all of them have criticized the Government at this early stage of its life. I might at the very outset point out to hon. Members—it has been said by others as well—that we have been in office for only four months, and if they criticize the manner in which the people have been neglected and if they level criticism against the administration and speak of the way in which the general public has been let down, it is nothing but a censure passed by them on their own Government which was in power for over nine years.

During the course of the last nine years has any attempt been made by them to improve the finances of the country ? Has any attempt been made by them to give the importance necessary to agriculture ? It is not for me to mention that Ceylon is an agricultural country and as such that what we should do in the first instance is to encourage agriculture so that with the production of raw materials we can industrialize our country. If you follow the history of this country from ancient times you might see that if ever we prospered it was during the reign of rulers who emphasized the role of agriculture. In the same manner, when the U. N. P. was in power immediately after the achievement of independence they always placed emphasis on agriculture.

It is not necessary for me at this stage to mention in detail the development schemes that we started, but I ask hon. Members of the Opposition who levelled so much criticism at the Government one question : can you point out to us one development scheme which was started and completed by you or any other scheme by which you intended to make the country prosper ? It has been the position that those who were in power held power for a purpose. I do not think this is the occasion for me to mention in detail the manner in which they held the reins of Government and the manner in which they conducted themselves as Ministers of State and as Members of the Government.

There was so much said by speakers from the other side about what they had done in regard to industries. I think the Hon. Minister of Industries in his speech pointed out to them the flaws in the policy they had followed and how industries were started for political reasons. This is not the occasion for me to point out that during the period that they were in power industries were started, not with the idea of encouraging industrial development in this country but for a purpose which they themselves ought to know. We know that the industrialists who have made thousands and thousands of rupees are not Ceylonese. We know how, although they obtained citizenship only a couple of months ago, they have overnight become millionaires. What, I ask them, prompted them to neglect Ceylonese being encouraged to start industries, and instead give all the assistance and encouragement to those who had nothing to do with Ceylon but wanted to make all the money in this country and across the Palk Strait and send it somewhere else ? I ask them to point out one Ceylonese enterprise which they helped or encouraged. I am afraid if one goes into detail one might have to draw so many skeletons from the cupboard. That is not my purpose on this occasion, but I might only point out that we propose to encourage Ceylonese enterprise in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබ්දුල් බකීර් මාකර් මයා.]

the correct way. And, I think, the Hon. Minister of Industries yesterday stated in detail what he proposes to do. This augurs well for our future.

The hon. Member for Dambulla (Mr. T. B. Tennakoon) spoke of the Hon. Minister of Social Services playing one tune in 1961 and another tune today. In other words, he said, that while he was with them he spoke in one way, but now that he has crossed over and is with us, he seems to be attacking the very policies which he supported at one time. That is nothing new. I think, in that matter, the Hon. Minister of Social Services has followed the correct Bandaranaike policy. I emphasize the fact that he has followed the correct Bandaranaike policy, because it is still fresh in our minds how the late lamented Mr. S. W. R. D. Bandaranaike, who was with the U. N. P., had prepared the Budget with them, co-operated with them, crossed over to the other side, and yet in the very same Debate on the Budget, which he helped to prepare, had attacked it. That was the beginning of the Bandaranaike policies, and when one considers that fact, one sees nothing new in the action of the Hon. Minister of Social Services.

Just think of the Marxist leaders. What venom they produced in attacking the Sirima Bandaranaike Government before the Coalition! Then, on every public platform they attacked the fair Lady, the Leader of the Opposition. But today, of course, they have changed. They formed the Coalition and with that they changed their attitude.

It is necessary to consider shortly the strange history of these Marxists who from public platforms shout slogans and make long speeches.

For thirty years they have been preaching Marxism and have been making every attempt to capture power. I ask them whether they ever practise what they preach. Do they have the experience that Lenin had during his days? Have they ever identified themselves with the suffering masses like Mao Tse-tung or Chou En-lai? Have they ever worked with the masses and endured their sufferings? No.

Our Marxists are Marxists of a different class and type. These are Marxists who have been hoodwinking the masses. They are not with the masses. They have not contributed towards the welfare of the workers and the peasant class like Lenin or Mao Tse-tung.

Our Marxists have today given up the real Marxist principles, and that accounts for the Fourth International sending them out lock, stock and barrel. Today they want to capture power. That is all.

I do not think that if you really practise Marxism you can come and preach in a democratic assembly like this and identify yourselves with democratic institutions.

And what about the revolution that they have preached all these years? Have they educated the workers and the peasants for that revolution? They are now hanging on to the saree *pota* in order to regain the power which they had when they formed the Coalition. But the workers of this country are not so uneducated as the Marxists think they are. They belong to a race of people that ruled this country for over two thousand years. They have a sense of responsibility and they will not allow the Marxists to capture power.

We know what has happened in those countries where the Marxists were allowed to have a hand in the Government. Those who gave some quarter to the Marxists had later to surrender power to them completely.

Mr. Chairman, talking about the Budget, we know that the Opposition or the Bandaranaike policy

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

followers, were in power for nine long years and during that period in which they were in power, I ask, what were the methods they adopted in order to see that the people were satisfied? I might mention to you, it was never their attempt to see to the welfare of the people. They were always there for their own benefit.

I remember, the hon. Member for Kalutara (Mr. Cholmondeley Goonewardene) making much about the Co-operative Wholesale Establishment and the number of depots he had opened in his constituency. I am reminded of what I saw in one of the depots that he opened. That was a store where he had put in his red-shirted followers. The manager was a person who had robbed a co-operative society and was sent out but very probably, at the request of the hon. Member for Kalutara, he was appointed as the manager of this depot. I remember, Mr. Chairman, walking into that depot one day with a view to seeing what was happening. I wanted to purchase certain items of crockery and I saw some of the racks empty. I addressed the salesman, "Look, can I get certain items of crockery?" The reply I got was, "They are not available." Mr. Chairman, they knew that I was the M. P. for Beruwala but all the same they refused to give me saying that there was none in stock.

Well, walking about the depot I scented something. I saw one of the lady salesmen showing some cups and saucers to another customer who was a lady teacher and a powerful S. L. F. P. supporter. I walked up to this saleslady and asked her whether cups and saucers were available. She said, "Yes, we are selling them." She did not know that the manager had informed me that there was none in stock and none for sale. Immediately, I followed the young lady to the stores and there, to my surprise, I discovered large stocks of crockery.

Of course, when I inquired further about these stocks, the manager turned round and said, "I never said that none were available but that only a few items were put out daily for sale." That, is the manner in which they have been carrying on business.

From the information I have gathered, I have found that most of the goods that come to these C. W. E. depots find their way into the blackmarket. That is the policy that was followed by the hon. Member who had been a Minister at one time.

I am reminded again of another matter or rather the manner in which the previous Ministers conducted themselves. We know that when the Coalition Government came into power there was much talk that they were going to eliminate corruption and that every attempt would be made to clean the administration. We also know that the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) as soon as he became Finance Minister, mentioned in so many words that he would make every effort to see that blackmarketeers were punished in the proper way and he, particularly, threatened the textile dealers. We saw how these goods were coming out and how some of them were displayed on the pavements of our streets. Then there was a lull and silence. The textiles that were on the pavements and windows disappeared and once again we found those dealers indulging in their old ways of blackmarketing. I do not know what prompted them to throw them out and once again get them into the blackmarket quarters and thereby encourage that way of trade. They are criticizing us and our Government.

I am also reminded of my good Friend, the hon. Member for Kalutara (Mr. Cholmondeley Goonewardene). You might remember that as soon as he became a Minister he said: "I find that there is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබ්දුල් බකීර් මාකර් මයා.]
corruption from top to bottom in the P. W. D. I am going to see that that is cleared and I will rid the P. W. D. of corruption". He went to the C. T. O. and all over the place and threatened the overseers, but I am wondering how a change took place and suddenly all his attempts to eliminate corruption and clear the P. W. D. failed. I also remember his words: "The P. W. D. overseers were all corrupt and I will remove them".

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

He never said so. He said some were corrupt. Quote him correctly, but do not misquote him.

**අබ්දුල් බකීර් මාකර් මයා.**
*(ஜனாப் அப்துல் பாக்கீர் மாக்கார்)*
(Mr. Abdul Bakeer Markar)

If the hon. No. 2 Member for Colombo South says so, I will accept it.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I am not "No. 2 Member" for Colombo South.

**අබ්දුල් බකීර් මාකර් මයා.**
*(ஜனாப் அப்துல் பாக்கீர் மாக்கார்)*
(Mr. Abdul Bakeer Markar)

May I call him "No. 1 Member"?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I am not.

**අබ්දුල් බකීර් මාකර් මයා.**
*(ஜனாப் அப்துல் பாக்கீர் மாக்கார்)*
(Mr. Abdul Bakeer Markar)

I think the correct term would be "Joint Member for Colombo South".

What happened? This very same Minister who said so much against the P. W. D. overseers has himself entrusted certain major works to the P. W. D. overseers in Kalutara. He wanted to put up a post office without any estimate or preparation. Suddenly when the elections were round the corner, he ordered the P. W. D. to commence work without plans and specifications. And who did the work? The P. W. D. overseer in Kalutara. I do not know why they start shouting against some of the people and then become silent. Then there is a lull and we find they are very good friends of the people against whom they have said so many things. That is how the leaders in the Opposition conducted themselves while in office.

I do not think I should take any more of your time, but I would only say that the National Government has been formed firstly with the intention of bringing about unity in this country. As minorities we are all happy that today we have a say in the administration. So much was said about the minorities. It was said that we were all whacking the Government. I might ask the leaders in the Opposition and the members and ex-Ministers of the S. L. F. P. did they not, while they were in power, treat the minorities as drawers of water and hewers of wood? Did they not treat them, particularly the Muslim community, as second class citizens? Today our deeds are not registered, today we have to prove our citizenship, today we cannot seek employment in the Government Service and today we cannot enjoy the rights that the other Ceylonese people enjoy. A man who is conferred rights of citizenship is a better Ceylonese than most of us. All this started during the Sirimavo Bandaranaike Government and trade was taken out of the hands of the Muslims. The Muslims were suffering under the S.L.F.P. rule. Mr. Chairman if the minorities, particularly the Muslim community, stood up against that Government and gave their hundred per cent. support to the United National Party, that was because they were treated in such a way as to make them feel that they were a second class race. I do not propose to take

Digitized by Noolaham Foundation. noolaham.org | aavanaham.org

any more of your time. I congratulate the Hon. Minister of Finance on the splendid manner in which he presented the Budget and on the Budget which he presented.

අ. භා. 7.41

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හත් හවුල් ආණ්ඩුවේ කුළුඳුල් අයවැය ලේඛනය ගැන කථා කිරීමට ප්‍රථමයෙන් සිංහල රටේ ඉතාම උසස් ආයතනය වන මේ පාර්ලිමේන්තුව තුළ සිංහල කවියක් සිංහල තාලයට කියන්නට ඉඩ නැති වීම ගැන මම මගේ කණගාටුව ප්‍රකාශ කරන්නට කැමතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)
ඒ කවිය කිව්ව.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

බොහොම ස්තුතියි. ඉදිරියටත් එසේ කියන්න ඉඩ දෙනවා ඇතැයි අප විශ්වාස කරනව. ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයකුගේ කථාවට සවන් දුන් මට බොහොම ලැජ්ජා හිතුන, මේ ඇමතිවරුන් කථා කරන්නේ කොයි විධියටද කියා. 1962-63 වර්ෂයේ පාර්ලිමේන්තු විවාදවලදී ඒ ඇමතිතුමා විසින් කරන ලද කථාවලින් කොටස් කීපයක් මම තමුන්නාන්සේට ඉදිරිපත් කරන්න කැමතියි. එදා එතුමා කීවේ මොන විධියටද කියා තමුන්නාන්සේට එයින් දැන ගන්නට පුළුවන් :

"1815 න් පසු මේ ආණ්ඩුව බලයට පත්වන තුරු බෞද්ධ ආගමට මේ රටේ තැනක් තිබුණේ නැහැ. අනික් ආගම් ආරක්ෂා කරන අතර බෞද්ධ ආගමට තැනක් දුන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බව මා නිර්භයව කියනවා. මා එය ඔප්පු කරන්නේ මොන සාධකවලින්ද? අනුරාධපුරය ශුද්ධ නගරයක් කළේ මේ ආණ්ඩුවයි. අනුරාධපුරය, පොළොන්නරුව, සෙංකඩගලනුවර, කැලණිය, යන ස්ථාන ශුද්ධ නගර කිරීමට මාර්ග සැලසීම බෞද්ධ ආගමට තැන දීමක් නොවේද? ඒ සමගම බෞද්ධ සංස්කෘතිය නගා සිටෙව්වෙ කොහොමද? විද්‍යෝදය හා විද්‍යාලංකාර යන පිරිවෙන් විශ්ව විද්‍යාල කිරීමෙන් බෞද්ධ සංස්කෘතිය මේ රටේ නගා සිටෙව්වා."—[නිල වාර්තාව, 1962 ජුලි 18; 47 වන කාණ්ඩය, තී. 338-9]

නැවතත් මේ විධියට කියනව :

"අවුරුදු දහස් ගණනක් වැඩවසම් ක්‍රමය අනුව වහල් බැම්මෙන් බැඳී සිටි අද ගොවියා ඒ වහල් භාවයෙන් මුදා ගත්තේ මේ ආණ්ඩුව නොවේද ?"—[නිල වාර්තාව, 1962 ජුලි 18; 47 වන කාණ්ඩය, තී. 339]

ඊ ළඟට මෙසේ කියනව :

"මේ රජය විසින් සෑම පාසැලක්ම රජයට ගැනීමෙන් ජාතික අධ්‍යාපන ක්‍රමයක් ඇති කළ නිසා අද ගම්බද ගස් බඩගාන මිනිසකුගේ දරුවකුටත් කුරුඳුවත්තේ මහේශාක්‍ය පුද්ගලයකුගේ දරුවකුටත් ලැබෙන්නේ සම අධ්‍යාපනයක්. ඉතින් මේ ආණ්ඩුව කර තිබෙන්නේ ප්‍රගතිශීලී, සමාජවාදී කටයුතු නොවේද ?"—[නිල වාර්තාව, 1962 ජුලි 18; 47 වන කාණ්ඩය, තී. 340]

ඊට පස්සෙ මෙහෙම කියනව :

"සිංහල භාෂාවට තැන දීමෙන් සිංහල උගත් ඕනෑම පුද්ගලයකුට මේ රටේ තැනක් ගන්නට මාර්ගය සැලැස්සුවේ මේ ආණ්ඩුව නොවෙයිද කියා මම අහන්නට කැමතියි. රෙද්ද බැනියම අඳින මිනිහාට මේ රටේ තැනක් දුන්නේ මේ ආණ්ඩුව නොවෙයිද කියා මම අහන්නට කැමතියි. සිංහල ගුරුවරයාට මේ රටේ තැනක් දුන්නේ මේ ආණ්ඩුව නොවෙයිද කියා මම අහන්නට කැමතියි. ආයුර්වේදයට, සිංහල වෙද මහත්මයාට මේ රටේ තැනක් දුන්නේ මේ ආණ්ඩුව නොවෙයිද කියා මම අහන්නට කැමතියි."—[නිල වාර්තාව, 1962 ජුලි 18; 47 වන කාණ්ඩය, තී. 340]

නැවතත් මෙහෙම කියනව :

"ප්‍රතිගාමී එක්සත් ජාතික පක්ෂය බලයට පත් වී සිටි කාලයේදී දුප්පත් මනුෂ්‍යයකුට නිවාස ණය වශයෙන් රුපියල් 1,000 ක් වත් ලබා ගන්නට පුළුවන් වුනාද කියා මම අහන්නට කැමතියි. ඔව්, තියෙන පුද්ගලයන්ටම ලක්ෂ ගණන් බෙදුවා. එක්කෙනාට 11,00,000, 12,00,000 බැගින් දුන්නා. එහෙම හදා ගත් පුද්ගලයන් කොළඹ මහා මන්දිර හදලා කුලියට දුන්නා. ඒ එක්සත් ජාතික පක්ෂය බිම වැටිලා ඉන්න දුප්පතා නැගිටුවන්නට කුමන වැඩ පිළිවෙලක් යෙදුවාද කියා මම අහන්නට සතුටුයි."—[නිල වාර්තාව, 1962 ජුලි 18; 47 වන කාණ්ඩය, තී. 341]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

ඊ ළඟට මෙහෙම කියනව:

"ලංකාවට නිදහස අරන් දුන්නේ එක්සත් ජාතික පක්ෂය විසින්ය කියා තමුන්නාන්සේලා කියනවා ඇති. කොයි හැටි වුවත් අප රටට සම්පූර්ණ නිදහස ලබා දුන්නේ ශ්‍රීමත් බණ්ඩාරනායක අගමැතිතුමා බව මම නිර්භයව ප්‍රකාශ කරනව. ඉංග්‍රිසි කාරයින්ගේ කොඩිය බිම දමා සිංහල කොඩිය ඔසවා ත්‍රිකුණාමල වරාය භාර ගැනීමෙන් එතුමා මේ රට නිදහස් කළා. කටුනායක ගුවන් තොටු පළෙන් එවකට තිබුණු ඇමෙරිකන් කොඩිය බිම හෙලා සිංහල කොඩිය ඔසවා නිදහස් කර දුන්නා." —[නිල වාර්තාව 1962 ජුලි 18; 47 වන කාණ්ඩය, තී. 344-5]

මේ විධියට තමයි, එතුමාගේ අදහස් එදා ප්‍රකාශ කළේ. ඒ ඇමතිතුමා අද මාක්ස් වාදීන්ට විරුද්ධව විශාල පහරක් එල්ල කළා. නමුත් එතුමා එදා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේදී කී දේ 1964-65 වර්ෂයේ හැන්සාඩ් වාර්තාවේ 56 වැනි කාණ්ඩයේ 2743 තීරුවෙ මෙහෙම තියෙනව:

"මට ලැබී තිබෙන කාලය මදි නිසා මුදල් ඇමතිතුමාගේ සෑම යෝජනාවක් ගැනම විස්තර කරන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා මට සාමාන්‍යයෙන් කියන්න පුළුවන්, ප්‍රගතිශීලී අදහස් අනුව, සමාජවාදි අදහස් අනුව, මේ අයවැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන බව."—[නිල වාර්තාව, 56 වන කාණ්ඩය, තී. 2744]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, එදා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මුදල් කටයුතු පිළිබඳ ගරු ඇමති වරයා වශයෙන් ඉදිරිපත් කළ 1964-65 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය සම්බන්ධයෙන් කථා කරමිනුයි සමාජ සේවා කටයුතු පිළිබඳ වර්තමාන ගරු ඇමතිතුමා ඔය විධියට ප්‍රකාශ කර තිබෙන්නෙ. එතුමා එයිනුත් නොනැවතී ඊළඟට මෙන්න මේ ආකාරයටත් කියා තිබෙනව:

"මේ අන්දමට සියයට 50 කින් ගාස්තු අඩු කොට පාසැල් දරුවන්ට බස්වල ගමන් කරන්න සැලැස්වීම ගැන මා සතුටු වෙනව. ඡන්ද ගුණ්ඩුවක් හැටියට නොවෙයි, ඉගෙනීමට පහසුකම් ඇති කිරීමේ පියවරක් හැටියට, මෙය කර ඇති බව ඇත්ත වශයෙන්ම පිළිගන්න ඕනැ."—[නිල වාර්තාව, 56 වන කාණ්ඩය, තී. 2747.]

ඊළඟට එතුමා ඒ අයවැය ලේඛනය ගැනම මේ විධියටත් කියා තිබෙනව:

"කෙසේ වුණත් සමාජවාදි වැඩ පිළිවෙලක් උඩ රට ගමන් කර තිබෙන නිසා, ජනතාව සුඛිත මුදිත කිරීමට වැඩක් සිද්ධ වන ආකාරයෙන් බඩ්ජට් එක නිසා මේ අයවැය ලේඛනය අපට පිළිගන්න පුළුවනි. මට පැය තුනක් තමුන්නාන්සෙ කථා කරන්න ඉඩ දෙනව නම් මෙම අයවැය ලේඛනයේ තිබෙන්නා වූ හොඳ නරක සියල්ලම විග්‍රහ කර පෙන්වන්නට තිබුණා. කෙසේ වුණත් මගේ ගෞරවය පිරිනමමින්, තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මාගේ වචන සවල්පය සමාප්ත කරනව".—[නිල වාර්තාව, 56 වන කාණ්ඩය, තී. 2751.]

ඔන්න ඔය විධියට තමයි එතුමා ගිය අවුරුද්දේ අගෝස්තු මාසයේ 13 වැනිදා කථා කළේ. මා දැන් ඉදිරිපත් කරන්න කැමතියි, මේ අයවැය ලේඛනයේ අඩංගු කරුණු සම්බන්ධයෙන් මගේ අදහස්. අය වැය කථාවේ සිංහල පිටපතේ 29 වැනි පිටුවේ මෙන්න මේ විධියට සඳහන් වෙලා තියෙනව:

"මේ රට මුහුණ පා තිබෙන විශාලතම ගැටළුවලින් එකක් නම් පුහුණු කාර්මිකඥයින් පිළිබඳ හිඟයයි. ඉංජිනේරු, කාර්මික සහ කාර්මික විද්‍යා විෂයයන්හි පුහුණුව ලත් අය පිළිබඳ විශාල හිඟයක් ඇති බව ජාතික සැලසුම් සම්පාදක දෙපාර්තමේන්තුව හා මහ බැංකුවද මගින් කරන ලද සමීක්ෂණයකින් පෙනී යනවා. උදාහරණයක් වශයෙන්, 1970 වන විට දැනට විශ්ව විද්‍යාලවලින් පිට වන උපාධිධරයන්ට අමතරව සිවිල්, කාර්මික සහ විදුලිබල යන ඉංජිනේරු ක්ෂේත්‍රයන්හි උපාධිධාරීන් 482 දෙනෙක්ද, රසායන ඉංජිනේරු ක්ෂේත්‍රයෙහි උපාධිධාරීන් 48 දෙනෙක්ද, ගුවන් යාත්‍රා ඉංජිනේරු ක්ෂේත්‍රයෙහි උපාධිධාරීන් 20 දෙනෙක්ද රටට අවශ්‍ය වන බව ගණන් බලා තිබෙනවා. මීට අමතරව රටේ ආර්ථික සංවර්ධනය වැඩිවීමත් සමග අනෙකුත් වෘත්තීන් පිළිබඳවත් පුහුණුව ලත් අයගේත් හිඟයක් තිබෙන්නට පුළුවනි."

මේ කාරණයෙන් පෙනී යනව, මේ රටේ නියම විධියේ සංවර්ධන වැඩ පිළිවෙලක් නිසි අන්දමින් ක්‍රියාත්මක කිරීමට නම් විශේෂඥ දැනුමක් තිබෙන උදවිය අවශ්‍ය බව. ඒ බව නොපිළිගන්න කෙනෙක් නැතැයි කියන්න පුළුවනි. ඒ නිසා මා කියන්න කැමතියි, මේ හත් හවුල් ආණ්ඩුවෙ මුදල් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා මේ ගැන සලකා බැලිය යුතු බව. අපට විශේෂඥ දැනුමක් තිබෙන උදවිය විශාල වශයෙන් වුවමනා කරනව. ඒ උදවිය ලබා ගැනීම තරමක් අමාරු බව ඇත්ත. එහෙත් ඊට ප්‍රතිකර්මයක් නැද්ද? ඇයි නැත්තෙ? ඊට ප්‍රතිකර්මයක් තිබෙනව. මම ඒක කියා දෙන්නම්. ප්‍රතිකර්මය වශයෙන් කළ යුත්තෙ මොකක්ද කියන කාරණය පැහැදිලිවම මම කියා දෙන්න ලෑස්තියි. මෙයට ප්‍රතිකර්මය වශයෙන් කළ යුතුව තිබෙන්නේ සමාජවාදි රටවලින් ආධාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලබා ගැනීමයි. සමාජවාදි රටවල් ගැන සඳහන් කරන විට අපේ සමහර ගරු මැති ඇමතිවරුන්ට ඉවසන්න බැහැ.

ලංකාවේ වානේ කම්හලට වුවමනා කරන සේවකයන් 40 දෙනකු සෝවියට් දේශයට ගොස් එහිදී උසස් පුහුණුවක් ලබා ගෙන ඇවිත් දැන් වානේ කම්හලේ වැඩ කටයුතුවල යෙදී සිටින බව මතක් කරන්න කැමතියි. ලංකාවේ පමණක් නොවෙයි, ලෝකයේ වෙනත් බොහෝ රටවල උදවිය ආසියානු, අප්‍රිකානු සහ ලතින්-ඇමෙරිකානු රටවල අධිරාජ්‍යවාදීන් විසින් බහුල වශයෙන් සූරා කනු ලැබීමෙන් පීඩාවට පත්වී සිටිනවා. මෑත කාලයේදී ඒ විධියේ අධිරාජ්‍යවාදී සූරාකෑම්වලින් නිදහස්ව සිටින රටවලට උදවිය අද නිශ්ශරණාධ්‍යාසයෙන් උදව් කරන්නේ සමාජවාදි කඳවුරයි. ඉන්දියාවේ බිල්හායි වානේ කර්මාන්ත ශාලාවට අවශ්‍ය සේවකයින් 5,000ක් දෙනා පුහුණු කළෝ කවුරුද? ඔවුන්ට එම පුහුණුව දුන්නේ සෝවියට් දේශයයි. මිසරයේ අස්වාන් වේල්ලේ කටයුතු සඳහා 8,000ක් දෙනා පුහුණු කළෝ කවුරුද? ඔවුන්ට ඒ පුහුණුව දුන්නෙත් සෝවියට් දේශයයි. දැනටමත් මධ්‍යස්ථාන 23ක 5,000ක් දෙනා පමණ පුහුණු කිරීමේ කටයුතු ආරම්භ කර තිබෙනවා. සෝවියට් විශේෂඥයන් මිසර දේශයට ඇවිත් අරාබි භාෂාවෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙනුත් පුහුණු කරනව.

අද සෝවියට් දේශයේ කාර්මික ආයතනයන්හි, විද්‍යායතනයන්හි, බහු ශිල්පායතනයන්හි නොදියුණු රටවලින් ගිය 22,000ක් තරුණ තරුණියන් කිසිම ගාස්තුවක් නොගෙවා විවිධ අංශයන්හි පුහුණුව ලබන බව රහසක් නොවෙයි. අප්‍රිකාවේ රටවල් 42කින් පමණක් 4,000ක් ශිෂ්‍යයෝ එහි ඉගෙනීමේ යෙදී සිටිති. මෙයින් එක් ශිෂ්‍යයෙකු ගැන මොනවා හරි කලබලයක් වුණොත් ධනපති පත්‍රවල ලොකු ශීර්ෂ පාඨ යොදා මේවා පළ කරනව. අනෙකුත් ශිෂ්‍යයින් ගැන, ඔවුන් ලබන අධ්‍යාපනය ගැන, ඔවුන් කිසිවක් කියන්නෙ නැහැ.

ඝානාවේ සිට ඔඩෙස්සා නගරයට ගොස් එහි නාවුක මධ්‍යස්ථානයේ පුහුණුව ලබන තරුණ ශිෂ්‍යයන් 87 දෙනෙක් සිටිනවා. ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු නිමැවීමෙන් පසු ඔවුන් තමන්ගේ රටට එන්න බලාපොරොත්තු වන්නෙ අහසින් නොවෙයි, මුහුදින්. තමන්ගෙ රටේ ධීවර කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය නැව් සහ බෝට්ටු පදවාගෙනයි, ඔවුන් ඝානාවට පෙරළා ඒමට බලාපොරොත්තු වන්නෙ.

නැගෙනහිර ජර්මනිය ගැන බලමු. ලංකාවේ ශිෂ්‍යයින් 50 දෙනෙක් පමණ ඒ රටට ගිහින් ඉගෙනීමේ යෙදෙනවා. නමුත් කණගාටුවෙන් කියන්න කැමතියි, ලංකාවේ ශිෂ්‍යයින් පණස් ගණනක් නැගෙනහිර ජර්මනියේ සිටිතත්, අපේ රටේ තිබෙන නැගෙනහිර ජර්මන් තානාපති කාර්යාලයේ පස් දෙනෙකු සිටීම වැඩියි කියා නිලධාරීන් පස්දෙනෙකුට ඉඩකඩ දෙන්නට මේ රජය මැළි වුණා. මේ රජය කටයුතු කර තිබෙන්නේ ඒ විධියටයි. මාර්ක්ස්වාදී රටවල් මහා භයානක රටවල් හැටියට මාක්ස්වාදය රටවලට මහා තර්ජනයක් හැටියට සලකන නිසයි මා මේ කරුණු ඉදිරිපත් කරන්නේ.

බුරුමයේ, ඉන්දියාවේ, කාම්බෝජයේ, ඇෆ්ඝනිස්ථානයේ, මිසරයේ, ඝානාවේ විද්‍යාස්ථාන 70 ක් පමණ ඇති කර අද ඒවා සෝවියට් දේශයේ වියදමින් පවත්වා ගෙන යනව. මෙම විද්‍යාස්ථානවල කරන්නේ කෘෂිකර්ම ශාස්ත්‍රඥයින්, ඉංජිනේරුවන්, විදුලි විද්‍යාඥයින් හා වෙනත් යාන්ත්‍රික ඉංජිනේරුවන් පුහුණු කිරීමයි.

අවුරුදු සිය ගණනක් අමෙරිකන් බ්‍රිතාන්‍ය රටවල් සමග මිත්‍රත්වයෙන් සිටියත් ඔවුන් අපේ රටේ කාර්මික දියුණුව සඳහා කර තිබෙන කටයුතු මොනවාද? දැනුත් පක්ෂපාතිත්වයේ හෝ කීකරුකමේ අඩුවක් නම් පෙනෙන්න නැහැ. නමුත් අද තිබෙන තත්ත්වය මොකක්ද? කීකරුකම නිසා අද සමාජවාදය අනුගමනය කරන රටවල් හෙලා දකින හෙයින් එම රටවලින් ආධාර ඉල්ලීමට ලැජ්ජයි.

මා කලින් කීවා, බිල්හායි වානේ කම්හල සෝවියට් ආධාරවලින් ගෙන යනවාය කියා. එහි වැදගත්කම බලන්න. ඒ කම්හල ගොඩනැගීමට පුහුණු කරනු ලැබූ කාර්මිකයින්ට කොතරම් ක්‍රමානුකූලව පුහුණුවක් දී තිබෙනවාද කීවොත්, ඉන්දියාවේ දෙවැනි වානේ කම්හල වන බොකාරෝ වානේ කම්හල [illegible]නීමට අවශ්‍ය සැලැස්ම සකස් කරන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

නට ඔවුන්ට පුළුවන් වුණා. මාර්ක්ස්වාදී රටවල්ය කියා අහක බලා ගන්නේ නැතිව ඒ රටවලින් ආධාර ලබා ගෙන අපේ රට දියුණු කර ගන්නට අපේ රට සංවර්ධනය කරන්නට අප වැඩ කරන්න ඕනෑ. ගඟේ වැටී ගිලෙන්නට යන විට අත දී ගොඩට ගන්නට එන අයගේ අත අල්ලා ගන්නේ නැතිව, දේශපාලන විශ්වාසයන් නිසා "උඹේ අත ගන්න මා ලැහැස්ති නැහැ" කියා දියේ ගිලී මැරෙනවා නම්, ඔහු මෝඩ යෙකු මිස නුවණක්කාරයෙක් නොවෙයි. මේ රජය අධිරාජ්‍යවාදීන්ට බයාදු ලෙස ඉඩ දෙන බවයි අපට පෙනෙන්නෙ. විදේශීය ආධාර ලබා ගෙන අපේ ජාතික සංවර්ධනයට වුවමනා මූලික වුවමනාවන් අතපසු කර ගන්නවා පමණක් නොවෙයි, දේශීය වශයෙන් උසස් අධ්‍යාපනයක් ලබා ගැනීමට පුල පුලා බල බලා සිටින තරුණ තරුණියන්ට අවස්ථාව දීමටද රජයේ බලාපොරොත්තුවක් නැති බව අපට දැන් පැහැදිලියි.

විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා 9,000 ක් පමණ සිටින බව කී රජය ගාල්ල, යාපනය, කුරුණෑගල, යන නගරයන්හි විශ්ව විද්‍යාල තුනක් ඇති කරන බව ප්‍රකාශ කළා. දැන් ඒ විශ්ව විද්‍යාල ඇනීම නතර කර තිබෙනවා. අද රජය කියන්නේ එදා කී එක නොවේ. දැන් කියනවා එසේ විශ්ව විද්‍යාල ආරම්භ කිරීමට වුවමනාවක් නැහැ කියල. දැන් කියන්නේ, විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසු අය තුන් දහසකට හාර දහසකට වඩා නැත, ඒ නිසා අතිරේක විශ්ව විද්‍යාල වුවමනා නැත, කියායි. කවුරු රවටන්නද මේවා කියන්නේ ? මේ හත් හවුල් රජය මේවා කියන්නේ කාව රවටන්නද ? කොළ කබා ඇඳගෙන හත්හවුල දිනවන්නට වැඩ කළ තරුණයින්ට මේක හොඳ පාඩමක්. මේ කරන්නේ ඔවුන්ට නිගාවක්.

ජීවන වියදම සම්බන්ධව කරුණු රාශියක් ඉදිරිපත් කර තිබෙනවා. ජීවන වියදම පහත දැමීමට මාලු ලාබයට දෙන්න ඕනෑය, එළවලු ලාබයට දෙන්නට ඕනෑය කියා තිබෙනවා. ඒකත් ඇත්ත තමයි. එමෙන්ම මේ රටේ පාසැල් ශිෂ්‍යයින්ට වුවමනා කරන පොත් පත්වල මිළ අඩු කරන්නටත් ඕනෑ. මේ රටේ පොත් පත්වල මිල අධික බව අපි දන්නවා. පවුලක දරුවන් වැඩි සංඛ්‍යාවක් සිටිනවා නම්, වැඩි මිළ දී පොත් පත් ලබා දෙන්නට දුප්පත් දෙමව්පියන්ට පුළුවන් කමක් නැහැ. පසුගිය ආණ්ඩුවෙන් සරල බසින්, නිවැරදි බසින්, ඉතා ලක්ෂණට පොත් රාශියක් පළ කර තිබුණා. ලංකාවේ විසිට සිටි දක්ෂ ලේඛකයින්ගේ හා දක්ෂ ගුරුවරුන්ගේ සහයෝගය ලබා ගෙන ගෙනගිය මේ වැඩ පිළිවෙළ එක පැත්තකින් ලංකාවේ සමහර ප්‍රවෘත්තිපත්‍රකාරයිනුත් අනික් පැත්තෙන් මේ රටේ පොත් ලියන්නනුත් පොත් කියවන්නනුත් සූරා කන ග්‍රන්ථ ප්‍රකාශකයනුත් එක්වී කඩා කප්පල් කළා. මේ උදවිය කිව්වා බෝ කොළ නිල් පාටයි කියා තිබෙනවාය කියා. එය දේශපාලන වාසියක් තකා ගෙන ගිය නින්දිත ව්‍යාපාරයක් බව මා කියනවා. සමහර මෝඩයන් කියනවා බෝ කොළ නිල්පාට නොවෙයි කියා. ඔවුන්ට ඕනෑ නම් කොළපාටයි කියා ලියා ගන්නට කමක් නැහැ. සමහර මෝඩයන් හිතනවා නම් බෝ කොලය නිල් පාටය කියන එක වැරදිය කියා, එසේම බෝ කොළය කොළ පාටය කියා ලිවිය යුතුය කියා මේ රටට කාගේ පිහිටද ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, පොත් මිළ, පොත්වල අධික මිළ දුප්පත් දෙමාපියන්ට මහ බරක්. ළමයාට කෑම සපයා දීමටත් වඩා පොත්පත් සපයා දීමට දෙමාපියන් උනන්දු වෙනවා. පවුලක දරුවන් හතර පස් දෙනෙකුට පොත් අරන් දෙන විට එය කරන්නට පුළුවන් වන්නේ එක්කෝ කණකර උගස් තියල, එසේ නැත්නම් තමන්ගේ පොල් ගස් දෙක තුන බදුදී ණය මුදලක් ලබා ගෙන. ඒ තරමට අද පොත් මිළ අධිකයි. සෑම අවුරුද්දක් අවසානයේදීම දෙමාපියන්ට මේ ප්‍රශ්නයට මුහුණපාන්නට සිද්ධ වෙනවා. මේ කනගාටුදයක තත්ත්වය වෙනස් කොට දුප්පත් දරුවන්ට ලාභයට පොත් පත් ලබා ගැනීමට ඉඩ සලසාදීම ජීවන වියදම අඩු කරන එක් මාර්ගයක්. අද ඇතැම් පොත්පත්වල මිළ ඉතාමත් වැඩියි. ඇත්තවශයෙන්ම අද පොත්පත්වල මිළ පාලනය කිරීමට වුවමනා කරනවා. කළුකඩයේ ආහාර ද්‍රව්‍ය වැඩි මිළට විකුණන විට අල්ලා අඩු පවරන්නට පුළුවන් නම්, මිළ පාලන නිලධාරීන් යවා කළුකඩයේ වැඩි මිළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගණන්වලට පොත් විකුණන විටත් අල්ලා නඩු පැවරිය යුතුයි. ඒ නිසා ආහාර වාගේම අවශ්‍ය පොත්පත් කළුකඩයේ වැඩි මිල ගණන්වලට විකුණන්නට ඉඩ නොලැබෙන විධියට නීති සකස් කිරීම ඉතා ඉක්මණින්ම කර දූනට වඩා ලාභයට අපේ දුප්පත් පාසැල් දරුවන්ට පොත පත ලබා දීමට කටයුතු කිරීම මේ රජයේ යුතුකමක් බව මා මේ අවසථාවේදී මතක් කරන්නට සතුටුයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, අත් යන්ත්‍රවලින් රෙදි විවීමේ මධ්‍යසථාන 1,000 ක් ඇති කිරීමට යෝජනාවක් මෙම අයවැය ලේඛනයේ සඳහන්වී තිබෙනවා. අත් යන්ත්‍රවලින් වියන රෙදි පිළිබඳ තත්ත්වය කුමක්ද? මහන්සියේ තරමට ආදායමක් නැහැ. ඒ වාගේම පාරිභෝගිකයාට ලාභයට ද්‍රව්‍ය ලබා දීමට පුළුවන්කමක් නැහැ. මේ අත් යන්ත්‍ර ක්‍රමය වහාම නවත්වන්න ඕනෑ. කුවේණියගේ කාලයේ කපු කර්මාන්තය කළ අන්දමටයි මේ ආණ්ඩුවත් කපු කර්මාන්තය කරන්නට යන්නෙ. අද මේ විද්‍යාත්මක අංශයෙන් මේ තරම් දියුණු වී තිබෙන ලෝකයක ඒ තත්ත්වයට ගැළපෙන අයුරින් කල්පනා නොකර ආදි කල්පික වැඩ පිළිවෙළවල් යොදා නම් කෙසේවත් මේ රටේ කපු කර්මාන්තය දියුණු කරන්නට පුළුවන් වෙන්නෙ නැහැ. නවීන ලෝකයේ පේෂකර්මය අතින් දියුණුව කරා ගමන් කොට සිටින, දූනට ගමන් කරන, රටවල් දෙස නොබලා මේ අයවැය ලේඛනයෙන් ඉදිරිපත් කරන්නේ ආදි යුගයේ වැඩ පිළිවෙළක්. මේ වැඩ පිළිවෙළෙන් තරුණ තරුණියන් ටික දෙනෙකු රවටන්නට පුළුවනි. එපමණයි එයින් කරන්නට පුළුවන්. මේ යෝජනාව, මේ අශාස්ත්‍රීය යෝජනාව, දියුණු වන ලෝකයට නොගැළපෙන යෝජනාව, ක්‍රියාත්මක කරන්නට සිදු වී තිබෙන්නේ සවදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාටයි. ගුරු වෘත්තිය, හෙදි සේවය, සාත්තු සේවය ආදී සේවා තුළින් දෙවු සමතුන්ගේ ප්‍රශ්නය විසඳන බවත්, එසේ විසඳන්නට බැරි වුණොත් තමා කළු ගඟේ දමන්නටය කී සවදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාට තමයි මේක ක්‍රියාවේ යොදවන්න වෙන්නෙ. මේ විධියට පුළුවන්ද, මේ රටේ ආර්ථික සම්පත දියුණු කරන්න ?

කපු වැවීම සම්බන්ධවත් මා වචනයක් කියන්නට සතුටුයි. නවීන යන්ත්‍ර සූත්‍ර යොදවමින්, ශාස්ත්‍රීය ලෙස බිම් සකස් කරමින් සුදුසු බීජ තෝරා ගනිමින් කපු වවතොත් ඊජිප්තුවේ කපු වගේම හොඳ කපු ලංකාවේ නිෂ්පාදනය කිරීමට පුළුවන් බව හම්බන්තොට ප්‍රදේශයේ ආදර්ශ ගොවි පොළවල ප්‍රතිඵලවලින් සෝවියට් විශේෂඥයන් ඔප්පු කර තිබෙනව. මේ ව්‍යාපාරයට ඇති බාධාව නම්, රජයේ ගොවි පොළවල් අසාර්ථක වන ලෙස කඩාකප්පල්කාරී කටයුතු ඇති වීමයි. නවීන යන්ත්‍ර සූත්‍ර යොදවා, නිෂ්පාදනය ඉක්මන් කොට, නිෂ්පාදනය වැඩි කොට, හැකි තරම් අඩු මිලට භාණ්ඩ සැපයීම තේරුම් ගන්නට අමාරු දුෂ්කර ප්‍රශ්නයක් නොවෙයි. මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි පේෂකර්ම ව්‍යාපාරය ගැන නැගෙනහිර ජර්මනියේ විශේෂඥයන් සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනව. පේෂකර්මය අතින් අපේ රට සවයංපෝෂිත කිරීමට විදුලි බලවේග පේෂකර්ම මධ්‍යසථාන ඇති කිරීමට එම වාර්තාවෙන් යෝජනා කර තිබෙනව. ජල විදුලි බලය බොහෝ ප්‍රදේශවලට බෙදා හැරීමට කටයුතු සංවිධානය වෙමින් පවත්නා බව කවුරුත් දන්නා කාරණයක්. ඒ නිසා සැහෙන අඩු මිලකට රෙදි නිෂ්පාදනය කළ හැකි බව පැහැදිලිව පෙනෙන කාරණයක්. පැරණි ක්‍රමයට අත්කර දෙක තුන බෙදා හැරීම සාර්ථක වැඩ පිළිවෙළක් නොවන බව පැහැදිලියි. නවීන යන්ත්‍රසූත්‍ර යොදා විශාල ගොවිපොළවල් ඉතා සාර්ථක අන්දමට කළ හැකි බව ඔප්පු වී තිබෙන කරුණක්. මෙබඳු සමූහ ගොවිපොළවල් ඇතිවීම වැළැක්වීමට ධනපතියන් අද ලොකු වෑයමක යෙදී සිටිනව. ධනපතියන්ට ඉඩම් දීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමයි නව රජයේ ප්‍රතිපත්තිය වී ඇත්තේ. පසුගිය රජය ලබාගත් අත්දකිම් දුප්පත් මහජනතාව වෙනුවෙන් නොයොදා ධනපතියන්ගේ ප්‍රයෝජනය සඳහා යොදවන්නටයි මේ රජය බලාපොරොත්තු වන්නේ. නමුත් ශ්‍රී ලංකා රජයේ හිටපු ඇමතිවරු කීප දෙනෙකුමයි මේ යූ. එන්. පී. හත් හවුල් ආණ්ඩුවෙත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

ඉන්නෙ. සෝවියට් දේශයේ ආධාර ලබා ගෙන මේ රටේ කපු වැවීම දියුණු කිරීම සම්බන්ධයෙන් විශේෂඥයන් සමග කළ සාකච්ඡාවලට මේ ඉඩම් ඇමතිතුමා සහභාගි වුණා.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන් කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1965 අගෝස්තු මස 25 වන බදාදා පවත්වනු ලැබේ.

அப்போது பி. ப. 8 மணியாகிவிடவே சபையினது நடவடிக்கைகள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது.

விவாதம் 1965 ஓகஸ்ட் 25 ஆம் திகதி புதன்கிழமை மீள ஆரம்பமாகும்.

*It being 8* P.M. *Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Wednesday, 25th August 1965.*



## කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

මතු පළවන යෝජනාව සභාසම්මත විය:

பின்வரும் பிரேரணை ஏற்றுக்கொள்ளப்பட்டது :

*Resolved :*

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය."—[ගරු වන්නිනායක].

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக".—[கௌரவ வன்னிநாயக்க]

"That the House do adjourn".—[Hon. Wanninayake]

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.1 ට, 1965 අගෝස්තු 20 වන දින සභාසම්මතිය අනුව, 1965 අගෝස්තු 25 වන බදාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.

அதன்படி பி. ப. 8.1 மணிக்கு சபை அதனது ஓகஸ்ட் 20, 1965 ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 1965, ஓகஸ்ட் 25 ஆம் தேதி புதன்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப் பெற்றது.

*Adjourned accordingly at 8.1* P.M. *until 10* A.M. *on Wednesday, 25th August 1965, pursuant to the Resolution of the House of 20th August 1965.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩක්. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30. தபால்மூலம் 45 சதம். முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months. Each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org